

champikaranawaka.lk

# අපේ මග

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්දතියෙහි විකාශනය
## හා
## ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ගමන් මග


# චම්පික රණවක



චින්තන පර්ෂද ප්‍රකාශනයකි



champikaranawaka.lk

පළමුවන මුද්‍රණය - 1989 ඔක්තෝබර්

© චම්පික රණවක

පිටකවරයේ සැකැස්ම - කේ. ඩබ්ලිව්. ජනරංජන

ප්‍රකාශනය හා බෙදාහැරීම
චින්තනය පරිෂදය
109/1 දුම්රිය පටුමග, මහරගම

මුද්‍රණය
අමද්‍යප තරුණ පුහුණු මුද්‍රණාලය, ශ්‍රී නාගවිහාරය කොට්ටේ.

champikaranawaka.lk

# අපේ මග


පළමුවන කොටස

| | | |
|---|---|---|
| 1. | භාරතීය අධ්‍යාපනය | 1 |
| 2. | භාරතීය අධ්‍යාපන පීඨ | 6 |
| 3. | ලාංකීය අධ්‍යාපනය | 9 |
| 4. | ලාංකීය ජාතික විද්‍යා පීඨ | 13 |
| 5. | භික්ෂු - ශිෂ්‍ය ව්‍යාපාරයේ අතීත ගමන් මග | 22 |

දෙවන කොටස

| | | |
|---|---|---|
| 1. | බටහිර අධ්‍යාපන ක්‍රම | 31 |
| 2. | ලංකාවේ විදේශ අධ්‍යාපනය | 39 |
| 3. | නව අධ්‍යාපන රටාව | 44 |

තෙවන කොටස

| | | |
|---|---|---|
| 1. | බටහිර උසස් අධ්‍යාපනය ඇරඹීම | 50 |
| 2. | නිදහස් අධ්‍යාපනය | 54 |
| 3. | 1956 පුනරුදය | 64 |
| 4. | කඩවුණු පොරොන්දුව හා තේරුම් නොගැනීම (70-77) | 65 |

සිව්වන කොටස

| | | |
|---|---|---|
| 1. | ශාපලත් යුගය ඇරඹේ.. | 71 |
| 2. | යූ.එන්.පී. ශාපයට එරෙහිව | 95 |
| 3. | අරගලයේ පසුපස | 106 |
| 4. | කළ යුත්තේ කුමක්ද | 117 |


chandikaranawaka.lk

මව්බිමේ උරුමය පතා

දැයේ පුදසුන මත

දිවිකුසුම් පුදා හළ

විරු ලක් සිසු දූ පුතුන්හට

පිදේ.

champikaranawaka.lk

# පළමු වන කොටස

## 1. භාරතීය අධ්‍යාපනය

### ● බුදුසමයට පෙර

අධ්‍යාපන හා සංස්කෘතික වෙසෙසින්ම එකිනෙක හා සුසංයෝග වූවකි. ඉන්දීය සංස්කෘතියේ ආරම්භය හා ව්‍යාප්තිය ආර්ය සමාජයෙන් ඇතිවූවක් ලෙස විශ්වාස කෙරේ. මෙකී ආර්යයැයි පිළිගන්නා ජන සමූහය වයඹ දිග දොරටුවෙන් ඉන්දියාවට සංක්‍රමණය වූයේ ක්‍රිඃපූඃ 1000-2000 අතර කාලය තුළදීය. මෙකී ජනයා බටහිර ආසියාවේ ජනාවාස වී පසුව එකිනෙකට වෙනස් මංපෙත් දෙකක ගමන් කළ යුරෝපීය හා ඉන්දීය ශිෂ්ටාචාර දෙකම බිහිකළ කොකේසියානු සම්භවයකින් යුතු ජන කොටස් ලෙස සැලකේ. කෙසේ වෙතත් මේ ආර්යය යැයි පවසන ගෝත්‍රිකයන් වරින් වර ඉන්දියාවට පැමිණි ආක්‍රමණිකයන් ලෙස ද හඳුන්වා තිබේ. මොවුන් පැමිණීමට පෙර ඉතා සංකීර්ණ අංග ලක්ෂණයක් සහිත ශිෂටාචාරයක් (මොහොන්දාජාරෝ - හරප්පා) පැවති බවට සාධක රැසකි. ආර්ය නොවූ එම ශිෂ්ටාචාරය ක්‍රිඃපූඃ 2000 - 3000 බැබිලෝනියානු ශිෂ්ටාචාරයට නෑකම් කියන්නකි. එහෙයින් ආර්යයන් ඉන්දියාව ආක්‍රමණය කරද්දී අනාර්ය වූ ද, වෙනස් වූද, සංස්කෘතියක් ඉන්දියාවේ පවතින්නට ඇත යන්න සාධාරණ නිගමනයකි. ආර්යයන් පැරණි ඉන්දීය ජනකොටස් යුදමය ලෙස පරාජය කර ප්‍රදේශයේ ආධිපත්‍යය දැරුවද, එවකට සිටි අනාර්ය කොටස් වල සංස්කෘතික ආක්‍රමණයට ඔවුන් ගොදුරු වූ පොදු - අනාර්ය සංස්කෘතිය යැ යි සිතිය හැකිය.

මෙලෙස ඇඹුණු ආර්ය ශිෂ්ටාචාරයේ ප්‍රථම යුගය ක්‍රිඃ පූඃ 500 - 1500 අතර කාලය තුළ ඇරඹුණු වෛදික යුගයයි. මේ යුගය වේද ග්‍රන්ථ ලෙස ප්‍රකාශ කරන ලදී. මේවා ප්‍රථම වශයෙන් පරිසරය හා මිනිසා අතර සහසම්බන්ධය වටහා ගැනීමට පැරණි ඉන්දු ආර්යයන් අනුගමනය කළ විදික්‍රම පිළිබිඹු කරයි. එහි ඉතාම වැදගත් දෙය නම්

බටහිර දර්ශනයට ඉහළින් සිටි මිනිසාද පරිසරයේ එක් ජීව ක්‍රියාවලියක් පමණක් බැව් වටහා ගන්නට වේද යුගයේ ඉන්දු ආර්යයන් සමත් වීමය. පරිසරයේ විවිධ ධාතූන් සූර්ය, ගිනි, වායු, ජල ලෙස හඳුනාගනිමින්, ඒවාත් මිනිසාත් අතර සහජීවනය වටහා ගනිමින් ඒවා පිදීම මරුත්-ඉන්ද්‍ර (අන්තරීක්ෂ), වරුණ, මිත්‍ර (අකාශෂ්ඨ) සෝම-අග්නි (භූමස්ථ) ආදී දෙවිවරුන් වෙසින් විද්‍යාමාන කරන ලදී. මෙහි විශේෂ ලක්ෂණය වූයේ අධිපති දෙවියකු නොවීමය. ඉන්ද්‍ර රණකාමී වූ අතර ආක්‍රමණවලට එරෙහි වීමේදී ප්‍රධාන විය. සාමකාමී යුග වලදී ප්‍රධාන වූයේ ධර්මිෂ්ඨ දෙවියකු වන වරුණය. පසුව මෙය එක්දෙවියකු ඇදහීම කරා සංක්‍රමණය විය. වේද ග්‍රන්ථ සතරින් ඍග් වේදය මෙකී පූර්ව තත්ත්වයන් මූර්තිමත් කරයි.

මෙකී ප්‍රවාදයන් ආර්යය සමාජයේ ප්‍රථම දැනුම කැටිකරගනිමින් ඒවා වේදනය කෙරුමට මිනිසා කළ උත්සහාය ප්‍රකට කරයි. ඉන්පසු ක්‍රමිකව මේ සංස්කෘතිය වර්ධනය වූ අතර ප්‍රවීණයන් වටා ගුරුකුල ගොඩනැගෙමින් වඩාත් අචල වූත්, සංවිධිත වූත් සංවිධානාත්මක වූත් සංස්කෘතික තත්ත්වයක් අපේක්ෂිත භාවයක් උදාවිය. එහි ප්‍රතිඵලය වූයේ යාග පැවැත්වීමේ ක්‍රම ඇතුළත් යජුර් වේදයේ බිහිවීමය. එහෙත් ආර්ය සමාජය පුහුණු කළ යන්ත්‍ර - මන්ත්‍ර ගැන වූ ඥානය ගැන අවබෝධයක් ලැබෙන්නේ අථර්වන් වේදයෙනි. (අථර්වන් යන පදය ඉරාන ජාතිකයන් 'පූජක' යන්ට සමානව යොදාගත් පදයකි.) එහෙයින් මේ කාලය වන විට වනාන්තරය තුළ පරිසරය තුළ ගිලී සිටි ජනකොටස්වල ඒකරාශී වීමක්, සංවිධිත බවක්, පූජක තිල භාවයක්ද එනයින්ම අධ්‍යාපනයේ නිෂ්පාදිත බවක්ද උදාවී තිබුණු බව සැලකිය හැකිය. 'සාමාත්' වේදයේ ඇතුළත් වූයේ ඍග් වේදයේ රචිත ගීත ගායනා කරණා ආකාරය යි. (සාමත් යන වදන තනුව නොහොත් 'විරිත' යන අර්ථය ගෙන දේ.) ඒ අනුව පෙනෙන්නේ සංගීතය වැනි සියුම් වින්දන ශක්තියකින්ද, එකිනෙකට වෙනස්වූ ස්වර හා සංඛ්‍යාත ගැනද මනා වූ අවබෝධයකින් ආර්යයා සිටි බවයි. චතුර් වේදයෙහිම පරිනාමය ගත්කළ එය පරිසරය තුළ රහස් සෙවීමේ වූ මානව කේන්ද්‍රී ආක්‍රමණය නොව, පරිසරයේ සහජීවනය හා එහි නැළවෙන චලනය සියුම් ලෙස ආගමද- දර්ශනයද සංගීතයද මූලාශ්‍ර ගත විය. අධ්‍යාපනයේ සංවිධානාත්මක ක්‍රියාවලිය සහමුලින්ම බ්‍රහ්මණ ඒකාධිකාරයක තත්ත්වයකට පත්ව තිබිණ.

වේද හා බ්‍රහමණ යුගය අවසාන කාලයේදී දැනුම ලබා ගැනීමෙ කාර්යය සඳහා අර්යයෝ මහත් උත්සහායක් ගත්හ. ලබාගත් ප්‍රථම අධ්‍යාපනයෙන් හිස එසවූ ඔහු මිනිසාත්, ඔහුගේ ජීව ක්‍රියාවලියත්, මනැසත්, මනුෂ්‍ය නොවන ක්‍රියාවන්ද ලෙස වූ වඩා පුළුල් විෂය මාලාවක් කරා අධ්‍යාපනය ගෙන යන ලදී. 'සත්‍යය' සොයා යමින් සිටි විවිධ ගුරුකුල නියෝජනය කළ විවිධ අධ්‍යාපන කව ලෙස සංවිධානය වූ

කොටස් හිමාගය හා වෙනත් ජනාවාස නොවූ තැන්හි සරසමින් කුඩා නිදහස් අධ්‍යාපන කව ආරම්භ කළහ. මේ වන විටත් නැගෙමින් තිබූ ශිෂ්ටාචාරයේ අධ්‍යාපනික ආධිපත්‍යය ඉසුරු බමුණන්ගේ සාම්ප්‍රදායික මත බිඳ වැටුණේ එවන් නිදහස් විප්ලවකාරී ශිෂ්‍ය අධ්‍යාපන කව මඟිනි. වර්තමානයේදී ද බමුණු මත පෙරලා දැමීම සඳහා එවැනි ම නිදහස් විප්ලවකාරී ශිෂ්‍ය බලයක් ක්‍රියා කරනුයේ එහි ඉතා ඈත අතීත භාරත මූලයයන් වෙතින්ද?

ආත්ම කේන්ද්‍රය කරගත් 'උපනිෂද්' ආදී දහම් වල බිහිවීම මෙයින් සිදුවිය. මූලික ලෙසම උපනිෂද් විසින් මූර්තිමත් කරන ලද්දේ පුදපූජා විධිවලින් වෙනස් වන්නාවූත් එයට එරෙහිව යන්නා වූත්, බ්‍රාමණයන්ගේ ලෝක විවරණයට වෙනස් වූද ලෝක දෘෂ්ටියකි. උපනිෂද් දහම තුළින් බ්‍රහමන්ද, රාගය හා විරාගයද, ඇති වීම නැති වීම ක්‍රියාවලිය පිළිබඳව ද වඩා පුළුල් අධ්‍යාපනික සාර සංග්‍රහයක් වෙයි.

මේ යුගයේ බිහිවූ ඉතාම සංවිධිත ලෝක දෘෂ්ටියක් ගෙන ආ දර්ශනයක් නම් ජෛන ධර්මය ය. ජෛන දහම අනුව විශ්ව මූල පදාර්ථ දෙකකට එනම් ජීව (සවිඥනක) හා අජීව (අවිඥක) ලෙස වෙන්කෙරේ. තවද එය 'ස්‍යාද් වාදය' එනම් අසම්භාවික 'විය හැකි ය' වූ ඉතා වැදගත් සාපේක්ෂක මතය ඉදිරිපත් කරයි. අනෙක් අතට එය පරමානුකවාදය, කාලය - අවකාශය ආදිය පහදන්නට උත්සුක වෙයි. එකිනෙකට වෙනස්වූ ප්‍රතිබන්දනයන් තුනෙක සංයෝජනයක් ලෙස 'සජනකෝටික' තර්ක ක්‍රමයක් ද ඉදිරිපත් කරයි. ද්විකෝටික තර්ක ක්‍රමය මත ගොඩනැගී ගිය බටහිර භෞතික විද්‍යාව හා ගණිතය අද මුහුණ දෙන අභියෝගයන් ජෛන මහාවීරගේ අධ්‍යාපන කව තුළ එදා සංවාදයට ලක්විණි ද?

තවත් විවිධ අන්තයන් නියෝජනය කළ අයද මාධ්‍යමික වාදියෝ ද මේ වන විට බිහිවෙමින් පැවති අතර ඔවුන් භෞතිකවාදීන්, විඥානවාදීන්, පරිසරවාදීන්, භෞතික-විඥානවාදීන් ලෙස විවිධ බලවේග විය. පොදුවේ මේ වන විට ඇතිවීමේ, නැතිවීමේ පාරිසරික ක්‍රියා දාමයන්ද, මිනිසා හා පරිසරය අතර සහසම්බන්ධය ද රළු ලෙසද සූත්‍රගත ආකාරයකින්ද ආර්යයන් දැන සිටි බව පෙනේ. ගොඩනැගිලි ඉදිකිරීම්, වෛද්‍ය වෘත්තීමය තාක්ෂණයද, ජ්‍යොතිෂය ගණිතය, ආකාශ වස්තු පරීක්ෂාව ආදී සූත්‍ර ගත විද්‍යාවන්ද යම් පමණකට සංවිධිත භාවයක් උසුලනු ලැබීය. අධ්‍යාපනයේ ආධිපත්‍යය ය ස්වාධීන කුඩා ගුරු කුල අතර ද බ්‍රහමණයින් අතරද පැවතින.

## බුදු සමය පැතිරීම

බුදු දහම භාරතයේ බිහිවද්දී විවිධ ගුරුකුළ හා බ්‍රහමණයන්ගේ එකාධිපතීත්වයක් අධ්‍යාපනික අතින් පැවතිණ. ආගම්ද, දර්ශනය ද - අධ්‍යා-

පනය ද වෙන් නොකළ හැකි සේ එකිනෙකින් වෙලී පැවතිණ. කෘෂිත ආර්ථිකය තුළ ජනයාගේ ආර්ථික තත්ත්වයද යම් පමණකට තෘප්තිමත් වූ අතර නිදහස් වෙළඳ පන්තියක බිහිවීමක්ද සිදුවෙමින් බැවතිණ. කුල ක්‍රමය ආදීය තුළින් ශ්‍රම විභාජන ආකාරයකට සමාජය වඩාත් සංවිධානාත්මක බලයකට අනුව පවත්වා ගනිමින් තිබින. සරල ගම්ද සංකීර්ණ පුරවරයන් ද විය. මේ සමාජ වතාවරණය තුළ අන්තවාදීන්ට ප්‍රතිපක්ෂව අන්තයන්ගේ සුසංයෝගය හෝ අන්තයන් දෙකම නොවන මැදුම් පිළිවෙතෙහි වූ තර්ක ක්‍රමයක්ද, ඇතිවෘමත් නැතිවීමත් කළාවද, පුද්ගලිකත්වය වෙනුවට සමාජයට නවක්‍රමයක් වූ සාමූහිකත්වය අඩංගු වූ සංඝ සමාජයද, මමත්වයත්, තෘෂ්ණාවත් මැඩීමද ආදිය මූලික කරගත් නව දහමක් ලෙස බුදු දහම බිහිව පැතිර ගියේ අධ්‍යාපනයේද නව නිම්වළලු බිහිකර ගනිමිනි.

බුදු දහම ඉතා වේගයෙන් පැතිර ගිය අතර පසු කලකදී එය ශාඛා කිහිපයකට බිඳ ගියේය. විවිධ ආක්‍රමණයන්ද, සමාජයේ වූ අස්ථිරතාවයන් ද නිසා බුදු දහම ද වෙනස් ව ගිය බව පෙනේ. මෙලෙස ශාඛා දහඅටකට බුදුසමය බෙදී ගියහයි විශ්වාස කරන ලද අතර ඉතා ප්‍රධාන ගුරුකුල දෙක ලෙස හීනයාන හා මහායාන ප්‍රචලිත විය. මේ ගුරුකුළ දෙක අතර න්‍යායික මෙන්ම ප්‍රයෝගික ලෙසද පැහැදිලි වෙනස් කම් වෙයි. සරල උදාහරණයක් ලෙස හීනයාන බුදු දහම පුද්ගලයාට'නිවන' ලබාගැනීමේ මාර්ගය පමණක් දක්වන දක්වන අතර, නිවන ලැබීම පුද්ගල කාරියක් ලෙස සැහීමකට පත්වෙද්දී මහායාන නිවන හෝ මෝක්ෂය ලැබීම සඳහා පුද්ගලයා නොනැවතී ක්‍රියාකළ යුතු යැයි උගන්වනු ලැබේ. කෙසේ වුවත් ස්ථාවර සමාජ පසුබිමක ධ්‍රැවතායන් (ආන්තික වීම) ප්‍රතික්ෂේප කරන බුදුදහමට අවිහිංසකව පැවතිය හැකි වුවද ආක්‍රමණික හා අස්ථාවර, ධ්‍රැවනය වූ ආගමක් වූ හින්දු මතවාදීමය ප්‍රහාරයන් වෙතින්ද ආක්‍රමණික ප්‍රහාරයන් වෙතින්ද පසු බස්වනු ලැබීය.

එහෙත් බෞද්ධ අධ්‍යාපනය ක්‍රමය තැබූ පිය සටහන් ගැඹුරු ඒවා වෙයි. එතෙක් පැවති බ්‍රහ්මණ සම්ප්‍රදායන් හා ගුරුකුලයන් වෙතින් දිරිගන්වනු ලැබුයේ වැඳුම් පිදුම් හෝ අධ්‍යාපන කටයුතු වල සාමූහික ක්‍රම නොව පෞද්ගලික සම්බන්ධතාවයන් ගුරු කොට ගත් අධ්‍යාපන ක්‍රමයකි. එබැවින් ගුරුතුමාගේ නිවසෙහිම සිට ඔහුට ආවතේව කරමින් වඩා බැඳුණු ගෘහස්ථයන්හි සිට අධ්‍යාපනය ලබන්නට ශිෂ්‍යයාට සිදුවිය. එය කුමන අර්ථයෙන් ගත් කළ වුව ස්වාධීනත්වය යටපත් කළ රළු අධ්‍යාපන ක්‍රමයකි. එහෙත් එයට ප්‍රතිපක්ෂව විහාර වටා බිහිවුන බෞද්ධ අධ්‍යාපනය එනම් සංඝ අධ්‍යාපනය වෙනස් මුහුණුවරක් ගනී. එය පුද්ගලික බැඳීම් වෙනුවට සාමූහිකත්වය ආදේශ කරන ලද්දකි. එමෙන්ම වඩාත් ස්වා-

ධීන වෙයි. එහි ඉතාම වැදගත් දෙය නම් ගුරු ගෝල සැබැඳියාවය. එනම් ඇඳුරන් මෙන්ම ගෝලයන්ද උසස් අධ්‍යාපනයට උචිත ලෙස වූ නිසසල මනසකට හා තාර්කික මනෝක්‍රමයකට ද, බාහිර වස්තූන් වෙතින් විකර්ශනය වූ තෘෂ්ණාව මඬින ලද බුදු දහම මගින් එකිනෙකා හා බැඳී සිටීමය.

සසුනේ ප්‍රමාණය පුළුල් වෙත්ම ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි හා වෙනත් පහසුකම් සැපයීම ධනය ඇත්තවුන් විසින් ඉටුකරනු ලැබිය යුතු විය. "ශක්තාය ඇත්තෝ තමන්ගේම යහපත උදෙසා ප්‍රසන්න ආරාම කරවා එම උගතුන්ට වාසස්ථාන කරත්වා" (චුල්ලවග්ග vi-1.5) තවද විහාර ඉදිකිරීමේදී නගර වලින් ඈත්වීමද එහෙත් වඩා ඈත් නොවීමද, භාවනායෝගී මානසික තත්ත්වයකට හා අධ්‍යාපනයනට සුදුසු පාරසරික තත්ත්වයන්ගෙන් යුතු පෙදෙසක විහාර තැනවිය යුතුය යැයි චුල්ලවග්ගෙයින්ම සඳහන් වෙයි. ඒ අනුව බෞද්ධ ඉන්දියාව පුරා රජ දරුවන්ගේ සිට ජනතා දරුවන් දක්වා සියලු පුරවැසියන් තම තමන්ගේ ශක්තිය ප්‍රමාණයට අනුව විවිධ මට්ටමේ වෙහෙර ද ඊට අදාළ අනෙකුත් පහසුකම්ද සසුනට ද අධ්‍යාපනයට ද ලබාදෙනු ලැබීය. එනම් ඇදුරන් ද සිසුන්ද ජනතාව වෙතින්ම යැපුන අතර පදානුගත අර්ථයෙන්ම නිදහස් අධ්‍යාපනය බිහිවිය.

අධ්‍යාපන ක්‍රමයද මනාව සංවිධානය කරන ලද්දේ ය. සාමූහික බව මූලික කර ගනිමින් ශිෂ්‍යයන් කෙරේ පෞද්ගලිකව ද ආරක්ෂාවක් හා සැලකිල්ලක් දක්වන ලදී. මෙය සකසා ගත්තේ විනය පිටකයට අනුව සංඝ විනය පවත්වා ගැනීම් මගිනි. මේ අනුව සෑම නවකයකුම හා ශිෂ්‍යයකුම නිසි සුදුසුකම් ලද පුද්ගලයන් දෙදෙනකු වෙත බෙදී තිබිණ. ඒ ශාස්ත්‍රීය අධ්‍යාපන කටයුතු සඳහා උපධ්‍ය කෙනෙකුද විනය හා පොදු ශුභ සිද්ධිය ගැන ක්‍රියා කරන ධර්මාචාර්ය කෙනෙකුද වශයෙනි. ඒ අනුව ඇදුරන්ගේත් සිසුන්ගේත් යුතුකම හා වගකීම මැනවින් පවත්වා ගනු ලැබීය.

විෂය මාලාවට ධර්මය එනම් පරිසරය දැනීමේ දර්ශනය හැදෑරීම අනිවාර්ය විය. එනමුත් ලෞකික විද්‍යා වූ ව්‍යාකරණ, තර්ක ශාස්ත්‍රය, කලාශිල්ප, අධ්‍යාත්ම හෝ ගුප්ත විද්‍යා ආදිය විය. තවද විහාර ඉදිකිරීම, නඩත්තුව දත් භික්ෂු ද, වෛද්‍ය වෘත්තිය හා රෝගීන් රැක බලා ගැනීම දත් භික්ෂු ද, ආහාර ද්‍රව්‍ය හා වෙනත් දෑ පාලනය සඳහා කළමණාකරණය දත් භික්ෂු ද, සිවුරු විවීම ආදී වෙනත් අවශ්‍යතා දත් භික්ෂු ද ලෙස විවිධ වෘත්තීමය ප්‍රවීණයෝද විහාරවල විසූහ. බෞද්ධ දර්ශනය පැතිරීමේ අරමුණින් විවිධ කෘති හා පර්යේෂණ කළ භික්ෂු ද වූහ.

# 2. භාරතීය අධ්‍යාපන පීඨ

## • නාලන්දාව

එකල ඉන්දියාවේ රජගහ නුවරට නුදුරින් පිහිටි පළඹුවන කුමාර්තුප්ත (ක්‍රිː වː 455-67) රජු විසින් තනවන ලද හා දියුණු කරන ලද නාලන්දා අධ්‍යාපන පීඨය විශ්ව කීර්තියට පත්වූවක් විය. එය කුමාර්ගුප්ත රජුටත් පෙර, බුදුසමය පැමිණීමටත් පෙර බ්‍රහ්මණික අධ්‍යාපණික පීඨයක් ව පැවතුන බව කියවෙයි. එහෙත් ඉන්දියාවේ මහායාන බුදුසමයේ වේගවත් පැතිරීමක් සමග ම එය මහායාන ධර්මය පිළිබඳ අතිප්‍රසිද්ධ විද්‍යා පීඨයක් විය.

ගොඩනැගිලි හා වෙනත් පහසුකම් ක්ෂේත්‍රයේ ද නාලන්දාව සුවිශාල විද්‍යායතනයක් විය. එයට අතිවිශාල නවමහල් ප්‍රාසාදයක් ද විශාල ශාලා අටක්ද ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා පමණක් කාමර තුන්සියයක්ද වූ බැව් කියවේ! ක්‍රිː වː 7 වන සියවස වන විට එහි කාන්තාවෝ ද ඇතුළු 8000 ට අධික ප්‍රමාණයක් අධ්‍යාපනය ලැබූ අතර දිනපතා ආහාර හා වෙනත් අවශ්‍යතා සැපයීම සඳහා ගම් දනව් 200 ට අධික ගණනක් පැවතින!

නාලන්දාවේ පැවති සෑම ශාලාවක ම ප්‍රධාන අනිවාර්යකු (මොවුන් හැඳින්වූයේ ද්වාර පණ්ඩිතයන් යන නමින්) යටතේ වූ විද්‍යාලයක් විය. විශ්ව කීර්තියට පත් තම විෂය ක්ෂේත්‍රයේ ඇති ශ්‍රේෂ්ඨත්වයට පත් ආචාර්යයවරු (පණ්ඩිතයන්) මෙහි විසූහ. දින්නාග, ධර්මපාල, සීලභද්‍ර වනාහි එවන් චිරප්‍රසිද්ධියට පත් පඬිවරුන් ය. නාලන්දා සරසවියට සිසුන් ඇතුළු කරනු ලැබූවේ ද්වාර පණ්ඩිතයන් විසින් පැවැත් වූ පරීක්ෂණයක් තුළිනි. මේ පරීක්ෂණය තුළින් සමත් වූයේ 20% - 30% අතර ප්‍රමාණයක් පමණි. නාලන්දාව සතුව අතිවිශාල අත්පිටපත් ගණනක් සහිත පුස්තකාලයක් ද වූ අතර, එම කෘතීන් අධ්‍යනය කෙරුමටත්, නව විෂයන් උගැනීමටත්, සුපුතල පණ්ඩිත ඇදුරන්ගේ කීර්තිය නිසාත්, දැනුම් ගවේෂණයේ රුචි වූ දේශීය මෙන්ම විදේශීය ද වූ විශාල ශිෂ්‍යයෝ පිරිසක් ඇදී ආහ. එහෙයින් එයට ඇතුළු වීම සඳහා විශාල තරගයක් විය. සරසවි පිවිසුමට 'තරගය' ඇතිවූයේ එතරම් ඈත කාලයකදී ද?

විෂය මාලොවේ ප්‍රධාන සංරචකය වූයේ මහායාන බුදු දහමයය. එහෙයින් හීනයාන බුදුදහමද එකල ඉන්දියාවේ පැවති එකිනෙකට වෙනස් සියලු දර්ශනයන් ද ගැඹුරින් අධ්‍යනය කිරීම සඳහා අවශ්‍යශ විය. වේදවේදහෙ, ව්‍යාකරණ, සංඛ්‍යා-ගණිතය, වෛද්‍ය, ජ්‍යොතීෂ, යෝගක්‍රම

නක්ෂත්‍ර තර්ක ශාස්ත්‍ර වැනි විෂයන්ද එහි විෂය මාලාවට ඇතුළත් විය. එනම් නාලන්දාව හුදු ආගමික අධ්‍යාපන පීඨයක්ම නොව අනාගාමික හා ලෞකික වූ විෂය ක්ෂේත්‍රයන් කරා ද පැතිරීගිය සරසවියක් විය. එහි දිනපතා දේශන සියයකට වඩා වැඩි ගණනක් පැවැත්විණ.

සංස්කෘත භාෂාව අධ්‍යාපන මාධ්‍ය විය. එහි අධ්‍යාපන සිසුනගේ වයසට හා දැනුමට අනුව ප්‍රාථමික, ද්වීතීක හා උසස් යැ යි පෙළ තුනකින් සමන්විත විය. ප්‍රාථමික අංශය වයස 18 - 13 දක්වාද, ද්වීතීක අංශය 13 - 20 ත් දක්වා ද්වීතීක අධ්‍යාපනය ලැබූවන් උසස් අධ්‍යාපනයට ද සුදුස්සන් විය. නාලන්දාව සතුව දැවැන්ත ශාලා තුනක පැවති පුස්තකාගයට අමතරව ආකාශ වස්තු නිරීක්ෂණය කළ හැකි පරීක්ෂණාගාරයක් ද වෙනත් ප්‍රයෝගික විද්‍යා ශාලාවක්ද විය.

ආයතනය කොතරම් විශාල වුවද එහි සංවිධානය අනෙක් විහාර වල ආකාරයෙන් වෙනස් නොවීය. සිසුවෝද ඇදුරෝද නේවාසිකව සිටි යහ. ශිෂ්‍ය සංඛ්‍යාව කෙතරම් වැඩි වුවත් සෑම ශිෂ්‍යයකුගේම පෞද්ගලික අධීක්ෂණය සඳහා එක් එක් ශිෂ්‍යයාට උපාධ්‍යායවරයෙක් හා ආචාර්යය වරයෙක් සැපයීමේ ක්‍රියාවලිය හා සම්ප්‍රදාය දිගටම ගෙනයන ලදී. අධ්‍යාපනය නිදහස්, නොමිලේ ලැබූ එකක් විය. ගුරු සිසු මූලික අවශ්‍යතා රජුන් හා දනන් සපයන් ලදී. කෙතරම් විශාල ආයතනයක් වුව ද වාර්ෂිකව කාමර වෙන්කර දීමේ සිට විනය කටයුතු දක්වා සියළු බල මෙසේ රජුගේ සිට මොනම බලපෑමක් වත් තොරව පූර්ණ ස්වාධිනත්වයෙන් අභ්‍යන්තරික වූ ස්වයං පාලනයේ සාමූහිකත්වයත් සරසවියක පරිපාලනය පිළිබඳ සම්මතයක් බවට පත්විය.

වාචිකව වූ බුද්ධිමය වාද විවාද නාලන්දාවේ අවශ්‍යම අංගයක් විය. පැවතිය හැකි හා නොපැවතිය හැකි ධර්මතාවයන් හා යථාර්ථයන් පිළිබඳව වාචික පුහුණුව "සංවාද ගුරුකුල" ක්‍රමයකින් ලබාදෙන, තම පණ්ඩිතයන් හුවා දැක්වීමට හා තියුණු කර ගැනීමට ඇදුරන්ටද සිසුවන්ටද එය කදිම තොතැන්නක් විය. නාලන්දාවේ විෂය කටයුතු අවසන් වූ විට "ශ්‍රී නාලන්දා භික්ෂු ආර්යය සංගමය" නම් වූ නිල මුද්‍රාව යටතේ සහතික කරන ලදී. රාජ්‍ය සේවය සඳහා එය විශිෂ්ඨ සුදුසුකමක් විය. තම උගැන්ම අවසන් කළ බොහෝ උගත්තු සේවය සඳහා රජු ඉදිරියේ පෙනී සිටියහ.

ක්‍රි:ව: 9 වන සියවස වන විට බුදු සමය ඉන්දියාවේ එතෙක් දැරූ ආධිපත්‍ය අවසන් වෙමින් පැවතිණ. සරසවියද එයට අනුරූපව පිරිහෙමින් පැවතින. 12 වන සියවසේ විහාර යටපත් කළ අරාබි ආක්‍රමණික මහමත් භක්ත්‍යාර් විසින් නාලන්දාව වැනි සමහර අධ්‍යාපනය පීඨ විනාශ කරනු ලැබීය. සමහර අධ්‍යාපන පීඨ ස්වභාවය

වෙනස් වෙමින් තන්ත්‍රයානය හා වෙනත් දර්ශනයන් පිළිබඳ මධ්‍යස්ථානයන් විය.

## ● වික්‍රම ශිලා

නාලන්දාව මෙන්ම වික්‍රමශීලාව ද මහායාන බුදුදහම පිළිබඳව ද වෙසෙසින්ම බෞද්ධ තන්ත්‍ර පිළිබඳ වද ඉමහත් ප්‍රසිද්ධියක් ඉසිලූ අධ්‍යාපනික ආයතනයක් විය. මේ එකිනෙක විද්‍යාල භාරව ද්වාර පණ්ඩිතයෝ විසූහ. එක් එක් විද්‍යාලයක මහාචාර්යයවරු 108 ක් බැගින් සිටි බව කියැවේ.

නාලන්දාවට වඩා වික්‍රමශිලාව කුඩා වුවද ජාත්‍යන්තර යශෝකීර්තියෙන් එයට දෙවැනි නොවීය. මෙම විද්‍යාපීඨය ද 12 වන සියවසේදී පරසතුරු උවදුරුවලට හසුවීය.

## ● තක්ෂිලාව

තක්ෂිලාවද, නාලන්දාව හා වික්‍රමශිලාව මෙන්ම සැලකිය යුතු ප්‍රමුඛස්ථානයක් දරූ අධ්‍යාපන මධ්‍යස්ථානයක් විය. මෙය වඩාත් ප්‍රසිද්ධ වූයේ වෛද්‍ය ශාස්ත්‍රය උදෙසාය. බිම්බිසාර රජු දවස විසූ 'ජීවක' තක්ෂිලාවේ සත් වසක් අධ්‍යාපනය ලැබුවෙකි. මහා ව්‍යාකරණ කරුවෙක් වූ පාණියන්ද, භාරතයේ මැකියාවෙලි වූ අර්ථශාස්ත්‍රඥ කෞටිල්‍යද තක්ෂිලාවෙහි ප්‍රසිද්ධ පඬිවරුන් ය.

පොදුවේ ඉන්දියාවේ උසස් අධ්‍යාපන ආයතන වල ලක්ෂණයක් වූයේ ඉහළ අධ්‍යාපනයත් විදුහලේ මට්ටමේ අධ්‍යාපනයත් එකම රටාවකට එනම් සරසවියකට අනුබද්ධව ම ප්‍රාථමික අධ්‍යාපනයන් ද ලබාදීම ය. අනෙක් අතින් මෙකී ආයතන ජනයාගෙන් ඉහළ වැජඹුන ස්වාධිනත්වයෙන් නොව බුද්ධිමය විවේකය සඳහා වූ ස්වාධීනත්වයක් ද සාමුහික සංඝ අභ්‍යන්තරික ස්වයංපාලනයක් ද පවත්වාගනු ලැබීය. අධ්‍යාපන පූර්ණ නිදහස් එකක් විය. එනම් එය නොමිලයේ ලැබුණක් පමණක් නොව බුද්ධිමය සංවාදයට පරිසරය සැකසූ අධ්‍යාපනයක් විය.

මෙකී උසස් අධ්‍යාපන ආයතන බොහෝමයක කාර්යභාර්යවූයේ සංඝයාගේ අවශ්‍යතා සඳහා මූලිකව කටයුතු කෙරුමය. බුද්ධ ධර්මය සුරැකීම් හා පැතිරවීම වැනි කරුණු වලදී වඩාත් සංවිධිත බවක් අවශය නිසා ගැඹුරු පර්යේෂණ ආදී කටයුතු මේ අධ්‍යාපන පීඨ ඇසුරේ පවත්වා ගනු ලැබීය. ත්‍රිපිටකයට අයත් බුදුදහම වර්ග කෙරුම හා කොටස්කෙරුම ධර්මයේ වූ දුෂ්කර කරුණු පැහැදිලි කෙරුමට විවරණ සාහිත්‍යයන් හා අට්ඨකථා (අටුවා) නිපදවීමට අවශ්‍ය විශ්ලේෂණ හා සංස්ලේෂණ දනුමද විවේචනාත්මක තාර්කික බුද්ධියද මේ උසස් අධ්‍යාපන පීඨ ඇසුරෙන්

උකහා ගන්නා ලදී. මහායාන බුදුදහම වැඩිවීමත් සමග සසුනේ පුළුල්භාවය නිසා ලෞකික අධ්‍යාපන ක්‍රමයක් ද එක් වූ අතර තාර්කික බුද්ධියෙන් පණකැවුණු නිසා එකී විෂයයන් (වෛද්‍ය, ජ්‍යොතිෂ, අර්ථ ශාස්ත්‍රය, යුද්ධ ශිල්පය, තර්ක ශාස්ත්‍රය..... ආදී ) වඩා ප්‍රවීණ මට්ටමකට ගෙන එනු ලැබීය. එහෙත් බොහෝ දෙනකු අසන ගැටලුව නම් බටහිර මෙන් මෙකී විද්‍යාවන් වරක් ප්‍රකාශ කළේ බමුණු කුල ක්‍රමය එයට හරස් කැපූ බවය. එහෙත් ලෞකික තරඟය සීමාකරන දහමක් මූලික වූ නිසා මේ විද්‍යාවන් පරිසරය ආක්‍රමණය කළ විද්‍යාවන් නොවූ බව පුළුල්ව සිතිය හැකිය. ඒවා පරිසරය සමග සහජීවනයට ගිය තෘෂ්ණාව මැවූ විද්‍යාවන් විය. කෙසේ වෙතත් ආක්‍රමන හා වෙනත් දර්ශනයන් (හින්දු) නිසා බුදුදහම භාරතය තුළ ඉසිලූ ආධිපත්‍ය අතුර ගියද එය විසින් උරුම කරන ලද දර්ශනය අද දක්වා භාරතයේ ආත්මගතව පවතී.

"සංඝ පරපුරේ හෙවත් බෞද්ධ භික්ෂු සාසනයේ ඉතිහාසයත් බෞද්ධ අධ්‍යාපනයත් සමගාමීවෙයි. වේද ගුරුකොට ගත් බ්‍රහමණ සංස්කෘතිය යාගහෝමාදිය කේන්ද්‍ර කොට පැවතින. ආගමික මෙන්ම අනාගාමික අධ්‍යාපනය ද භික්ෂූන් අතින්ම සිදුවිය. එයට බාහිර අධ්‍යාපනයක් බෞද්ධ ලෝකයේ නැත. ඉගෙනීමේ තනි අයිතියත් එය ලබා ගැනීමේ විවේක බුද්ධියත් බුදුදහම මගින් මඩින ලද ඔවුන්ට තිබිණ.

[ R.K. MOOKERJEE - ANCIENT INDIAN EDUCATION - Brahamimst & Buddhist

## 3. ලාංකික අධ්‍යාපනය

### ● බුදු දහම පැමිණීමට පෙර

විජය කුමරුන්ගේ ලංකාවතරණය (ක්‍රි:පූ: 543-483) සිදු වීමට පෙර කුමණ ආකාරයකට ඇදහිලි හා සංස්කෘතියක් මෙරට පැවතියේ දැයි විවාධ සහගත පැටලිලි ස්වභාවයක් ගනී. එහෙත් වෛදික සමයට සමගාමී වූ පරිසරය සමග රළු ලෙස එක්ව විසූ ජනකොටසක් ලංකාවේ ද වසන්නට එක්ව විසූ ජනකොටසක් ලංකාවේ ද වසන්නට ඇතැයි ද සිතිය හැකිය.

විජයගේ පැමිණීමෙන් පසු ස්වදේශිකයන් යුදමය වශයෙන් පරාජය වී භාරතීය ආර්ථිකය - සංස්කෘතික මූලයන් ක්‍රමයෙන් කිඳා බසින්නට විය. විජයගේ ආධිපත්‍යය ස්ථායි වීමත් සමග ම ස්වදේශක

සංස්කෘතියට එරෙහිව හෝ අනුගත වෙමින් ප්‍රධාන ප්‍රවාහයක් ලෙස බ්‍රාහ්මණ ඇදහිලි ක්‍රම භාරතයට සමරුව ක්‍රියාත්මක විය. විජය සමග පැමිණිවූන් අතර බ්‍රාහ්මණයෝද වූහ. රජුට එරෙහි කම් කළ 'උපතිස්ස' ඉන් කෙනෙකි. ඔහු වෙතින් මූලිකවම බමුණු දහම මුල් බැස ගන්නට ඇත්තේය.

බමුණු ආධිපතය රාජ්‍යය ක්ෂේත්‍රයේ ලා ඉන්පසු ප්‍රධාන විය. පණ්ඩුකාභය කුමරු ශිල්ප සතර හැදෑරුවේ පණ්ඩුල නම් බමුණා යටතේය. පසුකලේක පණ්ඩුකාභය රජුට පුරෝහිත වූයේ පණ්ඩුලගේ පුත්‍රයාය. රජු 'ජෝතිය' හා 'කුම්භාණ්ඩ' නම් නිගන්ඨයන්ට වාසස්ථාන ඉදිකොට පූජාකළ බැවු කියැවේ.හින්දු දොවොල් කිහිපයක්ද ඉදි කළේය. තවද රජු චිත්තරාජ නම් යක්ෂයා උදෙසා විමානයක් කර විය. චිත්තරාජ නම් ජලාශිත යක්ෂයා ඇදහීම එකල භාරතීය සමාජයේ ද වූවකි. රජු වෛශ්‍රමණ ගේ විමානයක් සඳහා නුග ගසක් ද, ව්‍යාධදේවගේ විමානය සඳහා තල් ගසක්ද වෙන් කළේය. මෙයින් පෙනෙන්නේ වෘක්ෂ දේවතාවන් පිදීමද පැවති බවය. තැනින් තැන යන විතණ්ඩවාදී පිරිසක් වූ පරිබ්‍රාජකයන් සඳහා එක් ආරාමයක්ද , ආජීවකයන් සඳහා තවෙකක්ද ලෙස රජු ආරාම දෙකක් කරවනු ලැබීය. බෞද්ධයන් ද සුළු වශයෙන් පවතින්නට ඇත. භද්ද කච්චායන කුමරිය සිඳුරුදරා මෙරට පැමිණීම එක් අදහසක් පමණි. කෙසේ වෙතත් ප්‍රධාන දහම බමුණු දහම වූ අතර රාජානුග්‍රහය යටතේ එය වැඩි යන්නට විය. වේදයෙහි නිපුන බමුණෝ පැරණි ගුරුවරු වූහ.

විජයගෙන් පසු ලාංකික ජනතාවට භාරතීය ජනතාවට භාරතීය සංස්කෘතික දොරටුවේ විවර වූ අතර භාරතයේ පැවති එකිනෙකට වෙනස් දර්ශනයක් හා අධ්‍යාපන ක්‍රම ලංකාවටද පැමිණි බවත් එයින් විශාල කැළඹීමක් වූ බවත් සැලකිය හැකිය.

මේ කඩා වැටුණු ප්‍රවාහය අමතරව ස්වදේශීයවම (යක්ෂ) වූ සංස්කෘතියක් පවතින්නට ඇත. එය පරිසරය සමග ගෙවුණු සියුම් පරිසර සමගම ගෙවුණු සියුම් වේදනයන්ගෙන් යුදමය පරාජයකට පත් වුවද සංස්කෘත්මය ලෙස තවදුරටත් තම අනන්‍යතාව වෙනුවෙන් සටන් වදින්නට ඇත. මෙලෙස මෙකී සංස්කෘතීන් දෙක අතර උනුන් ආකර්ෂණය කර ගැනීම සඳහා යම් පමණක තරගයක්ද පවතින්නට ඇත.

දේශීය වශයෙන් පැවතුණු විද්‍යාවන්ට අමතරව ජ්‍යොතිර් විද්‍යාව, නිමිති ශාස්ත්‍රය, වාස්තු විද්‍යාව ආදියේ ප්‍රවීණ වූ බමුණෝ රාජ අනුග්‍රහය යටතේ සෑම වැදගත් කාර්යයකම පුරෝගාමී විය.

## ● බුදු දහම පැමිණීම

සම්බුද්ධ පරිනිර්වානයෙන් වසර 298 කට පසු මිහිඳු මාහිමියන්ගේ පැමිණීම ලාංකික ඉතිහාසයේ වැදගත්ම පියසටහනක් වෙයි. එය ලාංකික සංස්කෘතිය හා අධ්‍යාපනය හැඩගැස්වීමට විශාල වෙනසක් ඇති කළේය. තමා ධර්ම විජය කළ රටවල් අතරින් එකක් නම් ලංකාව බව අශෝක රජුගේ දහතුන්වන ශිලා ලිපියෙහි සඳහන් වෙනත් මිහිඳු හිමි පිළිබඳ එහි සඳහනක් නැත.

මිහිඳු හිමියන් පැමිණෙන විට වැව් මුල් කරගත් කෘෂික ආර්ථිකමය මත දෙපයින් නැගී සිටි ජනතාවක් වීසූ අතර, ආර්ථිකමය වශයෙන් යම් පමණකට සංතෘප්තියට පැමිණි විවේකී ජනතාවක් විසීය. එහෙත් රජ දරුවන් ඇදහූ බ්‍රාමණ අධිපත්‍ය ද, එය නොරිස්සූ දේශීය සංස්කෘතියක් ද ලෙස සංස්කෘතික ගැටීමක් ඇතිවෙමින් පැවති බවද ඉහත දී ප්‍රකාශ කළෙමු. බමුණු දහම්වල දැඩිතාව හා ඒකාධිකාරය දේශීය කොටසක් නොඉවසූ බවත්, දේවානම් පියතිස්ස රජුට 'තිස්ස' යැයි මිහිඳු හිමියන් ආමන්ත්‍රණය කරන විට ඒ යක්ෂ ගෝත්‍රිකයකු ය යි රජු වරදවා වටහා ගැනීමෙන් රජුගේ ආධිපත්‍ය පවා දේශීය ජනකොටස් නොවිසූ බව පෙනේ.

බුදුසමය ලංකාව තුළ මුල්බැස ගන්නට ඉතා වැදගත්ම හේතුවක් වූයේ එයට රාජ්‍යා අනුග්‍රහය ලැබීමය. රජු තමාම බුදු සරණ යාමත් අරිට්ඨ මහා ඇමති පවා පැවිදි වීමත් ථූපාරාමයේ මහා සංගායනාවක් කර විනය හා ධර්මය පිළිබඳ ප්‍රවීණත්වයක් නවක භික්ෂූන්ට ලබාදීමත් ආදිය නිසා බුදුසමය පැතිරෙන්නට විය.

බුදු සමය මුල් බැසගන්නට ඉතා වැදගත් හේතුව වූයේ එහා දර්ශනය යි. බමුණන්, නිඝණ්ඨයන් හා වෙනත් භාරතීය ප්‍රවාහනයට සෘජුව අභියෝග කෙරුමත්, දහමේ වූ නොඇලුණු බවත්, මැදුම් පිළිවෙත්, පරිසරය සමග එක්ව විසීමත්, නිදහස් ගුණයත් ආදිය නිසා මෙතෙක් බ්‍රහ්මණ ආධිපත්‍යට අනුගත නොවුණු දේශීය (යක්ෂ) ජනයා පවා බුදුදහම වෙතට නම්‍යකරණය විය. මෙය ඉතා වැදගත් සිද්ධියක් වූ අතර එතෙක් අස්ථාවරත්වයට හේතුවූ විදේශික - ස්වදේශික ගැටුම් 'සහජීවනය' තුළ අවසන් නව ජාතියක නැවුම් සංස්කෘතික හි අධ්‍යාපනික පදනම දමනු ලැබීය. භාෂාව, කලාශිල්ප, දර්ශනය, ආර්ථිකය ආදිය එක්ව නව ජාතියක් පන්සලක් - වැවක් මුල් කරගෙන බිහිවන්නට විය. භාරතීය මුල් සිඳී ලාංකික මූලයන් එහි ආත්මය විය.

ජනතාව බ්‍රහ්මණ දහම් වලින් මෙපිටව ආකර්ශනය කරගැනීම සඳහා බුදුදහමට තරග වදින්නට විය. එහෙයින් බෞද්ධ අධ්‍යාපනය අත්‍යවශ්‍ය විය. අධ්‍යාපන ක්‍රමය සඳහා පිරිවෙන් පිහිටු වන්නට විය.

මෙකී පිරිවෙන් පොදුවේ මැනවින් සිතා බලා සංවිධිත ස්වරූපයෙන් පිහිටුවනු ලැබීය. සසුනට එළැඹි නවක හිමිවරුන්ට ස්වකීය ආචාර්ය

වරු යටතේ අධ්‍යාපනය ලබාදීම එහි පළමු අර්ථය විය. එහෙත් කල්යත්ම සසුනේ පැතිරීම සමග එය ගිහියන්ට විවෘත විය. එසේම බෞද්ධ දර්ශනයට අමතරව වෙනත් ලෞකික අධ්‍යාපන රටාවන් ද බිහිවිය.

නිදහස් මානසික රටාවකට ඉතාම යෝග්‍යයැ යි හැඟුන මනා පරිසරයකින් යුතු තන්හි මෙකී අධ්‍යාපන විහාර කරවන ලදී. සාමාන්‍ය භාෂාව, කලාව ආදී අධ්‍යාපනය ගම්වලම පන්සල් ආශිතව සිදුවුවද මෙකී අධ්‍යාපන විහාර කරවන ලද්දේ ඉන් එපිටට විහිදුනු උසස් අධ්‍යාපනයක් සඳහා ය. එසේ හෙයින් එය මනා සැලැස්මකින් යුතුව විවේකී බුද්ධියට උචිත ලෙස සකස් කෙරුම අනිවාර්ය විය. පිරිවෙන්වලට සෘජු ලෙස භාණ්ඩාගාරයේ ආධාර මෙන්ම රජු විසින් ගම්වර ද ලබාදෙන ලදී. විශාල සේවක සංඛ්‍යාවක් සංඝයාගේ සහයට සිටින ලදී. ඒ කුඹල්කරුවන්, මුරකරුවන් ඖෂධ තනන්නන්, වෛද්‍ය වරුන්, අරක්කැමියන්, ගැල්කරුවන්, මිදුල අමදින ස්ත්‍රීන් ආදී ලෙසය. කෙසේ වුව හැකි බොහෝ කටයුතු සහ විනයට යටත්ව සංඝයා විසින් ම ස්වයංව ඉටුකරන ලදී. ක්‍රමිකව ඇතිවූ භාෂාවේ දියුණුයත් සමග රටපුරා පොත් ගුල් ඉදිවන්නට විය. (මහපැරකුම්බාවන් පිහිටවූ පොත්ගුල් ගණන 128 කි) මිහින්තලා සෙල් ලිපියට අනුව භික්ෂූන් පිළිබඳ අතපත්, සේවකයන් සතු කාර්යය හා වේතනද, අය - වැය ලේඛන තැනීමේ, වරදකරුවන්ට දඬුවම් ආදී ලෙස මනාව සංවිධාන රටාවක් අධ්‍යාපනික වෙහෙර විහාර වල පැවති බව හෙළිවේ.

පිරිවෙන්හි උගන්වන ලද විෂය මාලාව නිශ්චිත නැතත් සූසැට කලාද, අෂ්ඨදශ ශිල්පයද ඉගැන්වූ බව සඳහන්වේ.

**සූසැට කලාවෝ නම්**

1. අක්ෂර
2 ලිඛිත
3 ගණිත
4 ගාන්ධර්ව
5 තර්ක
6 ව්‍යාකරණ
7 ඡන්දස්
8 නිඝන්ඩු
9 අලංකාර
10 ශාලිහොත්‍ර
11 මන්ත්‍ර
12 තන්ත්‍ර
13 යන්ත්‍ර
14 ආත්මදය
15 ජ්‍යෝතිර් ඥාන
16 ඉතිහාසය
17 පුරාණ
18 අග්නිස්ථම්භ
19 ජලස්ථම්භ
20 කොවුමාර
21 කූප ශාස්ත්‍ර
22 කාම ශාත්‍ර
23 ශාස්ත්‍ර වින්‍යාස
24 ශාස්ත්‍ර කර්මය
25 අශ්ව රෝහන
26 ගජ රෝහන
27 සූප ශාත්‍රය
28 අංකුශවාරන
29 වාරනය
30 මොහන
31 ස්ථම්භ
32 උච්ඡාඨන
33 ත්‍රෝටන
34 දූරගමන
35 දූර දර්ශනය
36 හෙරී
37 පත්‍ර වේදනය
38 චිත්‍ර කර්මය
39 මලාබන්ධ
40 ගන්ධ යුක්ති
41 දූන
42 හරහ
43 ස්ත්‍රී ලක්ෂණ
44 පුරුෂ ලක්ෂණ
45 නපුංසක ලක්ෂණ
46 පරහිත ඥාණ
47 කනක පරීක්ෂා
48 මේනක පරීක්ෂා

| | | | | | |
|---|---|---|---|---|---|
| 49 | චතුර්වාද | 55 | ශිෂ්‍ය කර්මය | 61 | අදූර්ශ කරන |
| 50 | ධාතුවාද | 56 | කාෂ්ඨ කර්මය | 62 | පරකාය ප්‍රවේශන |
| 51 | බිලවාද | 57 | හේම කර්මය | 63 | වෙනු විණා වාදය |
| 52 | කන්‍යාවාද | 58 | රත්න පරීක්ෂා | 64 | විෂ හරණය |
| 53 | ආකර්ෂණ | 59 | කන්ධරන | | |
| 54 | ආකාශ ගමන | 60 | ශ්‍රැයණා | | |

අෂ්ඨදශ ශිල්ප

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | ශ්‍රැති | 07. | ශික්ෂා | 13. | සමුද්‍රිකා |
| 02. | වේද | 08. | මෝක්ෂ ඥාණ | 14. | පැරකුම් |
| 03. | ව්‍යාකරණ | 09. | සිරිත | 15. | නිසන්ඩු |
| 04. | ඡන්දෝ ලක්ෂණ | 10. | ධනු ශිල්ප | 16. | නීති |
| 05. | ශබ්දාර්ත | 11. | හස්ති ශිල්ප | 17. | තර්ක |
| 06. | නක්ෂත්‍ර | 12. | කාම තන්ත්‍ර | 18. | වෛද්‍ය |

යක්ෂ එලය, අංජනම් එළිය, නිමිති, ජ්‍යෝතිෂ ආදිය ගර්භිත විද්‍යා ලෙස හංවඩු ගසන ලදී. තල්පත් වල පන්හිඳෙන් ලිවීමද, කටපාඩම ද මූලික විය. භික්ෂූන් තම සීමාවෙන් ඔබ්බට වූ ලෞකික අධ්‍යාපනය ලැබීමට නීති පනවන ලදී. උගත්කම පිරිමින්ට පමණක් (ගුරුළු ගෝමී, විද්‍යාචක්‍රවර්තී, පස්වන කාශ්‍යප, දෙවැනි පැරකුම්) නොව කාන්තාවන්ටද (විහාරමාහාදේවී, අනුලා, සුගලා, මැනික්සාමි) එකලෙස විය.

## ලාංකික ජාතික විද්‍යා පීඨ

### ● මහා විහාරය

අනුරාධපුර පැරණි නගරයට දකුණින් වූ දේවානම් පියතිස්ස රජු විසින් පූජා කරන ලද උද්‍යානයක මහා විහාරය පිහිටියේය. මේ උද්‍යානයේ භික්ෂූන් වහන්සේලා ගේ වාසය පිණිස කරවූ කුඩා කුටිද ගෘහ නිර්මාණය අතින් විශිෂ්ඨ වූ සිව්සල් ගොඩනැගිලි කිහිපයක්ද ධාතූන් නිදන් කරනු ලැබූ ස්ථූපයක්ද විය. මහා විහාරය විද්‍යා පීඨයක් ලෙස ප්‍රචලිත වූවද එනමින් හැඳින් වූයේ අනුරාධපුරයේ බිහිවූ ප්‍රථම සංවිධිත භික්ෂු සංවිධානය ය.

මහා විහාරයේ ප්‍රධාන කර්තව්‍යය වූයේ උසස් අධ්‍යාපනයේ අවශ්‍යතාව ඉටුකරලීමය. එනම් සාමනේරුවරුන්ට හා ගිහියන්ට උසස් අධ්‍යාපනය ලබාදීමය. මේ සඳහා ඉතා ඉක්මනින් ම දේශීය අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස දියුණු විය.

මහා විහාරයේ ප්‍රථම කාර්යයක් වූයේ පාලි ත්‍රිපිටක ග්‍රන්ථ සිංහලට නැගීමය. මෙය සෑම කෙනෙකුම තමන්ගේ බසින් ධර්මය උගත යුතු යයි බුදුන් දෙසූ වදනට අනුකූල විය. මුල් පාඨ ග්‍රන්ථ පරිශීලනය සඳහා පාලිය භාවිතා කළ මුත් සිංහලය ප්‍රධාන භාෂාව විය. මෙලෙස 'සිංහල' භාෂාවක් ලෙස නැගී සිටිමින් තම දර්ශනයද එයින්ම වටහා ගැනීම නිසා ජාතියක ප්‍රථම පැවැත්ම ස්ථිර විය. එතෙක් මුඛ පරම්පරාවෙන් පැවති ත්‍රිපිටක දහම් ග්‍රන්ථාරූඪ කෙරුම (ක්‍රි.ව. 5 වන සියවස අළුවිහාරය) මහා විහාරික භික්ෂූන් වහන්සේලා අතින් සිදුවූ විශිෂ්ඨ කටයුත්තකි. එය බුදු දහමේ පමණක් නොව අධ්‍යාපනයේ ස්ථිර බවක් ඇතිකරවීමක් විය.

විවිධ දෘෂ්ටීන් වෙතින් ඉතිහාසයක් පිළියෙළ කිරීම අතිශය දුෂ්කර ය. එහෙත් මහා විහාරය හා එහි භික්ෂූන් වහන්සේලා සතුව තිබූ ඓතිහාසික දැනුම උපයෝගී කරගනිමින් මහානාම හිමියන් පාලි භාෂාවෙන් 'මහාවංසය' රචනා කරන ලදී. තම උරුමය හා ජාතික ආත්මය සොයා විවිධ අවස්ථාවන්හීදී මහාවංසයේ පිටුකරා ආපසුයාමේ අද දවසේ වුවද සිදුකරනු ලැබේ.

මහාවිහාරය ද දේශදේශාන්තරයේ ප්‍රසිද්ධියට පත් විය. එහි අධ්‍යාපන කටයුතු මෙරටට සීමා නොවිණි. දකුණු ඉන්දියාව, මලය අර්ධද්වීපය හා ඉන්දුනීසියාවට ධර්ම දූතයන් යවන ලදී. විවිධ විදේශ භාෂාවන්ද මහා විහාරයේ හදාරන ලදී. බුදු සසුනේ පැතීරීම පහසුවන පිණිස සිංහල අටුවා පොදු භාෂාවක් ලෙස පාලියට පරිවර්තනය කරන ලද්දේ එහෙයින් විය හැකිය. මෙලෙස වරක් ඉන්දියාවෙන් බුද්ධඝෝෂ හිමි (දෙමළ ජාතිකයෙකි) පැමිණි විට මහා විහාරිකයෝ එම හිමියන්ගේ පාණ්ඩිත්‍ය මහාවිහාරික පොදු අධ්‍යාපන රටාවට ගැලපෙනවා දැයි තීරණය කරනු පිණිස ස්වතන්ත්‍ර අටුවාවක් සපයන ලෙස ඉල්ලා සිටියෝය. උන් වහන්සේ සිය සහය පිණිස පැමිණි බුද්ධත්ත හා ධර්මපාල හිමිවරුන්ගේ සහයෙන් හෙළ අටුවා පාලියට හැරවීමේ කාර්යයට පෙර ලියන ලද ස්වතන්ත්‍ර 'විශුද්ධි මාර්ගය' ථෙරවාදී බුදුදහමේ සිළුමිණක් වැනි සම්මත සාර සංග්‍රහයක් වූයේය. එය ලංකාවේ ථෙරවාද බුදු දහමට මහත් පිටුවහලක් හා පදනමක් වූයේය.

"බුද්ධඝෝෂ හිමියන්ගේ ජයග්‍රහණය නම් ථෙරවාදය නිකම්ම ධර්ම සමූහයක සිට දර්ශන වාදයක් බවට විකාශනය කෙරුමය. ධර්ම න්‍යායන් කෙතරම් තීර ලෙසත් සම්පූර්ණ ලෙසත් උන් වහන්සේ ඉදිරිපත් කර ඇතුවාද යත් ථෙරවාදය ලෙස ගැනෙනුයේ උන් වහන්සේගේම චින්තන විධියත් අර්ථ නිරූපනයත්ය. එහෙත් එය උන් වහන්සේගේ ම ස්ව බලය පමණක් නොව මහාවිහාරිකයන්ගේ හා හෙළ අටුවා ඇසුරෙන් උපන් දහම් බරක් ලෙස ගැනීම වඩා උචිතය." 5. Buft - Buddihist Monks and Moísties of India. තවද බුද්ධඝෝෂ හිමියන් විසින්

රචිත සමන්ත ප්‍රසාදිකා, කංඛා විහරනී, සුමංගල විලාසනී, පංසද්ච සුදනී, සාර්ත්ථ පතාසනී, මනෝරථ පුරනී, පරමත්ථ පොතිකා ආදී ලෙස මහා අට්ඨ කතා රැසක්ම ඇත.

මහා විහාරය දේශදේශාන්තරයේ ජනප්‍රිය වූ බැව් බුද්ධඝෝෂ පාහියන් ආදී හිමිවරුන්ගේ පැමිණිලිවලින් තහවුරු වෙයි. එහි සැලැස්ම හා අධ්‍යාපන රටාව භාරතයේ නාලන්දාවට සමරූපී වෙයි.

මහා වංසයට බලවත් හානියක් වූයේ වෛතුල්‍යවාදයේ පැතිරීමත්ය. එය මහසෙන් රජුගේ දැඩි පීඩනයට ලක් වූ මහා විහාරික භික්ෂූන් වහන්සේලා රුහුණට හා මලය රටට පලාගොස් ධර්මයත් අධ්‍යාපනයත් ඉතා දුෂ්කර තත්ත්වයේ රැකගත්හ. පාහියන්ගේ සමයේදී මහාවිහාරයේ භික්ෂූන් වහන්සේලා 3000 ක් සිටි බැව් කියැවේ. පසුව මහසෙන් රජු නැවත මහා විහාරය ප්‍රතිසංස්කරණය කරවීය.

## ● අභයගිරිය

වළගම්භා රජුගේ සමයේ මහාවිහාරයෙන් බිඳීගිය භික්ෂූන් වහන්සේලා පිරිසක් රජු විසින් තැනවූ අභයගිරිය වඩා නිදහස් මතධාරී දර්ශනිකයන්ට තොතැන්නක් විය. එය විවිධ බෞද්ධ නිකායන් සමගද ඉන්දියාවේ වෙනත් දර්ශනවාදයන් සමගම සබඳකම් ඇතිකර ගත්තේය. එය සංස්කෘත බසින් පළ කරන ලද මහායාන ග්‍රන්ථය අධ්‍යන කළ අතර, හීනයාන (ථෙරවාද) දහමට අමතරව මූලික විද්‍යාවන් පහක් පිළිබඳ අධ්‍යාපනය ද, ලෞකික අනාගමික දැණුම පිළිබඳ අලුත් ක්ෂේත්‍රයක් ද හඳුන්වා දුන්නේය. බුද්ධඝෝෂ හිමියන්ගේ ශාස්ත්‍රීය ක්‍රියාවන්ගේ මෙන්ම අභයගිරියේ ශාස්ත්‍රෝදය නිසා ද ලාංකීය අධ්‍යාපනයට විශාල මෙහෙයක් ඉටුවිය. අභයගිරියේ 5000 ක් පමණ ශිෂ්‍යයෝ විසූහ.

මහායාන ධර්මය සෑම මිනිසකුම උගත යුතු විෂයන් පහක් දක්වාලයි. මහායනිකයා වාද විවාදවලදී වෙනත් ආගමික දර්ශනවාදීන් නිරුත්තර කෙරුම සඳහා ව්‍යාකරණ හා තර්ක ශාස්ත්‍රද උගත යුතුය. පරාර්ථචර්යාව සඳහා වෛද්‍ය විද්‍යාව හා වෙනත් ලෞකික ශිල්ප ශාස්ත්‍ර උගත යුතුය. අවසානයේ තම යහපත උදෙසා සියල්ල නික්මවන සේ දර්ශනය උගත යුතුය. අභයගිරි වාසී භික්ෂූන් ගේ ශික්ෂණය මේ අනුව සැකසුණු අතර එය යම් ප්‍රායොගික බාධාවකින් හා නැවුම් බවකින් යුතුව ජනතාව අතරට බුදුදහම කාවැද්දීමක් විය. මෙය මහායාන ආගමේද විශිෂ්ඨ ලක්ෂණයකි. සමාජවාදය කරා අධිරාජ්‍යවාදීන් සමග අධිෂ්ඨාන පූර්වක ලෙස මහායාන බුදුදහමෙන් පොෂණය වූ රටවල්ය.



dharmikawaka.lk

අභයගිරිය හා මහා විහාරය අතර මහායාන - හීනයාන දහම් උදෙසාත් වෙනත් කරුණු උදෙසාත් විශාල ප්‍රතිරෝධතා පැවතුණු අතර එය එක් පසකින් තරගය තුළින් දහමේ අලුත් නිම්නයන් සොයා යෑමක් සලකුණු කළද අනෙක් පසින් සංඝ බේදය තුළින් සංඝ සමාජයේ උත්තර ව්‍යූහය කැලැල් කළේය. බුද්ධඝෝෂ හිමි ගේ විසුද්ධි මග මෙන් ම එයට සමගාමී වෙමින් අභයගිරි වාසී උපතිස්ස තෙරුන් ගේ විමුක්ති මාර්ගය ද විශාල න්‍යායික උද්‍යෝගයක් දල්වාලීය.

අභයගිරිය, මහාවිහාරය ආදී උසස් අධ්‍යාපන ආයතනවල මූලික සැකසුම භාරතයේ නාලන්දාවේ මෙන් පුද්ගලික බැඳීම් වෙනුවට සාමූහිකත්වයත්, පෞද්ගලිකත්වයත් රැකගත් ස්වාධීනත්වයත්, විවේක බුද්ධිය හා නිදහස් අධ්‍යාපනයත්, පාගනයත් ආත්මගත කරගත්තක් විය.

## ● විද්‍යාව හා කාර්මික ශිල්පය හා කලාව පැතිරීම

විජය පැමිණීමට පෙර විසූ ගෝත්‍රිකයන්ට ද තමාගේ වූ තාක්ෂණයක් පැවති බවට සැකයක් නැත. එය ඔවුන්ගේ දර්ශනය හා සංස්කෘතිය සමගද එහෙයින් අධ්‍යාපනය සමගද බැඳී තිබෙන්නට ඇත. නගරවල විසූ යක්ෂ ගෝත්‍රිකයන් ඔවුන්ගේ නගර නිර්මාණ, ගෘහ නිර්මාණ හා වෙනත් කාර්මික ඥානයන්ගේ යුතුව ආර්ය ජනතාව හා මිශ්‍රවන්නට ඇත. ඔවුන්ගේ කෘෂි හා වෙනත් කර්මාන්ත වලට අදාළව විශාල දැනුමක් ආර්යයන්ද උකහා ගන්නට ඇත. යක්ෂයන්ට අමතර විසූ නාග ගෝත්‍රය සිහිකෙරුම සඳහා වාරිකර්මාන්ත වලදී නාග ලකුණු යොදා ගැනීම මෙය සිහිපත් කරවයි. බුදුදහම පැමිණෙන තෙක් අඩුම වශයෙන් පැරණි හෙළයන්

(අ) නගර සැලසුම් කිරීම
(ආ) ගොඩනැගිලි තැනීම
(ඇ) වාරිමාර්ග තැනීම
(ඈ) තඹ, ලෝකඩ භාවිතය
(ඉ) ලෝකඩ සෑදීම පිළිබඳ ඉටි මැටි අච්චු නම් ශිල්ප ක්‍රමය
(ඊ) පබළු හා වීදුරු සෑදීම

දැන සිටින්නට ඇත. රන් රිදී ආභරණ තැනීමද අපූර්ව කලාවක් විය. තමන්ගේ කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සෑදීම පමණක් නොව ගොඩනැගිලි සවිමත් කෙරුම සඳහා යකඩ භාවිතයද ඔවුහු දැන සිටියහ. රෝග නිධාන සේවීම පමණක් නොව ශල්‍ය කර්ම කෙරුමට ද ඔවුන් සමත් ව සිටි බව සත්‍යයකි.

ආදී ආර්යයන් බ්‍රහ්මණ සම්ප්‍රදායන් ද ගෙනවිත් ඇත. ලංකාවේ බ්‍රහ්මණයෝ වේදමන්ත්‍ර ඉගැන් වූහ. කල්ප වේදායේ කොටසක් වන සුල්ව සූත්‍රයේ ගණිතය විශේෂයෙන්ම ජ්‍යාමිතිය විස්තර වේ. නක්ෂත්‍රයද වෛදික විෂයට අදාළව විෂයකි. විද්‍යාවද ස්වර සංඛ්‍යාත ගැන ද ඔවුන්ට ඉතා හොඳ අවබෝධයක් විය. මෙසේ වූ

ආර්යයන්ගේ තාක්ෂණය සමග පැරණි ගෝත්‍රික තාක්ෂණය මිශ්‍ර වූ අතර උනුන් අතර යැපෙමින් නව තාක්ෂණයක් බිහිවන්නට පදනම වැටී තිබිණි. එහෙත් මෙය බුදුසමය පැමිණෙන තෙක් නිසි ලෙස සිදු නොවීය. එයට හේතුව වූයේ ගෝත්‍රිකයන් හා බමුණන් අතර තිබූ ප්‍රතිවිරෝධයයි. එහෙත් මේ යුගය පණ්ඩුකාභය රජ දවස නගරයක්ද ජල සම්පාදනය සඳහා ජලාශයක් ද ඉදි කෙරිණ. එහෙයින් මෙවන් ඉදිකිරීම් කටයුතු සඳහා තාක්ෂණයේ අධ්‍යාපනය බ්‍රාහ්මණයන් විසින් අරඹන්නට විය.

අභිනවයෙන් ජනාවාස ඇතිවීමත් යම් පමණකට නාගරීකරණය වීමත් සැහැල්ලු අවශ්‍යතා සංකීර්ණ වීමත් තාක්ෂණය ඉල්ලා සිටීමක් විය. එහෙත් ගෝත්‍රිකයන් හා ආර්යයන් අතර පැවති විසංවාද බුදු සමය ඇති වීමත් සමගම නැතිවී ගිය අතර ජාතික සංස්කෘතිය මැදුම් පිළිවෙත මත ගොඩනැගින. මේ වන විට මෞර්ය අධිරාජ්‍ය යටතේ ඉන්දියාවේ කාර්මික ඥානයද ඉහළ අඩියක පැවතුණේය. කෞටිල්‍ය (චානක්‍ය) ගේ අර්ථ ශාස්ත්‍රය නම් කෘතියේ යපස්, මැණික් ආකර කර්මාන්තය, ලෝහ විද්‍යාව, වෙළෙඳ මාර්ග, නැව් ගමනාගමනය, වාරිමාර්ග, ඇතුන්, අසුන් හා ගවයන් පිළිබඳ විශාල විස්තර ඇතුළත් ව තිබිණ. එහෙයින් ඒවා සූසැට තුළින් වෛද්‍ය, කෘෂි ඉන්ජිනේරු හා කලා ශිල්ප පිළිබඳ ප්‍රවීණයන් බිහිවන්නට ඇතැයි ද සිතිය හැකිය.

අද සිංහලයන් ගේ කළා කර්මාන්තය ඉති විශිෂ්ඨ මට්ටමක පැවතියේය. ගල් පලා ගැනීම සඳහා රත්කිරීමට හා සිසිල් කිරමේ තාක්ෂණික ආනුභාවික සූත්‍ර සවා යොදා තිබේ. වරාහමිහිරගේ වෘහත්සංහිතාවේ එවැනි සූත්‍ර ගණනාවක් ඇත. තවද ගල් කඩා ඔප මට්ටම් කෙරුම පිණිස වානේ උපකරණ භාවිතයත්, යපස් මගින් වානේ තැනීමත් ඔවුන් දන සිටියෝය. එසේම මහා ගල් කුට්ටි ප්‍රවාහනය හා විවිධ උපක්‍රම වලින් ඒවා චලනය කෙරුම පිළිබඳව ඔවුන්ට දැණුමක් විය. වානේ වඩාත් ශක්තිමත් කර ගැනීම සඳහා ද විවිධ සූත්‍ර වරාමිහිරගේ කෘතියෙහි එයි. ලීවරය හා රෝදයේ තාක්ෂණය ද ඔවුන් දන සිටි අතර සෘජු මුල්ලවල් ඇති කෙරුම සඳහා පයිතගරස්ගේ ප්‍රමේයේ විලෝමය භාවිතා කළහ.

දාගැබ් කර්මාන්තයද බුදුදහම හා බැඳී එය සමග නැගී සිටි තාක්ෂණික විෂයකි. දාගැබ් ගොඩගැනීම සඳහා උසස් ඉන්ජිනේරු ඥානයක් හා දක්ෂතාවයක් ද්‍රව්‍යයන්ගේ ශක්තිය උද්ධාරය හා ආතතිය පිළිබඳ පැහැදිලි දැණුමක් ද අවශ්‍ය විය. දාගැබ් වල කවාකාර අත්තිවාරම සළකුණු කෙරුම සඳහා පරිදිය ලකුණු කිරීමේ සරල ක්‍රම භාවිතා කරන ලද අතර, එහි ගෝලාකාර හැඩය නිවැරදිව කුමන අයුරකින් සකසා ඇද්දැයි කිව නොහැකිය. ඝන ජාමිතිය ගැන පිරිපුන් දැණුමක් තොරව ගඩොල් තට්ටු එකිනෙකකින් එකිනෙකොට වෙනස් ලෙස බර



chandikawankaa.lk

දැරිය හැකි අයුරින් සකසා තිබේ. මෙපමණ ගඩොල් සඳහා පෝරණු ද පවතින්නට ඇත. ගඩොල් පිළිස්සීමත් ශක්තිමත් බදාම තැනීමත් ගැන මහාවංසයේ සඳහන් වේ. සිමෙන්ති සාදාගන්නා ක්‍රම තුණක් වරාමිහිරගේ කෘතියේ දැක්වේ. දාගැබ් කොත් කැරැල්ල පිහිටීමද අභියෝගයකි. ක්‍රි.ව 14 වන සියවසට අයත් අභයගිරි හා ජේතවනයේ අර්ධ ගෝලාකාර කොටස දිරාපත්ව ඇතත් කොතිකැරළි පෘතුවියට ලම්බකව තිබීමත් සිංහල තාක්ෂණයේ මහිම කියා පාන්නකි.

සුවිසල් මාලිගා තැනීමට තරම් පැරණි හෙළ ගොඩනැගිලි ශිල්පය දියුණුව පැවතියේය. ලොවා මහා ප්‍රාසාදයේ මහල් නවයක් විය. එය තඹ තහඩු සෙවිල්ලන ලද්දකි. එය ඉතා ක්‍රමවත්ව සිතා බලයන් නිසි අයුරින් විභේදනය කොට ඊට සරිලන මට්ටමේ වූ කුලුණු මත ගොඩනැගුවකි. එහිදී ගඩොල්වලට අමතරව ශක්තියක් සැපයීමේ ගල් කණු මැදට යැවීම මගින් ඉටුකර තිබේ. සීගිරි පර්වතයද මෙවැනි ඉදිකිරීමේ ඉංජිනේරු ශිල්පයේ හාස්කමකි.

වාරිකර්මාන්තයෙහිලා හෙළ දරුවන් පෑ හසල භාවය සුළුපටු නොවේ. නියං කාලවලදී වතුර එක්රැස් කරගැනීම පිණිස වැව් තැනීම සුළුපටු කාර්යයක් නොවේ. වැව් තැනීම හා එයින් ප්‍රයෝජන ලැබීමට වැව් නිසා පරිසරටෙ සිදුවන වෙනස්කම් සැලකිල්ලට ගැනීම අනිවාර්යයෙන් කළ යුතුය. තවද ද්‍රව පීඩනයන් පිළිබඳව නිවැරදි තක්සේරුවකින් තොරව ඇළ - ගංගා හරහා වෙලි බැඳිය නොහැකිය. වෙල්ල බැඳීමට ඉතා සුදුසු ස්ථානය නිර්නය කිරීම එවැනිම ක්‍රියාවලියක් වේ. ද්‍රව පීඩනය පිළිබඳව සියුම් පරීක්ෂණයන්ගේ ප්‍රතිඵලයකි බිසොකොටුව.

අක්කර අඩි 30,000 - 75,000 දක්වා වූ ජල කඳක පීඩනය වැව් බැදීමට හෝ කුඹුරුවලට හෝ වදිනා හානිකර වේගය වලක්වා පාලනය කිරීම සාර්ථක කරන නිර්මාණයකි බිසෝකොටුව. බිසෝ කොටුවට සමාන නිර්මාණයක් වූ කපාටාවය (Valve - pit) මගින් රොන් මඩ පිරී වැව කොඩවී යාම වලක්වා ඇත. පොකුණ කරා යන ජලයේ රොන් මඩ ඉවත් කිරීමට වෙනම උපක්‍රම සකසා ඇත.

ලොකුරුකම් සඳහා ද පැරැන්නෝ දක්ෂම් පෑහ. තවද වෛද්‍ය ක්‍රමයෙහිද, ආරෝග්‍ය ශාලා තැනීමෙහිද ඔවුහු විශිෂ්ඨත්වයක් පෑහ.

මේ සියලු තාක්ෂණ පිළිබඳ දැණුමක් අධ්‍යාපන පීඨ මගින් ලබාදුන් අතර ඒවා පිළිබඳව ප්‍රවීණයන් සෘජුවම රජු යටතේ සේවය කළහ. බුදු දහම පැතිරීමෙන් පසු දහම මගින් මඬිනු ලැබූ තාක්ෂණික ශිල්පියා එයට අනුරූප තාක්ෂණයක් ගොඩනැංවීම විශිෂ්ඨ ක්‍රියාවකි. පරිසර තුළ මිනිසාගේ අනන්‍යතාවය රැකීම මෙන්ම පරිසරය විනාශ කොට තම සම්පත් පරිභෝජනය වැඩි කෙරුමේ වෑයම ඔහු ගේ තාක්ෂණය තුළ දක්නට නොලැබුණි. ඔහු විසින් උපයෝගී කරගත් බොහෝ තාක්ෂණික

ක්‍රියාවලියන්ගේ නිපයෙන දෑ පහසුවෙන් පරිසරයට උකහා ගැනීමට හැකිවිය. එයින් ඔවුන්ගේ තාක්‍ෂණයේ මැදුම් පිළිවෙත ප්‍රකට වේ. විශේෂයෙන් වාරි කර්මාන්තයේ දී පරිසර ක්‍රියාවලිය වැදගත් වේ. අතිවිශාල වැව් තැනීමට වඩා කුඩා වාරිකර්මාන්ත රැසක් තැනීමට ඔවුන් යොමු වූයේ එහෙයිනි. තවද ජල චක්‍රය හා පරිසරයෙන් ලැබුණු දේ එයට උරුමකර දීමේ දී පරිසර චක්‍රයද නිසි අයුරින් ක්‍රියාක්මක ආකාරයට ඔහුගේ තාක්‍ෂණය සැදුම් ලද්දේය. එය ඇති වීමෙන් නැති වීමෙන් ක්‍රියාවලියක් ලෙස ලෝකය දැකීමට බුදු දහම තුළින් ඔහුට ලැබුණු ආභාෂය විය හැකිය.

වාස්තු විද්‍යාවේදී ද ප්‍රථිමා කලාවේදී ද, මෙවැනිම ලකුණු දක්නට ලැබේ. පරිසරය තුළ ගහ කොළ නිල්ල තුළ ඔහුගේ නගර නිර්මාණ වූයේය. නිසංසල උද්‍යාන මැද වෙහෙර විහාර පිරිවෙන් එහි සමුදායාර්ථයට අනුව ඉදිවිය. ගසින් වැටුණු පරිසරය මත ඉහළට නැගුණු මිනිස් අනන්‍යතාව කියාපාන සිත නිසසල වග , ජීවන චක්‍රය බඳු වෙහෙර දාගැබ් බිහිවිය. දුටු පමණින් සිත් නිවෙන ප්‍රථිමා ඉදිවිය. මේ සියළු දෑ තාක්‍ෂණය හා අධ්‍යාපනය පසුපස හූයක සේ බැඳුණු බුදුදහමත් එයින් මඬිනු ලැබූ චිත්තයත්, නොඇලුනු බවත්, ඇති වීමත් නැති වීමත් ජීවන චක්‍රයත් දුටු දාර්ශනික භාවයත් මනාව පෙන්වන ලකුණුය.

## ● මධ්‍යකාලීන යුගයේ අධ්‍යාපනය

1017 දී චෝල අධිරාජ්‍යයට යටත් වූ පසු භික්ෂූන් වහන්සේ විහාර පිරිවෙන් අතහැර ගියහ. එයින් පසු භික්ෂූන් වහන්සේ විහාර පිරිවෙන් අතහැර ගියහ. එයින් පසුව 1070 සිට පොළොන්නරු යුගය ඇරඹේ. 1 වන විජයබාහු රජවීමෙන් අනතුරුව නැවත වනවැදී සිටි භික්ෂූන් වහන්සේලා තම උරුමය සොයා නැවත පැමිණියහ. ඉන් පසුව 1 වන පැරකුම්බා යුගය උදාවිය. ජේතවනය, ලංකා තිලකය ආදී විශාල පිරිවෙන් නැවත පිහිටුවන ලදී. ජේතවනයෙහි තිබුණු ගොඩනැගිලි ගණන 520 කි. විශාල ප්‍රබෝධයක් නැවත ඇතිවූ අතර පූර්වාරාමය, දක්ෂිණාරාමය, ඉසිපතනය, වේලුවනාරාමය, ජේතවනාරාමය, තිවංක, ඇතුබඳලෙන ආදී මහාවිහාරයන් රැසක් නැවත ක්‍රමවත් අධ්‍යාපනයක් ඇතිවිය. රාජ්‍ය පාලනය ද අමාත්‍යාංශ දහයකින් සැදුම්ලත් අතර ඉන් එකක් වූයේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. තවද හුදෙකලාව හා වනවාසීව වෙනම නිකායන් මත ගොඩනැගී සිටි කොටස් ආරණ්‍ය වාසී නිකාය ලෙස සංවිධානය විනි. මෙය ද අලුත් දහමේ ගොඩනැංවීමට උපකාර විය. එහෙත් කාලිංස - මාඝ ආක්‍රමණයෙන් වෙහෙර විහාර ලොත්ගුල් ආදීය සහමුලින්ම විනාශ වී ගිය අතර අධ්‍යාපනයද ඇද වැටිණි.

මාඝ ගේ හමුදා පාලනයෙන් (1215 - 1236) යහපත් නොවූ භික්ෂූහු නැවත අධ්‍යාපනය විසින් තමන්ගේම හික්ම වූ මග ඔස්සේ ගමන් ගනිමින් ආක්‍රමණයට එරෙහිව ජනතාව පිබිද වූහ. මෙයින් පසු iii වන විජයබාහු යටතේ දඹදෙණියේ රාජධානිය පිහිටුවන ලදී. ඉන්පසු ii වන පැරකුම් රජු

යටතේ නැවත සමෘද්ධිය වෙත පිය මැණින. මේ රජතුමා පිරිවෙන් අධ්‍යාපනය මනාව ලැබූවෙක් විය. එබැවින් තම උරුමය සොයා පැවති ආර්ථික-සංස්කෘතික - අධ්‍යාපණික සමෘද්ධිය සොයා ඔහු පියමැන්නේය.

මේ කාලය තුළ පිරිවෙන් රාශියක් බිහිවූ අතර වැදගත් ග්‍රන්ථ රැසක්ම බිහි විය. විසුද්ධි මග පිළිබඳ අටුවාවක් ද, කව්සිළුමිණ නම් වූ කුසදාකව ද මෙතුමා විසින් ම රචනා කරන ලදී. රජුගේ විදග්ධභාවය නිසා අධ්‍යාපනය නව පණ නැංවූන අතර ආක්‍රමණයන් වෙතින් විනාශය කරණු ලැබූ ජාතික උරුමය ඉල්වමින් සිටි ශිෂ්‍ය ව්‍යාපාරයට ද නව ජීවනය කැවිණ. දඹදෙණි යුගයේදී මයුරපාද පිරිවෙන, පරාක්‍රමබාහු පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, අස්සද්දන පිරිවෙන, පස් මූල පිරිවෙන, තොටගමුවේ විජයබාහු පිරිවෙන, විදාගම සනාතන්ද පිරිවෙන ආදී පිරිවෙන් රැසක් බිහිවිය. පොදුවේ මුළු රටේම පිරිවෙන් වියපත් අංගතා ලෙස ආයතන අටකට බෙදා ප්‍රතිසංවිධානය කරන ලදී. උතුරු මුල, කපුරුමුල, වාදුම්, මුල, මානෙත්පාමුල, අභයගිරිය නිකායටද දකුණුමුල, සෙනරත් මුල, ජේතවන නිකායටද, ගලතුරුමුල , විල්ගම්මුල - මහාවිහාර නිකායටද සම්බන්ධව තිබිණි. 15 වන සියවසේ විජයබා පිරිවෙනේ අධිපති තොටගමුවේ රාහුල හිමියෝ උතුරුමුලට අයත් වූහ. තවද වනවාසී නිකායට ද අයත් අධ්‍යාපන මධ්‍යස්ථානයක් දෙවන පැරකුම් රජු විසින් සමනලකන්ද පලාබත්ගල පිහිටුවන ලදී.

දේශපාලන විපර්යාස, අගනුවර තැනින් තැනට මාරු වීම විශේෂයෙන් කුරුණෑගල සිට ගම්පොළටත් ඉකිබිති රයිගමටත් මාරු වීම නිසා අධ්‍යාපනයට තාවකාලික බාධා ඇතිවිය. iv පැරකුම්බාවන් (1412 - 1467) කොට්ටේදී අභිෂේක විමෙන් පසු අවිධිමත් බව පිටුදැක සංවිධිත ලෙස පිරිවෙන් නගා සිටුවීලූහ.

**● සුනේත්‍රාදේවී පිරිවෙන**

මුලින් රන්කාසි 2500ක් වැය කොට පුස්තකාලයක්, නේවාසිකාගාරයක් සහ වෙනත් බොහෝ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජු විසින් දෙනු ලැබූ අධිකාරී පත්‍රය පැපිලියාන සෙල්ලිපියෙහි සඳහන්වේ. රජු විසින් අගනා ඉඩම් වෙනත් දේපළ විශ්ව විද්‍යාලවලට පවරා තිබුණු අතර එයින් නඩත්තුව සිදුවිය. ත්‍රිපිටකය, තර්ක ශාස්ත්‍රය, භාෂා විෂයන් පිළිබඳව අධ්‍යාපනයට මුල්තැනක් දී තිබෙන ප්‍රධාන ආචාර්ය වරයා, ලේඛාධිකාරී ආචාර්යය මණ්ඩලය හා වෙනත් සුළු සේවකයින් ලෙස වැටුප් ක්‍රම සකසා විශාල සංවිධානයක් ද විය. මෙය හිරු, පරවි, කොකිල සංදේශයන් හි ද සඳහන් වේ.

**● කෑරගල පද්මාවති පිරිවෙන**

මේ පිරිවෙන් පිළිබඳ අගනා විස්තරයක් විදාගම මෛත්‍රී හිමියන්ගේ හංස සංදේශයේ සඳහන්ව ඇත. මෛත්‍රී තෙරුන් දෙවියන් යදින ලෙස

පණිවුඩය යැවූවේ කැරගල පද්මාවතී පිරිවෙනේ අධිපති ශ්‍රී වනරතන හිමියන්ටය. මෙය කොළඹින් සැතපුම් 25 ක් ඈත කැලණි ගඟ සමීපයේ සියනෑ කොරළයේ පිහිටියේය. එහි විෂය මාලාවට ප්‍රාචීන භාෂා සහ සාහිත්‍යද බුද්ධාංගම හා තර්ක ශාස්ත්‍රයද ඇතුළු විය. එහි උගැන් වූ විෂයන් හා ශාස්ත්‍රාන්තර වූ කලී හෙරණසික, මුණසික, සිබ වළඳ, න්‍යාස, ටීකා, කාසයින් පිරිත, නිසබ්බන විනිස, තෙර බණ, විජම් පෙළ, සුතුරු පෙළ, විනය පිටකය, සඳ වියරණලකය, කවිකලු සතර, සකු වියරන සඳලංකර ආදියයි.

මෙහි විෂය ක්ෂත්‍රය සම්ප්‍රදානුකූලව මහාවිහාරික ථෙරවාද බුදු දහමට පමණක් කොටු වීම නිසා සැලකිය යුතු බුද්ධිමතුන් ගණනක් මේ කෙරේ අවධානය යොමු නොකළ බව පෙනේ.

## ● තොටගමුවේ විජයබා පිරිවෙන

මීට ප්‍රතිවිරුද්ධ ලෙස ශ්‍රී රාහුල සංඝරාජ තෙරුන් ගේ විජයබා පිරිවෙනේ ලෞකික වෛද්‍ය හා නීති බඳු වැනි විෂයන්ද ඉගැන්විය. පිරිවෙන් විෂය මාලාවට

(අ) ව්‍යාකරණ කාව්‍ය ශාස්ත්‍රය, නාට්‍යය, භාෂාන්තර සහ සංස්කෘත, මගධ (පාළි සහ ප්‍රකෘති) සිංහල හා දෙමළ වෙනත් සාහිත්‍ය අංශ
(ආ) අභිධර්මය, සූත්‍ර, විනය අටුවා වේද සහ හින්දුන් ගේ දහ අට පුරාණ සහ වෙනත් ආගම්
(ඇ) වෛද්‍ය ශාස්ත්‍රය (ආයුර්වේදය) අර්ථ ශාස්ත්‍රය, නීති ශාස්ත්‍රය නක්ෂත්‍රය හා ගණිතය ඇතුළත් විය.

බ්‍රාහ්මණ ඇදුරන් විසින් තර්ක ශාස්ත්‍රය, දර්ශනය, ජ්‍යොතිෂ්‍ය. වශීකරණය, ගුප්ත විද්‍යාව ද උගන්වන්නට ඇතැයි සිතිය හැකිය. තොටගමුවේ රාහුල හිමියන් (ෂඩ් භාෂා පරමේශ්වර) නිසා පිරිවෙන ප්‍රසිද්ධ විය. ඉන්දියාවෙන් පැමිණි සුප්‍රකට බමුණකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී ද එහි සිසුවෙකු විය. මෙය iv වන පැරකුම් රජු විසින් පිහිටුවන ලද පිරිවෙනකි. ඉන්දියානු අධ්‍යාපන ක්‍රමය පිළිබඳ විශිෂ්ඨ දැනුමක් මෙහි දී ලබා ගත හැකි විය.

## ● වීදාගම ඝණානන්ද පිරිවෙන

වීදාගම මෛත්‍රී හිමියනගේ ප්‍රධානත්වයෙන් පැවති මේ පිරිවෙන් අධ්‍යාපනයට හා සාහිත්‍යයට විශාල සේවයක් ඉටු කළේය. ලෝවැඩ සඟරාව හංස සංදේශය, බුදුගුණාලංකාරය වැනි උසස් කෘතීන් රැසක් මෙකී පිරිවෙනින් සැකසිණ . බමුණු දහමටද දේව භක්තිකයන්ටද දැඩි ප්‍රහාරාත්මක බලපෑමක් මේ පිරිවෙනින් සිදුවිය.

යුරෝපීය ආක්‍රමණිකයන් නිසා පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට පටන් ගතී. පිරිවෙන් සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීමත් පරසතුරන්ගේ ආගම් හා අධ්‍යාපන ක්‍රමයන් පතුරවාලීම සඳහා පිරිවෙන් විනාශ කර-

ලීමේ ප්‍රතිපත්තියක් ඔවුන් අනුගමනය කිරීමත් නිසා අධ්‍යාපන රටාව බිඳ වැටිණි. නව අර්ථක්‍රමයක් හා නව විධික්‍රමයක් ද ආක්‍රමණිකයින් විසින් හඳුන්වා දීමත් සමගම සාම්ප්‍රදායික වෙදුන්, ගුරුන් ආදීන් කොන් වී යන්නට විය. මෙය යම් පමණකට වෙනස් වූයේ 1698 වර්ෂයේ වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් විසින් මල්වත්තේ මහා විහාරය, කුරුණෑගල රිදී විහාරයද, මුල්කරගෙන පිරිවෙන් ඇරඹීමත් සමග ගාල්ල, බෙන්තර, මාතර පිරිවෙන් රාශියක් අතිවිය. 1839 ශ්‍රී සිද්ධාර්ථ ස්වාමීපාදයන් විසින් රත්මලානේ මහා පිරිවෙන ඇරඹූ අතර පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ධර්මාලෝක හිමියන් විසින් ද මාලිගාකන්ද විද්‍යොදය පිරිවෙන ශ්‍රී සුමංගල හිමියන් විසින් බිහි කරන ලදී.

කෙසේ වුවත් මධ්‍යකාලීන අධ්‍යාපන ක්‍රමය නව ආලෝකයක් සහ සාහිත්‍යෝදයක් ඇතිවූ කාලයක් ලෙස සිතිය හැක. එමෙන්ම ඒවා තුළින් බිහිවූ උගත් භික්ෂු පරපුර ඊළඟ වටයේදී අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සටනේ තම අනන්‍යතාව වටහා ගත් පිරිසක් බවට පත් කෙරුම ගෞරවයද මධ්‍යකාලීන පිරිවෙන්වලට හිමිවේ.

## 5. භික්ෂු ශිෂ්‍ය ව්‍යාපාරයේ අතීත ගමන

බුදු දහමට අනුව නිවන් අවබෝධ කරගත හැක්කේ සියළු දේම යථාභූතඥානයෙන් ග්‍රහණය කරගැනීම තුළිනි. එහෙත් මෙය බොහෝ සෙයින් දුෂ්කර කාර්යයක් විය. එසේ හෙයින් ස්වයං අවබෝධය අසමත් වූවන් සඳහා උසස් අධ්‍යාපන පීඨයන් හි ක්‍රමවත් අධ්‍යාපනයක් අවශ්‍ය විය. ශ්‍රැති ග්‍රන්ථයක් යැයි ස්ථිරව කිව හැකි යමක් ද ධර්මයට නොවිණ. අනෙක් අතින් ධර්මයට ශ්‍රැති ග්‍රන්තයට සූත්‍රයකට ලඟකර ගැනීමත් අපහසු විය. එසේ හෙයින් ආචාර්යවරුන් සෙවනේ නිදහස් විවේකී බුද්ධියෙන් ප්‍රයෝගික සාමූහිකත්වය - සංඝ සමාජය වේදනය කරමින් අධ්‍යාපනය ලබාදීම අත්‍යාවශ්‍ය විය. එහෙයින් උසස් අධ්‍යාපනය පීඨයන්හි ක්‍රමවත් අධ්‍යාපනයක් අවශ්‍ය විය. තවද සමාජය පවත්වා ගැනීමේ දී ධර්මයට අනුකූලව අර්ථ සකසා ගැනීමට ද අවශ්‍ය වූ හෙයින් අනාගමික අධ්‍යාපනයක් අවශ්‍යතාවයක් අවශ්‍ය විය. තවද සමාජය පවත්වා ගැනීමේ දී ධර්මයට අනුකූගව අර්ථය සකසා ගැනීමටද අවශ්‍ය වූ හෙයින් අනාගමික අධ්‍යාපනික අවශ්‍යතාවයක් දනෙන්නට විය. අවසානයේ භාෂාවක් - සංස්කෘතියක් හා අනන්‍යතාවයක් මත එකම ජාතියක් ලෙස සංවිධානය වීමේදී ඇතිවන සංකීර්ණතාවයක් මත එකම ජාතියක් ලෙස සංවිධානය වීමේදී ඇතිවන සංකීර්ණතාවයන් හා දුෂ්කරතා ජයගැනීමටද අවශ්‍ය විය. එහෙයින් උසස් අධ්‍යාපනය පීඨයන්හි හා ක්‍රමවත් අධ්‍යාපනයක් අවශ්‍ය විය පිරිවෙන් ඉටුකළේ එකී ජාතික අවශ්‍යතාවයයි.

දැණුම හා උගත්බව යන්න දුර්ලභ දෙයක් නොවන පිරිවෙන්වලට



dahamkatawaka.lk

අමතරව බ්‍රමණයන් හා උගතුන් ඇසුරෙන් ද අධ්‍යාපනය ක්‍රම පැවතියේය. එහෙත් ඒවා පෞද්ගලික බැඳීම් මත මිසක සාමූහිකත්වය මත පදනම් නොවින. විදේශ ආක්‍රමණවලදීත්, සාගතයන් හා වෙනත් ව්‍යවසනාවල දීත් නැවත නැවතත් තම අවශ්‍යතාව මත අධ්‍යාපනයත් - ආර්ථික - සංස්කෘතික සමාජ පද්ධතියත් රැක ගත්තේ, පවත්වාගෙන ගියේත් පිරිවෙන් ආශ්‍රිත විසූ ලාංකික ශිෂ්‍ය ව්‍යාපාරය වූ භික්ෂූන් වහන්සේලාය.

විදේශ ආක්‍රමණයන්ගෙන් මව්බිම ගලවා ගැනීමත්, බලලෝභය හා තාක්ෂණය නිසා ඉරිතැලීගිය සමාජය නැවත නගාසිටුවීමටත්, ජාතික චින්තනයට හැඩගැස්වීමත්, භික්ෂු - ශිෂ්‍ය ව්‍යාපාරයේ යුතුකම හා වගකීම ලෙස ඔවුන් සැලකූ බව මව්බිමේ අතීත කතාව සලකා බැලීමේදී පෙනී යයි. යම් යම් කරුණු නිසා වැදගත් වූ ඓතිහාසික අවස්ථා කිහිපයක් පමණක් දැන් සලකා බලමු.

ක්‍රි.පූ. 267 දී, දේවානම් පියතිස්ස රජු ඇවෑමෙන්, ඔහුගේ සොයුරු උත්තිය රජ විය. ඔහුගෙන් පසු මහාසිවද, සූරතිස්සද, රජකම් කළෝය. මේ වන විට බුද්ධාගම ජනතා ආත්මය තුළට කාවැද්දී තිබෙමින් පැවති අතර, විවිධ ගෝත්‍ර අතර එකම ජාතියක් ලෙස ද එය පැතිර යමින් පැවතින. එහෙත් ඉන්පසු දකුණු ඉන්දීය ආක්‍රමණයක් (සේන - ගුත්තික) සිදු වූ අතර එය වරක් අසේල රජු පරාජය කළද, (ක්‍රි.පූ. 20 - 205) ඉතා දීර්ඝ ලෙස පැවති ආක්‍රමණයක් විය. එහි අවසන් වසර 44 පාලනය කළේ එරාළ රජු විසිනි.

එරාල පාලන සමයේ අනුරාධපුරයෙන් නිත්‍ය ලෙස ම භික්ෂු ශාසනය වඩාත් දුෂ්කර රුහුණු කැලණිය වැනි ආරක්ෂිත ප්‍රදේශවලට මාරුවී ගියේය. අනුරාධපුරයේ පැවති තත්ත්වය ආක්‍රමිකයාට අනුගතභාවයක් පෙන්වූ නමුදු, එය තීරණාත්මක ජාතික විමුක්ති අරගලය පැමිණෙන තෙක් සිය අනන්‍යතාව රැකගනිමින් වූ කල්බැලීමක් ලෙස සැලකිය හැකිය. අවසානයේ සියලු බන්ධනයන් පුපුරවා ජාතික හැඟීම ඉස්මත්තට පැමිණි අතර ආක්‍රමණිකයා පරදවා දුටුගැමුණු රජු (ක්‍රි.පු. 161) විජය ග්‍රහණය කළේය.

දුටුගැමුණුගේ විජයග්‍රහණයෙන් පසුපස භික්ෂූන් වහන්සේ ක්‍රියාකළ ආකාරය විමසිය යුතුය. විහාරමහා දේවියද එහි ඉතා වැදගත් වෙයි. වංශකතාව කලාත්මකව කුමක් කීවද, කැලණිතිස්ස රජු ගේ හා කාවන්තිස්ස රජු ගේ, වෙන්ව පාලනය වූ රාජ්‍යයන් දෙක සමගි කරලීමේ පුරුක වූයේ විහාරමහා දේවිය යි. එය අහම්බයක් නොව භික්ෂූන් වහන්සේලා ඉතා දැණුවත් ව සිදුකරණු ලැබූ ක්‍රියාවක් වෙයි. එනම් ජාතික විමුක්තියේ ප්‍රථම ක්‍රියාවලිය වනාහි, බෙදුණු ජනතාව එක්සත් කරලීමයි. එයට බුද්ධිමය දායකත්වය ලබාදීම භික්ෂූ - ශිෂ්‍ය බලවේගයේ ඓතිහාසික වගකීමය. ගැමුණු කුමරු උප්පත්තියට පෙර, ගිලන්ව සිටි සාමාන්‍ය තෙර නමක ගේ සුවදුක් විචාරීමට රජ බිසව වූ විහාරමහා දේවිය ගිය

අවස්ථාවේ. එකී තෙරුන් මීළඟ භවයේ විහාරමහා දේවියගේ කුසෙහි ඉපදෙන්නට ප්‍රාර්ථනා කළ බව කියැවේ. මෙහි වැදගත් ලක්ෂණය නම් වැඩවසම් පාලන ක්‍රමයක් මෙරට එකල තිබුණේ නම් රජ බිසව සාමාන්‍ය භික්ෂූන් වහන්සේ හා පාලකයන් අතර පැවති අන්තර් සම්බන්ධතාවයක් නොවේ. එහි සැබෑ අරුත, ගැමුණු කුමරු කුසෙහි සිටිද්දී සිටම අනාගත ජාතික විමුක්තිය උදෙසා ඔහු ජාතික චින්තනය විසින් මෙහෙය වූවෙක් වූ බවය. සිය සොයුරු සමග ද ආරවුල් ඇතිකරගත් දුටුගැමුණු කුමරු සහමුලින්ම ආරක්ෂා වූවෙත්, යැපුනෙත්, වනගතව අධ්‍යාපන ක්‍රමයත්, ශිල්ප ක්‍රමයත් සකස්කළ භික්ෂූන් වහන්සේලා අතිනි. වෙනෙකක්තබා, ඔහුගේ සේනා සංවිධානය වූයේත්, ථෙරපුත්ථාභය නම් උපැවිදී තෙර නමක් අතිනි. එයින් පෙනී යන්නේ සන්නද්ධ ක්‍රියාවලිය සඳහා වූ සේනාවේ යුද්ධ පිපාසය දහම් දියෙන් නිවා, ඔවුන් අයෝමය බෞද්ධ විනයකට අනුව මධ්‍යගත කළ සේනාවක් ද වූ බවය. අවසානයේ යුද්ධ සේනාව සමග දහම් දෙසමින් පැමිණි 500 ක් රහතුන් වහන්සේලා හා අනෙකුත් භික්ෂූන් වහන්සේලා නිසා විශාල ජනතා සහයක්ද ගලා ආ බව පැහැදිලිය. යුද්ධයෙන් මිය ගිය මිනිසුන් 1.5 ක් පමණ යැ යි පැවසූ පුවගු දිවයින් රහතුන් ගේ ප්‍රකාශය සමහරුන්ගේ සිනහවට ලක්ව තිබේ. එය සැලකිය යුත්තේ එලෙස නොවේ. අහිංසා දහමක් විසින් මඬින ලද ජනකායක්ද හිංසාකාරී සටනකට යොමුකර ලීම අපහසුය. එහෙත් සටන් නොකළහොත් ජාතිය ද වැනසෙන්නේය. මේ තත්ත්වය දුටු එවකට ජනතාවගේ බුද්ධිමය නායකත්වය වූ භික්ෂූ බලය, සටන සඳහා බෞද්ධ න්‍යායක් සකස් කර දුන්හ. ජාතික සටනකදී එවන් බෞද්ධ යුද්ධය න්‍යායක් අවශ්‍යව ඇත්තේ එවන් න්‍යායක් අවශ්‍ය ම වෙයි. අදද අපට අවශ්‍යව ඇත්තේ එවන් න්‍යායක් නොවේද? මෙයින් පෙනීයන්නේ දුටුගැමුණු නමින් නැගී සිටි ජාතික අරගලය සහමුලින්ම න්‍යායාත්මකව, සංවිධානාත්මකව, උපක්‍රමිකව හා දේශපාලනිකව සකස් කළේ භික්ෂු ශිෂ්‍ය බලවේගය විසින් බවය.

ගැමුණු චරිතයද නියම සෙන්පතියකුගේ දරිතය වෙයි. ගැමුණු රජුගේ මහ සෙනෙවිවරු වූ නන්දිමිත්‍ර, සුරනිමල, ථෙරපුත්තාභය, ගෝඨයිම්බර, වේලුසුමන, මහසේන, ඵුස්සදේව, ලභියවසභ, ආදී සියල්ලෝම ගැමුණු රජු මෙන්ම අද ද ප්‍රචලිතය. එහෙත් වෙනත් රජවරුන් ගේ සේනානායකයන් ගැන අපට එතරම් අසන්නට නොලැබේ. ගැමුණු රජු, ජාතික බලවේගයේ වූ විවිධ පුද්ගයන්ගේ විවිධ හැකියාවන් දැක, ඔවුන් අභියොග ලෙස නොව, ආශිර්වාද ලෙස ඔවුනට නිසි තැන දුන් බවද, එමෙන්ම ජාතියට විජයග්‍රහණය දුන් බව ද සත්‍යකි. ගැමුණු රජුට එය ලැබුනේ බුදු දහමේ උපේක්ෂාව හා සමානාත්මතාවය තුළින් විය හැකිය. අද ලංකාවේද, සැබෑ හැකියාවන් ඇති පුද්ගලයන් අභියෝග ලෙස දකිමින්, සැමට කලින් ඔවුන් නසාලීමට කටයුතු කරමින්

තමන් ම ජාතියේ එකම නායකයා වීමට වලිකන පුද්ගලයන්ට ගැමුණු රජු කදිම ආදර්ශයකි.

ගැමුණු රජුගේ සොයුරු සද්ධාතිස්සගේ (ක්‍රි.පූ. 137 -119) පුත්, වළගම්බා රජුගේ කාලය ද විශේෂිත වූවකි. ඔහුගේ කාලයේ තිස්ස (තීය) නම් බමුණකු විසින් ඇතිකරන ලද කැරැල්ලක් නිසා රට ආරාජිකත්වයට ගොස් මහා සාගතයක්ද ඇති විය. ජීවත් වූ භික්ෂූන් වහන්සේලා වනේ කැලෑ කොළ කමින්, ඉතා දුෂ්කර තත්ත්වයන් යටතේ දහමත්, අධ්‍යාපනයත් රැකගත්හ. රටේ ජනයා බෙදී රට අරාජිකත්වයට පත් වීමෙන් රට පාණ්ඩ්‍ය ආක්‍රමණයන්ට ගොදුරු විය. බලලෝභී සටනේ ප්‍රතිඵලය වූයේ රට විදේශ හස්තයට අසුවීමය. එහෙත් බෞද්ධ බලය නැසිය නොහැකිය. සමගියත්, කැපවීමත්, උතුනුන් ගරුකිරීමත්, ඒ අනුව කටයුතු කරලීමත් නිසා වලගම්බා රජු නමින් ජාතික බලයට පාණ්ඩ්‍ය ආධිපත්‍ය කෙළවර කරන්නට හැකිවිය.

වලගම්බාගෙන් පසු බිහි වූ රාජ්‍ය පාලකයන් බොහෝමයක් අපේම ජාතික චින්තනයට පිටුපා, බලලෝභී, ජනතා විරෝධී, කුමන්ත්‍රණ මගෙහි ගියෝය. උන් සැම එවැනිම ක්‍රියා, ප්‍රතික්‍රියා මගින් වැනසුනෝය. සාමයෙන් සමෘද්ධියෙත් පැවතුනේ භික්ෂූන් වහන්සේලා පාලකයන් හා ජනතාව අතර වූ සම්බන්ධයෙන් ජනසම්මතයෙන් රැකී පාලකයන් නම් භාතිකාභය රජු, වසභ රජු ආදීන්ය. ඔවුන් අතුරින් ශ්‍රේෂ්ඨයා වූයේ සිරිසඟබෝ අප අතර අමරණීය වෙයි.

ඉන් පසු කැපීපෙනෙන යුගයක් උදාවන්නේ මහසෙන් (ක්‍රි.ව. 276) යුගයේය. වෛතුල්‍යවාදය නිසා ගෝඨාභය කාලයේ සිට ඇති වූ න්‍යායික භේදය උග්‍ර වී ගොස්, පළිගැනීමේ චේතනාවෙන් සිටි එක් සොළී භික්ෂූ නමක් නිසා මහසෙන් රජු මහා විහාරයට එරෙහිව ක්‍රියා කළේය. මහා විහාරිකයන්ට දානය තහනම් විය. එහෙත් දැඩි අදිටනකින් යුතු වූ මහා විහාරිකයෝ කුසගින්නේ මිය ගියද, මිථ්‍යා දෘෂ්ටියක් වැළඳ නොගැන්මැ යි දැඩිව අධිටන් කළෝය. (අද අපට අවශ්‍යව ඇත්තේ විවෘත ආර්ථික සංස්කෘතික පාදඩකරණයට එරෙහිව මේ අදිටන නොවේ ද?) කෙසේ වෙතත් ජනයා - භික්ෂූන් - පාලක සම්බන්ධය බිඳ ජනසම්මතය වෙනුවට බලය පරිහරණය කරන්නට යෑමෙන් මහසෙන් රජුට එරෙහිව ජන රැල්ලක් නැග ආවේය. රජු ජනරැල්ලට හිස නැමීය. මහසෙන් රජු වැදගත් වන්නේ ඔහු මහා විහාරයට කළ හානිය නිසාවත්, ඔහු තැණූ දැවැන්ත වාරි කර්මාන්තයන් නිසාවත් නොව තම වැරදි දැක ජන මතයට හිස නැමුවක් ලෙස ය. අනෙක් වැදත් කරුණ නම් මහසෙන් රජු ගේ කාලයේ රට ආර්ථික අතින් සමෘද්ධිමත් වූව ද, ජාතික බලයට එරෙහිවීම නිසා ඔහු පරාජය වූ බව ය. ආර්ථික පදනම පරදවා සංස්කෘතික පදනම

chandikawalla walakulu.lk

නැගී සිටියේය. අපේ ඉතිහාසයේ ආර්ථික පදනම මත ක්‍රියා නොකළ බව මෙයින් පෙනේ.

මහසෙන්ගෙන් පසු කැපී පෙනෙන චරිතයක් වූයේ දළදාව ගෙන්වාගත් සිරි මේඝවර්ණ රජුත්, ගිලනුන්ට උපකාර කල බුද්ධදාස රජුන්, 2වන උපතිස්ස රජුන් ආදීන්ය.

ii වන උපතිස්ස ඇවෑමෙන් රජ වූ මහානාමගෙන් පසු මිත්සෙන් රජවිය. මිත්සෙන් රජු භික්ෂු - පාලක - ජනතා සහසම්බන්ධය බිඳදමා ජනසම්මතයට එරෙහිව ජනතා විරෝධී ක්‍රියාමාර්ගයට ගියේය. ජනසභය ඔහුට අහිමි වූ අතර ප්‍රතිඵලය වූයේ රට නැවත පාණ්ඩ්‍ය ආක්‍රමණයට ගොදුරු වීමය. මෙය ඉතිහාසයේ නැවත ජාතියකට පාඩම් ඉගැන්වූ අවස්ථාවක් විය.

සුපුරුදු පරිද්දෙන් නැවත රුහුණු, මලය ආදී දුෂ්කර ප්‍රදේශවලට පලායන්නට ජාතික හැඟීම් ඇති ජනයාට සිදුවිය. එසේ වූ ජනයාගේ නායකයා වූයේ ධාතුසේනය. ධාතුසේන කුමාරයා තනිකරම භික්ෂූ බලය යටතේ වැඩුනකි. ඔහු කුඩා කල සාමණේර හිමි නමකි. ඔහුගේ දර්ශනිකයා, සේනාධිනායකයා මෙන්ම මාර්ගෝපදේකයා, ද වූයේ ප්‍රසිද්ධ දික්සඳ සෙනවි පිරිවෙනේ මහානාම හිමියන්ය. ධාතුසේන කුමරා කැලෑ වන දුර්ගයක වූ අධ්‍යාපනය මධ්‍යස්ථානයක දැඩි විනයක් යටතේ අධ්‍යාපනය ලැබුවේය. යුද්ධ - අර්ථ - රාජ්‍ය ආදී ලෙස වූ පංච තන්ත්‍රයන් ම ආත්මගත කරගත්තේය. ජාතික චින්තනය හැඳින ගත්තේය. ඔහුට සංග්‍රෝප්‍රමික උපක්‍රම, සටන විධි, සේනාසංවිධානය, සේවාවන් තුළ විනය පවත්වා ගැනීම ආදී සියල්ල ලැබුනේ බුද්ධ පුත්‍රයන් අතිනි. සැඟවී නිස්සරන අධ්‍යාසයේ යෙදෙමින්, ජාතික ආත්මය බුද්ධිමය වශයෙන් පුබුදුවමින් සිටී, බලය සඳහා වංචනිකයින් නොව, සැබෑ ජාතික චින්තනය වටහාගත් බුද්ධ පුත්‍රයන් අතිනි. ප්‍රතිඵලය වූයේ ක්‍රි.ව. 460 දී පාණ්ඩ්‍ය රජ වූ පීඨිය පරදවා ධාතුසේන නමින් ජාතික විමුක්ති අරගලය ජය ලැබීමය.

ධාතුසේන රජු මරා රජවූයේ ඔහු පුත් කාශ්‍යපය. කාශ්‍යප කෙතරම් කලාකාමියෙක් වුවද, සිය පියා මැරීම නිසා, ඔහුගේ බලය පිණිස වූ දුෂ්ඨ මිනීමැරීම නිසා ඔහු ජනතා විරෝධියෙක් විය. ප්‍රතිඵලය වූයේ මුගලන් කුමරු, ඉන්දීය හමුදා ආධාරයෙන් ඔහු පරාජය කිරීමය. කාශ්‍යපගේ වධක ප්‍රතිපත්තිය නිසා කිපී සිටි ජනතාව, ආක්‍රමණිකයා පවා පිළිගත්තේ මිතුරු ලීලාවෙනි. (මේ ඓතිහාසික භූමිකාව නැවත රැඟදක්වමින් පවතීද?)

මුගලන්ගේ ආදර්ශයෙන් පසු රටෙහි පාලකයා බොහෝ ගුණයක් සිය අභ්‍යන්තර අරගල ජයගැනීම සඳහා විදේශ සහය පැවතුවෝය.

එහි ප්‍රතිඵලය වූයේ රට අක්‍රමණිකයාට වක්‍රව යටපත් වීමය. ක්‍රි.ව. 831 දී මෙසේ භේදභින්නව සිටි ජාතිය පාණ්ඩයන් විසින් සෘජුවම යටත් කරගන්නා ලදී. එහෙත් උපායශීලීව නිසි අවස්ථාව බලා ජාතික බල වේගයකය පණගන්වන්නට භික්ෂු - ශිෂ්‍ය බලය සමත් විය. i වන සේන ගේ ආරාජිකයන් පසු ii වන සේන රජ නැවත ගලවා ගත්තේය.

මින් පසුව අපට හමුවන රජෙක්වන ii වන මිහිඳුගේ (ක්‍රි.ව. 787) කාලයේ වැදගත් උදාහරණයක් වෙයි. රජු හා රුහුණේ දප්පුල නම් ආදිපාදවරයෙක් අතර වූ තීරණාත්මක, ජයකින් තොර දීර්ඝ සටන නිසා රට ඉමහත් දුෂ්කරතාවයන්ට මුහුණ දුන්නේය. රජු වහාම ජාතියේ බුද්ධි බලය වූ භික්ෂු - ශිෂ්‍ය බලයද වෙනත් බුද්ධිමතුන්ගේ ද විවෘත සභාවක් කැඳවා, ඔහු සමග බලය බෙදා ගත්තේය. අර්බුදයෙන් රට ගැලවින.

3 වන උදය රජු (ක්‍රි.ව. 945) තවත් වැදගත් උදාහරණයක් වෙයි. රජ විසින් සංඝ ආරාමයක ස්වාධිනත්වය උල්ලංඝනය කර කළ මිනී මැරුමක් නිසා භික්ෂුන් වහන්සේලා විරෝධය පළකළහ. ජනයා ප්‍රකෝපයට පත්ව කැරලි ගැසූ අතර රජුට ජනමතයට හිස නැමීමට සිදුවිය. 1987 මැයි 1 වනදා අභයාරාම පුදබිමේ සිදුවූ මිනීමැරුම් වැනි සිදුවීමකට, රාජ්‍ය පාලනයක් පෙරළීමට තරම් සවියක් එකල භික්ෂු - ශිෂ්‍ය - ජනතා බලයට තිබූ බව පෙනේ.

v වන සේන v වන මිහිඳු ආදී රජුන් ජාතික චින්තනය වටහා නොගත් නිවට පාලකයන් විය. ප්‍රතිඵලය වූයේ රට සහමුලින්ම i වන රාජ රාජ නම් සොලී රජුට (ක්‍රි.ව. 985) යටත් වීමය. සොලීහු අගනුවර පොළොන්නරුවට උපක්‍රමිකව මාරු කළහ.

ක්‍රි.ව. 1072 දී මේ විදේශ ආධිපත්‍යයෙන් රට ගලවා ගත්තේ විජයබාහු රජු විසිනි. කීර්ති නමින් පෙනී සිටි ඔහු ඉතිහාසයේ ඉතා වැදගත් වන්නේ දීර්ඝ වශයෙන් කැලෑ ප්‍රදේශවල සැඟවී සිටිමින් පුළුල් සැලසුමක් සහිතව ජය ලබමින් පසුබසිමින් සටන් කළ නරපතියෙක් ලෙසය. කීර්ති කුමාරයා වටා ජාතික සටන පෙළගැස් වීමට නැවත සියලු බලය සැපයූයේ භික්ෂු බලය විසිනි. වරක් තමන්ට එරෙහිව සොලින්ට එකතු වූ සෙනෙවිවරු පවා සමගිකර, ඔවුන්ගේ හැකියාව ජාතික සටනට යොදාගත්තේය. එවන් සමඟියකට නිසැකවම මුල්වූයේ ද භික්ෂු බලයය. විජයබාහු රජු උපායශීලී විදේශ ප්‍රතිපත්තියක් ද ගෙන ගිය අතර, බුරුමයෙන් (රාමඤ්ඤ රට) නැවත සසුන ස්ථායි කරගැන්මට උපකාරද ලබාගත්තේය.

විජයබාහුගෙන් පසු බල ලෝභය නිසා රට නැවත විනාශය කරා ගියේය. භික්ෂු අධ්‍යාපන ක්‍රමය තුළද අස්ථාවර තත්ත්වයක් පැවතින. ඉන්පසු කැපීපෙනෙන්නේ ක්‍රි.ව. 1153 දී රජ වූ පරාක්‍රමබාහු රජු ගේ



chandikanawaka.lk

සමයයි. පරාක්‍රමබාහු රජ වටා කුමන ප්‍රශංසා ගොඩනැගී තිබුණ ද, ඔහු රටේ ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කළ නරපතියෙක් වුවද, ජාතික චින්තනය තුළ ක්‍රියාත්මක වූවෙක් නොවීය. ඉන්දීය බලපෑම් නිසා බෞද්ධ චින්තනයේ යටපත්ව, පරාක්‍රමබාහු වෙතට 'කෞටිල්‍ය' වර්ගයේ බලකාමයේ මාවක බලපෑ බව පෙනේ. ගජබාහු යටපත් කරලීමේ දී ද, රුහුණේ ස්වාධීන රාජ්‍ය (මනාභරන - සුගලා) යුද්ධයෙන් යටපත් කරලීමෙන් ද, විදේශ සමග කළ යුද්ධ වලින්ද ඔහුගේ උන්නතිකාමය කැපී පෙනේ. ඔහුගේ උන්නතිකාකමය නිසා, මුදලේ අගය පිරිහී රට ඉමහත් අර්බුදයකට ඔහුගෙන් පසු ගමන් ගත්තේය. කෙසේ වෙතත් වරක් දෙවරක් භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් සාමය සඳහා ඔහු නම්‍යකරණය කරනු ලැබීය. ආර්ථික සමෘද්ධිය නිසාවෙන් සංස්කෘතික ප්‍රබෝධයකට ද, භික්ෂු අධ්‍යාපනය බලය නැංවීමට ද (ජේතවනය ලංකා තිලකය, ගල් විහාරය) ඔහු කටයුතු කළ බවද කිව යුතු ය.

මොහුගෙන් පසු රජ වූ නිශ්ශංකමල්ල රජු, භික්ෂු - පාලක - ජනතා ජනසම්මත මාවත වඩාත් හොඳින් ක්‍රියාත්මක කළ, ජනතාව සමග සිටි පාලකයෙක් විය. එහෙත් ඔහුගෙන් පසු පොදු ආර්ථික පසුබැස්මත් , විදේශීය - දේශීය රාජවංශ අතර වූ යුද්ධය නිසාත්, කාලිංස මාඝ (ක්‍රි.ව. 1214) ආක්‍රමණිකයා රට පුරා බලය පැවැත්විය. ඔහු නිසා අති විශාල පරිමාණයෙන් භික්ෂු - ශිෂ්‍ය අධ්‍යාපන රටාවට හානි පැමිණින. විශාල ලෙස වෙහෙර විහාර, පතපොත හා අධ්‍යාපනික මධ්‍යස්ථාන විනාශ කරන ලදී. නැවතත් වනගිරිදුර්ග තුළට වදිමින්, ඉතා දුෂ්කර තත්ත්වය යටතේ, සසුනත් - අධ්‍යාපනයත් රැකගත්තේ භික්ෂු බලය විසිනි. මාඝ විසින් බලයෙන් විසුරුවා හරිනු ලැබූ ජාතික බලවේග නැවත එක්සත් කරන්නටද, සමගිය මතින් අවියෙන් මෙන්ම, ආත්ම ගත කරගත් ජාතික හැඟීමෙන් ද ජාතික භාවය ස්ථාපිත කරන්නට ඔවුහු සමත් වූහ. 3 වන විජයභිහු රජු එහි නායකයා විය.

දඹදෙණියේ රජ වූ iii වන විජයබාහු ගෙන් පසු රජ වූ ii වන පරාක්‍රමබාහු රජු ජාතික චින්තනය ඉතා දැඩිව ග්‍රහණය කරගත් බුද්ධිමත් රජෙක් විය. සිය ප්‍රදේශ ආදිපාදයන් යුද්ධකර පරදවනු වෙනුවට, ඔවුන් සියල්ලෝම මහා සභාවකට කැඳවූ රජ, මාඝ ආක්‍රමණයෙන් සහමුලින්ම පරාජය කෙරුම සඳහා ඒ සැමගේ සමගිය ලබාගත්තේය. ඔහු ඉතාම නිරවුල් මනසකින් යුතුව, තනි යුද්ධ වියරුවේ මාවත තුළ නොව, උපායශීලීත්වය හා බුද්ධියේ, ජනමතයේ මාවත ඔස්සේ අක්‍රමණිකයා, පරදවා ජයගත්තා පමණක් නොව, ජාතියට යුද්ධය නිසා වූ හානිය ද අවම කරගත්තේය. ඔහු ජීවත්ව සිටිය දී ම භික්ෂූන් - බුද්ධිමතුන් හා ජනතාවගේ සභාවක් කැඳවා, ඔහුගෙන් පසු රජවන්නා තෝරාගන්නට තරම් ජනසම්මතවාදීයෙක් විය. ඉතිහාසයේ විනාශකාරීම, කාලිංස මාඝ භීෂණය හා ජාතික අර්බුදය ජාතිය ජයගත්තේ එසේය.

මෙයින් පසුව බටහිර විදේශ ආධිපත්‍ය හා ජාතික අර්බුදය පිළිබඳ

කතාන්තරයේදී ද, ඉතිහාසය නැවත නැවත කියාදුන්නේ සමගියත් ජාතික චින්තනයත්, ජනසම්මතයත් එකඟත්වයට පත්නොවූ තැන, ආක්‍රමණිකයා පළවා හැරිය නොහෙන බවයි. හොඳම උදාහරණයක් නම්, පෘතුගීසී යුගයේ පහල වූ සීතාවක රාජසිංහ (1581) රජුය. නිසැකයෙන් ම රාජසිංහ රජ වනාහි, අපේ ඉතිහාසයේ සිටි විශිෂ්ඨතම රණකාමියාය. එහෙත් රණකාමීත්වයත්, ආභීත ක්‍රියාමාර්ගත්, දිවි කැපකොට වුව කරන ක්‍රියාවලියක් වුව සමගියත් ජාතික චින්තනයත්, ජන සම්මතයත් නොමැති තැන සාර්ථක නොවන බව ඔහු ඔප්පු කළේය. ඔහු පෘතුගීසින්ට එරෙහිව සටන් කළ මහා පුරුෂයෙක් වුවද, විනාශකාරී ලෙස භික්ෂූන් වහන්සේලාට, ජනතාවට ඝාතනයේ, බියවැද්දීමේ බලයෙන් යටපත් කරලීමේ ඔහුගේම ක්‍රියා මාර්ග නිසා පරාජිත පුද්ගලයෙක් විය.

තවත් වැදගත් උදාහරණයක් නම් පෘතුගීසීන් පැන්නීමට ලන්දේසීන් සමග ගිවිසුම් ගැසූ ii වන රාජසිංහ රජු (1634) උගත් පාඩමය. එක් අධිරාජ්‍යවාදීයෙක් වෙනුවට තවත් අධිරාජ්‍යවාදියෙක් බලයට පත් විය. අද දවසේද යු.ඇන්.පී. රජයේ ඇමරිකන් ගැති ප්‍රතිපත්තිය ඉන්දීය රජය යටතේ වෙනස් කරවා ගන්නට තතන අයත්, ඉන්දීය බලපෑම අවසන් කෙරුමට වක්‍රව හෝ සෘජුව හෝ ඇමරිකන් අධිරාජ්‍යයාට අයාචනා කරන් අයත්, රාජසිංහ රජුගේ 'ඉඟුරු දී මිරිස්' ගත් ඓතිහාසික පාඩම ඉගෙන ගෙන නැත.

ඉංග්‍රීසි අධිරාජ්‍යයත්, එය ලංකාව සහමුලින්ම යටපත් කරලීමත් පසුව ඇත්තේ ඉංග්‍රීසින්ගේ සංග්‍රාමික හැකියාව නොව, නැවතත් ජාතියේ අසමගියත්, ජාතික චින්තනය නොදැනමත්, ජනසම්මතය නොතැකීමත්ය. ශ්‍රී වික්‍රම රජුගේ කෘෘර ක්‍රියාවන් ආක්‍රමණිකයාට රට අල්ලාගන්නට පාර කපා දුන්නේය. ඒ සඳහා බල ලෝභයෙන් ක්‍රියා කළ ජාතික බලවේග ද හවුල් විය. කෙසේ වෙතත් ඉංග්‍රීසින්ට එරෙහිව, තීරණාත්මකව සැමවිටම පෙනී සිටිමෙන් භික්ෂූ ව්‍යාපාරය ජනතාව තුළ අධිරාජ්‍ය විරෝධය අවුලුවාලූහ. 1818 දීද 1848 දීද ඇතිවූ කැරලි සිංහල ජනයා ගේ අධිරාජ්‍ය විරොධයේ ප්‍රචණ්ඩ ලකුණ මිස, ජාතික විමුක්ති අරගලයන් ලෙස වැඩී නොආයේය. වර්තමාන ගරිල්ලා යුද්ධය මෙන් වූ එම සටන භීෂණයෙන් යටපත් කරලීමෙන් විනාශ කරනු ලැබීය. එම කැරලි විරත්වයෙන් කැපවීමෙන් සිදුකරනු ලැබූවද, අසමගියත් ජාතික චින්තනයක් නැතිවීමත්, ජනසම්මතයට එරෙහිව කුමන්ත්‍රණකාරී ස්වරූපයක් ගැනීමත් නිසාවෙන් අවසන් විය. වැලිවිට සිරි සරණංකර හිමියන්ගෙන් පසු පැහැදිලි ලෙස භික්ෂූ බලය එක්සත් කර ජනතාවගේ ජාතික ආත්මය පුබුදුකරලීමත් වූ ප්‍රභල භික්ෂූ බලයක් නොවීය. ප්‍රථිඵලය වූයේ ජනතාවගේ මෙන්ම ජනනායකයින් ද, ශිව, හින්දු, නායක්කාර් ආදී විවිධ බලවේගවලට නතු වීමය.තම ඓතිහාසික වගකීම ඉටුකරලීමට භික්ෂූ - ශිෂ්‍ය බලය අසමත් වූ බව පෙනේ. ප්‍රථිඵලය වූයේ අද දක්වා දිවෙන, ජනතාව පෙළෙන යටත් විජිත රාමුවතට ජාතිය බිලිගැනීමට හැකිවීමයි.

ඉතිහාසයේ පාඩම් එසේ ය. එම ඓතිහාසික භූමිකාවම වර්තමානයේද රඟ දෙමින් පවතී. සැබෑ සමගිය, සැබෑ ජාතික චින්තනය ආත්මගත කර ගැනීම, සැබෑ ජනසම්මතය ගරු කෙරුම මගින් මිස, වෙන අන් කිසිදු මගකින් ජාතියට විනාශයක් මිස විමුක්තිය නොලැබෙන්නේය. අතීතයේ පාඩම එයයි.

champikaranawaka.lk

# දෙවන කොටස

## 1. බටහිර අධ්‍යාපන ක්‍රම

### ● බටහිර අධ්‍යාපන ක්‍රමයේ නැගීම

සුප්‍රටීස් ටයිගීස් ගංගා දෙකට මැදිව පිහිටි ලෙස සැලෙකෙන සුමේරියන් ජනයාගේ වාසභූමිය විය. මෙය ක්‍රිःපූः 3000 - 4500 අතර කාලය තුළ පැවති බව කියැවේ. නයිල් මිටියාවතේ ඇති වූ ශිෂ්ටාචාරයන් ක්‍රිःපූः 2000 - 4000 අතර කාලයට අයත් ය. මේ ශිෂ්ටත්වයෙන් දෙකට මැදිවී දර්ශනය අතින් බටහිර ප්‍රථම දැනුම තැනීමේ පුරෝගාමීන් පිරිසක් වූ යුදෙව් ජනයාගේ ශිෂ්ටාචාරයන් ද මේතරම් ම පැරැණිය. මෙම ශිෂ්ඨාචාරයන් මෙන්ම මේවාට පසුව බිහිවුණ ග්‍රීක, අරාබි, බැබිලෝනියානු ආදී ශිෂ්ටාචාරයන් ද තමන්ටම ආවේනික වූ ශිෂ්ටාචාරයෙන් අන්‍යොන්‍යය ලෙස යැපුණු බව පෙනේ.

තම ප්‍රථම දැණුම කැටිකරගන්නා පුද්ගලයකු වෙත තමා අවට වෙසෙන අනෙක් මිනිසුන් මෙන්ම, තම අතීත වර්ගයාගේ ක්‍රියා වන් මෙන්ම, තමා අවට පරිසරය තීරණාත්මක ලෙස බලපායි. ඉන්දියානු ශිෂ්ටාචාරය පැතිර ගිය ජනයා හා ප්‍රදේශවල පරිසර සාධකවලට වඩා වෙනස් වූ පරිසරයක් මේ ශිෂ්ටාචාරය වලින් ව්‍යාප්ත වූ මිනිසුන් වෙත දක්නට ලැබේ. එය ස්වභාවයෙන් ම නිරුදක කතරක සිට හිම මීදුන චන්ඩ ශීත කුණාටු සහිත පැහැදිලි ලෙස ප්‍රතිවිරුද්ධ ධ්‍රැවයන්ගේ සමන්විත බැව් පරාවර්ථනය කළේය. එහෙයින් ඔහුගේ ප්‍රථම දැණුම තුළ තමාට ආශිර්වාදයක් නොව රිදුම් පරිසරය තම ප්‍රතිවිරුද්ධ ධ්‍රැවය ලෙසද එය ජයගතයුතු බව ද, තමාට ඉහළින් වූ දෙවියකු පිළිබඳව ද මැවුම්කරුවකු පිළිබඳව ද චිත්‍රයක් මවා පෑවේ ඊට අනුරූපී ලෙස දර්ශනයක්ද, ආගමක්ද, අධ්‍යාපනයද වර්ධනය විය. මෙය ධ්‍රැවයෙන් ප්‍රතික්ෂප කළ, පරිසරය සමල විසූ ඉන්දීය දර්ශනයන්ගෙන්

සහමුලින්ම වෙනස් එකක් විය. සහජීවනය වෙනුවට ප්‍රතිරොධත්, තරගයත්, ජයග්‍රහණයත් මූලික පදනම වූ අතර ධ්‍රැවයක තර්ක ක්‍රමයක් වූ රූපික (ද්විකෝටික) තර්ක ක්‍රමය ආත්මය විය. ද්‍රව්‍යය එලෙස විස්තර වී විඥානය පිළිබඳ හැඟීම් මැවුම් කරුවාට හා දෙවියන්ට පූජා විය.

අධ්‍යාපනය අතින් දර්ශනය අතින් දැනුම වඩාත් සංවිධිත කරනු ලැබුවේ ග්‍රීක යුගයේදිය. කීර්තිමත් ගුරුවරුන්ට වඩා විවිධ ක්ෂෙත්‍රවලින් සිසුහු ගොනු වූහ. දර්ශනයට සොක්‍රටීස්, ඇරිස්ටෝටල්, පිලෝටෝ වැන්නෝද, චිත්‍රකර්මයට, තාක්ෂණයට ලියනාර්ඩෝඩාවින්චි, පයිතගරස්, වැන්නෝද, වෛද්‍ය ශාස්ත්‍රයට හිපොක්‍රටීස් වැන්නෝද වූහ. මේ වන විට උග්‍ර ආගමික මතයන්ගෙන් සැදුණු යුදෙව් ආගමික දහම හා පූජක ක්‍රියා වලිය ජනයා පෙළිමෙන් පැවති අතර, එයට ප්‍රතික්ෂෙපව එම මූලයන්ගෙන් බිහිවූ කතෝලික දහම නව අදහස් රැල්ලක් ලෙස පෙරට ආවේය. කතෝලික දහම වඩාත් සංවිධිත ලෙස, ඒ වන විට පැවතුණු සමාජය ආර්ථික තත්ත්වයන් හා බැඳුණු හෙයින් එවකට පැවති රෝම අධිරාජ්‍යද කතෝලික ආක්‍රමණයට හසුවිය. එහෙයින් රෝම අධිරාජ්‍ය පුරා කතෝලික දහම රෝමය මුල්කොට පැතිරෙන්නට විය. මේ වන විට තමන්ටම ආවේනික සංස්කෘතියක් හා ජාතියක් ලෙස නැගී සිටීමට රෝමයට යුද්ධය වශයෙන් යටපත්ව තිබූ ජාතිකත්වයන් ද එකිනෙකහි ම මේ දහම්වලින් ආකර්ශනය වූයේය. ප්‍රතිඵලය වූයේ යුද්ධ ශක්තියට අමතරව, විවිධ ජාතිකත්වයන් වෙනස්ව පැවතුනද ඒ සියල්ල නැවත මාධ්‍යට යොමු කරවන පොදු මාධ්‍යයක් ලෙස පීඩිතයන්ගේ දහමක් ලෙස මුල් බැස ගැන්මය.

12 වන සියවස වන විට කතෝලික ආධිපත්‍ය බටහිර වෙලා පැවතුන අතර ලතින් භාෂාව සම්භාව්‍ය භාෂාවක් ලෙස වර්ධනය වෙමින් පැවතින. ආර්ථිකමය ක්ෂේත්‍රයට ද වඩාත් සංවිධිත ස්වරූපයක් ඉසුලූ අතර විවිධ ජාතිකත්වයන් ද වඩාත් වැඩුණු ස්වරූපයක් දැරීය. කතෝලික දහමින් සංතෘප්ත නොවූ භෞතිකය කෙරේ වැඩි අවධානයක් යොමුවන්නට විය. යුදෙව් දහම හරයත් මධ්‍යයේ රැකගැනීම කතෝලික දහම ලෙස වර්ධනය වූවා සේම දැන් කතෝලික දහම පරයන අලුත් දහමක් වඩාත් සංවිධිත ස්වරූපයක් බටහිර ද්වි - ධ්‍රැව සමාජයට අවශ්‍යව තිබිණ. ස්වාධීන බුද්ධිමතුන් වෙනම විෂය පථයන් සමග සිටි අතර දැණුම් කේන්ද්‍රයන් ඔවුන් සමග විය. නූතන බටහිර විද්‍යාවේ විධි ක්‍රමයන් උපත ලබන්නට විය.

එක් පසකින් බටහිර විද්‍යාවේ දර්ශනයයෙන් ද, අනෙක් පසින් තම බලය හා සම්පත් බේරා ගැනීමටත් තම ජාතික අනන්‍යතාව රැක ගැනීමත් විවිධ ජාතීන් දැරූ දාර්ශනික හා එසේ නොවන උත්සාහයන්ගෙන් ද කතෝලික ඒකාධිකාරය කැලඹෙන ලකුණු පහලව තිබිණ.

කතෝලික දහමට වඩා තීරණාත්මක ලෙස මේ ප්‍රතිරොධයන් ජයගැනීම පිණිස තරග වදින්නට සිදුවිය. ප්‍රතිඵලය වූයේ උසස් අධ්‍යාපනික

ආයතන පිහිටු වීමය. මුලදී මෙවැනි උසස් අධ්‍යාපන ආයතන සහමුලින්ම පූජක පක්ෂයට පමණක් විවෘතව තැබිණ. ආගමික අධ්‍යාපනය මූලික විය. එහෙත් භෞතික ලෝකය ජයගැනීමේ අධ්‍යාපනය මූලික විය. එහෙත් භෞතික ලෝකය ජය ගැනීමේ අධ්‍යාශයෙන් ජනයා පෙරට ඇදෙන විට පවතින්නට නම් එයට අනුගත වන්නට කතෝලික දහමට බලකරණු ලැබීය. යුද තාක්ෂණය, නාවික විද්‍යාව, භාෂාව, සංගීතය, චිත්‍රකලාව ගොඩනැගිලි ශිල්පය ආදී දේ විෂය මාලාව වෙතට සැපැමිණ තිබිණ. ක්‍රමයෙන් ගිහියන්ටද උසස් අධ්‍යාපනය විවෘත වූ අතර බටහිර විද්‍යාව ද හැදෑරීමට ඉඩ පහසුකම් සලස්වනු ලැබීය.

මධ්‍යගත යුගය පසුකරන විට ආගමික වූ මෙන්ම ආගමික නොවූ පාසල්ද විය. දර්ශනය හා දේව ධර්මය පමණක් නොව වෘත්තීමය ප්‍රවීණයන්ගේ පාඨමාලා සැකසීමද විය. විශ්වයේ කෙළගණනක් වූ ජීවක්‍රියා වලින් ගෙන් එකක් වූ මිනිසා විශ්වය ම ජයගන්නට විශ්වවිද්‍යාල පිහිය වනු ලැබීය. මෙය පෙරදිග සරසවියෙන් වෙනස් වෙයි. පැරිස් විශ්වවිද්‍යාලය දර්ශනයට හා දේවධර්මයට ද, පැලර්ගෙන් වෛද්‍ය ශාස්ත්‍රයට ද බෙලෙංඤ්ඤෝ නිතියට ද ප්‍රසිද්ධ විය.

ප්‍රථම විශ්වවිදයාල බෙලෙංඤ්ඤෝවේ පිහිටි ආයතනය යැයි කියනු ලැබේ. මේ විශ්වවිද්‍යාලය පිහිට වූයේ උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමේ අරමුණින්ම පමණක් නොවේ. එවැනි අසංවිධිත ආයතන ඒ වන විටත් පැවතින. විශ්වවිද්‍යාල පිහිටවනු ලැබූයේ වරප්‍රසාද රැකීමේ අදිකාරියක්ද ලෙසය. ඇත්ත වශයෙන්ම වැඩවසම් පාලන තන්ත්‍රය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පරිපාලකයන් උපදේශකයන් ආදිය බිහිකෙරුම එහි අවශ්‍යයෙන්ම වූ පරමාථය විය. එහෙත් එය අපට වැදගත් වන්නේ විශ්වවිද්‍යාලයක් මූලික සංකල්පයක් වූ 'ස්වාධිකාරය' පිළිබඳව දැනගැනීමේදීය. තම අනාගත පාලකයන් හෝ පාලකයන්ගේ උපදේශකයන් සපයන විශ්වවිද්‍යාල වලට ගරුකටයුතු ලෙස සැලකිය යුතු පව පුරවැසියන් වෙත කාවද්දන ලද අදහස් විය. විශ්වවිද්‍යාල ලැබූ ස්වාධිනත්වය එය විය. වරක් නගරයේ වැසියන් සිසුන් හා ගුරුන්ගේ නිදහස්, හැසිරීම රටා වැලැක්වීමට යත්න දරන ලදී. නගරයේ පාලකයින්ට අවශ්‍යව තිබුණේද නගරයට ආඩම්බරයක් වූ විශ්වවිද්‍යාල ඉගෙනීමේ විශ්ව මධ්‍යස්ථාන බවට පාප්තුමා විසින් ද ස්ථිර කෙරුම නිසා බෙලෙංඤ්ඤෝ සිසුනගේ නිදහස සුරැකුන අතර පවතින නීති රාමුවට පිටින් සුවිශාල ස්වාධිපත්‍යක මූලික සංකල්පයක් ලෙසම පිළිගනු ලැබීය.

අධ්‍යාපනයේ මෙන්ම විශ්ව විද්‍යාල පද්ධතියේ පෙර නොවූ විරූ මහා පෙරළියක් වූයේ බටහිර විද්‍යාවද දර්ශනයද යෝද පිම් ආකාරයට

වර්ධනය වීම නිසාය. ඉන්දියාවේ සරසවි මෙන් ඇතිවී නැතිවී නොගොස් ක්‍රම ක්‍රමයෙන් දියුණුවට පත්වන්නට බටහිර විශ්ව විද්‍යාලවලට හැකිවිය. එයට විශාලම හේතුව නම් බටහිර විද්‍යාවේ වැඩීමය. ඉන්දියාවෙන් සමහර මූලික පදනම පවා උකහා ගනිමින් වැඩුණු බටහිර ඉතා කෙටි කලකදී ඉන්දීය ශිෂ්ටාචාරයන්ට හා විද්‍යාවන්ට වඩා වැඩුණු ඇයිද යන්න සලකා බැලිය යුතු කරුණකි.

බාහිර විද්‍යාව වැඩුනේ එයට පසුබිම් වූ දර්ශනය නිසාවෙනි. බටහිර ශිෂ්ටාචාරවල ජනයා ධ්‍රැවය වූ ප්‍රපීරෝධයන් සහිත ලෝක දැක්ම මෙයට හේතු විය. ඉන්දීය ජනයා ධ්‍රැවයෙන් ප්‍රතික්ෂප කළහ. සරල උදාහරණයක් කිවහොත් ධන (+) හා ඍන (-) සංඛ්‍යා ගැන අවබෝධයක් වෙසෙසින්ම (+) ධන දෙසට යොමු වූ දෘෂ්ටියක් බටහිරට තිබුණු නමුදු, (+)හෝ (-) හෝ සංඛ්‍යාවක් නොවන්න (හෝ ඒ දෙකම වන) ගුණය නොහොත් බිංදුව ඔවුනට වටහාගත නොහැකිවිය. එය උපත ඉන්දියාවය.

බටහිර විද්‍යාව සහමුලින්ම වැඩුනේ ධ්‍රැවයන් ගේ තර්ක ක්‍රමය වූ ද්විකොටික තර්ක ක්‍රමය යටතේය. දැණුම යනු ඒකක් යැයිද එය සරල රේඛීය යැයි ද දැණුම වර්ධනය කාලය සමග පෙරට යන්නේ යැයි ඔවුහු විශ්වාස කළහ. පැවතුන දෙය සත්‍ය නම් එහි ඉම් නිශේධය අසත්‍ය බැවු ද එහි විලෝමය ද එසේම බවත් ඔවුනගේ පදනම තර්ක ක්‍රමය විය. මෙය ප්‍රතිවිරෝධයන් වෙනුවට ප්‍රතිබන්ධනයන් ද, යමක් සහ එහිම නිශේධයේ අසත්‍ය බැව් ද එහි විලෝමය ද එසෙම බවත් ඔවුන්ගේ පදනම තර්ක ක්‍රමය විය. මෙය ප්‍රතිවිරෝධයන් වෙනස් විය. බටහිර ජනයා කරනු කඩා විශ්ලේෂණය කර දැණුම ලැබීම සම මග ලෙසද, මිනිසා පරිසරයෙන් වියුක්ත වූවෙක් බැවින් ඔහුගේ කාර්යය පරිසරය ජයගෙන අමරණීය වීම යැයි ද විස්තර කරන ලදී. එහෙත් සංස්ලේෂණය තම මග ලෙසද මිනිසා පරිසරය ජය ගෙන අමරණීය වීමට නොව ඇතිවීම නැතිවීම තේරුම් ගෙන පරිසරය සමග සහජීවනයට ඉන්දීය දර්ශනය යොමු විය.

ද්‍රව්‍යාත්මක හර පද්ධතිය මෙලෙස වූ පදනම තම දර්ශනය කර ගනිද්දී, විඥනික ලෙස විශ්ලේෂිත ආගමික සංස්ථාවන් වූ යුදෙව් හා කතෝලික - ක්‍රිස්තියානි ආගම් ද මෙවැනිම දර්ශනයක පිහිටීම නිසා තත්ත්වය වඩාත් වේගවත් වර්ධනයකට මගපෑදීය. පරිසරය ජයගනීමේ හා සියලු දේ දෙවියන් මවා ඇත්තේ මිනිසාගේ පරිභෝජනය යන අදහස් සරල දිවිපෙවත නොව වෙහෙසකර ශක්තිය කාබාසිනියා කරන සංකීර්ණ දිවිපෙවතක් වෙතට ජනයා යොමුකර විය. බලය, එය අත්පත් කර ගැනීම, පවත්වාගෙන යෑම පරිසරය මෙන්ම මිනිසාටද එරෙහිවූ යුද්ධය එය පවත්වාගෙන යෑම පරිසරයට මෙන්ම මිනිසාටද එරෙහි වූ යුද්ධය, එය පවත්වාගෙන යාම ආදී ලෙස වූ දයාර්ද්‍ර ක්‍රියාමාර්ගය, ද්‍රව්‍යලෝක කතරට සිහිල් බිඳක් වූ ආගම් හා දර්ශනය මගින්ද කුළු ගන්වනු ලැබීය. සියල්ල විශ්වාස කළ පරිදි ඉතිහාසයේ සරල රේඛීය මගේ දියුණුව උදෙසා පෙරට ඇදින.

දියුණුව ලබාගැනීමේ පියවර වූයේ තරගයයි. නිව්ටන් හා ලයිබ්නිට්ස් අතර තරගයෙන් ගණිතයේ කලනය ගොඩනැගුණාසේම කාල්මාක්ස් හා යුදෙව්වාදය අතර තරගයන් දර්ශනය වැඩී ගියා සේම බ්‍රිතාන්‍ය හා ප්‍රංශය අතර ගම්බිම් බෙදා ගැනීමේ තරඟයෙන් යුද්ධය ද වැඩී ගියේය. සරල රේඛාවේ ඊළඟ දියුණුව ලැබීම සඳහා ප්‍රතිරෝධයන් අතර පවතින තරඟයන් එක් අයකු ජය ලැබිය යුතුය යන්න විදික්‍රමය විය.

ඉන්දියානු දර්ශනය මෙන් බටහිර දර්ශනය සමස්තය ගැන සිතුවේ නැත. ඔවුන් සිතුවේ තම ප්‍රතිලාභය ගැන පමණි. උදාහරණයක් ලෙස විශ්වවිද්‍යාල ඇරඹීම ගත හැකිය. ලංකාවේ - ඉන්දියාවේ (බෞද්ධ) සරසවියක් ඇතිකරලීමට පෙර කරුණු රැසක් සලකා බලන ලදී. සරසවිය පවත්නා පරිසරය, ඇඳුරන් හා සිසුන් අතර සහසම්බන්ධය, පෞද්ගලික නොවූ සාමුහික අධ්‍යාපනයක ක්‍රියාවලිය, වියදමකින් හා ආර්ථික ප්‍රශ්න වලින් තොරව ඇඳුරන් හා සිසුන් නොවාසිකව එකම බිමක සිටිය යුතු බව, සරසවිය අභ්‍යන්තරයේ වූ මානසික නිදහස් හා ස්වාධීනත්වය ආදී ඒ මූලික සංකල්පය විය. ඉහත භාරතීය අධ්‍යාපන පීඨ යටතේ විස්තර කරන ලදී.

එහෙත් යුරෝපයේ පූර්ව සැලැස්මකින් තොරව විශ්වවිද්‍යාල අරඹන නේවාසිකාගාර නොවීය. කැරලි ඇතිවිය. පෞද්ගලික බැඳීම මත ඇඳුරන් අදහන ක්‍රමයන් විය. නොමිලේ ආර්ථික ප්‍රශ්න විරහිත අධ්‍යාපනයක් නොවීය. අද වනතෙක් කැරලි පවතී. ස්වාධිනත්වය පිරිනමනු ලැබුවේ චින්තනයේ මානසික නිදහස සලකා නොව අනාගත පාලකයින්ට වැඳ වැටිය යුතු ය යන ආකල්පය මතය. රෙදි කඩකින් දෙවුර වැසූ ඇදුරන් වෙනුවට දිලිසෙන ගාම්භීරත්වයෙන් යුතු උපාධි ලෝගු පැළඳ ගත් ඇඳුරන් විශ්වවිද්‍යාල හා සරසවිවල වෙනස සරලව අපට කියාපායි. බටහිර විශ්වවිද්‍යාල පිහිටුවීමේ දී අමතක කරන ලද සමස්තය නිසා උපන් අරගලය අද දක්වා ද පවතී.

ඒ කෙසේ වෙතත් ද්විකෝටික තර්ක ක්‍රමය ගුරුකොටගත් බටහිර විද්‍යාව අද මනුෂ්‍ය වර්ගයා පමණක් නොව මුළු මහත් පරිසරයේම අතිශය සංකීර්ණ තත්ත්වයකට ඇද දමා තිබේ. වර්ධනය වූ බටහිර විද්‍යාවන් ඇසුරේම උපන් න්‍යායන් එම විද්‍යාවට ම පහදාගත නොගෙන තත්ත්වයට පත්ව තිබේ. මුළු ජීව ක්‍රියාවලියේම අර්බුදයට ලක්ව තිබේ. මෙලෙස වූ අර්බුදයට ජීවය සැපයූ විශ්වවිද්‍යාල එකී අර්බුදය නිසාවෙන්ම අභ්‍යන්තර මෙන්ම බාහිර වූ, අධ්‍යාපනික මෙන්ම අනධ්‍යයන වූ ද අර්බුධයක් ගිලී පවතී. මෙය ධනපති ක්‍රමයේ අර්බුදය පමණක් නම් නොවේ. එයට එහා පැතිරී ගිය ලෝක දෘෂ්ටියක් අදට අවශ්‍යව ඇත. බටහිර විශ්වවිද්‍යාල ගුරුකොට ගත් බටහිර විද්‍යාව පරිසරයත් මිනිසාත්

විනාශකර ඇති සීමාවන් දකින විට නාලන්දාවේ හා මහා විහාරය ගුරුකොටගත් පැරණි දර්ශනයන් නැවත කුළු ගැන්විය යුතු තීරණාත්මක මොහොතකට ලෝකය සපැමිණ තිබේ.

## ● බ්‍රිතාන්‍ය අධ්‍යාපනය ක්‍රමයේ නැගීම

බටහිර අධ්‍යාපන ක්‍රමයේ උන්නතිය දැකීමටත්, අද ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන මාර්ගයේ අතීතය හැදෑරීමත් බ්‍රිතාන්‍ය සංස්කෘතිය හා අධ්‍යාපනික ඉතිහාසය හැදෑරීමට අත්‍යවශ්‍ය වේ. ඈත ප්‍රාග් - ඓතිහාසික යුගයක දකුණින් වර්තමාන ප්‍රංශයට ද නැගෙනහිරින් විශාල තැනිතලාවක මාර්ගයෙන් ජර්මනියටද බ්‍රිතාන්‍ය සම්බන්ධ විය. පසුව භූවිෂමතා වෙනස් විමකින් තත්ත්වය වෙනස්ව එය දූපතක් ලෙස වැඩෙන්නට විය. අවුරුදු දහස් ගණනක් ඇවෑමෙන් නව ජීවන ක්‍රමයක් අපට දත හැකිය. ඔවුන් නව ශිලා යුගයකට අයත් මිනිසුන් වූහ. ප්‍රථමයෙන්ම බ්‍රිතාන්‍යයට සංක්‍රමණය වූවෝ කෙල්ටික්වරුන් නමින් හඳුන්වති. ඔවුන් සතුව පූජක පන්තියක් වූ අතර ඔවුහු කෘෂික සංස්කෘතිය බ්‍රිතාන්‍යට හඳුන්වා දුන්හ.

මෙයින් පසු රෝම අධිරාජ්‍ය යුරෝපයේ පැතිරෙන්නට විය. හතරවැනි ශතවර්ශයේදී ක්‍රිස්තියානි සමයට ප්‍රධාන තැනක් ලැබුණු විට එක්සත් කිරීමේ තවත් බලයක් විය. නීතිය, භාෂාව හා සාහිත්‍ය පිළිබඳ පොදු අදහස්, ආගම් පිළිබඳ පොදු අදහසින්ද එහි සමස්තය ලෙස අධ්‍යාපනය නැමැති පොදු අදහසින්ද යුරෝපය පෙළෙන්නට වූ නිසාය. ආගම යුද්ධයට විරුද්ධව අධිරාජ්‍ය දුර්වල කළ ද, අනෙක් අතින් දේශපාලන බලය කේන්ද්‍රගත කළ හෙයින් වඩාත් ශක්තිමත් කළේය. ශූර පාලකයන් අතින් දෙවැනි කරුණ මොනවට සිදුවිණ.

ක්‍රිඃපූඃ 55 - 54 දී සීසර් ගේ ආක්‍රමණය පැහැදිලි රෝම ආධිපත්‍යට රට අසුවීමක් නොවීන. එහෙත් එයින් බ්‍රිතාන්‍ය රෝම අධිරාජ්‍යයේ සංස්කෘතියට හසු කිරීමේ ප්‍රථම ක්‍රියාවලිය ඇරඹින. ක්‍රි.ව. 450 වන විට ඉතා ආරූපික තත්ත්වයේ රෝම කතෝලික අධ්‍යාපනය ක්‍රමය අරඹා තිබිණ. එහෙත් ක්‍රි.ව. 450 - 600 අතර ඇන්ග්ලෝ සැක්සන්වරුන් ගේ ආක්‍රමණයට රට මුහුණ දුන් අතර රෝම අධිරාජ්‍යයෙන් සහමුලින්ම වෙනස් වූ රටක් බිහිවිය. ක්‍රි.ව. 597 බ්‍රිතාන්‍ය අධ්‍යාපනයට ඉතා වැදගත් වසරක් වෙයි. ශාන්ත ඔගස්ටිනෝ පැමිණීමෙන් කැන්ටබරියේත්, ලන්ඩනයේත්, රොචෙස්ටහිත් කතෝලික පාසල් තුනක් අරඹන ලදී. සැක්සන් එංගලන්තය වැඩුණු අතර එය ප්‍රධාන රාජ්‍යයන් තුනකට බෙදී ගියේය. එහෙත් සැක්සන්වරුන් අතර ක්‍රිස්තායානු දහම පිළිබඳ තැකීමක් නොවීන. ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමයත් මිෂනාරින්ගේ සංවිධානාත්මක බලය ඉදිරියේ සැක්සන්වරු පරාජය වූ හෝ අනුගත වූ හෝ අතර ක්‍රි.ව. 700 වන විට පාසල් 10ක් පමණ කතෝලිකයෝ පිහිටු වූහ.

නව වැනි ශත වර්ෂයේ ඩෙනිෂ් ආක්‍රමණයක් සිදුවූ අතර අල්ලා ගැනීමේ දුවැන්ත යුද්ධයක් බවට එය පරිවර්තනය විය. මේ වන විට නගර සියල්ලකම ලතින් භාෂාව ද, රෝමානු ආගමද පැතිර තිබූ අතර ඩෙනිෂ් අක්‍රමණයට එය ඍජුව හසුවිය. ගම්බදව සැක්සන් දිවි පෙවත ප්‍රචලිත විය. එහෙත් මහා ඇල්පඩුට් ගේ ඉදිරිපත් වීමෙන් ඩෙනිෂ් ආක්‍රමණික සිවරූපය මගහරවා ගතහැකි වූ අතර ඩෙනිෂ්වරුද එංගලන්තයේ කොටසක් විය. ක්‍රි.ව. 1066 දී නොර්මන්වරුන් එංගලන්තය ආක්‍රමණය කරන්නට විය.

මේ නොර්මන්වරු ප්‍රංශ භාෂාව කතා කරන, විද්‍යාවට අනුග්‍රහය දක්වන, ක්‍රිස්තියානියට උපස්ථාන කරන ගලින් ගොඩනැගිලි තනා නව සංස්කෘතියක් ගොඩ නැංවිය. නෝර්මන් විජයග්‍රහණය ඉංග්‍රීසින් ගේ හුදකලා බවද බිඳ දමා පෙර නොවූ පරිදි ඔවුන් ක්‍රිස්තියානිය රාජ්‍ය අවයවයක් කළේය. ඇත්ත වශයෙන් ම මෙය කතෝලික අධ්‍යාපනය ලැබූ ජයක් වූ අතර බ්‍රිතාන්‍ය ගැමි සැක්සන්වරු සහමුලින්ම අනුගත වී වැඩවසම් ක්‍රමය අරඹන මේ දිනවල අධ්‍යාපනය පූජක පන්තියට හිමිව තිබූ අතර ඔවුන්ගේ විෂයන් වූයේ ලතින් භාෂාවත්, සංගීතයත්, දේව ධර්මයත්, රාජ්‍ය පාලනයත්, ගොඩනැගිලි තැනීමත්, නැව් තැනීම ආදියය. එඩ්වඩ් රජුගේ කාලයේදී විවිධ ජාතීන්ගේ හා ආක්‍රමණිකයන්ගෙන් සැදුණු එංගලන්තය ජාතිය සිය ජාතිකත්වය සොයාගියහ. එහෙත් ක්‍රිස්තියානිය රාජ්‍යයේම අවයවයක් ලෙස පැවතින. මේවන විට රාජ්‍යයද වැඩුණු අතර, අධිකරණය, භාණ්ඩාගාරය, රාජ්‍ය සභාව ආදී ගෙස විධායක හා දේශපාලන බලය පවත්වගෙන යෑමේ සංවිධිත තත්ත්වය ගොඩනගන ලදී. දැන් අධ්‍යාපනයේ වැඩි වෙනසක් අවශ්‍ය විය.

මේ අවස්ථාවට උචිත ලෙස ස්ටුඩියම් ජෙනරල් නම් උසස් අධ්‍යාපන ආයතනය පිහිටුවන ලදී. මෙහිදී එංගලන්තය පොෂණය ලැබුයේ වෙනම වැඩුණු අයර්ලන්තයෙනි. සුප්‍රසිද්ධ අමා විද්‍යාලය එවැන්නක් වූ අතර එහි සිසුන්ගේ අයිතීන් හා යුතුකම් ද ගුරු වගකීම් හා යුතුකම්ද සංවිධිතව තිබූ අතර දිළිඳු සිසුන්ට සහන සැලසිණි. සමකාලීනව සැලර්නෝ, බෙලෙඤ්ඤෝ, පැරිස් විශ්වවිද්‍යාල පැවතුණු අතර 1185 ද ඔක්ස්ෆඩ් විශ්වවිද්‍යාලය එංගලන්තයේ පිහිටුවන ලදී. එතෙක් උසස් අධ්‍යාපනය සඳහා එංගලන්ත සිසුන් ඉහතින් සඳහන් කරන ලද විශ්වවිද්‍යාල කරා ඇදෙන ලදී. ප්‍රංශය හා දෙවන හෙන්රි අතර ඇතිවූ ආරවුලක් මේ විශ්වවිද්‍යාල ඇතිවීමට ආසන්නම හේතුවයි. එහෙත් නව එංගලන්ත ජාතික රාජ්‍යයේ වැඩීම වර්ධනය කෙරුමට අවශ්‍ය වූ උසස් අධ්‍යාපනය දැණුම ලබාදීමේ අවශ්‍යතාවය සමග එය සමාප්ත විය.

ඔක්ස්ෆඩ් සිසුන් හා නාගරිකයන් අතර ගැටුම් ඇති වීම නිසා 1231 දී කේම්බ්‍රිජ් සරසවිය ආරම්භ කරන ලදී. මේ විශ්වවිද්‍යාල දෙකේම අරමුණ වූයේ ආගමික හා වෙනත් අවශ්‍යතා සපුරාලන ලෙසයි. 19 වන සියවස තෙක් මේවා බ්‍රිතාන්‍යයේ

එකම විශ්ව විද්‍යාලය වූ අතර කල්යාමෙදී මේවා තුළ මතුවූ විවිධ ගැටුලු කැරලි හා රට තුළ වූ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් වර්තමානයේ පවතින විශ්වවිද්‍යාලයන්හි උපකුලපති, පියාධිපති ලෙස වූ අධ්‍යන මංඩලයන් ගේ සැකැස්මක් ලේඛණාධිකාරී ලෙස, උත්තර මණ්ඩල ලෙස, පාලක සභා සනාථ සභා ලෙස වූ පරිපාලන සේවාවලිනුත් සකසන ලදී. ඔක්ස්ෆඩ් හා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය දෙයාකාර විය. න්‍යායන්, පතපොත ඇසුර එකක් වූ අතර ඇඳුරන් හා වාද විවාදවලින් ගැටුලු නිරාකරණය දෙවැන්න විය. එය එක්තරා ආකාරයක අතදීමක් විය. වර්තමානයේ දී වාචික පරියේෂණ, න්‍යාය, නිබන්ධන ආදී ලෙස පරිවර්තනය වී ඇත්තේ මෙයයි. 1500 දී පමණ මේවායේ දේවධර්මය, නීතිය, වෛද්‍ය විද්‍යාව, තාරකා විද්‍යාව, භූගෝලය, සංගීතය හා සාහිත්‍ය විෂයන් විය. ෂේක්ස්පියර් දක්වා වර්ධනය වූ සාහිත්‍ය මේවායින් ඇරඹිණ. එසේම පසු කාලයේදී තාක්‍ෂණික විෂයන්, වෙනත් දර්ශනයන් ආදියට මෙහි ඉඩකඩ විවෘත විය.

1381 දී එංගලන්තයේ කැරලි ඇතිවිය. දාස භාවය, ඉඩම් නොමැතිබව, ක්‍රිස්තියානි දහම ආදියද අභියෝගයට ලක්විය. ජනතාව වෙනත් ආකාරයක අධ්‍යාපන ක්‍රමයක් හා පාලනයක් ඉල්වන බවත් වැඩවසම් ක්‍රමය ඇදවැටෙන බවත් පැහැදිලිවිය. පාප්තුමාගේ අධිකාරිය අභියෝගයකට ලක්වෙමින් එළඹී ටියුඩර් යුගය ධනපති ක්‍රමයේ පළමු මං සළකුණු ඇති කළේය. 15 වන සියවස වන විට යුරෝපය පුරාම තරඟය දල්වී තිබුණු අතර ධනපති ක්‍රමය කරලියට ඒමද, තම පැවැත්ම උදෙසා ආගමට අමතරව නව විද්‍යාවට ද ඉඩදීමට පාලකයන්ටද, සිදුවමින් පැවතින. එහෙයින් බටහිර විද්‍යා විෂයන් ද කතෝලික විෂය මාලාවට එක්විය.

එක් පසකින් විද්‍යාව ආගම සමග තරග වදිමින් සිටි අතර අනෙක් පසින් ජර්මනියේ ලූතර් වැන්නන් ගේ ආගම තුළ ම ඇති වූ කැරලිවළ උණුසුමද එංගලන්තයට දැනින. 8 වන හෙන්රි යටතේ එංගලන්තය ක්‍රිස්තියානිය රෝමයෙන් ස්වායත්තව වර්ධනය වූ අතර විද්‍යා අධ්‍යාපනයේ අවශ්‍යතාවත්, වැඩවසම් යුගයේ බිඳවැටීමත් ඇරඹිණ.

15 වන සියවසේ කේන්ද්‍රගත වූ බලය විහිඳවමින් එංගලන්තය ප්‍රංශය සමග යුද්ධය අරඹමින් සිටින විට පෘතුගාලය සයුර වටා අප්‍රිකාව තරණය කරමින් සිටියේය. මෙය අධිරාජ්‍යයන් සඳහා සෙසු රටවල්ද කැඳවන්නක් විය. අවි ආයුධ දියුණු කිරීම, නාවික විද්‍යාව, වෙළඳ කළමණාකරණය ආදිය අධ්‍යාපනික විෂයධාරාවන්ට ඇතුළු විය. යටත්විජිතකරණය පුළුල් වීමත් එහෙයින් විද්‍යා අධ්‍යාපනය දියුණු වීමත් එහි ප්‍රබන්ධයන් විශාල ලෙස ලියලා වැඩීමත් එංගලන්තය තුළ ප්‍රතිබන්ධයන් විශාල ලෙස ලියලා වැඩීමත් එංගලන්තය තුළ විශාල අධ්‍යාපනික ප්‍රබෝධයක් දල්වාලීය.

| | | | |
|---|---|---|---|
| වසර | 1812 | 1813 | 1830 |
| පාසල | 52 | 230 | 3670 |
| සිසුන් | 8620 | 40,488 | 3,46,000 |

මේ වන විට යටත් විජිත සහයෙන් යම් පමණකට යුරෝපීය ජනතාව තෘප්තිමත් වූ නිසා නව නිදහස් අදහස් වැඩියෙන් අවශ්‍ය විය. ප්‍රංශ විප්ලවයෙන් පසු, නැපෝලියන්ගේ ආක්‍රමණයවන්ගෙන් පසු එංගලන්තයේ නිදහස් අදහස් දින්තනය ශීඝ්‍රයෙන් පැතිර ගියහ. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බලය ක්‍රමිකව ජනතාව අතට පත්වූ අතර අධ්‍යාපනයෙහි නව ප්‍රබෝධයක් ඇතිවිය. 1604 දී රජය අධ්‍යාපනයට මැදිහත් වුවද පුනරුදය යටතේ එය ක්‍රියාත්මක වූයේ 1832 ට පසුවය. චාස්ටිස්ට් ව්‍යාපාරයද ඇමරිකාවේ සිවිල් යුද්ධයද නව පාඩම් රැසක් බ්‍රිතාන්‍යට උරුමකළ අතර නව අධ්‍යාපන රටාවන් සොයා යාමට ද අධිරාජ්‍ය පැවැත්ම සඳහා වඩ වඩා වැඩියෙන් කාර්මීකරණය වීමට ද එහෙයින් කාර්මික අධ්‍යාපනය නංවාලීමට ද සිදුවිය. විග් - ටෝරි දේශපාලන පක්ෂ ගැටුමද නව දේශපාලන දහරා බිහිවීමටද, කොන්සර්වේටිව - ලිබරල් ආර්ථික දේහය තුළය. මේවායේ දෝංකාරය බ්‍රිතානය යටත් විජිතවලට ද දැනෙන අතර එහෙයින් ලාංකික අධ්‍යාපන ව්‍යුහය කෙරේද තීරනාත්මක ලෙස බලපාන්නේය. 1844 දී Y.M.C.A. බිහිවීමද 1846 දී යුද්ධ පාසල් බිහිවීම ද එංගලන්තය තුළ අධ්‍යාපනයේ නව දිසානතියක් පෙන්නුම් කළේය. පශ්චාත් උපාධි ආයතනද, රාජකීය විද්‍යාඥයන් ගේ ආයතනද භෞතික, රසායනික, ගණිත, ජීව, පරිසර ආදී ලෙස විද්‍යාවේ විවිධ අංග ද බිහිවීමත් ඒවා වැඩීයාමත් දක්නට ලැබිණි. මෙ නව සොයාගැනීම් ලෝකය නව යුගයකට ගෙන ගිය අතර විශාල අධ්‍යාපනික ප්‍රගතියක් ද උදා කළේය.

අද ලංකාවේ පවතින පාසැල් හා විශ්වවිද්‍යාල සෑම එකක්ම මෙකී බ්‍රිතාන්‍ය ආකෘතිය මත තනන ලද ඒවාය. ඒවායේ පොදු බටහිර ස්වරූපයක් ද වේ. අද ද සමහර විෂය නිර්දේශයන් පරිපාලන උපක්‍රම ආදියද සියල්ල තීරණය කරන්නේ බ්‍රිතාන්‍ය හා ඇමෙරිකාවේ සම්මතයන්ට අනුවය.

## 2. ලංකාවේ විදේශ අධ්‍යාපනය

### ● පෘතුගීසීන් යටතේ අධ්‍යාපනය

1505 දී මෙරටට ගොඩබට පෘතුගීසී ආක්‍රමණිකයෝ 1597 දී කෝට්ටේ රාජධානිය ද 1621 දී යාපනේ රාජධානියද යටත් කර ගත්හ. පෘතුගීසීන් සිය පාලන බලප්‍රදේශයන් පාලනය කළේ කෝට්ටේ සිංහල රජ දවස පැවති පාලන රටාවන් ම උපයෝගිකර ගනිමිනි. පෘතුගීසි යටත් ප්‍රාදේශ ඔවුන්ගේ සංස්කෘතිය විසින් ගිලගත් අතර කතෝලික

ආගමද සුදු ජන වර්ගය ද අපගේ සංස්කෘතික ප්‍රවාහයට එක්විය.

ක්‍රමික කතෝලික ජනයාගේ වැඩීම ද සමග ක්‍රිස්තියානි ආගමේ උගැන්වීමේ කටයුතු සඳහා මිෂනාරීන් ගේ ප්‍රථම ආගමනයන් සිදුවිය. ප්‍රැන්සික්වරුන්, ජේසුයිට්වරුන්, ඩොමිනික්වරුන් හා ඔගස්ටිනියයන්වරුන් එවැනි මිෂනාරි කණ්ඩායම්ය. මෙරට මුලින්ම පැමිණි ප්‍රැන්සික්වරුන් ගේ ප්‍රථම ජයග්‍රහණය වූයේ බුවනෙකබාහු ඇවෑමෙන් රජවූ ධර්මපාල කුමරුවා (1557) දොන් ජුවන් නමින් කතෝලික ආගම වැළඳ ගැනීමය. මේ මුල් මිෂනාරිවරුන්ට භාෂාව පිළිබඳ ගැටලු වූ අතර ඔවුන් ධර්මයට දේශනා කළේ පරිවර්තකයන්ගේ සහයෙනි. ඔවුන් විසින් ප්‍රථම පෘතුගීසී අධ්‍යාපනය පාසැල් ආරම්භ කල අතර ඒවා පැරිස් පාසල් හා විද්‍යාල යනුවෙන් බෙදා තිබිණි. පැරිස් පාඨශාලා කුඩා ගැමි පාසල් වූ අතර විද්‍යාලයන් නාගරිකව පැතිරි තිබිණ. කොළඹ සෙන්ඇන්ටෝනියන් එලෙස ඇරඹූ ප්‍රථම විද්‍යාලයයි. මොවුන්ගේ විෂය මාලාවට ආගම කියවීම ලිවීම ලතින් භාෂාව හැදෑරීම සංගීතය, සුචරිත ධර්ම ආදිය ඇතුළත් විය.

ජේසුයිට් නිකායික පිරිස් 1602 මෙරටට පැමිණීම කතෝලික ධර්ම මිෂනාරි අධ්‍යාපනයේ ද නව යුගයක් විය. මොවුන් විසින් සිංහළ දෙමළ භාෂාවන් හැදෑරූ අතර ඒ තුළින් එතෙක් ස්වදේශික ජනතාව වෙතට යෑමට වූ එක් බාධාවක් පියමන් කළහ. මොවුන් ඉතා දක්ෂ ආගම් ප්‍රචාරකින් පිරිසක් වූ අතර ගම්වලට වැදී එහි ජනතාව සමග ජීවත් වෙමින් සුභසාධන ක්‍රියාදාමයන් ඉටු කරමින් ඉතා සාර්ථක ලෙස ආගම පැතිරවීමට සමත් වූහ. මොවුන් යටතේ ද්විතීක අධ්‍යාපනය ඇරඹුණු අතර පූජක වරුන් සඳහා සෙමනෙරිවල 'දේවධර්ම විදයාව' ලතින් බසින් ඉගැන් වූහ.

ඉන්පසු ඩොමිනිකන්වරු සහ ඔගස්ටින්වරුන් ද පැමිණීම නිසා ප්‍රදේශබදව එක් එක් මිෂනාරි නිකායන්ට වැඩෙන්නට සලස්වන ලදී. පාසැල් සඳහා පුද්ගලික ආධාර ද, බෞතීස්ම වූ දොන් ජුවන් විසින් පන්සල්වලට පැවරූ නින්දගම්වලට ආදායම් ද පල්ලියට ලැබෙන්න සැලැස්වූ හෙයින් ඉතා ඉක්මනින් පෘතුගීසී අධ්‍යාපනය පැතිර ගියේය. තම ආගම හා සංස්කෘතිය අන්සැමට වඩා උසස් යන මතය අන්සැම ආක්‍රමණිකයන් මෙන්ම පෘතුගීසීන් ද ඇදහූ අතර ලෙයින් කරන ලද අපරාධ සියල්ලම මිථ්‍යාදෘෂ්ටිකයින් කතෝලික කරණය කෙරුමෙන් සහායත්වය කරා පැමිණ වීමේ යටතේ සාධාරණීකරණය කරන ලදී.

### ● ලන්දේසීන් යටතේ අධ්‍යාපනය

ස්පාඤ්ඤ අධිරාජ්‍යයෙන් ගැලවුණු ඕලන්දය සෞභාග්‍ය පතා යටතේ විජිත ආක්‍රමණයේ යෙදුණු අතර 1639 දී මඩකලපුව හා ත්‍රිකුණාමණය පෘතු-

ගීසීන් වෙතින් අල්ලා ගත්හ. 1656 දී කොළඹ ද 1659 දී යාපනයද අල්ලා ගැනීමෙන් පසු ආක්‍රමණය සම්පූර්ණ විය.

ලන්දේසින්ට යටත් ප්‍රදේශවල වෙරළ බඩ මායිම් එතරම් ස්ථායි නොවූ අතර කන්ද උඩරට ආක්‍රමණ වලට අනුව ඒවා සකස් විය. පාලන බල ප්‍රදේශ පහසුව තකා යාපනය කොළඹ හා ගාල්ල ලෙස නම් කර තිබුණ අතර කන්ද උඩරට රාජධානියෙන් වඩාත් ඈත්ව පිහිටීම නිසා යාපන ප්‍රදේශ කතෝලික ආගම් හි අධ්‍යාපනය අතින් වේගවත් දියුණුවක් ලැබීය. ලන්දේසින්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ වෙළඳාමෙන් ලාභ ඉපයීමය. ඒ සඳහා ඔවුන් විසින් ආධිපත්‍ය පතුරවා ලීමේ මාධ්‍ය ලෙස ලන්දේසි රෙපරමාදු ධර්මය භාවිතා කරන ලදී. ලන්දේසින් පෘතුගීසින්ට වඩා තියුණු බලපෑම් සහිත ජාතියක් විය. ශවුන් විසින් ලංකාවට රෝම ලන්දේසි නීතිය හඳුන්වාදෙන ලද අතර මුද්‍රණ ක්‍රමය ද, ගෘහ නිර්මාණ ශිල්පය ආදී තාක්ෂණික ක්‍රියාදාමයන් ද මෙරට ආර්ථික - අධ්‍යාපනය ක්‍රියාවලියට එක් වූහ.

ලන්දේසි විසින් පෘතුගීසීන් හා වෛර නිසා කතෝලිකයන්ට හිරිහැර සිදුකළ ද අසරණ වූ කතෝලිකයෝ වඩ වඩාත් රට තුළට කාවැදුනේ සිංහල ජනයාගේ අනුකම්පාව ලදහ. ප්‍රතිඵලය වූයේ පොදුවේ ප්‍රතිවිරෝධතා පැවතුනද ක්‍රිස්තායානි ධර්මයට පැතිර යාමය.

මුල් යුගයේදී ලන්දේසින් විසින් පැරිස් පාඨශාලා ද, අනාථ දරු මඩම්ද පිහිටුවනු ලැබූ අතර මේවායේ මූලික ආගමික අධ්‍යාපනය ද, ලන්දේසි සංස්කෘතියට එකඟ වූ වෘත්තීමය පුහුණුවක් ද ලබාදෙන ලදී. 1663 දී පිහිටුවනු ලැබූ පාසැල් මඩල්ල ලන්දේසි අධ්‍යාපනය පරිපාලනයේ මූලස්ථානය විය. මුල් යුගයේදී පාඨශාලාවලට අධ්‍යාපනය කියවීම, ලිවීම ආගම දැනුම පිළිබඳ ප්‍රශ්න ඇසීම, දසපනත ආදී ලෙසද ආගමික අධ්‍යාපනය ලබාදීම ලෙස විය. පාසැල් සෑම වයස 15 තෙක් අනිවාර්ය වූ අතර එය පැහැර හරින්නන්ගේ දඩ මුදල් අය කරන ලදී. බාලිකා අධ්‍යාපනයද, මහළු ජනයා සඳහා අධ්‍යාපනය විවිධාකාර විය. කෙසේ වෙතත් ලන්දේසි යුගයේ දී විශේෂයෙන් යාපනය ප්‍රදේශයේ බටහිර ක්‍රිස්තියානි ආගමික දැණුමද අධ්‍යාපන දැණුමද යම් පමණකට බටහිර විද්‍යානුකූල දැණුමද පැතිර ගිය අතර එය රජය යටතේ සෘජුවම පාලනය වීම විශේෂ සිද්ධියකි. 1690 දී යාපනයේ නල්ලූර්හිදී සෙමනේරි පිහිටුවීම හා පසුව කොළඹ සෙමනේරි පිහිටුවීමද ඉතා වැදගත් පියවරයන් දෙකකි. උසස් ආගමික අධ්‍යාපනයක් ලබාදීම මේවායේ සිදු වූ අතර සමහර ශිෂ්‍යයන් ඕලන්දයේ විශ්වවිද්‍යාල කරා ද යොමු කරන ලදී. ගුරු අධ්‍යාපනයද ක්‍රමවත් වූ අතර ගුරුවරුන් පුහුණු කරන පාසලක්ද විය.

ලන්දේසි අධ්‍යාපනයේ ඉතා වැදගත් ප්‍රතිඵල නම් සංවිධානාත්මක නීති ක්‍රමයක් හා අධ්‍යාපනික රටාවක් හඳුන්වාදීමත්, කතෝලික

ආගම් උසස් ධර්මයන් පිළිබඳව මෙරට උසස් අධ්‍යාපන ආයතනයන්ද ඕලන්දයේ ලෙඩින් වැනි විශ්වවිද්‍යාල දක්වා පැතිර ගිය අධ්‍යාපන රටාවක් පැතිරයෑමත්ය. මෙසේ වූ ආගමික අධ්‍යාපනයට අමතරව ලන්දේසි සංස්කෘතියට එකඟ වූ වෘත්තීය පුහුණුවීම හා තාක්ෂණික ඥානය ද යම් ප්‍රමාණයකට මෙරටට උරුම විය. කෙසේ වෙතත් අවසන් ප්‍රතිපලය නම් ඉතා ශීඝ්‍ර අයුරින් ලංකාව ක්‍රිස්තියානීකරණය වීමය.

**● ඉංග්‍රීසින් යටතේ අධ්‍යාපනය**

ප්‍රංශය සමග බ්‍රිතාන්‍ය කළ අධිරාජ්‍ය යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස 1796 දී ලංකාව ඉංග්‍රීසි අධිරාජ්‍යට නතු විය. මුලදී ලංකාව පාලනය කෙරුම මධුරාසියේ සිට සිදුකරන ලද හෙයින් එතරම් සැලකිල්ලක් කිසිදු ක්ෂේත්‍රයක දක්නට නොලැබිණි. වෙළඳ සමාගමේ අර්ථය ලාභ ලැබීම වූ හෙයින් අධ්‍යාපනය ආදී දීර්ඝකාලීන ආයෝජනයන් සම්පූර්ණයෙන්ම අමතක කරනු ලැබූ අතර එවකට වැඩි අවධානයක් යොදවනු ලැබුවේ යටත් කර ගැනීමත්ය. මේ පීඩාවන්ට එරෙහිව 1797 දීම කැරැල්ලක් ආරම්භ විය.

ලන්දේසින් යටතේ මනාව සංවිධානය වී තිබූ අධ්‍යාපන රටාව මේ යුද ආණ්ඩුව වකවානුවේදී පිහිටීමට ලක්වූ අතර 1613 දී අධ්‍යාපන අධිකාරි පණතකින් ඉන්දියානුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ වගකීම පෙරදිග ඉන්දියා සමාගමට ලැබීමත් සමග දේශීය අධ්‍යාපනය දෙසට ද ඇස යොමු කරන ලදී. කෙසේ වෙතත් මේ යුද්ධයේදී 1798 නෝර්ත් ආණ්ඩුකාරයාගේ පැමිණීමත් සමගම අධ්‍යාපනය සඳහා නැවත සිත යොමු කරන ලද අතර ජේම්ස් සෙන්ඩිනර් ප්‍රමුඛ ලන්ඩන් මිෂනාරි සමාගමේ මිෂනාරින් ලංකාවට පැමිණීමත් සමගම සංවිධානාත්මක ලෙස අධ්‍යාපනය පැතිර යන්නට විය

මේ මිෂනාරින් පැමිණීමත් සමග පැරිස් පාසල් ප්‍රතිසංවිධානය කළ අතර මනා පරිපාලන සම්බන්ධතාවයන් ද පවත්වා ගන්නා ලදී. විෂය මාලාවට කියවීම, ලිවීම, අංක ගණිතය, ආගමික දැණුම, බයිබලය හැදෑරීමද ඇතුළත් විය. එහෙත් ලන්දෙසි යුගය මෙන් පාසැල් අධ්‍යාපනය අනිවාර්ය කිරීමක් නොවූ හෙයින් ඉතා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් මේවාට සහභාගි විය. පැරිස් පාඨශාලාවලට වඩා උසස් අධ්‍යාපනය අධ්‍යාපනයක් ලබාදිය යුතු යයි නොර්ත් ආණ්ඩුකාරවරයා තීරණය කළේය.%

"මුදලි තනතුරුවලටත් රජයේ වෙනත් නිලවලටත් පත්වීම් ලැබීම්වලට සුදුසු පවුල්වලට අයත් ස්වදේශිකයන්ගේත් ලන්දේසින්ගෙත් දරුවන් උදෙසා උසස් පාඨමාලා කිහිපයක් ඇතිකෙරුම මගේ බලා පොරොත්තුව වේ". මෙකී පරමාර්ථ ඉෂ්ඨ කරගැනීම සඳහා උසස් අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් හෙවත් ඇකබමයක් කොළඹ පිහිට විණ.

මෙහි ශිෂ්‍යයන්ගේ නවාතැන් , ආහාර, අධ්‍යාපනය හා ඇඳුම් ආදිය රජයේ වියදමින් ලබාදෙන අතර ගොස්තු සේවා අධ්‍යාපනය ලබන්නන්ද සිටියහ. මෙලෙස දීර්ඝ කාලීන බලාපෙරොත්තු මත යටත් විජිතයේ ආර්ථිකය වැඩීමත් සමගම මව් රටින් ස්වායත්තව වැඩෙන්නට සකස් කරලීමත් වැඩෙන ධනපති ක්‍රමයේ ඒ තුළ රක්‍ෂණය කෙරුමත් ඉංග්‍රීසි සංස්කෘතිය හා ආගම පැතිර වීමත් මෙහි මූලික අරමුණ විය. එහෙත් අධිරාජ්‍යයේ උපදෙස් පරිදි රජය වියදම් කපාහැරීමක් 1803 දී සිදු වූ අතර එයින් අධ්‍යාපන රටාවට තාවකාලික පසුබෑමක් ඇති විය. 1805 දී නෝර්ත් ආණ්ඩුකාරයා ද විශ්‍රාම ගත්තේය.

ඉන්පසු මේට්ලන්ඩ් ආණ්ඩුකාර යුගයේදී නව ප්‍රබෝධයක් හෝ ජීවයත් නොවිණ. පාසැල් වාසා දමුණු අතර කොළඹ ඇකඩමයද එක්සත් පාසලක් බවට පත් විය. කේසේ වෙතත් මේවන විට එංගලන්තයට ආපසු ගිය නෝර්ත්, ජෙම්ස්, සෙන්ඩිනර් වැන්නවුන්ද බූකනන් නම් දේවගැතියෙක්ද ආගමික අධ්‍යාපනය විනාශ කරතියි මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාටත් පොදුවේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියටත් පහර දීමේ හේතුවෙන් නව ප්‍රතිසංස්කරණ ඇති කෙරුම සිදු විය.

1812 - 1820 පාලනය ගෙන ගිය බ්‍රවුන්රිග් යුගය අතිශය තීරණාත්මක විය. කපටි හා දක්‍ෂ පාලකයෙකු වූ ඔහු අධිරාජ්‍ය ඉදිරියේ මනාව සලකුණු කරමින් කන්ද උඩරට ද අල්ලා ගනිමින් 1815 දී ලංකාව පූර්ණ යටත් විජිතයක් බවට පත්කර ගත්තේය. දැඩි ක්‍රිස්තු භක්තිතයෙක් හා දීර්ඝ ලෙස සකස් කරන ලද අධිරාජ්‍යක සිහින දකින්නෙක් වූ මොහු නැවත ක්‍රිස්තියානි ආගම නගාසිටු වන්නට විය. මුළු රට යටත් විජිතයක්ව පැවති හෙයින් දැන් මුළු රට තුළම බ්‍රිතාන්‍ය ධනපතික්‍රමය ද සංස්කෘතිය ද පතුරවා පූර්ණ යටත් විජිතයක් බවට පත්කෙරුමේ කාර්යයද ඔහු විසින් ආරම්භ කරන ලදී.

ලංකාව තුළ එංගලන්ත සභාව නීතිගත වීම නිසාත් වෙනත් නිකායන් වෙත බ්‍රවුන්රිග් දැක්වූ සමගිය නිසාත් 1818 දී කැරැල්ල මැඩ පවත්වා දේශපාලන වශයෙන් ස්ථාවර වීම නිසාත් අධ්‍යාපන රටාව නව ප්‍රවේශයකින් වැඩෙන්නට විය.

රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම එංගලන්ත සභාවට අයත් විය. 1830 පාඨශාලා සහ ශිෂ්‍ය සංඛ්‍යාව.

| පාඨශාලා වර්ගය | මුළු ගණන | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| මිෂනාරි | 236 | 9274 |
| රාජ්‍ය | 97 | 1914 |
| පෞද්ගලික | 610 | 8424 |

මෙයට අමතරව බෞද්ධ පන්සල් ඇසුරෙ පාඨශාලා 44 ක් (1827) පැවති බැව් ද සැලකිය යුතුයි. මේ සියලු කරුණු කෝල්බෲක් කොමිසම

champikaranawaka.lk

champikaranawaka.lk

ස්වාමි විවේකානන්ද වැන්නවුන් ද 1875 දී අලිලාරිනි ඉංග්‍රීසි - මුස්ලිම් පාසලක් ඇති කළ සර්අයිඩ් අහමඩ් කාන් මුස්ලිම්මුන්ට බලපාන ලදී. එහෙත් බෞද්ධයන්ට බෙහෙවින් ම බලපාන ලද්දේ ඇමෙරිකානු ජාතියකු වන හෙන්රි ස්ටීල් ඔල්කට් තුමාගේ පරමාවිඥානාර්ථ ව්‍යාපාරයයි.

## ● පරම විඥානාර්ථවාදීහු

පරම විඥානාර්ථ සමාගම රුසියානු ගුප්ත විද්‍යාඥයකු වූ හෙලේනා බැලැවැට්ස්කි සහ ඇමෙරිකානු නීතිඥයකු වූ කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් විසින් 1875 දී ආරම්භ කැන ලදී. මෙය විශේෂයෙන් ඇති කරන ලද්දේ පෙරදිග දර්ශනයන් හා විධික්‍රමයන් ඇති කරන ලද්දේ පෙරදිග දර්ශනයන් හා විධික්‍රමයන් හැදෑරීමේ ආයතනයක් ලෙසය. මොවුන්ට දැඩි ක්‍රිස්තියානි විරෝධයක් තිබුණු අතර නිදහස් මතයක්ද තිබිණි. 1878 දී මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි ගේ පානදුරාවාදය කියවා තෘප්තිමත් වූ ඕල්කට් තුමාගේ අදහස් අනුව ගුණානන්ද හිමි, සුමංගල හිමි ඇතුළු තවත් බෞද්ධ නායකයින් කිහිම දෙනෙක් පරම විඥානාර්ථ සමාගමට බැඳුනහ. 1881 දී ලංකාවට පැමිණ රටපුරා සංචාරය කළ ඕල්කට් තුමා නිසාවෙන් බෞද්ධ පාසැල් අරමුදලක් පිහිටුවනු ලැබූ අතර 1886 දී ආනන්ද විද්‍යාලයද 1899වන විට තවත් පාසැල් 120 ක් ද ඇති විය. බෞද්ධ ප්‍රබෝධයද පෙරට ඇදී ගිය අතර ගුණානන්ද හිමියන් විසින් කොළඹ නගරය තුළ ම පැසැල් පිහිටුවීමෙන් ප්‍රවේගවත් ගමනක යෙදුනහ. බෞද්ධයන්ට සමරූපීව මේ වන විටත් 1849 දී පිහිටුවනු ලැබූ සයිස් ප්‍රකාශන වැනි හින්දු පාසැල් අරභයා ද පොදු ජාතික අනන්‍යතාවයක් කරා ජාතියට පියනගමින් සිටි බව පැහැදිලිය.

කෙසේ වෙතත් විකල්පයන් ලෙස ඇතිකරන ලද මේ පාසැල් වෙතින් ජාතික සුවඳ වහනය වූ වුවද පිබිදිය යුතු අතිවිශාල දේශීය ජනතාවගේ සුවඳ කැට් නොවීය. ඒවායේ විෂය මාලාව සැකසුනේ බ්‍රිතාන්‍ය ආකෘතිය මතමය. ඕල්කට් විදේශිකයකු වීම නිසාවෙන් ඔහු අපගේ පැවති සම්ප්‍රදාය නිසි අයුරින් ග්‍රහණය නොවීම අරුමයක් නොවේ. එලෙසම 1505 සිට පරිහානිය කරා යමින් විශේෂයෙන්ම 1815 දී යටත් විජිත තත්ත්වයට පැමිණීමෙන් පසු ආර්ථික - සංස්කෘතික යුදමය අක්‍රමණයකින් පසුව අපේ උරුමය මත අපේම හර පද්දතියකින් බැලීමට අවශ්‍ය විශාල ජව වේගය මෙවන විට නොතිබිණ. ඒ නිසාවෙන් බ්‍රිතාන්‍ය සංස්කෘතිය මත සිට ගනිමින් ඔවුන්ගේ අධ්‍යාපන උපක්‍රමයන්, විධික්‍රමයන් හා විෂය මාලාවන් නිවට අයුරින් අනුකරණය කරමින් මේ බෞද්ධ පාසැල් සැකසිණි. ඒවා ක්‍රිස්තියානිකරණයට එරෙහිවූයේ රාජකීය. සෙන් තෝමස්, සෙන් බ්‍රිජට් වැනි තරඟකාරී ක්‍රිස්තියානී පාසැල් පළමු පෙළේ පැවැත්මට එරෙහිව මිස ඒවායේ හර පද්දතියට විකල්ප හර පද්දතියක් ගොඩනැංවීමට නොවේ. මෙය බරපතල අඩුවක් වූ අතර මේ ප්‍රවනතාවයන් අද දක්වාම පැවැත්ම එයටත් වඩා කනගාටු දායක වෙයි.

● **පිරිවෙන් අධ්‍යාපනය**

බටහිර අධිරාජ්‍ය යුගයේ විද්‍යාස්ථාන ඇති වූයේ වැලිවිට සංඝරාජ මාහිමියන්ගෙනි. එහෙත් උන්වහන්සේගෙන් පසුව රටතුළ ධර්ම ශාස්ත්‍රය ඉගැන්වූ කිසිවෙකු අතින් පිරිවෙන නමින් ආයතන පිහිටුවා ක්‍රමානුකූල ඉගැන්වීමක් සිදු නොවිණ. එහෙත් පැවති තත්ත්වය තුළ වළානේ ශ්‍රී සිද්ධාර්ථ හිමිපානන් වහන්සේ විසින් රත්මලානේ පරම ධම්ම චේතිය විද්‍යායතනය ඇති කෙරුම තීරණාත්මක මංසන්ධියක් විය. ඒ හිමියන්ගේ ගෝලයෙක් වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හිමිපාණන් 1873 දී ගිහි පැවිදි සිසුන් හත් දෙනෙකුගෙන් විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළහ. ඒ 'පිරිවෙන' නමින් ඇතිකළ ප්‍රථම අධ්‍යාපනික මධ්‍යස්ථානයයි. 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් විසින් පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කරන ලදී. එතැන් පටන් ප්‍රධාන දේශන අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස විදුදය - විදුලකර පිරිවෙන් පෙරට එන ලදී.

විද්‍යෝදයේ පිරිවෙණ් ආරම්භයේ පටන්ම පැවිදි ශිෂ්‍යයාට ධර්ම විනය, තර්ක ශාස්ත්‍රය, ඡන්දෝලංකාර, ශබ්ද ශාස්ත්‍රාදිය සහිත සිංහල. පාලි, සංස්කෘත භාෂා ද ගිහි ශිෂ්‍යයන්ට තර්ක ශාස්ත්‍රය ඡන්දෝලංකාර, සිංහල, සංස්කෘත ආදියට අමතරව ගණිතය හා වෛද්‍ය ශාස්ත්‍රය ද උගත් වන ලදී. බෞද්ධ පාසැල්වලට හා ක්‍රිස්තියානි පාසැල්වලට ප්‍රතපක්ෂව විකල්ප හර පද්දතියක් මෙ පිරිවෙන් ඇසුරෙන් ලබාදෙන ලදී. ඇදුරන් හා සිසුන් ධර්ම චින්තනයේ බැඳී කටයුතු කළ අතර ස්වභාෂාවන්ගෙන් ස්ව උරුමය හා බැඳුනු පෙර පැවති ලෙස වූ පූර්ණ නිදහස් අධ්‍යාපනය භුක්ති වින්දාහ. ජනතාව පිරිවෙන් රැකගත් අතර ජනතාව රැකීමට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කිරීම පිරිවෙන් මගින් සිදුවිය.

මින්පසු පිරිවෙන් අධ්‍යාපනය සිසුන් අතර ප්‍රචලිතව ගිය අතර රත්මාලාන පරම ධම්ම චෙතීය පිරිවෙන 1887 දී ආරම්භකරන ලද්දේ විද්‍යෝදය ශාඛාවක් ලෙසය. 1913 වන විට වැලිගම අග්‍රබෝධි, මාතර සුදර්මදින්න, කළුතර සුදර්ශන, පානදුරේ ශ්‍රී සද්ධර්මෝදය, මහනුවර සංඝරාජ ආදී පිරිවෙන් තිස් ගණනක් විය. මේ පිරිවෙන් සඳහා 'ඩෙන්හැම්' අධ්‍යාපන අධ්‍යක්ෂව සිටිය දී රජයෙන් ද නඩත්තු මුදලක් ගෙවන ලදී. 1943 කන්නන්ගර පනතින් පිරිවෙන් වඩාත් තියුණු ලෙස ආධාර ලබන්නට විය. එය වෙනස් 1987 දී ජයවර්ධන රජයෙනි. 1987 දී රජය පිරිවෙන් ආධාර නතර කළ අතර පිරිවෙන් වැසියන්ට විය.

විද්‍යොදය - විද්‍යාලංකාර පිරිවෙන් දෙක 1959 දී විශ්වවිද්‍යාල තත්ත්වයට දියුණුවීම ඓතිහාසික විකල්ප අධ්‍යාපන රටාවක් ඒ තුළින්

බලාපෙරොත්තු වුවද අද ඒ සරසවි දෙක දෙස බැලීමේදී බටහිර අධ්‍යාපනයට වෙනස් පද්දතියක් දැකිය නොහැකිය.

## ● වතු පාසැල්

1830 බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කරන ලද කෝපි වගාවත් ඉන්පසු ඇතිකරන ලද තේ වගාවත් පාරම්පරික උඩරට නිජ භූමිවලින් ජනයා පන්නා දමා බලය මත සිදුකරන ලද්දකි. මේ වතුවග වැඩට ඒමට නිවට නොවූ සිංහලයන් අකමැති වීම නිසා ඉන්දියානු දෙමළ කම්කරුවන් ගෙන්වීමට සිදුවිය. පරම්පරාගණනක් වතු පොළව මත තම දහඩිය හෙළීමෙන් පසු ඔවුන් ද භූමියේ වහලුන්ගේ තත්ත්වයට පත්වූයේ ඉඩම් අහිමිකරන ලද සිංහලයන් කුඩා ගම්වල නිරාදූක් විඳිද්දීය.

1908 අංක 8 දරණ අධ්‍යා පනතේ v වැනි කොටස් යටතේ ප්‍රථම වරට වතුපාලකයින්ට වතුවල සේවය කරන කම්කරුවන් ගේ වයස 6 - 10 දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ අනිවාරයය කෙරිණි. එය ඉතා නින්දා සහගත දිවි පෙවතක් ගෙන ගිය දෙමළ කම්කරුවන්ට යම් සහනයක් විය. මෙහි විෂය මාලාව ලිවීම, ගණිතය, බාසාව, ක්‍රීඩාද ගැහැණු ළමයින්ට මැහුම් ගෙතුම් සෞඛ්‍ය හා සමාජ විද්‍යාව ද ඇතුළත් විය. මෙය හුදු පීඩාකාරී තත්ත්වයන් වතු කම්කරුවා මුදාලීමක් නොවූ අතර උසස් අධ්‍යාපනයේ වරම ඔවුන්ට අහිමිකර තිබුණි. කන්කානිවරු, ලිපිකරුවෝ අඩු මුදලට මිලදී ගැනීම මෙහි අරමුණ විය. එහෙත් කන්නන්ගර වාර්තා වලිනුත් ඉන්පසු වතු පාසැල් ජාතික පාසැල් බවට වර්ධනය කෙරිණි. එහෙත් අද ද ඒවායේ සැළකිය යුතු ප්‍රගමනයන් දක්නට නොලැබිණි.

කුමන ආකාරය අඩුපාඩු තිබුණද පරමවිඥානාර්ථ ව්‍යාපාරයත් ඒවා බැදුණු බෞද්ධ පාසැල් ද පිරවෙන්ද ජනතාව අවදිකරලිමේ විශාල වැඩකොටසක් ඉටු කළහ. 1880 දී අරඹන ලද සරසවි සඳරැස් නම් පුවත් පත හරාහා ජාතික දේශපාන කරලියේ ඉමහත් බලපෑම් ඇති කළ පුද්ගලයකු බිහිවිය. ඔහු නම් අනගාරික ධර්මපාලතුමාය. ඔහු මෙන්ම වලිසිංහ හරිස්චන්ද්‍රතුමා, එච්.චන්. පෙරේරා වැන්නවුන් ද මේ පත්‍රය තුළින් විශාල සේවයක් ඉටුකරන ලදී. 1915 දී මෙය තහනම් කරන ලදී. එහෙත් සිංහල බෞද්ධයා, කවට කතිකයා ආදී පුවත්පත් රැසක්ම ආරම්භ කරන ලද අතර ඉන්දීය ජාතික සටනද මහත් ආස්වාදයකින් යුතුව විඳගනිමින් නව ප්‍රවනතාවයක් ඇතිවිය. ඉන්දියාවේ සිට 'ඇනී බෙසන්ට්' වැනි අය ගෙන ගිය බ්‍රිතාන්‍ය විරෝධි අරගලය ඉතා තියුණු අයුරින් බලපෑ අතර මේ බලය පෙරට ගෙනා ප්‍රථම පුද්ගලයා අනගාරික ධර්මපාල තුමාය. මධ්‍යම පන්තියේ පිළුණු වූ බෞද්ධ හැඟීම් වෙනුවට අනු කාරක බෞද්ධ අධ්‍යාපනයට ප්‍රතිපක්ෂව ගැමි ජනතාව වෙතත් නාගරික කම්කරුවන් වෙතත් අනගාරික ධර්මපාලතුමා ගමන් කළේය. නිදහසේ, ආර්ථිකයේ - සංස්කෘතියේ අධික පිපාසාවෙන් වෙලී සිටි, සියවස්

ගණනක් උරුමය රැගෙන ආ මේ මිනිසුන් විසින් ධර්මපාල තුමා උසස් අයුරින් පිළිගන්නා ලදී. ඔවුන් අතර ඔහුන් වගා අනුගාමිකයන් වෙමින් බෞද්ධ පාසැල් අධ්‍යාපනයට ඇතුළත් වූ අතර ජනතාව තුළ වේගයෙන් එය පැතිර ගියේ නව නිදහස් රැල්ලක් මතිනි. එහෙත් 1915 දී ඇති වූ ජාතිවාදී කෝලාහල නිසාවෙන් දැඩි මර්ධනයක් ජාතික නායකයින්ට එල්ල විය. එසේම කපටි ධනපති අනුකාරකයින් ස්වකීය ආර්ථික පැතුමන් සඳහා පමණක් ධර්මපාලතුමා අවට සිටිමින් වංචා සහගත ලෙස හැසිරුණහ. මේ වංචා ඉදිරියේ රට හැරගිය ධර්මපාලතුමා ඉන්දියාවට ගොස් මහා බෝධි ව්‍යාපාරයේ නියලුනේය. ජාතික ධනපති පන්තිය ධර්මපාල මාවත ප්‍රතික්ෂේප කළද ඔහු විසින් අවුල්වනු ලැබූ ගැමි ගොවි සංඝය තුළ වූ නිදහස් සිතුවිලි සුදුසු අවසස්ථාව එනතෙක් පුපුරායන්නට අළු යට ගිනි මෙන් යටපත් විය.

champikaranawaka.lk

# තෙවන කොටස

## 1. බටහිර උසස් අධ්‍යාපනය ඇරඹේ

**● වෛද්‍ය විද්‍යාලයේ සිට......**

බ්‍රිතාන්‍යයේ වැඩෙමින් ආධිපත්‍ය දරූ ධනපති ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ද වැඩෙමින් පවතින ධනපති ආර්ථික ක්‍රමයත් ඒ හා බැඳුණු සංස්කෘතික රටාවත් වේගයෙන් නගර ආශ්‍රිතව පැතිර ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනයද පුළුල්ව පැතිරෙන්නට විය. එක් පසකින් ශ්‍රී ලංකාවේ ධනපති ක්‍රමය පෙරට ගෙන යෑමට අවශ්‍ය බලය වූ උසස් අධ්‍යාපනය ලැබුවන් නිරතුරුවම මව් රටින් (බ්‍රිතාන්‍යයෙන්) බලාපොරොත්තු වන්නට නොහැකි විය. එය වඩා වියදම් සහිත විය. අනෙක් පසින් ධනපති ක්‍රමය විසින් ගිලගත් දේශීය කොටස් ද යම් ප්‍රමාණයක වැඩිවීමක් පෙන්වමින් සිටි අතර බටහිර අධ්‍යාපන රටාව ග්‍රහණය කරගනිමින් සිටියහ. වඩා උසස් අධ්‍යාපනය සඳහා තම ආර්ථික ක්ෂේත්‍රය පුළුල් කරගැනීම සඳහා, වඩ වාඩා අධිරාජ්‍ය සරණයෑම සඳහා ඔවුන්ට උසස් අධ්‍යාපනය අවශ්‍ය වූ අතර ඔවුන් අතරින් ඒ සඳහා බලපෑම් එන්නට පටන් ගනී. එහෙත් එකී බලපෑම් අධිරාජ්‍යයන්ට තර්ජනයක් නොවූ අතර අධිරාජ්‍ය වඩා වැළඳ ගැනීමක් පෙන්නුම් කළ හෙයින් මේ ජාතික ආත්මය නසාගත් දේශීය ධනපතියන් හරහා බ්‍රිතාන්‍ය උසස් අධ්‍යාපනය මෙරට ජාතික ආත්මයට බද්ධ කෙරුමට කාලය හා අවකාශය සැපරී ඇති බව අධිරාජ්‍යවාදීන් තේරුම් ගත්හ.

ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන ගණනාවක් ම මෙවකට ඇති වෙමින් පැවතින. බ්‍රිතාන්‍යයේ සිට පාලනය කෙරුණ කේම්බ්‍රිජ්, ජූනියර්, සීනියර් විභාගය සමත්වූවන්ගේ ගණන ද ඉහළ ගියේය. එහෙයින් උසස් අධ්‍යාපනය ගැන සලකා බැලීම පිණිස මැක්ලියෝඩ් ප්‍රමුඛ කාරක සභාවක් පත්කරන ලදී. එහිදී ස්වභාෂා මාධ්‍යයන් ඉගැන්වීම, ඉංග්‍රීසි පාඨශාලාවල ක්‍රියාපටිපාටියේ යෝග්‍යතාව, විද්‍යාව හඳන්වාදීම, පරීක්ෂණ ක්‍රම, ලන්ඩන් විභාග පැවැත්විය යුතුද නැතහොත් යුනිවසිටි කොලිජියක් පිහිටුවනවාද නැද්ද යනාදිය සලකා බැලීමෙනි. මෙහිදී මැක්ලියෝඩ් විසින්

පවතින අර්බුදයට විසඳුම් පිණිස යුනිවසිටි කොලිජියක හා උසස් අධ්‍යාපනයේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී. මැක්ලියොඩ් (1912) ප්‍රථමයෙන් උසස් අධ්‍යාපනය පිළිබඳ හඬක් නැගුනේ මෝර්ගන් (1867) වාර්තාවේ ප්‍රතිඵලයක් ලෙසය. එමගින් ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවක් ද, කොළඹ ඇකඩමය ප්‍රතිසංවිධානය කිරීම ද ඉංග්‍රීසින් විශ්වවිද්‍යාල ශිෂ්‍යත්වයන් ආරම්භ කෙරුමද යොජනා කෙරිණි.

මේ වන විට උසස් අධ්‍යාපනයට පහසුකම් තිබුණේ කොළඹ ඇකඩමියේ (රාජකීය විද්‍යාලය) පමණි. එය කල්කටා විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් පුහුණු කරණ ආයතනයකට සම්බන්ධවිය. මෝර්ගන් වාර්ථා අනුව ඉහත කී සම්බන්ධය බිඳවැටුණි. එය සෘජුවම ලන්ඩන් විශ්වවිද්‍යාල කරා යොමු වුණු අතර එහි බාහිර උපාධි පාඨමාලා සඳහා අවකාශය ලැබෙන තෙක් යාපනය හා කොළඹ උසස් අධ්‍යාපනය ආයතනවලට කල්කටා මදුරාසි විශ්වවිද්‍යාල සමග සහ සම්බන්ධය පවත්වා ගැනීමට ඉඩ සලස්සන ලදී. මෙය විශ්වවිද්‍යාල ක්‍රමය වැඩී යාමට හේතු විය.

1870 දී වෛද්‍ය විද්‍යාලය පිහිට වූ අතර එය මගින් ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරන ලදී. 1881 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි සඳහා විභාගයක් ප්‍රථමවරට පැවැත්විණ. 1889 දී වෛද්‍ය විද්‍යාලය විසින් පිළිගනු ලැබීය. මේ අතරේදී නීති විද්‍යාලය විසින් පිළිගනු ලැබීය. මේ අතරේදී නීති විද්‍යාලය ඇරඹිණ. කොළඹ ඇකඩමයේ සිසුන් හට කේම්බ්‍රිජ් ශිෂ්‍යත්වයන් එකක් 1880 වනතෙක් ලබාදෙන ලද අතර 1911 දී එය දෙකක් දක්වා වැඩි කරන ලදී.

1907 දී 'ලන්ඩන් ඉන්ටර්මිඩියට්' විභාගය මෙහි ඇරඹුණු අතර 'ඉන්ටර් ආර්ට්ස්' 'ඉන්ටර් සයන්ස්' යන විභාගවලට ඉදිරිපත් වූයේ අතළොස්සක් පමණි. 1912 මැක්ලොයිඩ් (ඉහත සඳහන්) වාර්තාව විධායක මන්ත්‍රණ සභාවන් පිළිගැනීමත් පසු යුනිවසිටි කොලීජියේ අවශ්‍යතාවය ක්‍රියාත්මක භාවයට හැරිණි.

විශ්වවිද්‍යාලයක් ඇති කෙරුම පවත්නා සමාජ ආර්ථික තත්ත්වය තුළ යථාර්ථය තුළ ජාතික ආර්ථික සංස්කෘතික පුනර්ජීවයක මධ්‍යස්ථානයක් වේ යැයි සහේතුක බියක් ද පාලකයන් වෙත පැවතින.

බ්‍රිතාන්‍ය ක්‍රමය අනුව විශ්වවිද්‍යාල අධ්‍යාපනය මුදල් ගෙවා ලැබිය යුතු විය. එබැවින් එය මුදල් ඇති කොටස්වලට පමණක් සීමා විය. තවද නේවාසික හා ගුරුගෝල සම්බන්ධයක් සහිත බෞද්ධ මහා විහාරික හෝ අඩු කරමින් ඔක්ස් - බ්‍රිජ් හෝ සම්ප්‍රදායන් ද ඒ තුළ නොවීය. සාමූහික බලපෑමෙන් ඇති වන පුද්ගල විග්‍රහයන් සමාජ විග්‍රහයන් කරා පරි-

වර්තනය ද එහි ප්‍රතිවර්තනය ද නිසි අයුරින් සිදු නොවීය. සිදුවූ එකම ප්‍රතිඵලය නම් දේශීය ලෙස උපාධි ධාරීන් බිහි කෙරුම පමණක්ය.

යුනිවසිටි කොලිජියේ අධ්‍යාපනය භාෂාව වූයේ ඉංග්‍රීසි ය. සිංහල හා දෙමළ පවා ඉගැන්වූයේ ඉංග්‍රීසියෙනි. කලා, ප්‍රවීණ අධ්‍යනය හා විද්‍යා වශයෙන් අංශ තුනක් විය. වාණිජ, කෘෂිකර්මය වැනි අංශ පාඨමාලාවට ඇතුළත් විය යුතු යැයි යෝජිත වූවද ක්‍රියාත්මක නොකිරිනි. ප්‍රාචීන අංශයේ ඉගැන්වීම හා එය කිසිසේත් සංසන්ධනය කළ නොහේ. ඒමගින් යුනිවසිටි කොලිජිය ජාතික සංස්කෘතියක පුරෝගාමීන් බිහිවීම අසුරන ලදී. එයින් බ්‍රිතාන්‍ය සංස්කෘතියට අදාළ උසස් අධ්‍යාපනය හුවා දක්වන ලද අතර ජාතික සංස්කෘතියට එරෙහිව දේශීය වශයෙන් අනුකාරකයින්, රාජ්‍ය පාලකයින්, ගුරුවරුන් බිහිකරන මධ්‍යස්ථානයක් ලෙස එය පවත්වා ගෙන යනු ලැබීය.

පශ්චාත් උපාධි යුනිවසිටි කොලිජිය පිරිනොනැමු අතර ඒ සඳහා ලන්ඩනයට යෑමට සිදුවිය. එයින්ම අධ්‍යාපනය සීමා වූ අතර එවන් පශ්චාත් උපාදි සඳහා පිටත ගිය අය නැවත මව් රටට පැමිණීම සීමා සහිත විය. එහෙයින් යුනිවසිටි කොලිජිය උගතුන් බිහිකරන යන්ත්‍රයක ස්වරූපය ගත්තා මිස අඩුම වශයෙන් බටහිර විද්‍යාවේ සංකල්ප හෝ හඳුන්වාදෙන බුද්ධිමතුන් බිහිකරන තෝතැන්නක් නොවින. එහෙත් විශ්වවිද්‍යාලයට පරිබාහිර පුද්ගලයෙක් වූ ආචාර්ය A.N. වාඩිග විසින් විද්‍යාභිවර්ධන සංගමය පිහිටුවීමෙන් පසු බටහිර විද්‍යාත්මක සංකල්ප උගතුන් අතර පැතිරයන්නට විය. මෙවන විට ඔක්ස් - බ්‍රිජ් සම්ප්‍රදාය අභාසය ලැබූ (ඔවුන් ද ධනපති දරුවන් විය) කොටස් අතර අලුත් උද්‍යෝගයක් ඇතිවිය. මුදල්, පටු උගත් බව, දේශියත්වයට ඍජු එදිරි බව ආදී සංකල්ප තුළ යුනිවසිටි කොලිජිය කොටුවී සිමාවී තිබිය දී මෙයට වඩා පුළුල් නේවාසික සංවිධිත බුද්ධිමය කේන්ද්‍රයක් ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය පුළුල්විය යුතු යැයි උද්ඝෝෂණයක් පැවතින. ධනපති ක්‍රමයේ අතුරුපළ හක්ති විඳි දේශිය ධනපති පන්තියේ පහළ  කොටස් ද ඔක්සි - බ්‍රිජ් සම්ප්‍රදායේ පහස ලැබ, ඒ වන විට බ්‍රිතාන්‍ය පුරා කුණාටුවක් ලෙස හමාගිය නිදහස් මතවාදයේ, විද්‍යාත්මක සංකල්ප වාදයේ , මාක්ස්වාදයේ පහස ලැබූවන් විය. එහෙයින් ඔක්සි - බ්‍රිජ් සම්ප්‍රදායේ විශ්වවිද්‍යාලයක් සඳහා වඩා සංවිධිත උද්ඝෝෂණයක් ද හා සංවිධිත උද්ඝෝෂණයක් ඇරඹිණ.

1921 ශිෂ්‍යයන් 115 දෙනකුගෙන් අනිවාර්ය මාක්ස් යටතේ ඇතිවූ යුනිවසිටි කොලීජියට හරස් කපන්නෝද වූහ. කතෝලිකයෝ මෙහි පෙරමුණ ගත්හ. කතෝලිකයන්ගේ අධ්‍යාපනික ඒකාධිකාරියට හා අනන්‍යතාවයකට හානියක් වේයැයි සිතූ ඔවූහු වෙනම අධ්‍යාපන ආයතනයක් සඳහා සටන් වැදූහ. එහෙත් ක්ෂණිකව යටපත් කරන ලදී.

1929 දී රිඩල් කොමිෂම විසින් නිර්දේශ පරිදි ලංකා විශ්වවිද්‍යාලය ඒකීය නේවාසික හා ස්වාධිකාරී විය යුතු යයි ආඥා පනතෙන් නියම විය. ඒකීය යන්නෙන් අදහස් කරනුයේ විශ්වවිද්‍යාලයට පළාත් බදව මණ්ඩල පවත්වා ගත නොහැකි බවය. නේවාසික බවින් ශිෂ්‍යයන් හා ඇදුරන අතර මනා පාරසරික තත්ත්වයන් තුළ සිදුවන සාමූහික සංවාදයන් ගේ අර්ථය සලකන ලදී. ස්වාධිකාර්යය යන පදය 12 වන සියවසේ බොලෙඤ්ඤවේ ශිෂ්‍ය අරගලවල සිට පැතිර එන්නකි. එය තුළින් විශ්වවිද්‍යාල අභ්‍යන්තර තුළට ගෙණෙන ලද නීතිරීති ප්‍රමාණයන් මගින් සමාජයේ ගුණාත්මක හරය පාලනය කරන්නන් සඳහා මූලික පුහුණුවක් ද විනය හා ශික්ෂණයක් ද ලබාදීම අපෙක්ෂා කරන ලදී.

ලංකා විශ්ව විද්‍යාල යුනිවසිටි කොලීජියේ හා වෛද්‍ය විද්‍යාලයේ එකතුවක් ලෙස ඒකාබද්ධ කරන ලද්දේ 1942 අංක 20 දරන ලංකා විශ්වවිද්‍යාල ආඥා පනතිනි. විශ්වවිද්‍යාල පිහිටු විය යුත්තේ කොළඹ ද නැත්නම් කොළඹින් බැහැරද යන්න ප්‍රශ්නය මත බොහෝ වාද විවාද පැවතින. 1926 දී ඇරඹි මේ විවාදය 1938 තෙක් පැවතින. එයම විශ්වවිද්‍යාලයක් ඇරඹීම තාවකාලිකව යටපත් කළේය. 1934දී, 1931 ඩොනමෝර් කොමිසම පත්කළ අධ්‍යාපනය කාරක සභාව විශ්වවිද්‍යාලය දුම්බරට ගෙනයාම යෝග්‍ය යැයි තීරණය කැන ලදී.

සර් අයිවර් ජෙනිංන්ස් උප කුලපති ලෙස පත්ව 1942 දී කාන්තාවන් 91 ක් දෙදෙක් ඇතුළු ශිෂ්‍ය සංඛ්‍යාව 904 ක් විය. 1951 දී පේරාදෙනියේ ගොඩනැගිලි තැනීම අවසන් වූ අතර වෛද්‍ය හා විද්‍යා පීඨ කොළඹ රැදී තිබිය දී මුළු විශ්වවිද්‍යාලයම පේරාදෙණියට කේන්ද්‍ර ගත විය. 1955 දී ප්‍රාචීන භාෂා, කලා, විද්‍යා, වෛද්‍ය හා ඉන්ජිනේරු අංශ යටතේ ආචාර්යයවරු 183 දී ශිෂ්‍යයෝ 2232 ද එහි වූහ.

මේ විශ්වවිද්‍යාලයේ කටයුතු කෙරුණේ ඉංග්‍රීසියෙනි. ඒ වන විට ලංකාවේ විසූ 8% ක් වූ ඉංග්‍රීසින් උගත් අතළොස්සක් පමණි. විශ්වවිද්‍යාලය තුළ ශාස්ත්‍රය ලැබීමේ වරම ලැබූවේ අයිවර් ජෙනිංන්ස් විසින් ඉතා උපායශීලීව දේශිය කලාවන් ශාස්ත්‍රයන් අතරින් බටහිර කලා විද්‍යාවන් වෙතට ජනයා ඇද ගැනීමේ මාධ්‍යයක් ලෙස ද පිබිදීමින් තිබූ ජාතික අරගලය මොටකර දැමීමේ ආයතනයක් ලෙස ද විශ්වවිද්‍යාල සංවිධානය කරනු ලැබීය. ලංකා විශ්වවිද්‍යාලය ඇත්ත වශයෙන්ම රට නාමික ලෙස අධිරාජ්‍යවාදයෙන් මිදුණු පසුවද තවදුරටත් එය අතාත්වික ලෙස බැඳී තබන බලකොටුවක් විය. කළු සුද්දන් හා බටහිර විධික්‍රමයේ උගතුන් බිහිකරන තොතැන්නක් විය. එයට එරෙහිව ස්වදේශික හැගිමෙන් හා

දේශිය ආත්මය මුල් කරගත් අධ්‍යාපන රටාවක අවශ්‍යතාවය 40 ගණන් වල මුල සිටම දැනෙන්නට විය.

## 2. නිදහස් අධ්‍යාපනය

අධිරාජ්‍යවාදීන්ට එරෙහිව තම උරුමය සොයා යෑම සඳහා දේශීය වශයෙන් පොදු ජනතාවතුළ දැඩි උනන්දුවක් මේ වන විට දැල් වෙමින් තිබිණ. අධ්‍යාපන ක්ෂේත්‍රය කළු සුද්දන් ගේ වූ ඒකාධිකාරිය මොනවටද පැහැදිලි විය. නිශ්චිත නොවූ අගාදයක් තුළ ස්වකීය උරුමය සොයමින් අතිවිශාල බහුතර ජනතාව ක්‍රියාත්මක වෙමින් පැවතින. රාජකීය විද්‍යාලයට ප්‍රතිලෙස ගොඩනගන ලද ආනන්ද විදයාලය (1886) නව හර පද්දතියක් හඳුන්වාදීමක් නොපෙන් වූ අතර එය රාජකීය විද්‍යාලයේ හර පද්දතියම උකහා ගන්නා ලදී. මේ වන විටත් ස්වදේශීය අධ්‍යාපනය යම් ප්‍රමාණයකට පුළුල්ව තිබුණ ද උසස් අධ්‍යාපන වරම මුදල් හා භාෂාව පදනම් කරගෙන බහුතරය වෙතින් උදුරා ගනු ලැබීය. මේ වන විට ශක්තිමත් පදනමක සිට දේශිය ධනපති පන්තියටද නව අධ්‍යාපන රටාවක් දේශිය ලෙස අවශ්‍ය වූ අතර ඔවුන් අනුකාරකයින් වූ නිසා වැඩිදුර පුළුල් වනවාට එරෙහි වූහ.

| | 1938 | 1939 | 1910 |
|---|---|---|---|
| ස්ව භාෂා පාසල් | 625,699 | 640,517 | 650,910 |
| ඉංග්‍රීසි පාසැල් | 83,219 | 86,476 | 92,049 |
| ද්වි භාෂා පාසැල් | 20,96 | 19,912 | 15,912 |

රාජය භාෂාව ඉංග්‍රීසි වීමද පාසැල් ගාස්තු අධික වීම හේතුවෙන් ද පාසැල් අධ්‍යාපනය සීමාකාරිවිය. මෙසේ භාෂාව හා ආර්ථිකය හරහා සමාජය පැහැදිලි බෙදීමකට ලක්වූ අතර ඒ දෙකොටස අතර තියුණු ඝර්ෂණයක් හටගැනින. එය පියමන් කෙරුම 1943 නොවැම්බර් මාස ඉදිරිපත් කරන ලද අධයාපනය පිලිබඳ විශේෂ කාරක සභාවේ වාර්තාව තුළින් සිදුකෙරුමට එවකට අධ්‍යාපනය ඇමතිව සිටි සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා උත්සාහ ගන්නා ලදී. මේ කාරක සභාවට සමාජිකයින් 28 දෙනෙක් ඇතුළත් විය.

### ● කන්නන්ගර වාර්ථාව

කන්නන්ගර වාර්තාවේ පස්වන පරිච්ඡේදයේ වර්තමාන අඩුපාඩු යනුවෙන් සඳහන් වේ. ඒ සඳහන් පරිදි

50. වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ පවත්නා ඉතා ප්‍රකට ලක්ෂණය නම් ඉගැන්වීමට උපයෝගි කරගත් භාෂාවන්ට අනුව දෙවැදෑරුම්...........

51. ඉංග්‍රීසි අධ්‍යාපනයේ මහත් ආකර්ශනය පවත්නේ හොඳ වැටුප් සහිත ඉහළ පදවි සඳහා ඉංග්‍රීසි දැනුම අවශ්‍ය නිසා යයි අප කිවහොත්........

52. තවද ඉංග්‍රීසි පාඨශාලා වූහ. ඒවායේ හොඳ ගෙඩනැගිලි ද හොඳ උපකරණ ද හොඳ ගුරුවරුද සිටිති.

53. මේ සියලු කරුණු නිසා වියදම් කරගත හැකි අය තම දූ පුතුන් ඉංග්‍රීසි පාඨශාලාවලට යැවූහ............

54. අපේ අධ්‍යාපනයේ ඇති දෙවන විශාල ඌනතාවය නම් එහි ඇති ප්‍රමාණය ඉක්මවා ගිය ඒකීය ස්වාභාවය යි. අධ්‍යාපනයේ ප්‍රාථමික අවස්ථාවේදී සැලකියයුතු ප්‍රමාණයක ඒකීය ස්වාභාවයක් පැවතුනද රටේ අවශ්‍යතාවයනුත් ශිෂ්‍යයන් ගේ ප්‍රතිඵලයත් භාවයනුත් සලකා බලා පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනය වෙනස් කිරීම අවශ්‍යය....

55. තුන්වන මහා ඌනතාවය නම් සියල්ලන්ට ම එක සමාන ඉඩපහසු කම් නැතිවීමය. ප්‍රධාන වශයෙන් ගාස්තු ගෙවිය හැකි අය සඳහා එක් පාඨශාලා වර්ගයක්ද එසේ ගෙවීමට වත්පොහොසත් කම් නැති අය සඳහා තවත් පාඨශාලා ලෙස........

56. ප්‍රතිභාව ශක්තිය දරුවකුගේ රඳා පවතිනුයේ පියාගේ ආදායම් තරම් පිට යැයි කීමට සාධක නැත.......

57. සිව්වන මහා දුර්වල තත්ත්වයක් නම් දරුවන්ට අනිවාර්ය අධ්‍යාපනය අනිවාර්යය නොවී තිබීමය.........

මේ සඳහා කන්නන්ගර වාර්තාව පහත සඳහන් යොජනා ගෙන එයි. ආගමික සංවිධානවල ගැටලු මගහැරීම සඳහා

63. ................ඉදුරාම රාජ්‍ය මගින් පවත්වන සංවිධාන ද ආගමික සංවිධානය ද එකට පැවතීමේ ක්‍රමය තිබිය යුතු යයි අපි යෝජනා කරමු.

64. ළමයින්ගේ ඇතුළුවන ආගමික නිකාය උපදෙස් යටතේ ඒ ළමයින්ගේ අධ්‍යාපනය පවත්වා ගෙන යෑමට ජනතාවගේ කිසියම් කොටසක් යම් විටෙක කැමති වේනම් රාජ්‍ය විසින් ඊට වුවමනා පහසුකම සැළකිය යුතුය.

75. ..............අත්හදා බැලීමක් ලෙස ළදරු පාසැල් කම්කරු පංති දරුවන් සඳහා පළාත් පාලන මණ්ඩලවල ආධාරයෙන් කොළඹ, ගාල්ල, යාපනය , මහනුවර එහි ප්‍රධාන නගරවල පිහිටිය යුතු යැයි අපි යොජනා කරමු.

76 .ප්‍රාථමික අවස්ථාවට පොදු අධ්‍යාපනයක් ඇති පොදු පාඨශාලාවක් අපි යොජනා කරමු. එහි ඉගැන්වීමේ භාෂාව දරුවන්ගේ මව්බස විය යුතුය.

80. තුන්වැදෑරුම් , පශ්චාත්, ප්‍රාථමික පාඨශාලාවලට ශිෂ්‍යයන් ඇතුළු කර ගැනීමේ පස්වැන්නේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව එය යුතු යැයි අපි යෝජනා කරමු.



chandikalanawak.lk

91 - 92 - 93 ඛණ්ඩ වලින් සිංහල - දෙමළ භාෂාවන්ට නිසි තැනදී ඉංග්‍රීසියේ ස්ථානය නිර්ණය කෙරුම යෝජනා කර ඇත.
110 - 120 දක්වා ජ්‍යේෂ්ඨ පාඨශාලාවල ඉගැන්විය යුතු විෂය මාලාව නිර්ණය කරයි. එහිදී දේශිය බවට සැලකුම් යෝජනා කර ඇත.
131 - 137 දක්වා ලන්ඩන් නුවර සිට මෙහෙය වන විභාගවල අයෝග්‍යයතාව පෙන්වමින් ලාංකික විශ්වවිද්‍යාලයක යෝග්‍යතාව යෝජනා කෙරේ.
169 වැනි වගන්තියෙන් පළමුව නිදහස් අධ්‍යාපනයද දෙවනුව නිදහස් වෛද්‍ය සේවයක්ද යෝජනා කරති.
171 .......අධ්‍යාපනය බාලාංශයේ සිට විශ්වවිදයාලය තෙක් නොමිලේ විය යුතු යයි යෝජනා කරමු.

කන්නන්ගර මැතිතුමාගේ වාර්තාව එවකට පැවති අධ්‍යාපන රටාව පිළිබඳ සවිස්තර වාර්තාවක් වූ අතර අධ්‍යාපනයේ කැපී පෙනෙන වෙනස්කම් (විප්ලවකාරී) යෝජනා කරන්නක්ද විය. ළදරු පාසැල්, ප්‍රාථමික පාසැල්, පශ්චාත් ප්‍රාථමික පාසැල්, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය, විශ්වවිද්‍යාලීය විභාග පරීෂණ අධ්‍යාපන වියදම් ආදිය ඉතා සවිස්තර ලෙසත් සකසා පලකරන වාර්තාවක් විය.

## පාසැල් සංඛ්‍යාව

| වර්ශය | රජයේ | ආධාර ලබන | එකතුව |
|---|---|---|---|
| 1945 | 2394 | 2144 | 4513 |
| 1950 | 3188 | 2139 | 5227 |
| 1955 | 3675 | 2213 | 5888 |

කන්නන්ගර වාර්තාව සමාජ ආර්ථික දේහය පැත්තෙන් ඉතා වැදගත් කරුණු කිහිපයක් අනාවරණය කළේය. එනම් ජාතික නිදහස සඳහා දේශිය ජනතාව තුළ පැවති දැඩි උනන්දුවත් එනම් ස්වභාෂා අධ්‍යාපනයත් පිරිවෙන් ආශ්‍රිත වූ ස්වකීය අධ්‍යාපන රටාවන් කෙරෙහි වූ දැඩි උනන්දුවත් ප්‍රකට කරන ලදී. එයට අමතර වශයෙන් සාම්ප්‍රදායික කතෝලික ක්‍රිස්තියානි මිෂනාරි අධ්‍යාපනයට එරෙහිව බටහිර විද්‍යාත්මක අධ්‍යාපනයට එරෙහිව බටහිර විද්‍යාත්මක අධ්‍යාපනයට බටහිර අනුකාරකයින් තුළම පැවති උනන්දුව ප්‍රකට කරයි. ඒ තුළින් සාම්ප්‍රදායික කතෝලික ක්‍රිස්තියානි ආක්‍රමණය දෙදරන සුළු වූ අතර ඒ වෙනුවට බටහිර විද්‍යාත්මක සංකල්පවල ආක්‍රමණය ආදේශ කරන ලදී.

ආර්ථිකමය සංස්කෘතික ලෙස බෙදී පවත්නා සමාජයට නැවත එක්ව පියමන් කෙරුමක් නිදහස් අධ්‍යාපන යෝජනාවලියෙන් යොජනා නොවූණු අතර එය පැහැදිලි ලෙසම සාම්ප්‍රදායික සුද්දන් හා එහි අනුකාරකයින්ට දේශිය ජනතාවට ද, බටහිර උගතුන් ද ගෙන ගිය අරගලය ජයග්‍රහනයක් විය. එහෙත් මේ වාර්තාව ක්‍රියාත්මක කෙරුමට එවකට ජාතික ධනපති පංතිය නියෝජනය කළ එ.ජා.ප. නායකයින් වූ ඩී.එස්. කොතගාවල, ජේ.ආර්. විජයවර්ධන වැන්නවුන්ද උන්ගේ

ප්‍රචාර මාධ්‍යයන් වෙතින් විශාල ප්‍රචාරයක් ගෙන ගිය අතර එයට ප්‍රතිපක්ෂව පිරිවෙන් ආශිතව විසූ බොදු ජාතික බලවේගයද සුවිශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන් වහන්සේලාද බටහිර අධ්‍යාපනය ලැබූ විප්ලවකාරී කොටස් ද හඬනැගූහ. තම අධ්‍යාපනික ආධිපත්‍ය රැකගැනීම පිණිස කතෝලික පල්ලියද - ක්‍රිස්තියානි සභාවද නැවත ඉතා දැඩි වෙහෙසකර උත්සාහයක් ගන්නා ලදී. ඒත් සියල්ල පරදා ජනතා අපේක්ෂාවන් හා බහුමතය පෙරට ආ අතර එහෙයින් වංචනික ලෙස එ.ජා.ප. නායකයින් එදා නිදහස් අධ්‍යාපන පනත දෙවරක් කියවීමේදී පක්ෂව ඡන්දය දුන්හ.

එහෙත් නිදහස් අධ්‍යාපනය පනත ක්‍රියාත්මක වීම වැළැක්වීමට ඔවුන් දැඩි උත්සාහයක් ගන්නා ලදී. 1945 - 1955 තෙක් පාලන සමය තුළ පැසැල් වැඩීම (සටහන) ඉතා සෙමින් සිදුවිය. හඳුන්වාදෙනු ලැබූ මධ්‍ය මහා විද්‍යාල සංකල්පය ගුරු විදුහල් සංකල්පය ආදිය හෙමිහිට ක්‍රියාත්මක විය. එසේ ක්‍රියාත්මක වූ අවම දුෂ්කරතාවයන් තුළින් පවා අවදි වීමට යත්න දරමින් සිටිනා මහා බලවේගයක හඬ ක්‍රමයෙන් පැවතින.

"නිදාගන්න එක්කෝ පැදුරක් නැත්නම් මහපොළොව, කන්න බතුයි සම්බෝලයි. ගමේ කොලුවන්ට මීට වඩා හොඳ අවස්ථාවක් ලබාදෙන්න ඕනෑ." යයි කන්නන්ගර මහතාගේ වචන වලින් පරිසමාප්ත ලෙස ගැමි පෙදෙසකින් අවුත් උසස් ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබුවද ගුරුවරයෙක් ලෙස කටයුතු කළද ගම ගැමිබව පිළිබඳව හැඟීමක් ඔහු වෙත පැවති බැව් ඔහු එවකට ධනපති පංතිය වෙත සිටියද පෙනේ. අනෙක් අතට කන්නන්ගර වෙතින් පෙනුනේ එවකට පාලිත එ.ජා.ප. ධනපති පන්තිය තුළම යම් දේශියත්වයක් ඉවකින් වටහා ගත් ආර්ථික සංස්කෘතික ලෙස සියවස් ගණනක් පීඩාවට පත්කරන ලද ස්වදේශිය සිංහල දෙමළ ජනයාගේ ක්‍රමික පිබිදීම ඒ මහා බලවේගයේ හඬ කලකට පෙර දුටු බවකුයි.

කන්නන්ගර වාර්තාව තුළින් නව උද්ඝෝෂණයක් පැතිර ගිය අතර ග්‍රාමීය ප්‍රාදේශය කරා දේශිය හා බටහිර අධ්‍යාපනය වේගයෙන් ගමන් කරන ලදි. එහෙත් ඒ තරම් තීරණාත්මක ලෙස නොදැනින. බොහෝ ගැමි ප්‍රදේශවලින් ආ කොටස් තමා නියෝජනය කරන බලය කුමක් දැයි වටහා ගත්තද තමා ඉදිරියේ මහා බලයක් ඉංග්‍රීසි භාෂාවෙහි හා ආර්ථික ඒකාධිපතියෙහි සරණින් අසුරවන කොම්ප්‍රදෝරු ධනපති පංතිය - බමුණු කුලය ඉදිරියේ චංචලභාවයකට පත්විය. මේ නව බලවේගය එවකට පිබිදෙමින් පැවති ජාතික බලවේගය සමග එක්වූ අතර සමාජය දෙදරවන මහා බලයක් බවට කන්නන්ගර බිහිකළ අතළොස්සක් වූ ශිෂ්‍ය ව්‍යාපාරය පත්විය.

## ● විද්‍යාලංකාර පිරිවෙනේ ක්‍රියාකාරීත්වය

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහිව ඇතිවූ බෞද්ධ ප්‍රබෝධය භික්ෂු ශිෂ්‍ය ව්‍යාපාරය හා ඒකාබද්ධව ජාතිවාදී මුහුණුවරක් ගත් එක් මූලික හා උපරි ස්ථානයක් නම් විද්‍යාලංකාර පිරිවෙනය. අතීත උරුමය අනුව යමින් ජාතික නිදහස අත්පත්කරගැනීමත්, සමාජවාදී අදහස් පතුරවාලීමටත්, අර්ථවත් කරගැනීමටත්, බෞද්ධ අර්ථ ක්‍රමය, රාජ්‍ය ක්‍රමය රටේ ජනයාට කාවැද්දීමටත් විවිධ තර්ජන බාධක, ප්‍රහාර ඉදිරියේ නොසැලී සිටිමින් ඉටුකරලීමට විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂූන් නිස්සරන අධ්‍යාශයෙන්ම, පරිත්‍යාගයෙන්ම ඉදිරිපත්වූහ. විශේෂයෙන් 40 දශකයේ ඇතිවූ ජාතික නිදහස් ප්‍රබෝධයටත් ඉන් පසුව ඇතිවූ 56 පිබිදීමත් මේ භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියාකාරීත්වය විශාල ජීවාත්මක බලපෑමක් කළේය.

විද්‍යාලංකාරයෙන් මතුවූ මේ ජාතික බලවේගය 40 දශකය තුළ බලවත් බලතරංග ප්‍රමාණයක් පොදු ජනයා වෙතට ගෙන ගියහ. ජාතික නිදහස නම් මායාවෙන් ජනතාව රවටා සුද්දන්ගෙන් පසු ජනතාව ගසා කෑමටත් ඉව අල්ලමින් සිටි විජාතික ගැති ධනපතීන් වහාම මේ ප්‍රගතිශීලී භික්ෂු බලයට එරෙහිව නැගුණාහ. "දේශපාලනය භික්ෂූන්ට අකැපය" ආදී ලෙස සිය ධන බලය, කුල බලය, නිල බලය හා ප්‍රතිගාමී සන්නිවේදන අංශ (ලේක්හවුස් - ටයිම්ස්) පරිහරණය කරමින් මේ බලය යටපත් කරන්නට මහා අරගලයක් සතර අතින් ආරම්භ කළෝය. එයට ප්‍රතිපක්ෂ ලෙස වඩවඩාත් ජනතාව අතරට යමින් විද්‍යාලංකාර භික්ෂූහු වහන්සේලා ද ක්‍රියාකරන්නට වූහ. "භික්ෂූන් හා දේශපාලනය" නම් චිරප්‍රසිද්ධ විද්‍යාලංකාර ප්‍රකාශය 1946 පෙබරවාරි 13 දා විද්‍යාලංකාර ආචාර්ය මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද්දේය. එහි එක් කුඩා වාක්‍යයක් මෙසේය. "...භික්ෂු ජීවිතයට කැළල් නොවන අයුරින් අපේ රටවැසියන්ගේ යහපතට හේතුවන යම් වැඩ පිළිවෙළක් වේ නම් එහි නම දේශපාලනය වේවා! කුමන හෝ වේවා! එහි යෙදීම භික්ෂූන්ට සුදුසුමය."

මෙයින් අතිශය බියට පත් විජාතික ගැති ධනපතීන් සියලු අංශ වලින් සිය ප්‍රහාරය වඩවඩා විද්‍යාලංකාරය වෙතට එල්ල කළහ. ධනවත් ප්‍රභූන් ලවා ආධාර කැප්පවූහ. දානය වැළැක්වූහ. හිමිවරුන්ට ශාරීරික හා මානසික පීඩා ආදියද එල්ල කළහ. විවිධ නීති නිර්මාණය කරමින් ප්‍රගතිශීලී භික්ෂු බලයේ යෝධයකු වූ කොටහේනේ ප්‍රඥකීර්ති හිමියෝ මෙසේ කීහ.

"...ලෝවාමහාපාය ගිනි තබා, මහා විහාරය බිඳහෙලා සමතලා කර උඳුවපුරද්දීත්, සංඝයාට බත් පිඩක් දුන් කෙනෙකුට දහසක් දඩය, කහසිවුරට දඬුවම මරණයයි ආදී ලෙස මහා බල සම්පන්න රජවරුන්

නියෝගය දෙද්දී, යුද්ධකාමයෙන් මත්වූවන් අණදෙද්දීත්, මේ රටේ ජාතිකත්වයත්, ආගමික පොත්පත් ටිකත් රැකගත් මහා සංඝයාගෙන් පැවතෙන භික්ෂූන් වහන්සේලා අධෛරයට හෝ බයට පත්කළ නොහැකි බව ඉතිහාසයේ නොදත් අධිපති පක්ෂය දත යුතුය..."

සිය අතීතයේ පැවති නිදහස් - සම අධ්‍යාපනය පිළිබඳ උරුමයන් අවැස්සී, දහසක් ප්‍රතිගාමීන් බාධකය හිරිහැර පමුණුවද්දී රටේ ජනතාව වෙනුවෙන් නැවත "නිදහස් අධ්‍යාපනය" ඇතිකරලීමට පෙරමුණට ගියේද භික්ෂු ශිෂ්‍ය බලයමය. රට පුරා රැස්වීම් පවත්වමින්ද, පෙත්සම් අත්සන් කරමින්ද, ප්‍රතිගාමී මිෂනාරි අධ්‍යාපනඥයන් හා විජාතික ධනපතීන්ගේ සියලු බාධාවන්ට අධිෂ්ඨාන පූර්වකව මුහුණ දෙමින් උන් වහන්සේලා ගෙන ගිය ජාතික ව්‍යාපාරය නිසා නිදහස් අධ්‍යාපන පනතට මුලින් එරෙහි වූ ඩී.එස්., කොතලාවල, ජයවර්ධන, ඩඩ්ලි ආදී විජාතික පරගැති යු.එන්.පී. නායකයෝ පවා පසුව වංචනික ලෙස එයට පක්ෂවූහ. රටේ ජාතික නිදහස් පිළිබඳ අරගලයට හා අපේ උරුමය සොයා යෑමේ අරගලයට ද, සමාජ වෙනසකටද අතිමහත් ජයක් හා විභවයක් සපයමින් ඈත ගම්වල දරුවන් පවා පුබුදුවමින් මහා බලවේගයක් ලෙස ගලා ගිය නිදහස් අධ්‍යාපන සංකල්පය ආරම්භක ජය ලැබුවේ එසේය. මේ ගැන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රකාශයක් කළ හින්දු මන්ත්‍රීවරයෙකු වන වී. නල්ලයියා මහතා මෙසේ කීහ.

"...නිදහස් අධ්‍යාපන පනත ගැන බලවත් මහජන මතයක් ඇති වූයෙත් එයට එරෙහිව සිටි මැති ඇමතීන්ට පවා එයට පක්ෂ වීමට සිදුවූයෙත් එයට ප්‍රතිගාමී භික්ෂූන් ගේ ක්‍රියාකලාපය නිසාය. බෞද්ධ - හින්දු ලෙස පැහීමට ලක්වූ අතිවිශාල බහුතරය තවත් පගා දමන්නට ක්‍රිස්තියානි පූජකවරුන් ක්‍රියාකිරීමට අයුතු සහගත බව ඔප්පු විය..."

රටේ ජාතික නිදහස සාක්ෂාත් කරගැනීම සඳහාත්, පාලකයින්ගේ බරපතල තර්ජනවලට මුහුණ දීම සඳහාත් සියලු භික්ෂූන් වහන්සේලා බලවේගයක් ලෙස එක්සත් කරන්නට මේ ප්‍රගතිශීලී භික්ෂු - ශිෂ්‍ය බලයට හැකිවිය. 1946 ජූනි 29 දා ඓතිහාසික සංඝ රැලියක් පවත්වා "ලංකා එක්සත් භික්ෂු මණ්ඩලය" නම් ලංකාවට පූර්ණ නිදහස ලබා ගැනීමේ අටියෙන් සංනිවේදනයක් පිහිටුවා ගන්නා ලදී. එහි පරමාර්ථය ලෙස,

1. ලංකාවේ තවදුරටත් වහල් බැම්මේ බැඳ තබන සෝල්බරි ආණ්ඩුක්‍රමය ප්‍රතික්ෂේප කර බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් වෙන්වී පූර්ණ ජාතික නිදහස අත්පත් කර ගැනීම.
2. නිදහස් ලංකාවක් නිදහස් ඉන්දියාව සමග එක්ව කටයුතු කෙරුම.
3. සියලුම ගිහි පැවදි රටවැසියන්ගේ දේශපාලන අයිතිය නිදහස රැකගැනීම.

4. රටේ ආර්ථිකය හා සමාජික තත්ත්වය දියුණු කර අපරාධ වලින් මිදුණු ධාර්මික සමාජයක් ඇතිකෙරුම ආදී ලෙසය.

ඊනියා නිදහස ප්‍රතික්ෂේප කර සැබෑ ජාතික නිදහස් සාක්ෂාත් කර ගැනීම සඳහා ලංකා එක්සත් භික්ෂු බල මණ්ඩලය රැස්වීම්, පෙත්සම් ආදී ලෙස බලගතු ව්‍යාපාරයක් ගෙන ගියහ. එහෙත් මේ ජාතික අරගලය නිසි ආකාරයට වර්ධනය කරන්නට හා හසුරුවා ගන්නට එවකට සිටි ජාතික නායකයින් අපොහොසත් විය. එහි ප්‍රතිඵලය වූයේ විජාතික ගැත්තන් බලයට පැමිණීමය.

රටේ ජනතාවට 'සමාජවාදය' සරලව වටහා දීමට හා බෞද්ධ අර්ථ ක්‍රමය, රාජ්‍ය ක්‍රමය ආදිය හඳුන්වා දීමටද, එහිදී භික්ෂූන් වහන්සේලා ගේ අනන්‍යතාවය රැකගැනීමද මේ ව්‍යාපාරය මෙහෙය වූ යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම, කොටහේනේ ප්‍රඥාකීර්ති, වල්පොළ රාහුල, කලල් ඇල්ලේ ආනන්ද සාගර, නාත්තන්ඩියේ පඤ්ඤකර ආදී හිමිවරුන්ට හැකිවිය. කොළඹ නගරයේ ඇතිවූ කම්කරු ලිපිකරු වැඩ වර්ජනවලදීද, රටේ අනෙක් ප්‍රදේශවල ඇතිවූ නිදහස් අධ්‍යාපනය ජාතික සංස්කෘතික අරගලය, ගොවි ජනතා අරගලය ආදීය කසාවතින් බබලවාලන්නටද මැර ප්‍රහාර, ලේ ගංගා, මර්දනය නීති මැදින් උන්වහන්සේලාට හැකිවිය.

මේ ජාතික බලවේගයේ ඉතාම වැදගත් කරුණක් වූයේ 'මාක්ස්වාදය' අනුකරණය ලෙස පිළිනොගෙන අපේ උරුමයට හා චින්තනයට ගැලපෙන අයුරු එය සකස් කර ගැනීමත් ජාතික විමුක්ති අරගලයක් සඳහා වූ දේශීය උරුමය හා චින්තනය වටහා ගැනීමත්ය. ධර්ම ගවේෂකයෙකුගෙන් මෙපිටට වර්ධනය නොවූණු ධර්මපාලතුමාගේ ජාතික විමුක්ති අරගලය, සමාජ ආර්ථික දේශපාලනමය ලෙස වූ භික්ෂුවගේ දේශපාලනික ක්‍රියාකාරීත්වය පිළිබඳවද, ලෝක අධිරාජ්‍යවාදී බලවේග ක්‍රියාකාරීත්වයද ලෙස විවිධ අංශවලින් පැතුරුණු ස්වරූපයක් ගත්තේ 'විද්‍යාලංකාර ප්‍රබෝධය' මතිනි. එහෙත් ජාතික නිදහසේ නියමුවන් ලෙස පෙනී සිටිය අය සහ මාක්ස්වාදීන්ගේ අධිතක්සේරුකම් හා අන්තවාදීත්වය හා කට්ටිවාදය නිසා එය පැහැදිලි දේශපාලන අරගලයක් ලෙස වර්ධනය නොවිණ. එහෙත් එයින් ඇතිකරන ලද බල තරංග කම්පනයක් ලෙස අද දක්වාද පැතිරයමින් පවතී.

භික්ෂුවගේ දේශපාලන ක්‍රියාකාරීත්වය, සමාජවාදය, ජාතික නිදහස ගැන විශිෂ්ඨ කෘති ගණනාවක් සරල බසින් ලියූ විද්‍යාලංකාර විද්‍යාලංකාර ප්‍රබෝධයේ නියමුවා වූ යක්කඩුවේ හිමියන් ගේ මේ වාක්‍ය කාණ්ඩ වෙතින් ඒ හිමියන් කෙතරම් දුරට ජාතික උරුමය ආත්මයකොටගත් අධිෂ්ඨානශීලී පුද්ගලයකුද යන්න හෙළිවේ.

"ඔය අලුත්තාලෙට හැඩගැහිලා පරන දේ පෙන්නන්න බැරුව ඉදිරියට යන මහත්තැන්ලාට පුළුවනි." ඔය පරණ නූගත්

මෝඩයින්ගේ කෝපියුගයේ අදහස් මේ විසිවෙනි ශතවර්ෂයට ගැලපෙන ඒවායැ!" කියා. නමුත් මේ අහපන් අනේ බන් පරණම පරම කෝපිම කෝපි කාලේ මනුස්සයන් තුල තිබුණු ගතිගුණ, අදහස්, දිවිපැවැත්ම, මිනිස්කම, එන්ට එන්ටම වෙනස් කරගන්නේ නැතිව පරපුරෙන් පරපුරට ආවානම් අද මොකටද බන් අමුතුවෙන් සමාජවාදයක් ගැන කයි කතන්දර! බුදු හාමුදුරුවනේ ඇතිකළ වදාළ අණපනත් ඒ හැටියටම ගෙන ආවා නම් වෙන මොන සමාජවාදයක්ද බන්!.. (යායුතු මග... ලිපියෙනි)

"අපේ ගමන අපට ඉතාමත්ම පැහැදිලිය. ගමන අවසන්වන්නේ දුක් විඳින පොදු ජනතාවට සතුට සොම්නස සැනසීම ලබාදෙන ක්ෂේමභූමියකින් බව ඉතා පැහැදිලිය."

ජේ.ආර්. ජයවර්ධනට විරුද්ධව ප්‍රචාරක රැස්වීමකට ගිය වල්පොළ රාහුල හා කළුපහන රේවත හිමිවරුන්ට බේබදු දාමරිකයන් ලේ ගලනතුරු. සිහිනැතිවන තුරු පහර දුන්නේ නියම නර රකුසන් ලෙසය.

නමුත් මේ කිසිම විටකත් අපේ භික්ෂූන් වහන්සේලා දුර්වල කරන්නට හෝ මෙල්ල කරන්නට හෝ ඔවුහු අපොහොසත් වූහ. "අපේ ගමන සාර්ථකයි කියා හිතෙනතුරුම අපි ඒ ගමන් මග ගියෙමු."

## 3. 1956 පුනරුදය

අධිරාජ්‍යවාදයට එරෙහිව 1818 දීත් 1848 දිත් ඇතිවූ කැරැලිවලින් පසු උදාවූයේ අනුගත වීමේ යුගයකි. එනම් බටහිර අධ්‍යාපන ක්‍රමය සරණ යමින් ධනපති ක්‍රමය තුළට වදිමින් විදේශීය සංස්කෘතිය තුළ ගිලෙමින් දේශීය ප්‍රභූ කොටස් පෙරට ගියහ. එහෙත් ගැමි කොටස් වෙත අසහනය තවදුරටත් බලපෑ අතර ස්ථිර විසඳුමක් ද නොවීය. කෙසේ වෙතත් නැග එන දේශීය අනුකාරකයින් ධනපති පංතිය තුළින් තම චින්තනය පතා ගමන් මගක් ඇරඹුණු බව අපි දුටුවෙමු. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මගින් බිහිකරන ලද ආනන්ද, නාලන්ද, ධර්මරාජ, මහින්ද ආදී පාසැල් විකල්ප පාසැල් නොවූ අතර ඒවා ද රාජකීය, සෙන් තෝමස් ආකෘති තුළ ම ගිල්වනු ලැබූ නාම මාත්‍ර දේශීය පාසැල් විය. ආරුමුග නාවලර් විසින් පිහිටුවනු ලැබූ යාපනය හින්දු විද්‍යාලය, මුස්ලිම්වරුන් වෙනුවෙන් පිහිටවූ මරදාන සහිරා විද්‍යාලය ආදිය ද ජාතිකමය හර පද්දතියක් ඉදිරිපත් නොකළහ. තව ද ඒවා වෙත ඇදී ගියේ ඉතා සීමිත පිරිසක් පමණි. කන්නන්ගර නිදහස් අධ්‍යාපන පනතේ යම් යම් ක්‍රියාකාරකම් මගින් දේශීය අධ්‍යාපනයේ පුනරුදයක් ඇතිවූ බවත් ආනන්ද

විශාකා, හින්දු, සහිරා ආදී විද්‍යාලවලට හසුකර ගත නොහැකි වූ සියවස් ගණනක් යටපත් කරන ලද බලවේගයන්ගේ උතුරා යන ජීවය ගම්බද මධ්‍ය මහා විද්‍යාලවලින් ප්‍රකට වූ බවත් කැපී පෙනෙන ලක්ෂණයක් විය.

නාමමාත්‍ර නිදහස ලැබීමෙන් (1948) පසුව දේශීය ධනපති පංතිය සුදු අධිරාජ්‍යවාදය දෙසට සිදුකරමින් සිටියහ. එක් පසකින් කොරියන් යුද්ධය නිසා ඉහළ ගිය රබර් මිල වැනි හේතු කාරකයන් තුළින් යම් ආර්ථික ස්ථාවර භාවයක් උදාවූ අතර බටහිර සුබෝපභෝගී බඩු මුට්ටු, සුරා සූදු වේගයෙන් පැතිරිණි. බටහිර සංස්කෘතිය සම්භාව්‍යත්වයක් කරා පිය මනිමින් තිබිණ. අනෙක් පසින් පමණ නොදුන කළ වියදම් හේතුවෙන් ආර්ථිකයේ ඇතිවූ අවපාතයන් ඉදිරියේ දැඩි ආර්ථික ගැටලුව ද සාමාන්‍ය ජනයා අතර පැතිරෙමින් පැවතින.

ධර්මපාළ තුමා - වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා ආදීන් ගොඩ නැගූ ජාතික ව්‍යාපාරය හා විදුදය, විදුලකර ආදී දේශිය අධ්‍යාපන රටාවෙන් පෝෂිත වූ දේශීය අනන්‍යතාවයක් පතන්නෝද 1948 න් පසු නව පැතුම් ගොඩනගා ගත්හ. නව ජාතික නවෝදයක්, උද්‍යෝගයක් හා පැතුමන් පැතූහ. එහෙත් සිදු වූයේ පෙරටත් වඩා නරක කාලයක් උදාවීමය. ජාතික උරුමය හඹාගිය කොටස් දුර්මුඛ වූ අතර ඔවුන් විසින් කුළුගන්වනු ලැබූ සියවස් ගණනක් තම අනන්‍යතාවය රැකගනිමින් සිටි බහුතර ජනතාව ද පැතුමන් අලුත්කර ගැනීමක් කරා පියමන් කර සිටියහ. ආර්ථිකමය ලෙස ද සංස්කෘතිමය ලෙසද දැඩි පීඩාවකට හසුව සාමාන්‍ය ජනයා පෙළමින් සිටි අතර නව උදාවක් පතමින් සිටියහ.

මේ බලවේගයට යම් පමණකට හෝ වේගවත් නායකත්වයක් ලැබුණේ ලංකා සමසමාජ පක්ෂය මූලිකව වමේ පක්ෂ වලින් පමණි. එහෙත් ඒවායේ නායකයින් බොහෝ දෙනෙක් බටහිර උසස් අධ්‍යාපනය විසින් ජාතික ආත්මය සිඳගත් ජාතික හැඟීම බුද්ධියෙන් තබා ඉවකින්වත් හඳුනා නොගත් කොටස් වූහ. එහෙයින් අවදි වන මේ මහා බලවේගය නියම නිදහස් සටනක් කරා යොමු කෙරුමට ඔවුන් අසමත් විය. එහෙත් ධනපති පංතිය තුළින් මේ බව වටහාගත් බණ්ඩාරණායක මහතා ද පෙරළිකාරයකු වන පිළිප් ගුණවර්ධන මහතාද මේ මහා බගවේගය වටාහා ගත් අතර ඔවුන් විසින් රාජ්‍ය බලය ලබාගැනීමක් කරා ගමන් කරනු ලැබීය.

එය තීරණාත්මක ලෙස බමුණු කුලයේ ඇද වැටීම විය. ස්වභාෂාව තීරණාත්මක සාධකය බවට පත්විය. අධ්‍යාපනයේ පුළුල් බවක් ද විශාල වෙනසක්ද සිදුකරන ලදී. අධ්‍යාපනයේ සිදුවූ ප්‍රථම වෙනස නම් ස්වභාෂා අධ්‍යාපනය පෙරට ඒමය. සිංහලය රාජ්‍ය බස වීමය. එතෙක් එතෙර මෙතෙර අතර වැනෙමින් තිබූ අධ්‍යාපනය මෙතෙර එකක් බවට පත්වීම එහෙයින් සහතික විණි. මේ වන විටත් නොසලකා හැර අතිවිශාල

දේශීය ගැමි ජනතාවගේ දරුවන්ට නව උදාවකින්, නව පැතුමන් තුළින් අධ්‍යාපනය දෙස බැලීමට එය මහෝපකාරි විය.

දේශීය සංස්කෘතික ධාරාව ප්‍රාණවත් කරන ලදී. පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවන ලද අතර දේශීය විෂයන් කොරෙහි ඉතා උනන්දුවක් දක්විණි. විද්‍යොදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්ව විද්‍යාලයන් බවට නගා සිටුවන ලද අතර ඒවායේ ස්වභාෂා අධ්‍යාපනය ප්‍රථමයෙන් ම විශ්ව විද්‍යාලවල ආරම්භ විය.

පාසැල් ප්‍රමාණය ඉතාම තීරණාත්මක අයුරින් වර්ධනය කරන ලදී. අරඹන ලද බොහෝමයක් ගම්බද පාසැල් විය. පාසැල් පැමිණීම කෙරෙහි දරුවන් උනන්දු කරවීමේ වැඩ පිළිවෙළක් යොදන ලදී.

| වර්ෂය | රජයේ | ආධාර ලබන | එකතුව |
|---|---|---|---|
| 1955 | 3675 | 2213 | 5888 |
| 1960 | 4394 | 2592 | 6986 |
| 1965 | 3464 | 1086 | 4559 |
| 1972 | 8551 | 1446 | 9697 |

පාසැල් ප්‍රමාණය ඉතා ශීඝ්‍රයෙන් වැඩි වූ අයුරුත් 1961 දී ගෙන එන ලද පනතක් නිසාවෙන් පෞද්ගලික පාසැල් බොහෝමයක් රජය වෙතට ජනසතු කළ අයුරුත් මෙයින් පෙනේ. එදා පාසැල් ජනසතුවට කතෝලිකයෝ ඉතා දැඩිව විරුද්ධ වූ අතර එය කඩාකප්පල් කෙරුමට විශාල උත්සාහයක් දරන ලදී. පාසැල් ප්‍රමාණය ද වැඩිකරන ලදී. 1956 පෙරළියට දායක වූ එක් බලවේගයක් ද වූයේ ගුරුවරුන්ය. ගුරු විද්‍යාල පුළුල් කර පුහුණු ගුරුවරුන් ඉතා විශාල ප්‍රගතියක් බිහි කරන ලද්දේය.

අධ්‍යාපනය ප්‍රමාණාත්මකව මෙසේ ඉතා විශාල ප්‍රමාණයක් (100%ක්) සිය නිම් වළලු පුළුල් කර ගනිද්දී එය ඉතා විශාල ගුණාත්මක පියවරයන් ද ඉදිරියට තබනු ලැබීය. 56 පෙරළියේ ඉතා වැදගත් පියවරක් වූයේ දේශීය විෂය ධාරාවන් (කළා විශය ධාරාව) ඉතා විශාල ලෙස කුළුගන්වන අතර ම බටහිර විද්‍යා අධ්‍යාපනයද ඉතා පුළුල් අයුරින පාසැල් මට්ටමින් ඇරඹීමය. විද්‍යාව ස්වභාෂාවෙන් ඉගැන්වීම අරඹන ලද අතර ඒ සඳහා අවශ්‍ය වූ විද්‍යාගාර පහසුකම් යනාදිය ගැමි පාසැල්වලට ද සපයන ලදී. අම්පාර හාඩි ආයතනය, මරදාන හෙ රත්මලාන කාර්මික විද්‍යාල ආදිය මෙසේ ප්‍රාථමික කාර්මික ආයතන වූ අතර කටුබැද්දේ පිහිටුවනු ලැබූ කාර්මික විද්‍යාලය විශ්ව විද්‍යාලයක් බවට පෙරළීමක් දක්වා ඉදිරියට ගිය තාක්ෂණික අධ්‍යාපණික රැල්ල ආරම්භ වූයේ 56 පුනරුදය තුළිනි.

## විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්

| වර්ෂය | මුළු ශිෂ්‍යයන් | කලා% | විද්‍යා% |
|---|---|---|---|
| 1957 | 2718 | 40.3 | 59.7 |
| 1962 | 7816 | 62.9 | 37.1 |
| 1966 | 14287 | 75.8 | 24.2 |
| 1972 | 12074 | 65.2 | 34.8 |

පොදුවේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ඉතා විශාල ප්‍රමාණයක් පෙන්නුම් කරන අතර කලා පාඨමාලාවන්ගේ ප්‍රසාරණය විද්‍යා පාඨමාලාවන්ට වඩා වැඩි ශීඝ්‍රතාවයකින් සිදු වූ බව පෙනේ.

පෙරදී පාසැල් කිහිපයකට පමණ සීමාවූ විශ්ව විද්‍යාල වරම යම් පමණකට ගැමි දරුවන්ට හිමි වූ අතර ඔවුන් ලැබූ අධ්‍යාපනය නිසාවෙන් නව බලවේගයක ප්‍රසාරණයක් සිදු වෙමින් පැවතින. කෙසේ වෙතත් 1956 පුනරුදය නිසි අයුරින් මෙහෙය වූ එකක් නොවින. බමුණු කුලයේ පරාජිත තත්ත්වය දුටු ප්‍රතිගාමීත්වය බණ්ඩාරණායක මහතා ඝාතනය කළ අතර නැග ආ බලවේගය හඳුනා නොගත් වාමාංශික පක්ෂ වෙතින්ද විවිධ බාධා ඇති විය. පාසැල් ජනසතුව ආදී ක්‍රියාදාමයන් කතෝලික - ක්‍රිස්තියානි හා සමහර බෞද්ධ ධනපතීන්ද පුනරුදයට දැඩිව එරෙහි කරවීමට හේතු විය. මේ සියලු බලවේගවල ප්‍රතිගාමීත්වයන් නැග ආ පුනරුදය මන්දගාමී කරන ලද අතර තම බලවේගයන් කුමක් දැයි වටහා නොගත්කම තුළ එය පෙරට ගෙන ගිය කොටස් ද හඝරක් නොදැන වල්මත් වූහ.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයද පැසැල් අධ්‍යාපනයද කෙතරම් පුළුල් වුවද කලා සන්ධාරයද විද්‍යා තාක්ෂණික සන්ධාරයන් ද ඉතා සීඝ්‍රයෙන් පුළුල් වුවද එකී පුළුල් වන බලවේගයන් ජාතික ආර්ථිකයට අවශෝෂණය කෙරුමේ වැඩ පිළිවෙළක් නොවිණ. ජනසතු ව්‍යාපාරය තුළින් නව ජාතික ආර්ථිකයක සුවඳ වහනය වුවද අධිරාජ්‍යවාදීන් ඇතිකළ ධනපති ක්‍රමයේ ආර්ථිකය බටහිරකරණයේ විනාශයෙන් රට ගලවා ගත හැකි විදේශීය රාමුවෙන් මිදුණු ජාතික ආර්ථිකයක් බිහි නොවින. ආර්ථිකයත් අධ්‍යාපනයත් අතර පැවතිය යුතු සහජීවනයද යම් පමණකට බිඳ වැටුණු හෙයින් උසස් අධ්‍යාපනය ලැබුවන් අතර සෙමෙන් කලකිරීමක් දක්නට ලැබිණ. මෙය ආචාර්ය හා සිසු දෙපිරිස ම අතර පැතිර ගියේය.

අනෙක් තීරණාත්මක සාධකය වූයේ සස්කෘතිකමය වශයෙන් පැවති බමුණු කුල ආධිපත්‍ය සහමුලින්ම බිඳ නොදැමීමය. ආර්ථිකමය වශයෙන් බමුණු කුලය අතුගෑවී නොගිය අතර තවමත් සංස්කෘතික ලෙස පෙර තරම් නොවුනත් ඒකාධිකාරය ඔවුන් සතුවිය. අනෙක් අතට ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් බිහි වූ කොටස් (නාලන්ද - ආනන්ද) වලට පෙරට වඩා ඒකාධිකාරයක් ලැබුණා මිස සාමාන්‍ය ජනතා වලට පෙරට වඩා වැඩි ඒකාධිකාරයක් ලැබුණා මිස සාමාන්‍ය ජනතා දරුවන්ට එහි තැනක් නොවීය. මේවායින් බිහිවූ කොටස් ද විකල්ප හර



chandrakarawaka.lk

පද්ධතියක් සහිත වූවන් නොවූ බව අපි දනිමු. එහෙයින් ආනන්දය වැනි පාසැල් වලින් බිහි වූවන් පැවති හර පද්ධතිය තුළ තරගයට වැදුනා මිස දේශීය හර පද්ධතියට සේවයක් කළේ නැත. මෙතෙක් දෙවැනිව තිබූ ආනන්දය - රාජකීය මට්ටමට පැමිණීම පමණක් සිදුවිය.

පැවති හා පවතින බමුණු කුල අධිකාරිය බිඳින්නට නම් එයට ප්‍රතිපක්ෂ ආර්ථිකය හා සංස්කෘතික රාමුවක් ගොඩනැගීම ද අවශ්‍යව තිබිණ. විදේශීය ධනපති කඳවුරෙන්ද (ඇමරිකාව - බ්‍රිතාන්‍ය) තියුණු තර්ජනයක් ලංකාවට එල්ල විය. ජනසතු ව්‍යාපාරවලට එරෙහිවද පාසැල් ජනසතුව, ස්වභාෂා අධ්‍යාපනය ආදීයෙන් ඇවිස්සුණු ආගමික (සුළු ජාතික) බලවේගයන් ද ඔවුන් විසින් කුළුගන්වනු ලැබීය. මේ සියල්ල පියමන් කරගැනීමට නම් ඒ සඳහා විකල්ප වැඩපිළිවෙළකුත් එය රැක ගැනීම සඳහා පරිත්‍යාගශීලී දැඩි කැප කිරීම් සහිත පිරිසකුත් අවශ්‍ය විය. ඔවුන් ලබා ගැනීමට හැකිවන්නේ ඈත ගැමි පාසැල් වලින් බවත් ඔවුන්ට බලය වරදානය කළ යුතු බවත් 56 බලවේගයට නොහැඟුණි.

එක් පසකින් 56 රැල්ල මගින් ගැමි දරුවන් ද අවුස්සනු ලැබුවේය. පැසැල් පුළුල් වීම - සරසවිය පුළුල් වීම - ස්වභාෂා නිදහස් අධ්‍යාපනය හරහා විශාල පිරිසක් උසස් අධ්‍යාපනයට ගියහ. එහෙත් 56 පුනරුදයේ ඉහත කී දුර්වලතාවයන් නිසා, එනම් අර්ධ පුනරුදයක් නිසාවෙන් ගැමි දරුවන් තමන් පොලන ආර්ථික - සංස්කෘතික ඒකාධිකාරය දුටහ. එය වඩා සවිඥාණක බැල්මක් වූයේ ඔවුන් ගේ හැඟීම්බර ස්වරයට බුද්ධියක් ද දියක කළ අධ්‍යාපනය නිසාවෙනි. ඇතිකරන ලද අර්ධ විප්ලවය පූර්ණ විප්ලවයක් කෙරුමට ඔවුන්ට අවශ්‍ය විය. රැකියා විරහිත භාවය, රැකියාවල තත්ත්වය, දේශපාලන බලය ඇතිවීම ආදිය ඉතා තීරණාත්මකව වෙනස් කළ යුතු යයි ඔවුන් තීරණය කරන ලදී. මෙවන් ඇවිස්සුණු ගැමි ගොවි දරුවන් පිරිසක් 56 පුනරුදය මගින් බිහිවීම ඓතිහාසික විය.

## 4. කඩවුණු පොරොන්දුව හා තේරුම් නොගැනීම (70 - 77)

1956 දී තමන් පැතූ ලෝකය තුළ තමන්ට හිමිවූ නිසි ස්ථානය එනම් දේශපාලන බලය නොලැබී යෑම අවදිව සිටි ගැමි තරුණයන්ට කඩවුණු පොරොන්දුවක් විය. 1971 දී නැගී සිටිනු ලැබුයේ එසේ විශ්වාස භංගවූ සියවස් ගණනක සිට නිදහස උදෙසා සටන් වැදුණු විජයබාහු - කැප්පෙටිපොළගේම දරු මුණුබුරන්ය. ඓතිහාසික සරදමවූයේ ඔවුන් නැගී සිටියේ සිය දෙමාපියන් විසින් ම 1956 දී සිදුකළ අර්ධපෙරළියේ නායකත්වයට එරෙහි වීමය.

1971 සිදුවූ භීෂණ ක්‍රියාවලිය තුළින් වත් උගත යුතු පාඩම් ජාතික නායකයින්, බණ්ඩාරණායක - පිලිප් පෙරළියේ නායකයෝ වටහා නොගත්හ. පිබිඳ එමින් සිටින මේ ගැමි දරුවන්ගේ අවශ්‍යතා සපිරෙන ජාතික ආර්ථිකයක් - සංස්කෘතියක් හා අධ්‍යාපනික රටාවක් නොපමාව ස්ථාපිත කිරීම අවශ්‍යතාවයද එවැනි පෙරළියක් සිදුකිරීමේ දි එහි මූලික ජවවේගය සපයන්නා හා දේශපාලන බලය ගෙනයන්නා මෙකී ගැමි දරුවන් ම වන බව ද අමතක කරණු ලැබීය. එහෙත් මෙය පසුපස යමක්, යම් කිසි ක්‍රියාවලියක් සිදුවන බව වටහා ගන්නා ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉතා විශාල ප්‍රමාණයේ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ රැසක් සිදුකරන ලදී.

1966 දී අංක 20 දරන උසස් අධ්‍යාපන පනතකින් වර්තමාණයේ පවතින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම වැනි කොමිෂන් පත් කෙරුමට උපකුලපති පත් කෙරුමේ අයිතිය ඇතුළු ස්වාධිකාර්යය උල්ලංඝනය වූ ක්‍රියාමාර්ගයන් නිර්දේශ කරන ලදී. මෙය සමගි රජයේ මුල් යුගය (1970 - 1971) තුළද වෙනස් අයුරින් ක්‍රියාත්මක කෙරුමට උත්සාහ කළ ද කැරැල්ල නිසාවෙන් සියල්ලේ පුළුල් වෙනසක් අවශ්‍ය බැව් තීරණය කරන ලදී.

1972 අංක 1 දරන විශ්ව විද්‍යාල එක්කොට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පිහිටුවන ලද අතර එයට අනුබද්ධ මණ්ඩප ලෙස එතෙක් පැවති විශ්ව විද්‍යාල පත් කරන ලදී. ඉතා විශාල බලතලවලින් යුතු ශිෂ්‍ය මණ්ඩපවලට ලබා දුන් අතර, ආචාර්යවරුන්ට හා සේවකයින්ට ද විශ්වවිද්‍යාල පරිපාලනය ලා බලපෑම් ඇති කළ හැකි ආකාරයට ඉඩකඩ සකසන ලදී. 1972 කටුබැද්ද මණ්ඩපයද ඇති කරමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පුළුල් කරන ලදී. 1972 දී 12,074 ක් වූ ( කලා 60.2% - විද්‍යා 34.8%) ශිෂ්‍ය සංඛ්‍යාව 1977 සිට "ප්‍රමිතිකරණය" යනුවෙන් නව ආකෘතියක් විශ්ව විද්‍යාලවලට ඇතුළු වීමේ ප්‍රතිපත්තියට ඇතුළු කරන ලදී. එයට පෙර සරසවි ප්‍රවේශය ප්‍රතිපත්තිය වූයේ උසස් පෙළ ලකුණු තත්ත්වය පමණක් සැලකිල්ලට ගැනීමය. මෙය මාධ්‍යය පදනම් කරගත් ප්‍රමිතිකරණය තුළ දිස්ත්‍රික් පදනමකට ද ඉඩ සලසන ලදී.

එක සමාන උසස් පෙළ අධ්‍යාපනය පහසුකම් රට පුරා ව්‍යාප්තව නොපැවති හෙයින් දිස්ත්‍රික් පදනම ද දුෂ්කර දිස්ත්‍රික් පදනම ද පැවතිය නොයුතු වූ අතර අසමාන අධ්‍යාපන වාතාවරණයේ අහිතකර ප්‍රතිඵලවලට තාවකාලික පිළියමක් ගෙන ආවේය. මාධ්‍ය ප්‍රමිතිකරණය තුළින් අධ්‍යාපනික දියුණුම දිස්ත්‍රිකයක් වූ යාපනය දෙමළ සිසුන්ට හානිකර ප්‍රතිඵල ගෙන දුනි. පොදුවේ විශ්වවිද්‍යාල අභ්‍යන්තරයේත් බාහිරත් විශ්ව විද්‍යාලවලට දුෂ්කර ගැමි දරුවන් ගේ ප්‍රවේශය කුළුගන්වන ලදී.

අධ්‍යාපනික විෂය මාලාව පාසැල් විෂය මට්ටමේ සිට වෙනස් කරන ලදී. විද්‍යා සන්ධාරය කුළුගන්වනු ලැබූ අතර තාක්ෂණික විෂයන්ද (වඩු වැඩ, අත්හුරු වැඩ, කාර්මික වැඩ) සමාජය දෙස විචාරශීලීව බලන විෂයන්ද (සමාජ අධ්‍යාපනය) ආදී ලෙස පාසැල් අධ්‍යාපනය නවීකරණය විය. පෙර පැවති දැඩි තරඟකාරී අ.පො.ස. සාමාන්‍ය පෙළහි ගැඹුරු විෂයන් වෙනුවට ගැඹුරු විෂයන් මෙන්ම සාමාජීය අගයෙන් යුතු විෂයන් පද්ධතියක් ද ඇතුළු කරන ලදී. මෙය අ.පො.ස. (සා.පෙළ) හි තත්ත්වය බාල කිරීමක් යයි සමහරු හඬ නැගුවද වඩා නැවුම් ස්වභාවයක් එකී අධ්‍යාපන රටාව තුළ තිබුණු බව පෙනී යයි.

මොන තත්ත්වය තිබුණද මේ වන විට අපගේ විද්‍යා අධ්‍යාපනය බ්‍රිතාන්‍ය සම්මතයන්ට අනුව හඬගැසී තිබිණි. උපාධි තත්ත්වය බ්‍රිතාන්‍ය සම්මත වූ අතර එය තුළ නිර්ණය වූ උසස් පෙළත් සාමාන්‍ය පෙළත් පොදු අනුකාරක ස්වරූපයක් මිස ජාතික ආර්ථික - අධ්‍යාපනික අවශ්‍යතා ඉටු කළ හැකි ස්වරූපයක් නොගත්තා ලදී. 1956 දී පවා සිදු නොවුණු මේ විෂය මාලාවේ වෙනස අලුත් දෘෂ්ටියක් සිට 1970 - 1977 කාලය තුළ අරඹන ලද්දේය. එහෙත් විශ්ව විද්‍යාල විෂය නිර්දේශයන් පෙර පරිදිම පවතිමින් පාසැල් අධ්‍යාපනයේ පමණක් සිදුකළ වෙනස පසුකාලයේදී 70 - 77 පාසැල් ශිෂ්‍යයන්ව සිටි කොටස් උසස් අධ්‍යාපනය කරා යෑමේදී අතරමං කෙරුමක් බවට පරිවර්තනය වූ බව අමතක නොකළ යුතුය.

තාක්ෂණය ඇසුරෙන් සෑම සිසුවෙකුම උගත යුතු විෂයක් ඇති කෙරුම ද වැදගත් පියවරක් විය. නව තාක්ෂණය ඇසුරෙන් ගොවිතැන්ද කාර්මික විද්‍යාල ද 1913 කන්නන්ගර වාර්තාවෙන් යෝජිත කුසලතා විෂයන් පෙරට ගෙන යෑමක් විය. එහෙත් සමස්ත රාමුවේ වෙනසක් සිදු නොවූ නිසා ගැමි දරුවන් ධීවර කර්මාන්තය, කෘෂි කර්මාන්තය, වඩු වැඩ, මැටි වැඩ උගනිද්දී නාගරික කොටස් විදුලි ඉංජිනේරු ශිල්පය, රේඩියෝ කිර්මික විද්‍යාව, මුද්‍රණ ශිල්පය ආදී පැවතුණු රාමුවේ වඩා ආර්ථික ශක්තියකින් යුතු විෂයන් හැදෑරීමට විසංවාදයක් ඉතිරි කළේය.

කෙසේ වුවද විශ්ව විද්‍යාලවල තාක්ෂණික අධ්‍යාපනය පෙරට ඒම පේරාදෙනි ඉංජිනේරු පීඨයට අමතරව කටුබැද්ද ඉංජිනේරු පීඨය ඇති කිරීමෙන් උදාවූ අතර විශ්ව විද්‍යාලවලට පහළින් තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලා නිසි ආකාරයට පුළුල් කරන ලදී. තාක්ෂණික ක්ෂේත්‍රයේ අධ්‍යාපනයේ සම්පූර්ණ ඒකාධිකාරය රජය සතුව පැවතුණ හෙයින් ඉතා සංවේදී ලෙස කිසිවෙකුටත් අසාධාරණයක් නොවන ලෙස ප්‍රතිපත්ති සැකසිය හැකිව තිබිණ. පොදුවේ විද්‍යා අධ්‍යාපනය විශ්ව විද්‍යාලවල වැඩි දියුණු විය. 1966 දී 24.2% වූ විද්‍යා සන්ධාරය 1972 34.8% ක් ද 1977 දී 39.4% ක්ද දක්වා වැඩි දියුණු විය.

අ.පො.ස. සමාන්‍ය පෙළ මට්ටමේ අධ්‍යාපනය දක්වා (10 වැනි ශ්‍රේණිය) පොදු විෂය ධාරාවක් ඇති කළ අතර එය තුළ සෞන්දර්ය නම් විෂයක් ද ඇතුළු කරන ලදී. චිත්‍ර කලාව, සංගීතය හා නැටුම් මේ යටතේ ශිෂ්‍යයාට හැදෑරිය හැකිව තිබිණ. රාජ්‍ය අනුග්‍රහයෙන් 56 දී සංස්කෘතික අමාත්‍යංශය පිහිටු වීම සමග දේශීය කලා ශිල්ප වෙත නැඹුරුවක් තිබුණු හෙයින් පාසැල් මට්ටමේ ඇති වූ මේ සෞන්දර්ය විෂයන් උපාධි මට්ටමේ විෂයන් දක්වා වර්ධනය කරනු ලැබීය. එය ඇත්ත වශයෙන් ද කුළු ගැන්වෙන සුළු වෙනසකමක් විය.

ආර්ථික විද්‍යාව, ඉතිහාසය, භූගෝලය, දේශපාලන විද්‍යාව, දර්ශනය ආදී ලෙස පෙර 8, 10 ශ්‍රේණි අතර පැවති විෂය මාලාව සමාජ අධ්‍යයනය නමින් වූ වඩා සරල එක් විෂයක් බවට පෙරළීම එක් අතකින් එකී විෂයන්ගේ භාරය අඩු කළ ද අනික් පසින් වඩා රසවත් කළේය. සමාජ අධ්‍යන විෂය එවකට පැවති පුළුල් විෂය විය. රටේ ආර්ථික සමාජ අවශ්‍යතා, රටේ හා ලෝකයේ වෙළෙඳ අවශ්‍යතා, රටේ හා ලෝකයේ දේශපාලන ප්‍රවණතා ඉතා විවෘත ලෙසත් සංවාදශීලී ලෙසත් 6, 10 ශ්‍රේණිවල දී අධ්‍යනය කරන ලදී. එයටම අදාළ කොටස් ප්‍රයෝගික දේශපාලන සත්වයෙක් සිසුවා කෙරෙහි බිහිකෙරුමට ක්ෂේත්‍ර අධ්‍යයනය නම් වැඩ මුළුවක් ද පැවැත්වූ නමුත් විවිධ ආර්ථික - සමාජීය දුෂ්කරතා නිසා එය අසාර්ථක විය. කෙසේ වෙතත් ධනවාදී - සමාජවාදී දේශපාලන ක්‍රමය ආදී දෙයට විශාල සංවාදශීලී බවක් පැතිර යන ලදී. මේ අධ්‍යාපනයේ දෝංකාරය රටතුළද දෝංකාරය වූ අතර නව සාහිත්‍යයේ රැල්ලක් සිනමා රැල්ලක් නාට්‍ය රැල්ලක් ලෙස අලුත් සංස්කෘතික ප්‍රචාරයක් අපේ සංස්කෘතියට පටහැනි නොවුණු රැල්ලක් ආරම්භ විය.

එහෙත් 56 - 70 තුළ ඇතිවූ සංස්කෘතික තත්ත්වයට මූලික වූ කරුණු වෙනස් නොවින. 71 නැගී සිටීමෙන් ගැමි දරුවන්ගේ එක් කළ විභවයක් පුපුරා ගියද නව විෂයක් එක්තැන් වෙමින් පැවතින. එහි පළමු වැන්න නම් ආර්ථිකය ප්‍රසාරණය නොවීමය. උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් රැකියා විරහිත භාවයට පත් වූහ. එයට සමරූප ලෙස උසස් පෙළ, සමාන්‍ය පෙළ සමත් විශාල පිරිසකට රැකියා සුලභ නොවීය. නැවත වතාවක් පුළුල් වන අධ්‍යාපන රටාවේ නිපැයුම් සමග ජාතික ආර්ථික අත්වැල් බැඳ නොගන්නා ලදී. වතු ජනසතුව පස් අවුරුදු සැලැස්ම වගා සංග්‍රාමයආදී සටන් පාඨ ඔස්සේ ආර්ථික ක්‍රියාවලිය පෙරට ගෙනයෑමට යත්න දරුව ද එයට ගැමි ජනයාගේ ජීවමාන සහය ලබා ගැනීම අපහසු විය. ඇත්ත වශයෙන්ම සංඝිකක්‍රමය පිළිබඳ, සාමූහික ක්‍රමය පිළිබඳ ඉතා දීර්ඝ කාලයක් තිස්සේ ආගමික සංස්කෘතික ලෙස මඬනු ලැබූ ගැමි ජන කොටසට සමූපකාර ක්‍රමය පවා දිරවන සුළු නොවීය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ගැමි දරුවන් වෙතින් ඇත් වුණු දේශපාලන නායකත්වයත්, ගැමි දරුවන් නොලැබුණ දේශපාලන

බලයක්, වෙනස් නොවූ සමස්ත බමුණු කුලයේ ආර්ථික - සංස්කෘතික රාමුවත්ය.

ආර්ථික - සංස්කෘතික ජාලයේ ඈත පරිධියේ විශාල වෙනස්කම් මධ්‍යයේ බලයෙන් වෙනස් වූ අතර පරිධියේ වෙනස්කම් ඉදිරියේ මාධ්‍ය බලයට වෙනස් විය නොහැකි විය. පරිධියේ දේශපාලන චලනයන් මෙයින් කැලැඹුණු අතර මාධ්‍ය දේශපාලනයෙන් ඉවත්ව නව බලයක් කරා යෑමට පොළඹ වන ලදී. ප්‍රතිගාමීත්වය විසින් 1977 දී තුරුලු කරගන්නා ලද්දේ මෙසේ අවුස්සා - නොසලක හරින ලද ජන කොටස්ය.

ආර්ථික ක්‍රියාදාමයන් තුළ අධ්‍යාපනයේ ඵල අවශෝෂණය නොවන විට උසස් අධ්‍යාපනය සඳහා බිහිවිය. එය විද්‍යා අධ්‍යාපනය දක්වා වූ තරගයක් බවට ක්‍රමයෙන් පෙළෙනු දක්නට ලැබිණ. එක් වාර්තාවකට අනුව එවකට (1978 දී) පටන් ගැනීමේදී 15% ක් දරුවන් පාසැල් නොයති. 50% ක් අතරමග ඇන හිටී. 20% ක් දක්වන ශ්‍රේණියෙන් ඉවත් වන අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලැබෙන්නේ 1% කට පමණි.

| විභාග වර්ෂය | සුදුසුකම්ලත් සංඛ්‍යාව | බඳවාගත් සංඛ්‍යාව | ප්‍රතිශතය | පෙනී සිටින මුළු ගණනට ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1970 | 10,282 | 3457 | 33.09% | 10.9% |
| 1972 | 10,747 | 3420 | 31.82% | 10.8% |
| 1974 | 12,961 | 3532 | 27.25% | 11.2% |
| 1975 | 15,023 | 3942 | 26.23% | 8.4% |
| 1976 | 19,045 | 4150 | 21.79% | 7.8% |
| 1977 | 27,582 | 4996 | 18.11% | 5.9% |

## විශ්වවිද්‍යාල ප්‍රවේශය

මෙලෙස අධ්‍යාපනික තරඟය ආරම්භ වුවද එය වර්තමානය තරම් මාරාන්තික දෙයක් නොවීය. සමාජය තුළ තරඟයට තිබූ ඉඩකඩ අඩු වීම එයට හේතුවක් විය. කෙසේ වෙතත් පාසැල් පාසැල් අධ්‍යාපනය පුළුල් නොවීමත් එයට සමරූපී ලෙස ජාතික ආර්ථිකය සකස් නොවීමත් මහත් අර්බුදයක් ලෙස නැග එමින් පැවතින.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මුල් යුගයේ සිට බ්‍රිතාන්‍ය ආකෘතියයට පවා සරසවි ස්වාධිකාර්ය හා සරසවි සිසුන්ගේ නිදහස් - ආර්ථිකය ආදිය වැදගත් විය. එහෙත් 60 දශකයේ සිට කුකුල් මස්වල සිට කහට කොප්පය දක්වා සරසවි සිසු ආර්ථිකය පිහිටුණු අතර මංඩපාධිපතිවරයන් ගේ දේශපාලන ක්‍රියාදාමයන් හා රටේ පොදු අසහනය සරසවි තුළින් ඉතිරීයන තත්ත්වයක් ඇති විය. එහෙත් බොහෝ ශිෂ්‍ය සංගම්වග බලය රජයට පක්ෂපාත දේශපාලන කණ්ඩායම් අත තිබිණි. එහෙත් එය තව දුරටත්



chamikaranawaka.lk

එසේ නොවන බව 70-77 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඵල රහිත ලෙස බවත් පෙන්වමින් 1976 නොවැම්බර් 12 දින වීරසූරිය ඝාතනය සමග පැමිණි ශිෂ්‍ය සටන් රැල්ල පැවසීය.

1970 -77 අධ්‍යාපන ක්‍රමයේ - ආර්ථිකයේ වූ අඩුපාඩු ඉහත සංක්ෂිප්තව පවසා ඇත. එහෙත් මේ සියල්ලටම වඩා වූයේ දේශපාලන බලය ප්‍රධාන පාඩම එය විය. මේ සඳහා ගැමි බලවේග සමග බලය බෙදා ගැනීම වෙනුවට ප්‍රථමයෙන් ඔවුන් දැඩිව යටපත් කරනු ලැබූ අතර පසුව අසංවිධානාත්මක ලෙස මේ ප්‍රතිසංස්කරණය සිදුකරනු ලැබීය. උපාය මාර්ගික ලෙස ගැමි දරුවන්ගේ සංස්කෘතික ආර්ථික බලයට එරෙහිව වෙනත් නාගරික මධ්‍යම පාන්තික තරුණයන් වෙතින් නව ප්‍රගතිශීලී රැල්ලක් ද ඇති කිරීමට යත්න දරන ලදී. කෙසේ වෙතත් මේ උනුන් හඳුනා නොගැනීමත්, ගැමි දරුවන් තව දුරටත් දේශපාලනයේ පරිධියේ ලක්ෂයන් වෙතට කොටු කර දැමීමට ගත් උත්සාහයත්, ප්‍රතිගාමීත්වය තම වාසියට හරවා ගනී. ඇත්ත වශයෙන් ම ඇති කළ වැඩ පිළිවෙළ අවංකව දැඩි කැපකෙරුමකින් ඉදිරියට ගෙනයෑමට අවශ්‍ය බලයක්, පැවතුණු 70 - 77 රජයේ නියෝජනය නොකළ අතර එහෙයින් එකී ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ඒවාට ප්‍රතිපක්ෂවම නැග එන්නට විය.

champikaranawaka.lk

# සිව්වන කොටස

## 1. ශාපලත් යුගය ඇරඹේ.......

### ● අධ්‍යාපන පද්ධතිය කැළඹේ....

1977 යූ.එන්.පී. ය බලයට පැමිණීමට අධ්‍යාපනික ලෙස බලවේග පෙළ ගැසෙණු ආකාරය කෙටියෙන් අපි ඉහත සලකා බැලුයෙමු. 1977 පසු ආර්ථික - සංස්කෘතික දේහයට සිදුකළ උඩු යටිකුරුව එතරම් ශීඝ්‍රයේ විදේශ ආක්‍රමණිකයින් වත් සිදුවේ යැයි සිතිය නොහැකිය. විවෘත ආර්ථිකයේ චණ්ඩ සැඩ පහරට අසුව ජාතියේ සියලු පද්ධති, සම්මතයන් බිඳ ගියේය. ප්‍රතිඵලය වූයේ මුළු රටම මිනීකුණු ගඳගස්සන අමුසොහොනක් වීමය. එය නිකම්ම පාළු සොහොනක් නොව, දිවා රාත්‍රී කොකා - කෝලා - චොකාබයිලා නටන අමුසොහොනක් විය. එතරම්ම ව්‍යසනකාරීවූ මේ හිම සමයේ ලාංකික සමාජ ආර්ථික දේහයේ කොටසක් වූ විශ්වවිද්‍යාල, අධ්‍යාපනය ද මහත් ව්‍යසනයකට මුහුණ දුන්නේය.

අධ්‍යාපනය යනු ආර්ථිකමය මෙන්ම එසේ නොවුණු කරුණු අතින්ද අයෝජනයකි. එහෙත් පසුගිය කාලය පුරා දක්නට ලැබුණු දෙයක් නම් (1956 සිට) අධ්‍යාපනය පුළුල් වන තරමට එය අවශෝෂණය කෙරුමට රටේ ආර්ථික - සංස්කෘතිය පුලුල් නොවීමය. මෙය උගත් විරැකියවක් ඇති කළේය. 1977 පසු යූ.එන්.පී. රජය මෙයට විසඳුම් දුන්නේ අධයාපනය උකහා ගත හැකි ආකාරයට ආර්ථිකය වර්ධනය කෙරුමට නොවේ. ඔවුන් ගේ පාදඩ ආර්ථික - සංස්කෘතික රටාවන් අධ්‍යාපනය තුළ එනෙක් නොවූ විරූ තරඟයක් ඇති කළේය. අනෙක් අතින් යූ.එන්.පී. යේ ආර්ථික සංස්කෘතික ප්‍රතිපත්ති ඉදිරියේ විශ්ව විද්‍යාල හා අධ්‍යාපන ක්‍රමයට වූ ප්‍රාථමික වැදගත්කම අහොසි වී ගියේය. අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය වැදගත් වන්නේ දේශීය වශයෙන් භාණ්ඩ සේවාවන් නිපදවන හා පවත්වාගෙන යන ආර්ථික - සංස්කෘතික පද්දතියක

බුද්ධිමය බලය මෙන්ම මගපෙන්වන්නාද ලෙසය. එහෙත් යූ.එන්.පී. ය රටට උරුම කර දුන්නේ සේවාවන් වැඩියෙන් ඇති එකී සේවාවන්ද විදේශ ණය උතුරා යන කළු සල්ලි වලින්ද පවත්වාගෙන යනු ලබන සියලු භාණ්ඩ ආනයනය කරන හා අවශ්‍ය නඩත්තුවද, ඥානය ද ආනයනය කරන වර්ගයේ ආර්ථිකයකි. එයට මගපෙන්වූයේ විදේශීය උපදේශක සමාගම් හා ජාත්‍යන්තර ණය ලබාදෙන මූලස්ථානයයි. අනෙක් අතින් සංස්කෘතියද, දේශීය භාෂාව, සාහිත්‍ය, ඉතිහාසය ආගම මූල්කරගතක් නොව බටහිර සම්භාව්‍ය ඉංග්‍රීසියද, බටහිර පාදඩ සංස්කෘතිය ද ගුරුකරගත් ආනයනය කරන ලද පාදඩ සංස්කෘතියක් විය. මේ තත්ත්වය තුළ අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ආර්ථිකමය ආයෝජනයකට වඩා ආර්ථිකට බරක් ලෙස සලකන ලද්දක් විය. ඇතිවූ විකෘතිය ඉදිරියේ විද්‍යා හා කලා අධ්‍යාපනික ධාරාවන් ගෙන් ඉවත්ව වෙළඳ විෂයන් වන වෛද්‍ය - ඉංජිනේරු ආදී විෂයන් කරා අධ්‍යාපනය තල්ලු වී ගියේය. එකී විෂයන් ද දේශයට ගැලපෙන ලෙස නොව සෘජුවම ආනයනය කරන ලද ඒවා විය.

මෙලෙස තම පාදඩ, පර ආර්ථික - සංස්කෘතික පද්ධතිය පවත්වා ගැනීමට අනිවාර්යයෙන්ම අධ්‍යාපන කප්පාදුවක් වෙතට යොමු වන්නට රජයට සිදුවිය. එය ආරම්භ කරන ලද්දේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙනි. ප්‍රථමයෙන් ව්‍යවස්ථාදායක ලෙසත් පසුව නග්නවත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ඔවුන්ට අවශ්‍ය ආකාරයට කප්පාදු කරන ලද්දේය.

## ● විශ්ව විද්‍යාල පදනම බිඳ වැටේ....

1. ස්වාධීනත්වය අහිමි කිරීම

විශ්ව විද්‍යාලයක එහි බටහිර මෙන්ම පෙරදිග ආකෘතියේද ඉතාමත් වැදගත් ක්‍රියාදාමයක් වන්නේ ගුරුන් හා සිසුන් අතර පවතින සම්බන්ධතාවය ය. ඊළඟට වැදගත් වන්නේ ස්වාධිකාරයයි. අධ්‍යාපනික නිදහස, චින්තනයේ නිදහස, ස්වයංපාලනයේ නිදහස හා වෙනත් බාහිර ඇඟිලි ගැසීමෙන් තොර ආදී අදහස් වලින් සමන් විත 'ස්වාධිකාරය' නම් වදන භාරතීය නාලන්දාවේ සිට බෙලෙක්ස්කෝව දක්වා විවිධ දෘෂ්ඨීන් ගේ සිට වුවද මූලික සංකල්පයක් විය. 1959 දී විද්‍යෝදය සරසවියේ උපකුලපති පදවියට පත් පූජ්‍ය වැලිපිටියේ සෝරත හිමියන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයා විප්ලවවාදීයෙක් ද, ගවේෂකයෙක් ද, නිරීක්ෂකයෙක් ද නිදහස් අදීන චින්තනයක් ඇති අයෙක් ද ලෙස හැඳින් වූයේ මේ මනසික නිදහස උත්වහන්සේ ඉතා වැදගත්කොට සැලකූ නිසා විය යුතුය.

ස්වාධිකාරය හා ශිෂ්‍ය ඇදුරු නිදහස පිළිබඳ සංකල්පයේදී 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ඉතා වැදගත්වෙයි. එය එ.ජා.ප. රජයේ ප්‍රථම පියවර වූ ව්‍යවස්ථානුකූලව ඒකාධිපතිත්වයට යන

chandikaramwak.lk

ගමනේ සෙසු බලතල කැටිකර ගත් අයුරටම විශ්වවිද්‍යාල බලතලද කැටිකර ගැනීමට දැරූ ප්‍රයත්නය වෙයි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම පිහිටු වීම....

1966 දී ද යූ.එන්.පී. රජය විසින් මෙයට සමාන ප්‍රයත්නයක් දරන ලද අතර එය යථාර්ථයක් කරන ලදී. පනතේ මෙසේ විය.

(2) තත් කාලයේ කොමිෂන් සභාවේ සාමාජිකයින් වන තැනැත්තන්ගෙන් සමන්විත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් මේ පනත යටතේ පිහිටුවනු ලැබේ.

(3) පහත සඳහන් කටයුතු කොමිසමේ අරමුණ වේ.

(i) ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය.

(ii) එක් එක් විශ්වවිද්‍යාවල මුදල් ප්‍රතිපාදනය හා වියදම් පාලනය.

(iii) උසස් අධ්‍යාපන ආයතන ශාස්ත්‍රීය මට්ටමින් පවත්වාගෙන යෑම.

(iv) උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය විධිමත් කිරීම

(v) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයන් ඇතුළත් කිරීම විධිමත් කිරීම.

(4) කොමිෂන් සභාව සභාපති වරයෙකු හා වෙනත් සමාජිකයන් හතර දෙනකුගෙන් සමන්විත වන අතර ඔවුන් සියලු දෙනා ම ජනාධිපතිවරයා විසින් පත්කළ යුතුය.

මෙලෙස සෘජු ලෙසම ජනාධිපතිවරයාගේ අනසක යටතට විශ්වවිද්‍යාල පද්ධතිය යටපත් කරන ලද අතර ප්‍රතිපාදන කොමිසම සිය බලතල විටෙක විකෘති කර හුවා දක්වමින් විශ්වවිද්‍යාල පාඨමාලාවලට හා ගැටලුවලට සෘජුවම මැදිහත් විය. අ.පො.ස. (උ.පෙ.) ප්‍රථිඵල ලේඛන සැකසීමත්, විශ්වවිද්‍යාල ප්‍රවේශයේ ලා වූ විවිද අක්‍රමිකතාත්, විශ්ලේෂණයෙන් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වැනි ආයතන සඳහා වූ අක්‍රමිකතාත් සඳහා ප්‍රතිපාදන කොමිසම බලපාන ලදී. විශේෂයෙන් විෂය නිර්දේශයන්, ප්‍රතිපත්ති සැකසීම් යටතේ සෘජු ලෙස ජනාධිපති පත් කළ පඹයින් විසින් රජයේ පාදඩ ප්‍රතිපත්ති සියල්ල විශ්වවිද්‍යාල ඇදුරන් හා සිසුන් වෙත සෘජුවම යොමුකරවනු ලද්දේය.

මෙයට අමතරව උසස් අධ්‍යාපන ඇමතිවරයා සතුවද විශාල බලතල ප්‍රමාණයක් කේන්ද්‍ර කොටගෙන තිබිණ.

20 - (3) උසස් අධ්‍යාපනයක පවත්නා තත්ත්වය රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ ජාතික ප්‍රතිපත්තියට පටහැනි හෝ බවට අමාත්‍යවරයා සෑහිමකට පත්වූ විටක තමා අවශ්‍ය යැයි හැඟෙන



chandikarawaka.lk

ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රතිපාදන කොමිසට විධාන කළ හැකිය.

20 - (4) යම් වර්ජනයක් හෝ පිටමං කෙරීමක් හෝ වෙනත් හේතුවක් නිසා උසස් අධ්‍යාපන ආයතනයක වැඩකටයුතු හෝ පරිපාලනය අඩාල වී ඇති බවට හා ඒවා යථා තත්ත්වයට පැමිණවීමට අදාල බලධාරීන් අසමත් වී ඇත්නම්, නැවත යථා තත්ත්වය ඇති කෙරුමට.

අ/ ඒ උසස් අධ්‍යාපන ආයතන වසා දැමීමට
ආ/ අදාළ බලමණ්ඩලයක් හෝ පුද්ගලයකු වෙනුවට නිසි බලධාරියකු පත් කෙරුමට බලතල ලැබේ.

රටේ විධායක බලතල සහිත ජනාධිපතිවරයාත් උසස් අධ්‍යාපන ඇමතිවරයාත් එක් අයකු වීමද (1977 - 88) හේතු කොටගෙන මෙලෙස ඉතා බරපතල ලෙස ස්වාධිකාරය උල්ලංඝනය වන පරිද්දෙන් විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන වසා දැමීමට හැකිවිය. ඉතාම නුසුදුසු උදාහරණය නම් විද්‍යෝදය (ජයවර්ධනපුර) විශ්වවිද්‍යාලයේ නිසි බලධාරියා ලෙස මහාචාර්ය කන්ගහආරච්චි මහාතා උපකුලපති පදවියෙන් ඉවත්කර යූ.එන්.පී. තරුණ සංවිධානයකු වූ කරුණාසේන කොඩිතුවක්කු මහතා පත්කෙරුමය. සිසුනට පහර දෙමින්, නේවාසිකාගාර ගිනිබත් කරමින් විශ්ව විද්‍යාලය යකුන් නැටූ පිටියක් බවට පත්වීමට ඊට පසු වැඩි කලක් ගත නොවීය.

තවද මේ පනත යටතේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය විසුරුවා හැර ස්වාධීන විශ්ව විද්‍යාලයන් ලෙස කොළඹ, කැලණිය (විද්‍යාලංකාර), ජයවර්ධනපුර (විද්‍යෝදය), පේරාදෙණිය, මොරටුව, යාපනය ලෙස ස්වාධීන ආයතන 6ක් ඇතිකරන ලදී. මඩකලපු විශ්ව විද්‍යාලය පේරාදෙණි විශ්ව විද්‍යාලය යටතේ ආරම්භය කෙරිණි.

විශ්ව විද්‍යාල අභ්‍යන්තරය

33 - පහත සඳහන් තැනැත්තෝ විශ්ව විද්‍යාලයක නිලධාරයෝ වන්නාහ.

(i) උපකුලපතිවරයා.
(ii) මණ්ඩප වෙතොත් එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපති.
(iii) මණ්ඩප වෙතොත් එක් එක් මණ්ඩපයේ ම මණ්ඩපාධිපති.
(iv) එක් එක් පීඨයේ පීඨාධිපති.
(vi) පුස්තකාලාධිපතිවරයා.
(vii) මුල්‍යාධිකාරී වරයා සහ වෙනත් නියමාවලි මගින් නියමිත තනතුරු (පාඨමාලාවක අධ්‍යක්ෂක ආදී)

chandanapikanawala.lk

54 - (අ) මෙම වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව විශ්වවිද්‍යාලයේ උත්තර මණ්ඩලය විසින් තෝරාගනු ලැබූ පසු වර්ෂය තුනක කාලයක් සඳහා කුලපතිවරයා විසින් පත්කරනු ලැබිය යුතු වෙයි.....

(ආ) දෝෂාරෝපණ හෝ වෙනත් විශ්වාස භංගයකදී උත්තර මණ්ත්‍රීමණ්ඩලයේ 2/3 වැඩි ජන්දයෙන් උපකුලපති ඉවත් කළ හැක.

මෙසේ උපකුලපති පත්වීමේ හා ඉවත්කෙරුමේ කිසියම් ප්‍රජාතන්ත්‍රවාදයක් තවමත් ඉතුරුවී තිබිණ.

## බල මණ්ඩල

### (i) උත්තර මණ්ඩලය -

කුලපතිවරයා, උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපති - මණ්ඩපාධිපති (වෙතොත්), පාලක සභාවේ සාමාජිකයින් හා පීඨාධිපතිවරු නිලබලයෙන් සාමාජිකවරු වෙති. තෝරාපත් කරගත් සාමාජික ලෙස සනාථන සභාවෙන් තෝරාගත් එක් එක් පීඨයෙන් සාමාජිකයෙක්, සානාතන සභාවේ සාමාජික නොවන ආචාර්ය මණ්ඩල සමාජික දෙදනෙක්, ශිෂ්‍ය සභාවේ දෙදනෙක් විශ්ව විද්‍යාල පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයින් දෙදනෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හයදෙනෙක් ප්‍රතිපාදන කොමිසම විසින් තිරණය කළ සංස්කෘතික ආයතන 8 ක සමාජිකයින් ලෙසය.

මෙයට එතරම් බලතල නොවූ අතර උපකුලපති පත්කෙරුම, ඉවත්කෙරුම, ව්‍යවස්ථා අනුමැතිය ආදිය නියම විය. රජය බහුතරය හිමිවුවද ගුරු - සිසු සේවක නියෝජනය වැදගත්වෙයි.

### (i) පාලක සභාව -

උපකුලපතිවරයා මණ්ඩාධිපති වරයා (වෙතොත්), පීඨාධිපතිවරු, සනාථන සභාව තුළින් තෝරාගත් සාමාජිකයින් තිදනෙක්, මේ සියලු සාමාජිකයින්ගේ එකතුවට එක් අයකු වැඩිවන ලෙස ප්‍රතිපාදන කොමිසම විසින් වෘත්තීය හා සංස්කෘතික අංශ නියෝජනය වන අයුරින් පත්කළ අයද මෙහි සාමාජිකයන් විය.

මොවුන් සතුව විශාල බලතල රැසක් විය. පරිපාලනමය හා වෙනත් අධ්‍යයන කටයුතු රැසක් වගකීම මොවුන්ට පිට පැටවුණි. විශ්වවිද්‍යාල ඇරීම, වැසීම, අවශ්‍ය පරිදි අතුරු ව්‍යවස්ථා තැනීම, නියෝග තැනීම, අධ්‍යයන තනතුරු ඇති කිරීම, නැති කිරීම, අංශාධිපතිවරු පත්කිරීම ආදී ලෙස අධ්‍යාත්මය හා පරිපාලනමය වූ විශාල බලතල ප්‍රමාණයක් මෙයට සතුවිය. සැමවිටම එහි බහුතරය රජය සතුවීමෙන් විශ්වවිද්‍යාලවලට විශාල බල පෑමක් විශාල අහිතකර ලෙස කළහැකි විය.



chandrapalakaraliyawa.lk

**(iii) සනාථන සභාව -**

උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, මණ්ඩපාධිති, පීඨාධිපතිවරු, අධ්‍යයන අංශ ප්‍රධානීන් පුස්තකාලාධිපති හා මෙයට ඇතුළු නොවන අචාර්යවරු දෙදනෙක් මෙහි සාමාජිකයන් විය.

විශ්වවිද්‍යාලයේ අධ්‍යන කටයුතු පිළිබඳ තීරණ ගැනීමට හා සමහර තීරණ පාලක සභාව වෙත දැණුම් දීම මෙහි වගකීම විය.

**(iv) පීඨ සභාව -**

පීඨය සඳහා සංයුක්ත කරන ලද සියලුම මහාචාර්යවරු, සහය මහාචාර්යවරු, ජෙෂ්ඨ කතිකාචාර්ය හා කතිකාචාර්ය, පුස්තකාලාධිපති හා ස්ථිර සහය කතිකාචාර්යවරුන් අතරින් ස්ථිර කාර්ය මණ්ඩලයේ දෙදනෙක්, පීඨයේ ශිෂ්‍යයින් අතරින් දෙදනෙක්, වෙනත් පීඨයන් පිටත ප්‍රවීණයන් තිදෙනෙක් මෙහි සාමාජිකයන් විය. පීඨයක අධ්‍යයන කටයුතු මෙයින් තීරණය විය.

ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍ය සභා පිහිටුවා තිබුණු අතර ශිෂ්‍යයින් ගේ ඡන්දයෙන් එහි නිලධාරී මණ්ඩලය තෝරාපත්කර ගන්නා ලද්දේය. ශිෂ්‍යයින්ගේ අධ්‍යයනය හා අනධ්‍යයන කටයුතු සඳහා පෙනී සිටීම ශිෂ්‍ය සභාවේ වගකීම විය. එමෙන්ම ජාතික ප්‍රතිපත්ති හා ජාතික ප්‍රශ්නවලදී ක්‍රියාකෙරුමද එහි වගකීමක් වීම වැදගත් විය. මේ බලතල බොහෝමයක් 1972 ව්‍යවස්ථාවේ ද ඇතුළත් විය. එහෙත්,

114 - ශිෂ්‍ය සභාවක් , ඒ සභාව අයත් උසස් අධ්‍යයන ආයතනයන් බාහිර කිසියම් සංවිධානයක් හෝ මණ්ඩලයක් සමග අනුබද්ධ නොවිය යුතුය.

යන වගන්තියෙන් එක් එක් විශ්ව විද්‍යාල ශිෂ්‍ය සභා සමගත් වෙනත් බහුජන සංවිධාන සමගත් නිත්‍යානුකුල බැඳීම බිඳ දමන ලදී. 1972 ව්‍යවස්ථාවෙන් තහවුරු කරන ලද මේ අයිතිය අහිමි කෙරුම ගැන ශිෂ්‍යයෝ සිය විරෝධය පළකළ අතර එයට පිටුපා සියලු ශිෂ්‍ය සභා එකතුකර අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලය (අ.වි.වි.ශි.බ.ම.) ගොඩනැගූහ.

මෙලෙස වූ විශ්ව විද්‍යාලවල බල මණ්ඩලවල සංයුතිය හා සමස්ත අරමුණ සලකද්දී සියලු බලතල සහිත ආයතනවල වැඩි ඡන්ද ප්‍රතිපාදන කොමිසමට එනම් රජයට හිතකර අයුරින් සලසා තිබිණ. පාලක සභාව මෙයින් විශේෂිත වූ අතර එය මගින් අංශාධිපතිවරු පත්කෙරුම තුළ පීඨ සභාවද, සනාථන සභාවද නැවත රජයේ ග්‍රහණයට ලක්කර ගන්නා ලදී. මෙතෙක් රජයට හිතවත් අයට පමණක් උපකුලපති, පීඨාධිපති, අංශ ප්‍රධාන ආදී ලෙස වූ සමස්ත බලධාරීන් සියල්ල පවත්වා ගනිමින් මුල් වටයට විශ්වවිද්‍යාල අභ්‍යන්තරයට සෘජු ලෙසම මැදිහත්වන ලදී.



chamikaranawaka.lk

මෙයට අමතරව ප්‍රතිපාදන කොමිසම, පාලක සභා ආදිය හරහා පරිපාලනය හා වෙනත් ක්ෂේත්‍රවල පහළම සේවකයාගේ සිට ඉහළම නිලධාරියා දක්වා 'ජුන්ටාකරණය' එනම් සියලු අංශ සිය පාක්ෂික හිතවතුන්ගේ පොල්මෑකාර උරුමයට යට කෙරුම සිදුකරන ලදී. විද්‍යොදය (ජයවර්ධනපුර) විශ්වවිද්‍යාලය සුපැහැදිලි උදාහරණයකි. තවද ශිෂ්‍යයන් අතර ද රජයට හිතවත් සමවාදී ශිෂ්‍ය පෙරමුණ ලවා විශේෂ වරප්‍රසාධය සහිත සිසුවන් ප්‍රමාණයක් බිහිකරන ලද්දේය.

රජය තවදුරටත් හදිසි නීතිය, අත්‍යවශ්‍ය සේවා ජනාධිපති උසස් අධ්‍යාපන ඇමති බලතල පරිහරණය කරමින් කටයුතු කළේ, 1983 දී ශිෂ්‍ය සභා තහනම් කරමින්, සිසුවන් අත්අඩංගුවට ගනිමින් පහර දෙමින් සෘජු ලෙස ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට සරසවිය තුළ පොලීසියක් ද පිහිටුවමිනි. එහෙත් සනාථන අරගලයක් තියුණු මුහුණුවර ආපසු ගැන්වීමට  මේ එකද ක්‍රියාවලියක්වත් ප්‍රමාණවත් නොවින. සිසු ජීවිත දෙකක් සරසවි පොලීසිය ඉවත්කරලීමට බිලිගන්නා ලදී. ඉනිපසු පාලකයන් කළේ වඩාත් නිර්දය ලෙස හා නග්නවම 1978 පනතින් ඉතුරු කර තිපූ ස්වාධිකාරය හා අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ද නැතිකර දමන පනතක් ගෙන ඒමය. එය 1985 අංක 7 දරණ සංශෝධන පනතයි.

1985 නව පනත -

මේ පනත මගින් උත්තර මණ්ඩලය අහෝසි කරන ලදී. විශ්වවිද්‍යාලයේ ඉහළම මණ්ඩලය බවට පාලක මණ්ඩලය (සභාව) ගෙන එන ලදී. ඉතාම බරපතල හානිය වූයේ උපකුලපති පත් කෙරුම වෙනස් කරලූ ආකාරයෙනි.

17-1 (අ) විශ්වවිද්‍යාල පාලක සභාව මගින් තෝරාගන්නා ලද ආයදුම්කරුවන් තිදෙනෙක් අතරින් ජනාධිපතිවරයාට රුචි පුද්ගලයකු විශ්වවිද්‍යාල උපකුලපතිවරයා ලෙස වසර 3 කට පත්කළ හැකිය.

(ආ) අවශ්‍ය ඕනෑම මොහොතක ඔහුව ධූරයෙන් ඉවත් කරලීමට ජනාධිපතිවරයාට හැකිවේ.

මෙලෙස රජයට දැනටමත් වැඩි බලයක් සහිත පාලක සභාවේ නියෝජිතයන් අතුරින් රජයට ඉතාම හිතෛෂීවන්තයා උපකුලපති විය. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කරුණාසේන කොඩිතුවක්කු මහතා නිසි බලධාරී (මේවන විටත් නිසි බලධාරී අධිකරණයේ අභියෝගයට ලක්ව සිටියේය) උපකුලපතිවරයා වී අධිකරණයේ අභියෝගයෙන් ගැලවී ගත්තේය. ජනාධිපති නියමයෙන් පේරාදෙනියේ උපකුලපති මහාචාර්ය මැකලම් ප්‍රණාන්දු මහතා ඉවත් කෙරින. මෙලෙස මෙතෙක් තිබූ අල්ප

මාත්‍ර ස්වාධිකාරයද අහිමිව විශ්වවිද්‍යාල ජනාධිපතිවරයා වටා භ්‍රමණය වන්නට විය.

අංක 57-58-59-61-62-63-64 වගන්තිවල බලතල සහිත එනම් ශිෂ්‍යයින් ගේ අධ්‍යාපන සුභසාධන හා ජාතික ප්‍රතිපත්ති කෙරෙහි වූ ශිෂ්‍ය මතය නියෝජනය කළ ශිෂ්‍ය සභා (මේ වන නිට 1983 සිට හදිසි නීතිය යටතේ තහනම්ව තිබිණ) සහමුලින්ම අහෝසි කරන ලදී. එයට අනුව විකල්පය වූයේ ජනාධිපත් පත් කළ රූකඩ උපකුලපති සභාපතිත්වය දරන ශිෂ්‍ය සම්බන්ධීකරණ කමිටු නම් ආයතන විශේෂයකි. එහි බලතලය වූයේ ශිෂ්‍ය සුභසාධනය පිළිබඳව බලධාරීන්ට කරුණු දැක්වීමේ අයිතිය පමණි. එහි තෝරාගැනීමද සිදු වූයේ වක්‍ර ආකාරයකටය.

එහෙත් සිසුන් සහභාගි නොවීම නිසා ශිෂ්‍ය සම්බන්ධීකරණ කමිටු නොපිහිටනු ලැබූ අතර ඒ වෙනුවට ශිෂ්‍යයින් විසින් ම පිහිටවා ගත් (1983 සිට පැවත එන) ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු (ශි.ක්‍රි.ක.) ගොඩනංවා ගනු ලැබේ. එහෙත් ශි.ක්‍රි.ක. බලධාරීන් විසින් පිළිගැනීම නිසා එතැන් සිට කිසිදු ශිෂය නියෝජනයක් බලධාරීන් වෙත නොතිබිණ. විශාල අර්බුදයක් එයින් ජනිත විය.(එහෙත් 1987 - 88 වකවානුවේදී මේ නීති විරෝධී යයි කිවූ ශි.ක්‍රි.ක. බලධාරින් විසින් පිළිගත්තා ලදී. අර්බුදය විසින් ජනිත කළ බරපතල තත්ත්වයට බලධාරීන් මුහුණ දුන්නේ වඩාත් දැඩි මර්දන නීති සමුදායක් අතුරු නීති නමින් හඳුන්වා දීමෙනි. මේ අතුරු නීති පැසිස්ට් සිර කඳවුරුවල නීතිරීති සිහිගැන්වූ අතර අභ්‍යන්තර නාමමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදය හා පුද්ගල නිදහස පවා සහමුලින්ම අහිමි කෙරුමක් විය.

i) විශ්වවිද්‍යාලය අභ්‍යන්තරයේ සිසුන් පස් දෙනෙක් එක්රැස්වීම දඬුවම් ලැබිය හැකි වරදකි.

ii) විශ්වවිද්‍යාල අභ්‍යන්තරයේ පෝස්ටර්, පත්‍රිකා, බිත්ති පුවත්පත් හා කවි සංකල්පනා පලකෙරුම දඬුවම් ලැබිය හැකි වරදකි.

iii) විශ්වවිද්‍යාලය අභ්‍යන්තරය පිළිබඳ වූ ප්‍රවෘත්ති පුවත්පත්, සන්නිවේදන මාධ්‍ය හෝ බාහිර කවර පුද්ගලයකුට වුවද ( ජනාධිපතිට වුවත්) දැන්වීම දඬුවම් ලැබිය හැකි වරදකි.

iv) කුමන හෝ කරුණක් සඳහා පුර්ණාධාර, මුදල් එකතු කෙරුම ආදිය දඬුවම් ලැබිය හැකි වරදකි.

මේ කුමන වරදකට හෝ සති දෙකේ පන්ති තහනම සිට ශිෂ්‍යභාවය අහෝසි කරලීම දක්වා දඬුවම් උපකුලපතිට නියම කළ හැකි විය. මේ නිසාවෙන් බලධාරීන් අධිකරණය හමුවේ අභියෝගයට ලක්කෙරුම ද අහෝසි වී ගියේය. (ජයවර්ධනපුර දිසානායක ශිෂ්‍යයාගේ නඩුව වැනිදෑ)

තවද අභ්‍යන්තරයේ මහපොළ ශිෂ්‍යාධාර ආදිය කප්පාදු කරලීම මගින්ද ශිෂ්‍ය ස්වාධීනත්වයට බලපෑම් එල්ල කරන ලදී.

මේ සියල්ල අසාර්ථක වූ පසු සෘජු පොලිස් මැදිහත්වීම ද, ඉතා විශාල ප්‍රමාණයේ අත්අඩංගුවට ගැනීමද, හදිසි නීතිය, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ආදිය යටතේ සිසුන් හා ඇදුරන් දීර්ඝ කාලයක් චෝදනා විරහිතව රඳවා ගැනීමද, සිසුන් හා ඇඳුරන් පැහැරගෙන ගොස් මරා දැමීමද, විවෘත පොලිස් පහරට ලක්කෙරුමද සිදුකරන ලදී.

**(ii) උසස් අධ්‍යාපන වැනසේ**

එක් අතකින් සෘජු පුද්ගලීකරණය හරහාද, නව උසස් අධ්‍යාපනික ක්ෂේත්‍රයන් පුද්ගලික අංශ මගින් පමණක් ඔවුන්ගේ ඒකාධිකාරය යටතේ පවත්වා ගැනීමද, උසස් අධ්‍යාපනයට වැයකළ මුදල් ප්‍රතිශත ඉතාම අවම මට්ටමකට ගෙන ඒමෙන්ද, විෂය මාලාවන් පාඨමාලාවන් සහමුලින්ම විනාශකරලීම තුළින්ද ඉංග්‍රීසි බස ආදී සංස්කෘතික බාධක ඉදිරිපත් කරමින් බමුණුකුලයේ අධ්‍යාපන ස්ථානය රැකීම තුළින්ද උසස් අධ්‍යාපනය වැනසීම සහතික කරන ලදී.

යු.එන්.පී. යේ 1977 න් පසු ප්‍රතිපත්තිය වූයේ විවෘත ආර්ථිකය යටතේ පුද්ගලීකරණයයි. මේ තත්ත්වය උසස් අධ්‍යාපනයටද එල්ල විය. එහි එක් විශාල කැළඹීමකට තුඩුදුන් පාර්ශ්වයක් නම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ දූෂිත කතන්දරයය. එහි උපත 1978 පනතේ 25 වන වගන්තිය ය. එය මෙසේය.

"කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නියමාවලි මගින් නියම කරනු ලැබූ කොන්දේසිවලට යටත්ව විශ්වවිද්‍යාලයක විභාග සඳහා අනුමක කරන ලද අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමේ කාර්යය සඳහා ආයතන පිළිගත හැකිය."

මේ වගන්තිය යටතේ 1981 නිකුත්කරන ලද ගැසට් නිවේදනයකට අනුව උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය නම් පුද්ගලික ආයතනයක් පිහිටුවනු ලැබීය. එහෙත් එකී වගන්තියට අනුව පැනවූ පිළිගත් ආයතන ආඥා පනත කිහිප පොළකක් උල්ලංඝනය කරන ලදී.

(i) පිළිගත් ආයතනයක් සඳහා අයදුම්පත් ඉදිරිපත්කළ යුත්තේ එකී ආයතනයේ විශ්වවිද්‍යාල පාඨමාලාව පවත්වා ගැනීම සඳහා අධ්‍යයන, අනධ්‍යයන පහසුකම් සපුරා ඇත්නම් පමණි.

එහෙත් පෞද්ලික වෛද්‍ය විද්‍යාලය සඳහා අයදුම් කරද්දී, ආදායම්කරුවන් සතුව තිබුණේ ඒ සඳහා රජයෙන් ප්‍රදානය කළ ඉඩම් පමණකි.

(ii) පිළිගත් ආයතනයක් සිය පාඨමාලාව පිළිගැනීම සඳහා පවත්වන සියලු ශ්වවිද්‍යාල පීඨයන් වෙතින් අයදුම් කළ යුතු අතර අවසාන අයදුම්පත ප්‍රතිපාදන කොමිසම වෙත යොමුකළ යුතුය.

chamikarawaka.lk

එහෙත් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ බලධාරීන් අයදුම්කළේ කොළඹ වෛද්‍ය උපාධිය පිළිගත් හෙයිනි. රජයේ වෛද්‍ය පීඨ වූ රුහුණු හා යාපනය පීඨවලට තවමත් මේ පිළිගැනීම ලැබී නැත.

(iii) එවන් අයදුම් පතක් ලැබී දින 74 ක් ඇතුළත අදාල උපකුලපතිත්, ප්‍රතිපාදන කොමිසමත් ආයතනය පිළිගනීද නැද්ද යන්න ප්‍රකාශ කළ යුතුය.

එහෙත් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සඳහා මෙයට මාස 9ක් ගතවිය. එහිදීද ප්‍රකාශ කරනු ලැබුයේ ව්‍යවස්ථාවේ සඳහන් නොවූ "තාවකාලික පිළිගැනීමක්" (**Provisional Recognition**) ලබාදීමය. (1983) එය පිළිගත් ආයතනයක් වූයේ 1987 දීය.

කෙසේ වෙතත් මෙලෙස වූ සියලු ව්‍යවස්ථාමය දුර්වලකම් 1988 ජූලි මස ගෙනඑන පද ව්‍යවස්ථා සංශෝධනයක් මගින් දුරුකර ගන්නා ලදී.

අනෙක් අතට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට සිසුන් බඳවා ගනු ලැබුයේ රජයේ විශ්වවිද්‍යාලවල ප්‍රවේශ ප්‍රතිපත්තියට පටහැනිවය. එනම්,

(i) වෛද්‍ය උපාධිය හදාරන සිසුවෙක් උසස් පෙළ විභාගයේදී සත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සමත්වී තිබිය යුතු අතර උද්භිද විද්‍යාවට හෝ ශුද්ධ ගණිතයට හෝ ගත් ලකුණු ප්‍රමාණය 25 ට වැඩි විය යුතුය.

එහෙත් භෞතික විද්‍යාව අසමත් වූවන් ද, ගෘහ විද්‍යාව හැදෑරුවන් ද පෞ.වෛ.වි. අධ්‍යාපනය ලබති.

(ii) අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත්කර ඇති සහතිකය අත්‍යවශ්‍ය වන අතර පාසැල් සහතික කිසිසේත් ප්‍රමාණවත් නැත.

පෞ.වෛ.වි. ට වංචා සහගත ලෙස ඇතුළුවූවන් බොහෝමයක් සිය ප්‍රථිඵල සඳහා බරපතල ලෙස විකෘතිකරන ලද පාසැල් සහතික භාවිතා කර ඇත.

(iii) ප්‍රවේශය වසරකට පෙර වසරකදී සිසුවා උසස් පෙළ සමත්ව තිබිය යුතුය.

ආරම්භක වසරේදී ඇතුළු කරගත් 140 දෙනෙක් අතරින් තොරතුරු පලකළ 97 දෙදෙනාගෙන් 75 දෙනෙක් මෙය උල්ලංගනය කොට තිබිණි.

තවද වෙනත් විශ්වවිද්‍යාලයක පාඨමාලා හදාරනවූවන්ට තවත් විශ්වවිද්‍යාලයක පාඨමාලා හැදෑරිය නොහැකි වූවද මෙහිදී එයද බලපා නොතිබිණි.

තවද පෞ.වෛ.වි. සඳහා බඳවා ගන්නා ලද්දේ (ප්‍රකාශිත පරිදි) සහමුලින්ම උසස් පෙළ කුසලතා මත නොව උසස් පෙළ 70% සා.පෙළ 10% සම්මුඛ පරීක්ෂණය 10% වෙනත් ක්‍රියාකාරකම් හා පවුල් තත්ත්වය 10% ලෙසය.

එහෙත් ප්‍රයෝගිකව පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට සහමුලින්ම ඇතුළුවිය හැකිව තිබුණේ ධන බලය මෙන්ම පවුල් හා දේශපාලනික බලයද තිබූවන්ගේ දරුවන්ට පමණක්මය. සරල උදාහරණයක් ලෙස එක් වසරක උසස්පෙළ විභාගයෙන් ලකුණු 279 ක් ගත් ජාතියේ දරුවන්ට වෛද්‍යවරයෙකු වීමට ඉඩකඩ අහිමිවෙද්දී ලකුණු 167 ක් ලත් ශිෂ්‍යයා පෞ.වෛ.වි. වෛද්‍යවරයෙක් වීම සඳහා ඇතුළත්විය. සුදුසුකම වූයේ ශිෂ්‍යයාවගේ පියා රජයේ මහ ඇමතිවරයෙකු වීමය.

මෙය පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය යැයි ප්‍රකාශ කළද, රජය විසින් ඉඩම් මිලදී ගැනීමෙන්ද, ගොඩනැගිලි හා වෛද්‍ය උපකරණ ලබා දීමෙන්ද, රාගම රෝහලේ නවීකරණය කර කඩක්තුකර දීමෙන්ද, මේ බමුණුකුල දරුවන් උදෙසා මහජන මුදල් කෝටි 200කට ආසන්නව වැයකර තිබේ. (එක් වසරක් සඳහා සමස්ත රජයේ විශ්වවිද්‍යාල පද්ධතියටම කරන්නේ කෝටි 30 කට ආසන්න මුදලකි.)

තවද වෛද්‍යවරයෙකු වීමට අවශ්‍ය ප්‍රයෝගික ප්‍රවීනතා මහාචාර්ය පුහුණුව අවශ්‍ය සම්මතවලින් 1987 දීත් ඇතිකර තිබුණේ 44% ක් පමණි. මානසික වෛද්‍ය අංශයක් එහි පැවතුණේම නැත.

මෙලෙස මුදල් බලය මත අධ්‍යාපනය ලබාදීම 1943 කන්නන්ගර යෝජනා ආපසු හැරවීමක් විය. මේ තත්ත්වය තවදුර දිග ගියේ 1985 ඇතිකළ සංශෝධන පනත මගින් උපාධි ප්‍රදානය කළ හැකි ආයතන, එනම් පෞද්ගලික විශ්වවිද්‍යාල නීතිගත කෙරුමෙනි. එහි 12 වන වගන්තිය මගින් මෙකී ආයතන හඳුන්වා දුන් අතර 25 A වගන්තිය යටතේ සංස්ථාපිත කරන ලදී. 38 වන හා 70 A B C D E වගන්තිවලින් මේවායේ බලතලත් ඒවායේ පාඨමාලා සකස් කරන විශේෂිත බලධාරීන්ගේ බලතලත් අවධාරණය කර තිබේ.

අතිශය හානිකර 'උපාධි කඩ' තවමත් යථාර්ථයක් කරගත නොහැකිව ඇත්තේ ශිෂ්‍ය උද්ඝෝෂණය නිසාය. 1981 දීත් ඉන්පසුවත් පෞද්ගලික ඉන්ජිනේරු ආයතන සඳහා සලකා බැලීම කර තිබුණු අතර අදාළ පියවලින් එකී යෝජනා ප්‍රතික්ෂප කර තිබුණි.

ධනපති ආර්ථික ඉල්ලුම් හා සැලසුම් මත තීරණය වේ. එහෙයින් වැඩි වෙළඳ අධ්‍යාපනය සඳහා පෞ.වෛ.වි. ඇතිකර ඇති අතර, පෞද්ගලික දන්ත වෛද්‍ය ආයතනයක් සඳහා ප්‍රපිපාදන කොමිසම සලකා බැලීම කරගෙනයනු ලැබේ.

පුද්ගලීකරණයේ ඊළඟ පාර්ශ්වය වන්නේ ප්‍රවීණයන්ගේ ආයතන හරහා විශ්වවිද්‍යාල උපාධි නොවන එහෙත් ප්‍රවීණත්වයක් ලබාදෙන පාඨමාලා ක්‍රියාත්මක කෙරුමය. දනටමත් වාස්තු විද්‍යාව සඳහා පෞද්ගලික වාස්තු විද්‍යාලයක්, එවැනි ප්‍රවීණයන්ගේ ආයතනයක පිළිගත් වාස්තු විද්‍යාඥයකු ලෙස කටයුතු කරලීම පිණිස, පවත්වාගෙන යනු ලැබේ. තවද වාණිජ්‍ය, කළමාණාකරණය, පරිපාලනය වැනි විෂයන් සහමුලින්ම පාලනය කෙරෙනුයේමේ ප්‍රවීණයන්ගේ ආයතන හරහාය.

උසස් පෙළ දැඩි තරගයක් පවතින ඉන්ජිනේරු අංශය සඳහා ද මහනුවර උපාධි ප්‍රදානය කරන ආයතනයක් ඇතිකෙරුමට යත්න දරන ලදී. බ්‍රිතාන්‍යයේ සමස්තයට අනුව ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කෙරුමට උපාධිය අවශ්‍ය නොවේ. ඒ අනුව සැකසුන ලාංකික කොටස්ද ඉන්ජිනේරු උපාධි ආයතන අදහස් ඍජු ප්‍රහාරයට ලක්වන හෙයින් අතහැර දමා ඉතා විශාල ලෙස ප්‍රවීණයන් ගේ ආයතන හරහා ඉංජිනේරුවන් ලෙස පිළිගන්නා ආයතන ඇති කරමින් යති.

තවත් මෙවැනි පියවරක් වනුයේ බ්‍රිතාන්‍යයේ හෝ වෙනත් විදේශවල පවත්වන විභාග සඳහා ඍජුවම පෙනී සිටීමට ඇති හැකියාව වර්ධනය කෙරුමය. ඉංජිනේරු ක්ෂේත්‍රයේ සී.ඊ.අයි. (C.E.I) හා වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ ආර්.අයි.බී.ඒ. (R.I.B.A.) වැනි ප්‍රවීණතා සහතික ඉතා විශාල මුදල් වැයකෙරුමකින් පසු ලබාගත හැකි ය. එහෙත් ඒවායේ මුදල් මූලික වුවද අක්‍රමිකතා අල්පය.

ගණකාධිකරණ, වාණිජ්‍ය හා කළමණාකරණ ක්ෂේත්‍රයේ ද තවමත් ඇත්තේ විදේශ විභාග සහතික වල ඒකාධිකාරයකි. සරසවි උපාධි ලැබුවන් පාවා සී.අයි.එම්.ටී. (C.I.M.T.) වැනි විභාගයන් සඳහා පෙනී සිටීම අනිවාර්ය වෙයි. 1874 සිට පවත්වාගෙන එන නීති විද්‍යාලය තුළින්ද සිදුවන්නේ එවැනිම ප්‍රවීණයන්ගේ ආයතන වල සාම්ප්‍රදායික ඒකාධිකාරය පෙරට ගෙන යැමකි. මෙලෙස විශ්වවිද්‍යාලවලින් පරිභාහිරව බොහෝ විට බමුණුකුලයේ පොල්මඃකාර උරුමයට යටත්වූ සියලුම ප්‍රවීණයන්ගේ ආයතනවල ඍජු පාලනයක් අද අවශ්‍ය වෙයි. වෘත්තීමය හා එසේ නොවන සියලු විෂය පථයන් ගේ කේන්ද්‍රය බවට විශ්ව විද්‍යාලය පත්කළ යුතුය.

1977 න් පසු 21 වැනි සියවසේ ජපන් අධිතාක්ෂණයේ සුරලොව අල්ලා ගැනීම සඳහා රජය ඉතා ඉක්කමනින් පියවර ගන්නා ලදී. එක් සාතිශය උළෙලකදී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ප්‍රකාශකළේ 'සාහිත්‍යයෙන් 'ටීවී' හෝ සැප කාර් හෝ නොලැබෙන බවය. ජනතාව අධිතාක්ෂණයේ සුරලොව ඉවකරද්දී, එහි දිලිසෙන එළියෙන් ගිනිකන වැටෙද්දී අධිතාක්ෂණ පාඨමාලාවන් මුදලට විකුණන ආයතනයන් ශීඝ්‍රයෙන් බිහිවිය.

විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ මේ පාඨමාලාවන් පුළුල් නොවනවා පමණක් නොව එසේ කිරීමට වුවමනාවක්ද නොමැති බව පෙනේ. පරිගණක විද්‍යාව, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සන්නිවේදන විද්‍යාවන් සඳහා විශේෂිත පාඨමාලා ඇත්තේ ඉතා සුළු පිරිසකට මොරටු විශ්වවිද්‍යාලයේ ය. පේරාදෙනිය ඇතුළත්ව පොදු විදුලි ඉංජිනේරු සිසුන් සීයයක් පමණ වසරකට බිහිවීමට අපේක්ෂිතය. එහෙත් විභාග අසමත් වීම් හා වෙනත් හේතු නිසා එය තවත් ලසුවේ. තත්ත්වය එසේ හෙයින් විදේශ පුහුණුව ලැබුවන්ට හා විශ්වවිද්‍යාලවලින් බාහිරව ශිෂ්‍යයෙන් ඇතිකරගෙන යන අධිතාක්ෂණික පාඨමාලා හරහා අවශ්‍ය ප්‍රවීණයන් බිහිකරලීමට යත්න දරණු ලැබේ. දැනටමත් ඇමරිකාවේ හුස්ටන් ආයතනය සමග අත්වැල් බැඳගත් පරිගණක උපාධි විද්‍යාලයක් පිහිටුවා ඇත. පරිගණක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් බිහිකෙරුමේ ඒකාධිකාරය අයි.බී.එම්. (I.B.M) වැනි බහුජාතික සමාගම් සතුවේ. මේ අතර රටපුරා හතු පිපෙන්නාක් මෙන් සිසුන්ගෙන් මුදල් ගසාගන්නා බොහෝ විට වංචනික පරිගණක පාඨමාලා ඇතිකර තිබේ. තවද විශ්වවිද්‍යාලවල සිටින ආචාර්යවරුන් හා පරිගණක සම්පත් උපයෝගි කරගනිමින් මුදලට දැණුම් දෙන පරිගණක පන්ති ඇතිකර තිබීම ද ගැටලුවකි.

අධිතාක්ෂණය ගැන ද අප සලකා බැලිය යුතුය. දැනටමත් බැංකු හා වෙනත් රජයේ හා පෞද්ගලික ක්ෂේත්‍රවල ආයතන 'පරිගණකකරණය' වෙමින් පවතී. දැනටමත් අතිවිශාල රැකියා විරහිතයින් ප්‍රමාණයක් සිටිනා රටකට ශ්‍රම සූක්ෂම වැඩපිළිවෙළ මිස පරිගණකකරණය කෙතරම් ගැලපේදැයි ප්‍රශ්නයකි. අනෙක් අතට අධිතාක්ෂණය දැනටමත් පරිසරයට කර තිබෙන හානිය සලකා බලන විට එය අපේ දේශීය අධ්‍යාපන දෘෂ්ඨියට පටහැනි අතර එය ලෝකයේ කෙතරම් ගැලපේ දැයි සිතා බැලිය යුතුවේ.

**උසස් අධ්‍යාපනයට වියදම් අඩුකරේ -**

පොදුවේ සමස්ත උසස් අධ්‍යාපනයටමත්, අධ්‍යාපන ක්‍රමය සඳහාත් රජයේ වියදම් ඉතාම අඩුමට්ටමක පවතී. එහිදී ඉතා වැදගත් තැනක් ගන්නා අධ්‍යාපනය පවත්වා ගැනීම නොව එය පුළුල් කෙරීම සඳහා වූ ආයොජන මට්ටමේ ඉතා අඩුබව පෙනේ. තවද සංඛ්‍යා ලේඛන මෙසේවුවද වසර මැදදී ආරක්ෂක ආදී කටයුතුවලට වැඩි මුදල් සපයා ගැනීමට සිදුවූ විට මුලින්ම මුදල් කැපීයන ආයතනය අධ්‍යාපනයය. ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දැලිපිහියට වඩාත්ම අසුවන ආයතනය ද අධ්‍යාපනයය. එසේ හෙයින් එයට කොපමණ සත්‍ය මුදලක් වැය වූවාද යන්න සැක සහිතය.

උසස් අධ්‍යාපන වියදම් සංඛ්‍යා ලේඛන මෙසේවෙයි.
(ජංගම වියදම මිලියනවලින්)

| වර්ෂය | 73 | 75 | 77 | 79 | 81 | 83 | 85 |
|---|---|---|---|---|---|---|---|
| ආණ්ඩුවේ මුළු වියදම (මිලියනවලින්) | 5025.7 | 7186 | 8812.6 | 20339 | 29485.6 | 41790 | 67103 |
| උසස් අධ්‍යාපන වියදම(ජංගම) | 34 | 38.3 | 52.9 | 97.3 | 136.9 | 237.0 | 298.0 |
| ප්‍රතිශතය | 0.68% | 0.53% | 0.60% | 0.48% | 0.46% | 0.57% | 0.44% |

1987 වන විට මෙය 0.23% ක් දක්වා පහළ බැස තිබිණ.

**බමුණු කුලය හිස ඔසවයි** -

මේ සියලු තත්ත්වයන් උපයෝගි කර ගනිමින් වරප්‍රසාද ලත් පංතියේ බමුණු දරුවන් විශ්වවිද්‍යාලවලට පිටතින් කෙරෙන ප්‍රයත්නයන් තුළින් නගා සිටුවීමට ක්‍රියාකරනවා මෙන්ම විශ්වවිද්‍යාලවලට ඇතුළු වන අල්ප පිරිසෙන් ද තම පන්තියේ කොටස් සුවිශේෂ කරගැනීමට යත්න දරණු පෙනේ. මෙහිදී වෛද්‍ය - ඉංජිනේරු වැනි වෙළඳ පාඨමාලා විශේෂිත වේ.

1967 කරන ලද සමීක්ෂණයකින් වෛද්‍ය - ඉංජිනේරු පාඨමාලාවල 73% ක් පෞද්ගලික හෝ වෙනත් වරප්‍රසාදලත් පාසැල් වලින් පැමිණියහ. 18% ක් පාසැල්වලින් පැමිණ නැති පුද්ගලික සිසුවෝය. මෙයින්ම අති බහුතරයක සමාජ තත්ත්වය කවරෙක්දැයි පැහැදිලිවේ. 1976 දී පොදුවේ සරසවි ප්‍රවේශ වූවන්ගේ 34.2% ක් දිළිඳු පවුල්වලින් වු විට විද්‍යා අංශයේ එය 13.6% ක් වැනි අඩුසංඛ්‍යාවක් විය. විද්‍යා අංශයේ 36.5% ක දෙමාපියෝ ගුරුවරු වූහ. මෙලෙස විද්‍යා අංශවලද වෛද්‍ය ඉංජිනේරු පීඨවල මැද පන්තියේ හා උසස් පන්තිවල නියෝජනය වර්තමානය දක්වාම ඉහළ මට්ටමක පවතී.

ආර්ථික - සංස්කෘතික ලෙස පීඩිත දරුවන්ගේ සරසවි ප්‍රවේශය මෙලෙස සතුටුදායක තත්ත්වයක නොතිබියදී විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය තීරණය කිරිමේලා වූ කිංස්ලිද සිල්වා කොමිසම 1987 දී මෙසේ යෝජනා කරන ලදී.

1. සරසවි ප්‍රවේශය අවම ලකුණු ප්‍රමාණය 180 සිට 200 දක්වා වැඩිකළ යුතුය.

ලකුණු 160 න් ද සිසුන්ට පෙරදී උපාධි ලබාගතහැකි නම්, ආචාර්යවරු මහාචාර්යවරු විය හැකි නම් එය ඉහළ දැමීමෙන් පෙනෙන්නේ තරඟකාරීව වැඩිවෙන සිසු කුසලතා හා තරඟයට අනුරූපව සරසවි පහසුකම් පුළුල් නොකිරීමේ රජයේ නොහැකියාව ය.

2. 1979 ප්‍රකාශ කරන ලද 1985 සංශෝධිත ප්‍රවේශ ප්‍රතිපත්තිය වූ කුසලතා පදනම 30% දිස්ත්‍රික් පදනම 65% හා දුෂ්කර දිස්ත්‍රික් පදනම 5% වූ පදනම අහෝසි කර පදනම කුසලතා පදනම් කළ යුතුය.

ඇත්ත වශයෙන්ම 1979 ප්‍රවේශ ප්‍රතිපත්ති යටතේ දුෂකර දිස්ත්‍රික්ක දීමනාව 15% ක් විය. 1985 දී එය 5% දක්වා අඩුකර, මොනරාගල දුෂ්කර දිස්ත්‍රික් පදනමින් ඉවත්කරන ලදී. දුෂ්කර දිස්ත්‍රික් (හම්බන්තොට, දිගාමඩුල්ල, වන්නි, මන්නාරම්) පදනම හා දිස්ත්‍රික් පදනමක් අවශ්‍යව ඇත්තේ අධ්‍යාපන පහසුකම් බෙදීයෑමේ අඩුපාඩු නිසාවෙනි. පාසැල් විසිරීයැම මෙසේය.

| | මුළු පාසැල් ගණන | උ.පෙ. කලා, වාණිජ විද්‍යා | උ.පෙ. කලා වාණිජ | 10 තෙක් | 5 හා 7 දක්වා |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 9634 | 430 | 1292 | 3914 | 3998 |
| කොළඹ | 455 | 47 | 62 | 239 | 107 |
| යාපනය | 478 | 41 | 34 | 147 | 256 |
| මොණරාගල | 198 | 3 | 30 | 109 | 50 |
| හම්බන්තොට | 286 | 1 | 29 | 127 | 104 |
| මුලතිව් | 87 | 03 | 04 | 17 | 63 |

මෙයින් දිස්ත්‍රික් පදනමක් අවශ්‍යව ඇත්තේ ඇත්දැයි පෙනේ. එය රජයට සමව පහසුකම සැපයීමට නොහැකි වීම නිසා ඇතිවූවකි. කුසලතා පදනම එකම පදනම වීම නිරපේක්ෂව සහේතුකය. එහෙත් සාපේක්ෂව එය ක්‍රියාත්මක කළහැක්කේ පහසුකම අතර සම තත්ත්වයක් ඇති කෙරුමෙන් හා එසේ පමණක්මය. අපේ උගතුන් අනුයන බ්‍රිතාන්‍යයයේ පවා මෙවැන් දීමනා දක්නට ලැබේ.

3. උසස් පෙළ ප්‍රවේශය දෙවතාවකට සීමා කෙරේ.

4. ඉංජිනේරු - වෛද්‍ය පීඨ සඳහා ඉංග්‍රීසි භාෂාවේ නිපුනත්වය අවශ්‍යම වෙයි.

ඉංජිනේරු පීඨ වලින් ඉංග්‍රීසියේ තරම මැනගත හැකිය. පේරාදෙණිය ඉංජිනේරු පීඨයට ඇතුළු වන්නන් 100ක් අතුරින් අවසන් උපාධි සම්පූර්ණ කරන්නේ 46.7 ක් පමණි. මොරටු ඉංජිනේරු පීඨයට ඇතුළු වන්නන් අතුරින් දෙවන වසරට පියමණින්නේ 70% ක් පමණි. මෙයට එක් ප්‍රධාන හේතුවක් නම් අනවශ්‍ය ඉංග්‍රීසිය. තවත් හේතුවක් බටහිර රටවල පාඨමාලා හා සම තත්ත්වයට පාඨමාලාවල සම්මතයන් ඉහළ යැවීමය. සිංහලයෙන් මේ පාඨමාලා රැගෙන යා නොහැකිබව අසත්‍යකි. සත්‍යනම් ඒ සඳහා කිසිදු උත්සාහයක් නොදැරීමය. අනිත් අතින් සිසුන් අසමත් කෙරුම තුළින් පහසුකම් අර්බුද ජයගැනීමක් ද අපේක්ෂිතය. 1987 අධ්‍යයන වර්ෂය සඳහා මොරටු ඉංජිනේරු පීඨයේ පළමු වසරේ



chandimakalanawaka.lk

332ක් අධ්‍යාපනය ලද අතර දෙවන වසරේ පහසුකම් ඇත්තේ 270 කටය. පේරාදෙණි දන්ත වෛද්‍ය පීඨයේ තත්ත්වය මෙසේමය. එහෙයින් විභාගය සමත්වූවන්ද අසමත් වූවන්ද අසමත් කෙරුමට සිදුවේ. සරසවි විභාගයෙන් ද ක්‍රමයෙන් උසස් පෙළ මෙන් සීමිත පහසුකම සඳහා කරන බලු පොරයක් බවට පෙරළමින් පවතී. එහි නියත ජය බමුණු කුලයටය.

බමුණු කුලයේ ඊළඟ එල්ලය පශ්චාත් උපාධිය යි. බොහෝ විට සම්මුඛ පරීක්ෂණවලදී විශ්වවිද්‍යාල බලධාරීන් ගේ හා ප්‍රතිපාදන කොමිසමේ ප්‍රාථමික කොන්දේසි වන්නේ විශ්ව විද්‍යාලයේ සමාර්ථයේ පෙළ නොව අතීත පාසැලේ හි පවුලේ උරුමයය. ක්‍රිකට් ගැසූ, රගර් සොකර් ගැසූ, බැලේ ඩාන්ස් කළ පාසල්වල දරුවන්ම ජයග්‍රහයකයන් වෙති. ඔවුන් පශ්චාත් උපාධි ලබා (බොහෝමයක් යළි මව් රට නොඑති) ආචාර්ය, මහාචාර්ය වූ විට කරන්නේ ද තම සමාජ ස්ථර රැකගැනීම පිණිස ක්‍රියාකෙරුමය. මේ විෂම චක්‍රය ආර්ථික - සංස්කෘතික ලෙස පීඩිත දරුවන් කුඩු පට්ටම් කරන්නේ පරම්පරාවෙන් පරම්පරාවට පෙරට යයි.

**විශ්ව විද්‍යාල විසුරුවා හැරීම -**

මහාචාර්ය අයි. බාලසූරිය මහතා විසින් විශ්වවිද්‍යාල විමධ්‍යගත කරණය නමින් කරන ලද සමීක්ෂණයෙන්ද, 1987 පාර්ලිමේන්තු අනුකාරක සභාවේ ඒ.සී.එස්. හමීඩ් වාර්තාවේ ප්‍රාදේශීය විශ්වවිද්‍යාල වලින්ද 1988 යූ.එන්.පී. ප්‍රතිපත්ති ප්‍රකාශයේ සරසවි පාසැල් නමින් ද 1985 වැනි වකවානුවක එවකට අගමැති ආර්.ප්‍රේමදාස මහතාගේ විශ්වවිද්‍යාල ගමට ගෙන යෑමේ ආදී වූ සියලු දෙයින් ද කියවුණේ එකම අරුතකි. එනම් විශ්වවිද්‍යාල විසුරුවා හැරීමය.

බාලසූරිය වාර්තාව අනුව වෛද්‍ය - ඉංජිනේරු වැනි ප්‍රවීණ පාඨමාලා හැර සෙසු සෑම පාඨමාලාවක්ම දිස්ත්‍රික් මට්ටමේ පාසැල්වල උගැන්විය හැකිය. හමීඩ් වාර්තාවට අනුව විශ්වවිද්‍යාලයට තේරුණු සිසුවා තම ප්‍රථම වසර දිස්ත්‍රික් පාසැල්වලට ඇතුළත්ව ඉන්පසු අවශ්‍ය නම් පමණක් වැඩිදුර විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබනු ඇත. පළමු වසරේ ලැබෙන ඩිප්ලෝමා සහතිකය සමග රැකියාවක් ලබා ගැනීමට ඔහු දිරිගන්වනු ලැබේ.

මොවුන් සිතාගෙන ඇත්තේ විශ්වවිද්‍යාලය යනු කෙසේ හෝ ඉගෙන ගන්නා පාඨමාලාවක් කියායි. ජේ.ආර්. ජයවර්ධන මහතා "සියලු විශ්වවිද්‍යාල වසා විවෘත විශ්වවිද්‍යාල ඇතිකරනවා" යැයි කියා වරක් ප්‍රකාශ කළ පරිදි තැපැල් මාර්ගිකව හෝ පැසල්වල හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාදිය නොහැකිය. විශ්වවිද්‍යාලයේ එක් මූලික සංකල්පයක් නම් සාමූහික ගුරු - සිසු බුද්ධිමය කේන්ද්‍රයේ වැඩිමය. තැපැල් මාර්ගිකව එය ලබාගත නොහැකිය. නවසිය හතලිස් ගණන්වල අයිවර් ජෙනිංග්ස් ගේ නේවාසික විශ්වවිද්‍යාල සංකල්පයට මෙරට විද්වතුන් ගෙන ආ එක්

තරකයක් වූයේ එය සමාජයෙන් වියුක්ත වූවක් බවය. විමධ්‍යගත කුඩා සරසවි අපේ උරුමයක් බවය. විශ්වවිද්‍යාලය බටහිර රටවල මෙන් සමාජයෙන් ඉහළ පවත්වාගැනීමක් අවශ්‍ය නොවූවද සාමූහික බුද්ධි කේන්ද්‍රයේ වැඩිම එයට කිසිසේත් ප්‍රතිපක්ෂ නොවේ.

එහෙත් යූ.එන්.පී. නායකයන් මේ තැත් කරන්නේ මේ කිසිවකටත් නොව ආර්ථික ප්‍රතිලාභ, දේශපාලන ප්‍රතිලාභ තකා විශ්වවිද්‍යාල පෞද්ගලීකරණයෙන් නොනැවතී එය සංකල්පයක් ලෙස විනාශ කෙරුමටය.

**● පාසැල් අධ්‍යාපනය වැනසේ –**

පාසැල් සඳහා රජය අනුගමනය කළේ සෘජු පුද්ගලීකරණය, අධ්‍යාපන වියදම් කපා හැරීම, වරප්‍රසාද ලත් බමුණු කුලය ඒ තුළින්ද නගා සිටුවීමේ යන සියලු ක්‍රියාදාමයන් ඉටුකරගැනීම සඳහා වූ ප්‍රතිපත්තියකි. 1981 දෙසැම්බර් මස ගෙන එන ලද අධ්‍යාපන ධවල පත්‍රිකාව රජයේ පාසැල් වැඩ පිළිවෙළ මොනවට කියාපාන්නක් විය.

**(i) ධවල පත්‍රිකාව**

ප්‍රථමයෙන් ලංකාවේ ඒ වන විට පැවති පාසැල් 10,000 කට ආසන්න ප්‍රමාණය ඒකීය, පොකුරු හා හුදකලා පාසැල් යනුවෙන් නම් කරන ලදී.

ඒකීය පැසැල් ලෙස නම් කළේ සෘජුවම මුදල් ගෙවා අධ්‍යාපනය ලැබිය යුතු පාසැල් ලෙසය. පසුව මේවා ජාතික පාසැල් නමින් ද ක්‍රියාත්මක කෙරුමට යත්න දරන ලදී. මේ සියලු ක්‍රියාදාමයන් ඉමහත් ජාත්‍යන්තර හා දේශීය බලපෑම් මත සිදු කරන ලද පුද්ගලික පාසැල් ජනසතුකරණය ආපසු හැරවීමට තැත් කෙරුමකි. අර්ධ ලෙස පුද්ගලික වූ සුපිරි පාසැල් ද, රජයේම වුවද බමුණු කුලයේ තනි උරුමය පිණිස වූ පාසැල් ද පවතින විට තනිකරම පුද්ගලික පාසැල් ඇතිකෙරුම තත්ත්වය තවත් බැරෑරුම් කරන්නේය. ප්‍රථමයෙන් විදේශ සිසුන් හට පමණක් ලෙස ආරම්භ වී දැන් දේශීය සිසුන් 20% - 40% දක්වා ඇතුළත් ජාත්‍යන්තර පාසැල් ද පැරණි අධිරාජ්‍යවාදී සම්ප්‍රදාය නැවත ප්‍රතිෂ්ඨාපනය සඳහා තබන ලද සෘජු පියවරයෝය.

ධවල පත්‍රිකාවේ 60 වන වගන්තියේ මෙසේ විය.

> "රටෙහි ඇති 9500 ක් පමණ වන පාසැල් පරිපාලනය හා සංවර්ධනය කාර්යයන් සඳහා රාශිගත කර පර්ෂද 1000ක් පමණ සංඛ්‍යාවක් වශයෙන් සංවිධානය කරනු ඇත. පිහිටීම අනුව මූලස්ථ පාසලක් වටා මේ රාශිගත පාසැල් පිහිටවනු ඇත. පර්ෂද විද්‍යාලාධිපතිවරයා විසින් නිර්දේශ, ගුරුවරු සම්බන්ධ

ගැටලුවලදීත් පහසුකම් ශාස්තු ගැටලුවලදීත් ඍජු බලධාරියා වන්නේය."

මෙයින් කුඩා පාසැල් සංවර්ධනය සහමුලින් නතර කරවන සුළු වූ අතර, කුඩා පාසැල්වල දරුවන් විශාල මඟක් ගෙවා ක්‍රීඩා පහසුකම්, විද්‍යාගාර පහසුකම් සඳහා මූලස්ථානය වටා කොටුකරනු ඇත. මෙය රජයේ අධ්‍යාපන වියදම් නින්දිත ආකාරයක කපාහැරීමක් වන අතර ගැමි පාසැල් විනාශය කරා යොමුකර වීමක් ද වේ. තවද මුදල් අයකර ගැනීමේ හා ගුරුවරු මාරු කෙරුමේ බලතල පර්ෂද විදුහල්පතිවරුන්ට ලැබීම (මොහු අනිවාර්යයයෙන් පාලක පක්ෂයේ පාක්ෂිකයකු වනු ඇත) හේතුකොට ගෙන විෂමාචාරයන්ද, ශාස්තු ගෙවිය නොහැකි පාසැල් දරුවන් මූලස්ථයෙන් කොන්වී යෑමද සිදුවනු ඇත.

දැනටමත් ගොඩනැගලි අරමුදල, ක්‍රීඩා අරමුදල, අතිරේක ගුරු අරමුදල, ඩෙස් පුටු ලෙස සියලු මූලික කරුණු (රජයෙන් ඉටුවිය යුතු) දෙමාපියන් වෙත පටවා ඇති අතර විශාග වශයෙන් දරුවන් පාසැල් නොයෑමටත් මේ තත්ත්වය ද ඉවහල් වී ඇත්තේය.

69 වැනි වගන්තිය මෙසේ ප්‍රකාශ වෙයි.
"මූලස්ථානයක් වටා ගොනුකළ නොහෙන පාසැල් හුදකළා පාසැල් ලෙස නම් කෙරේ"

පාඨශාලා ව්‍යුහයන් මෙසේ සකස් විය.

> "1 - 5 ශ්‍රේණි දක්වා වූ ප්‍රාථමික ද, 6 - 8 දක්වාවූ කනිෂ්ඨ ද්විතීක අවස්ථාවන්ද වෙයි. 8 වන ශ්‍රේණියේ විභාගය කඩ ඉමක් අතර වෘත්තීය තාක්ෂණික අධ්‍යාපනය දෙසට ඉන්පසු සිසුවා උනන්දු කරනු ලැබේ. ඔවුන් තාක්ෂනික අධ්‍යාපනය පාඨමාලාවක් හෝ විවෘත පාසලක පාඨමාලාවක් හෝ හදාරනු ඇත. ජ්‍යෙෂ්ඨ ද්වීතීක විභාගය 9 - 11 ශ්‍රේණිවල නැවත පවත්වන ලද අතර එයින්ද සිසුන් තාක්ෂණික පාඨමාලා හා විවෘත පාසැල් අධ්‍යාපනය කරා තුළු ගන්වනු ලැබේ. 12 - 13 ශ්‍රේණිවල අධ්‍යාපනයක් ලද ශිෂ්‍යයින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හෝ විවෘත පාසැලේ, තාක්ෂණික විශ්වවිද්‍යාල සඳහා හෝ බඳවා ගන්වා ඇත."

11 - වගන්තිය අනුව මේ වනතෙක් ගැමි දරුවන් (හැකියා පූර්ණ) උසස් පාසැල් කරා ගිය පස්වැන්නේ ශිෂ්‍යත්වය අහෝසි කරන ලද අතර, 8 වන ශ්‍රේණියේ දී ලබාදෙන්නේ ජාතික සහතිකයක් නොව පර්ෂද සහතිකයකි. මේවා කොපමණ අක්‍රමිකතාවලට ගොදුරුවේදැයි යන්නත් කොළඹ පර්ෂදය හා හම්බන්තොට පර්ෂදය අතර සහතිකවල පවතින වෙනස්කමත් පැහැදිලිය. මෙහි වැදගත්ම අංශය නම් ශාස්තු ගෙවා විවිධ පාඨමාලා සඳහා විවෘත පාසැල් ( විවෘත විශ්වවිද්‍යාල වැනි) කරා සිසුන්

විටින් විට පාසැල් හැරයෑමට පෙළඹවීමත්ය. විවෘත විශ්වවිද්‍යාලවල ආර්ථික අරමුණු මෙන්ම සිසුන් එක්රැස්වීම වැලැක්වීමේ අරමුණු ද මේ විවෘත පාසැල් කෙරේ බලපවත්වයි. විවිධාකාරවූ ප්‍රායෝගික විෂයන් සහිත පාඨමාලා ඇති කෙරුම යෝග්‍ය වුවත් විවිධ ශාස්ත්‍ර අය කරන පුද්ගලික හෝ රජයේ හෝ අසංවිධිත, පාසැල් අධ්‍යාපනය හා එක්ව නොයන, පාඨමාලා අධ්‍යාපන පාඨමාලාවක අර්ථය කෙලෙසන අතර එය සිසුන් අතරමං කෙරුමක් ද වනු ඇත. සැලසුම් සහගත නොවී හතු පිපෙන්නාක්මෙන් ඇතිකර ඇති, ආර්ථිකයට උදුරාගත නොහෙන පුද්ගලික හා කාර්මික විද්‍යාල පාඨමාලාවන් හැදෑරූ විශාල පිරිසක් අදද රැකියාවක් නැතිව සිටීමේ මෙහි ප්‍රායෝගික තත්ත්වය හුවා දක්වයි. ඔවුන්ට පාසැල් අධ්‍යාපනය ද අහිමි වීම ඛේදවාචකයකි. විවෘත පාසැල් වල පාඨමාලාවල අනාගතයද එම මගම ගනු ඇත.

98 වන වගන්තිය මෙසේ ප්‍රකාශවෙයි

"මධ්‍යතලයේ කළමණාකාර වෘත්තීන් සඳහා තුන් අවුරුදු හෝ සිව් අවුරුදු හෝ කලක් ගතවන විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් එතරම් අවශ්‍ය නොවේ. එම පිරිස විශ්වවිද්‍යාල නොවන වෘත්තීය ආයතන වල පුහුණු කරවිලීමට....."

මේ ප්‍රයත්නය ඉතා පැහැදිලි ය. එනම් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පුළුල් කෙරුම නතර කොට විකල්ප පහළ මට්ටමේ වෘත්තිකයන් මේ විවෘත විශ්වවිද්‍යාල, ජාතික තාක්ෂණික ආයතන, ආධුනිකත්ව පුහුණු ආයතන වලින් ලබාගෙන ඔවුන්ගෙන් ඉහළ වෘත්තියක රැකියා අවශ්‍යතා පුරවාලීමය.

විෂය පාඨමාලාවේ වෙනස්කම් පහත ආකාරයට සිදුවිය.

ප්‍රථම භාෂාව, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව, සමාජ අධ්‍යනය සඳහා පමණක් 11 ශ්‍රේණියේ විභාගය පවත්වනු ලැබේ. තාක්ෂණික විෂය, ආගම, සෞඛ්‍ය, සෞන්දර්ය විෂයන් පර්ෂද මට්ටමින් සංවිධානය කරනු ලැබේ.

මෙහි පළමු බරපතල හානිය නම් ආගම විෂය වෙනුවට ඉංග්‍රීසි අනිවාර්යය කෙරුමය. මෙමගින් ජාතික ආත්මය කුඩාකලදීම දරුවන් වෙතින් පළවා හැර බටහිරකරණයට යොමුකර වීමේ අපේක්ෂිතය. දෙවැන්න නම් සමාජ අධ්‍යන විෂයේ පටු සීමාවය. එය 70 - 77 සමාජ අධ්‍යන විෂය හා කිසිසේත් එක්ව නොයයි. එය සහමුලින්ම විවෘත ආර්ථිකය හා ආර්ථික - සංස්කෘතික පාදඩකරණය ස්ථාපනය කෙරුම සඳහා යොදවා ගත්තකි.

තවද විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා කලා, විද්‍යා විෂය ධාරාවන් දෙකක් හඳුන්වා දී ඇති අතර 'පළමු කොටස' ලෙස යෝග්‍යතාවයක් ලබා ගත යුතු අනිවාර්ය කොටසක් ලෙස විෂයන් හතරක් නම් කර ඇත.

i ශ්‍රී ලංකාවේ ආර්ථික උරුමය සහ සමාජ ආර්ථික පරිසරය

ii ඉංග්‍රීසි

iii ප්‍රථම භාෂාව

iv ප්‍රජා නැඹුරුව හා වැඩ හුරුව

අනෙක් විෂයන් පෙර පරිදිම වෙයි. මේ සංයෝගතා විෂයන් අතරින් යූ.එන්.පී. යේ සැබෑ අරමුණ වූයේ ඉංග්‍රීසිය උසස් පෙළට අනිවාර්ය කෙරුමය. සෙසු විෂයන් යොදා ඇත්තේ එකී අරමුණ සඟවා ගන්නටය. අවසානයේ ප්‍රායෝගීකව එම 'විකාරයන්' රැස කැපී ගොස් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා 'ඉංග්‍රීසි' අනිවාර්ය යොග්‍යතාවයක් වෙයි. විශ්වවිද්‍යාල තලයම පාසැල් අධ්‍යාපනයන් බමුණු කුලය වෙත පවරා දෙන්නේ එසේය.

11 - 12 - 14 - 15 - 16 යන වගන්තිවලින් හඳුන්වා දී ඇති අඛණ්ඩ ඇගයීම් ක්‍රමය ද සැලකිල්ලට ගත යුත්තේ නිරපේක්ෂව නොව සාපේක්ෂ වටපිටාවක් මතය. අනවතරයෙන් ශිෂ්‍යා තම විෂය හා බාහිර දැණුම් ඔස්සේ කුළු ගැන්වීම ඉතා හොඳය. එහෙත් ඒ ඔහුගේ සමස්ත ආර්ථික පරිසරය ගැන සලකමිණි. රූපවාහිනිය හා වෙනත් සන්නිවේදන තුළින් කරුණු සෙවීමක් හා වැඩ හුරුවක් ඉතා දුෂ්කර පාසැල් සිසුන් වෙතින් බලාපෙරොත්තු විය නොහැක්කකි. අඛණ්ඩ ඇගයීම් දුෂ්කර පාසැල්වල නැවත ඇගයීමට අධ්‍යාපන අමාත්‍යාංශයට සිදුවෙමින් පෙනේ. සිසුන්ගේ විෂය පථය පුළුල් කළ යුත්තේ අනියම් තරගයත්, අවිවේකී බවත් එහෙයින්ම අසහනයත් ඔවුන්ට උරුමකරන බලහත්කාරී මාවත් තුළ නොව විවේකී බුද්ධිය තුළය. ඇත්ත වශයෙන් ම අඛණ්ඩ ඇගයීම්වල මුඛ්‍ය අරමුණ වූයේ ආර්ථික - සංස්කෘතික ලෙස පීඩිත දරුවන් අධ්‍යාපන කේන්ද්‍රයෙන් එහි පරිධියට විසිකර දැමීමය. අඛණ්ඩ ඇගයීම් ක්‍රමය ක්‍රියාත්මක කෙරුමට තමන්ට සම්පත් නැතැයි බ්‍රිතාන්‍යය පවසද්දීත්, ඇමරිකාව අනුගමනය කරමින් අපේ අධ්‍යාපනඥයන් ගත් ක්‍රියාමාර්ගය ඔවුන් ගේ මුග්ධ බවත්, අනුකාරක බවත් හෙළිකරවන්නකි.

(ii) අධ්‍යාපනික වියදම්

ශ්‍රී ලංකාවේ දරුවන්ගේ වාර්ෂික උප්පත්ති ගණන නවසිය අසූ ගණන්වල සිට ක්‍රමයෙන් අඩුවන බවක් පෙනේ. එහි තේරුම තව දුරටත් පාසැල් ඇති කෙරුම සඳහා වියදම් කෙරුම අනවශ්‍ය බවය. පාසැල් සංතෘප්තව පවතී. අධ්‍යාපනය සඳහා වියදම් මෙසේ විය.

| වර්ෂය | 1973 | 75 | 77 | 79 | 81 | 83 | 85 |
|---|---|---|---|---|---|---|---|
| ආණ්ඩුවේ වියදම් | 5025.7 | 7186.6 | 8812.6 | 20339 | 29485.6 | 41790 | 67103 |
| අධ්‍යාපනය සඳහා වියදම | 602.0 | 706.6 | 704.9 | 1097.4 | 1641.8 | 2257 | 3025 |
| ප්‍රතිශතය % | 11.9 | 9.8 | 8.6 | 5.3 | 5.5 | 5.9 | 4.5 |

පාසැල් අධ්‍යාපනය තුළ යටත් විජිත යුගයේ සිට පැවත එන අර්බුදයත්, නිසි ජාතික අධ්‍යාපන ක්‍රමයක් කරා අධිෂ්ඨානශීලීව ගමන් නොකිරීමේ අර්බුදයත්, අධ්‍යාපනය රටේ ආර්ථික - සංස්කෘතික ක්‍රියාදාමයෙන් වියුක්තව එයට අවශෝෂණය කරගැනීමට නොහැකි එකක් වීමත්, 1977 න් පසු මේ සියලු ක්‍රියාදාමයන් නව ජව වේගයකින්, ශීඝ්‍ර ත්වරණයකින් සාතීය ලෙස වර්ධණය වීමත් යන කරුණු වලින් පාසැල්වල දේශපාලන කැළඹීම් වලට පුළුල් පදනම් සැකසූ අතර එය බාහිර දේශපාලන අරගලය සමග සම්පාත වීමෙන් උත්ප්‍රේරණය විය.

ගම්බද පාසැල් කඩාවැටී දරුවන් මිය යන තත්ත්වයත්, දෙමාපියන් වෙත පටවා ඇති අදික විය හියදම් හරයත්, විෂය නිර්දේශ හා විෂයන්ගේ ගැටලුත්, අතිවිශාල තරඟයක්, පෞද්ගලික අධ්‍යාපනය හා අධ්‍යාපනය පුද්ගලීකරණයත්, ඉංග්‍රීසි හා බමුණු කුලය පෙරට ගෙන ඒමත් යන ප්‍රායෝගික කරුණු කිරි බනිස් ඉල්ලමින්, අඛණ්ඩ ඇගයීම් හා ජාතික පාසැල් ප්‍රතික්ෂප කරමින් ඇතිවූ අරගලයට පාදක වූ අතර එය පසුව මර්දනයට එරෙහි සටනක් වී අවසානයේ සම්මත සමාජය ක්‍රමය ම ප්‍රකම්පනය කරන ලද 'අභියෝගයක්' බවට පත්විය.

කෙතරම් විකෘතිවීම් සිදුවුවද මේ ශිෂ්‍ය කැරැල්ල පිටුපස ජාතික නිදහස් ඉල්ලවන ගැමි දරුවන්ගේ නිදහස් අරගලයත්, නාගරික පීඩිතයන්ගේ අසහනයත් ප්‍රකට වෙයි. පාසැල් වැසී, පාසැල් අධ්‍යාපනය සහමුලින්ම වැනසී ගියේ මේ යථාර්ථය බලධාරීන් මෙන්ම අඩුම තරමින් සටන් කරන්නන්වත් නොදැන සිටීම නිසාවෙනි.

**● විෂය නිර්දේශ හා සිසු ගුරු ගැටළු.**

අධ්‍යාපනය යනු ආර්ථිකමය හා එසේ නොවන කරුණු අතින් ද අයෝජනයකි. එහෙත් පසුගිය කාලය පුරා දක්නට ලැබුණු දෙයක් නම් (1956 සිට) අධ්‍යාපනය පුළුල් වන තරමට එය අවශෝෂණය කරගන්නට රටේ ආර්ථික - සංස්කෘතික පුළුල් නොවීමය. මෙය උගත් විරැකියාවක් ඇති කළේය. 1977 න් පසු යු.එන්.පී. රජය මෙයට විසඳුම් සෙව්වේ අධ්‍යාපනය උකහා ගත හැකි ආකාරයට ආර්ථික දේහය වර්ධනය කෙරුමට නොවේ. ඔවුන්ගේ පාදඩ ආර්ථික - සංස්කෘතික රටාවට උකහා ගත හැකි ආකාරයට අධ්‍යාපනය කප්පාදු කෙරුමටය. මේ තත්ත්වය තුළ තියුණු තරඟයක් ඇති කළ අතර එය අවසානයේ මස් කුට්ටිවලින් වන්දි ඉල්වන, වන්දි ගෙවන ආකාරයේ ම්ලේච්ඡ යුද්ධයක් දක්වා වැඩී ගියේය.

මෙම අධ්‍යාපනය කප්පාදුවේ අවශ්‍යතාවය ඔවුන් ඉටුකර ගත් එක් මගක් වූයේ ඉතා තියුණු අයුරින් විෂය නිර්දේශය වෙනස් කරලීම මගිනි. රජයේ මැදිහත් වීමෙන් කුළු ගන්වනු ලබන වියරු පාදඩ ආර්ථිකයට විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් අනවශ්‍ය ය. ආර්ථික විද්‍යාඥයන්, කලා-

කරුවන්, ජාතික ආත්මය පෝෂණය කරවන්නන් අනවශ්‍යය ය. රටේ ආර්ථික ක්‍රියාවලියට කලා පාඨමාලා අවශෝෂණය කරගත නොහැකිව ඇත්තේ එහෙයිනි.

අනෙක් අතින් අපගේ ජාතික ආත්මය වටහාදෙන ඉතිහාසය, සාහිත්‍ය, ආගම, දර්ශනය, පුරා විද්‍යාව වැනි විෂයන් මේ පාදඩ ආර්ථික - සංස්කෘතික දහරට අකැපය. අපගේ ජාතික ආත්මය සිඳ අප බටහිරකරණය වූ නිවටුන් රැල්ලක් බවට පත්කර ගැනීමටත්, එමගින් තම පාලනය ශක්තිමත් කර ගැනීමටත් මේ පරගැති නිවට පාලකයෝ කැසකවති. 1977 සිට කර ඇති සංස්කෘතික - සමාජයීය උඩු යටිකරුව අධිරාජ්‍යවාදියෙකුවත් නොකළ එකකි. ලාංකිකයන් ද්‍රව්‍යයේ වහලකු කෙරුමත් තරඟය ඉදිරියේ ඔහු ගේ සියුම් සංවේදී බව හා විනාශ කරලීමත් අනුමත කරන ලද හෙයින් වඩා වේගයෙන් කලා පාඨමාලා කප්පාදු කෙරිණි. මෙය තවත් 15% කින් 1988 නව අධ්‍යනය වර්ෂයේ සිට කප්පාදුවෙයි. කලා උපාධියේ මේ බාල්දු තත්ත්වය නිසා සංවේදී සිසුන් කුඩා කලම සිට විද්‍යා පාඨමාලා වෙතට ආර්ථිකයමය කරුණු පතා තල්ලු වී යෑමෙන් කලා පාඨමාලා හුදු පුද්ගල ප්‍රපංච මතවත් රඳා නොපවතින් සුළු තත්ත්වයකට ඇඳ වැටී ඇත.

මිනිස් ආත්මය තනන, සියුම් සංකල්පනා හා මානව දයාව වැඩිවන කලා පාඨමාලාවල විනාශයේ ප්‍රතිඵල, මස්කුට්ටි වලින් සියලුම ආකාරයේ ගනුදෙනු සිදුවන වර්තමාන ම්ලේච්ඡත්වයෙන් පෙනී යයි.

බ්‍රිතාන්‍යය සම්මතයට අනුව පාඨමාලා සකස්කළද ප්‍රසාරණය නොවන ආර්ථිකයට විද්‍යා උපාධිධාරීන් උකහා ගැනීමද අසීරු වෙයි. මෙයට විකල්පය ලෙස රජය කෙරුමට අදහස් කළේ උපාධිවල අගය අඩුකරලීමට ය. වෛද්‍ය හා ඉංජිනේරු උපාධි වසර 3 කට සීමාකර ඉතිරි අධ්‍යාපනය මුදල් ගෙවා ලැබෙන තැනට කටයුතු කෙරුම පළමු වෑයම විය. වෛද්‍ය හා ඉන්ජිනේරු පාඨමාලාවන් කෙතරම් දුරට දේශයට ගැලපෙනවාද යන්න බරපතල ප්‍රශ්නයක් නමුත් සමස්ත ක්‍රියාදාමය එලෙසම පවත්වා ගනිමින් එය පමණක් වෙනස් කෙරුම නැවත පීඩිත දරුවන්ට කරන අසාධාරණයක් වෙයි. කෙසේ වෙතත් එම අදහස් තිඹිරි ගෙයිදීම (1983) ජනතා විරෝධය නිසා යටපත් විය. එහෙත් එයට විකල්පය වශයෙන් උපාධි පාඨමාලාවට පහළ පාඨමාලා සෑම තැනකම (විශේෂයෙන් ඉංජිනේරු) කුළු ගන්වනු ලැබේ. එය විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා වංචනික අර්ථයෙන් සිදුකරනු ලබන්නකි.

විශ්ව විද්‍යාල හා පාසැල් විෂය නිර්දේශයම හුදු අනුකාරකයෙක් මිස අනෙකක් නොවේ. බ්‍රිතාන්‍යයේ පශ්චාත් උපාධි පාඨමාලා එල්ල කර ගෙන ගොඩනගන ලද මේ පාඨමාලා දේශීය සිසුන්ට හිසරදයක් හා දේශයට දිරවා ගත නොහැක්කක් බවට පෙරලී ඇත. පශ්චාත් උපාධි

සඳහා යන ලක්ෂයකට එකක් පමණ වන සිසුන් අල්පය සගකා අති විශාල බහුතරයක පාඨමාලා සකසනු ලැබේ. එහෙත් මේ පාඨමාලා වල දේශීය කරනය සිදුකළ යුත්තේ සමස්තය තුළ සිදුකරන දේශීය කරණයක එක් අංශයක් ලෙස පමණක් මය.

පශ්චාත් උපාධිය සහ විශ්ව විද්‍යාලවලින් සිදුකරන ගවේෂණ ඉතා අඩු මට්ටමක පසුගිය වකවානුව තුළ පැවති බව සැලකේ. පර්යේෂණ කාර්යයන් සඳහා වූ ආයෝජනයන් නිසි අයුරින් නොලැබීම එකකි. අනෙක් අතින් කලා ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා සුදුසු තෝතැන්නක් පරිසරය විසින් සකසා නොමැත. පාදඩකරණය වන, ශිෂ්ඨාචාරයෙන් ම්ලේච්ඡත්වයට යන සමාජයකට කුමන පර්යේෂණ දැයි විශ්වවිද්‍යාල විද්වතුන් සිතීමට පෙළඹීම එක් හේතුවකි. අනෙක් පසින් විද්‍යා පාර්ශවයෙන් කෙරෙන පර්යේෂණ ද අල්පය. පිටරටින් ගෙන එන ලද යන්ත්‍ර සූත්‍ර පරිහරණයට හා නඩත්තුවට ක්‍රියාත්මක වනවා හැරෙන්නට, නිෂ්පාදනය හා නිර්මාණයට පවතින තත්වය තුළ තහනම් වචන වේ. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සම්මේලනයට වාර්ෂිකව ඉදිරිපත් කරන පර්යේෂණ වලින් වැඩිහරියක් විශ්වවිද්‍යාල ඇදුරන් ඉදිරිපත් කළද විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ගවේෂණශීලීභාවය ඉතා අවමය. මේවාට යන අධික වියදම් ද බාහිර බලපෑමෙන්ද හේතුසාදකය. බොහෝ විද්වතුන් විදේශ සඳහා සේවය කරනු එහෙයින් නොමදව දක්නට ඇත්තේය.

විශ්වවිද්‍යාල වලින් බාහිරවූ පර්යේෂණායතන - තේ පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණායතනය, මධ්‍යම කෘෂිකාර්මික පර්යේෂණායතනය, විශ්වවිද්‍යාල අතර අන්තර් සම්බන්ධීකරණයක් ගොඩනගන්නේ නම් මේ ජාතික ආයතන වඩා සපලදායි වනු ඇත. එහෙත් සියලු දේ ආනයනය මත යැපෙන වෙළඳ ප්‍රතිපත්තිය වෙත රට ගමන් කරවා ඇති හෙයින් ඒවා කෙතරම් ප්‍රශස්ත අගයක් ගනීද යන්න ගැටලුවක්ව පවතී. සමස්තය කරා වැටෙන විට විශ්වවිද්‍යාල ද ගරා වැටෙමින් පවතී.

ඒ කෙසේ වෙතත් විශ්වවිද්‍යාලවලට බාහිරින් මාර්ග, සාමාජික කේන්ද්‍රය හා සර්වෝදය වැනි ආයතන වඩා ක්‍රියාශීලී පර්යේෂණ ප්‍රහාරයක් අරඹා ඇත. මේ විදේශික සහය ලබන ආයතනවල පර්යේෂණයන් අපගේ ජාතික ක්‍රියාවලියට කෙතරම් ඵලදායකද යන්න ගැන ඉමහත් විවේචනයන් පවතී.

ශිෂ්‍ය ප්‍රශ්නයද අද ඉතා සංකීර්ණ වෙයි. ආර්ථික ප්‍රශ්න එයින් මූලික එකකි. 1977 දී 212 ක් වූ ජීවන අංකය අද 800 කට ආසන්න වෙයි. අතිතයේ නාලන්දාව, මහාවිහාරය ආදියේ උගත් සිසුවන් ජනතාව වෙතින් යැපුණ හෙයින් ආර්ථික ප්‍රශ්නය පැන නොනැගින, දුගී සිසුන් සඳහා 1946 තරම් ඈත කාලයක ණය ක්‍රමයක් සැකසුනේ එහෙයිනි. 1972 දී



dhamsakaranaya.lk

එය වසරකට රු. 2700ක උපරිමයකට යටත් කෙරිණ. මේ බැංකු ණය වැඩි වශයෙන් (1978 දී 86%)කලා පීඨවල සිසුන් ලබාගෙන තිබෙන ඔවුන්ගෙන් 74% ක් (1976 ට අනුව) මසකට රු 600 ට වඩා අඩුවෙන් උපයන පවුල් වල දරුවෝද වූහ. මහපොල සංකල්පය ගෙන ආවේද මේ දුගී සිසුන්ගේ ආර්ථික ප්‍රශ්න වලට පිළියමක් පිණිස යැයි කියනු ලැබේ. පුද්ගලික විශ්ව විද්‍යාල. සැණකෙලි, රේස් අශ්වයන් සඳහා කෝටි ගණන් ජාතික ධනය නාස්ති කරණ රජය මේ සඳහා මුදල් උපයා ගත්තේ ජනයා සූදුවට පෙළඹවීමෙනි. එහෙත් මහපොළ හා ශිෂ්‍යාධාර මුදල් රු. 350 මසක (වසරකට වාරික 10) යැපීමට ප්‍රමාණවත් නොවන අතර එය බහුතරයක් සිසුන්ට නොලැබෙයි. මේ නිසා තාවකාලික රැකියා සිසුන් යොමු වී තිබේ. මෙවැනි ක්‍රියා දාමයන් සඳහා සිසුවාගේ කාලය වැය කෙරුමට ඔහු වෙහෙසකර හා කටපාඩම් උගතකු බවට පත් කරයි.

නේවාසිකාගාර ප්‍රශ්නයද ඉතා තීරණාත්මක එකකි. 1978 දී සරසවි වලට ඇතුලු කරගත් ගණන 4800 ක්ද 1988 දී 6300 ක් වේ. එළෙස වාර්ෂිකව ඇතුළුවන සිසුන් ගණන වැඩි වුවද 1977 සිට මේ දක්වා මොනම නේවාසිකාගාරයක්වත් සකසා නොමැත. පේරාදෙණියේ 60% කටද ජයවර්ධනපුර හා මොරටුවේ 10% කටද, කොළඹ හා කැලණිය විශ්වවිද්‍යාලවල 14% කටද, පමණක් නේවාසිකාගාර ඇත. රුහුණු විශ්වවිද්‍යාලයේ කිසිවෙකුට නේවාසිකාගාර නැත. තත්ත්වය එසේ තිබියදී මනා පාරිසරික හා නේවාසික පහසුකම් ඇති පේරාදෙණියෙන් ශිෂ්‍යයන් නාගරික තදබදයෙන් යුතු කොළඹ විශ්ව විද්‍යාලයට අනුයුක්ත කෙරුමට ප්‍රතිපාදන කොමිසම ගත් තීරණය (1987) ශිෂ්‍ය සමගිය බිඳීමේ පටු වුවමණාව මත සිට ගන්නා ලද එකක් වෙයි.

විශ්වවිද්‍යාල ස්වාධීනත්වය බිඳීමද, විෂය මාලාවල අධිකභාරය ද, පාරිසරික ප්‍රශ්නයද නිසා සිසුන් තියුණු මානසික ආතතියද භාජනය වේ.

1977 න් පසු ඇති කරන ලද වෙළඳ ආර්ථිකය යටතේ විශ්වවිද්‍යාල ඇදුරන්ගේ ගෞරවනීයභාවය කෙලසී ගිය අතර පාඨමාලා කප්පාදුකරණය ආදියෙන් ද, දේශපාලනයෙන් ද, දේශපාලන බැල්ම නිසා වෙන් ද දක්ෂ, විදග්ධ ඇදුරන් රැසක් විශ්වවිද්‍යාලවලට අහිමිවිය. සිංහල පිළිබඳ මහාචාර්යවරුන් ජීවත් වූයේ ඉංග්‍රීසි ටියුෂන් දීමෙනි. ආර්ථික තත්ත්වයේ අසතුටුදායක බව නිසා සමහර ඇදුරන් විදේශගතවීමට හෝ වෙනත් වාණිජ ආයතන කරා ආකර්ෂණය කරනු ලැබීය. දේශපාලන ඇඟිලිගැසීම් හා ස්වාධීනත්වය අහිමිකෙරුම් හා තුවක්කුවට ආත්ම ගරුත්වය පාවා දීමට සිදුවීම ආදී කාරණා විසින් ඉතාම පරාර්ථකාමී ඇදුරන් ද විශ්වවිද්‍යාල වලින් ඉවතට තල්ලුවෙමින් සිටිති. සමාජයේ විශේෂයෙන් විශ්වවිද්‍යාලවල පවතින අස්ථාවර තත්ත්වය මෙය උත්ප්‍රේරණය කර ඇත. වසර 10ක විශ්වවිද්‍යාල අධ්‍යාපනය විසින් බිහිකළ විදග්ධයන් සියලු දෙනාම පාහේ අධ්‍යාපනයට අහිමිවීමේ ඛේදවාචකයකට විශ්වවිද්‍යාල ඇදුරන් ගමන් කරවා තිබේ.

මේ සමස්ත වාතාවරණය සිසු - ගුරු ඒකත්වය, මානසික නිදහස ආදී සියලු ගුරු කටයුතු සම්මත ගරා වැටෙමින් පවතින්නේය. සරසවි සිසුවෙකු, ඇදුරෙකු මෙන්ම උපකුලපතිවරයෙකු වීමද මරණය ලැබීමේ අපරාධයක් බවට පෙරළමින් පවතී. විශ්වවිද්‍යාල අධ්‍යාපන බිඳවැටී, එහෙයින්ම පාසැල් අධ්‍යාපනය බිඳවැටී සියලු සිසුවන් බලාපෙරොත්තු විරහිත තත්ත්වයකට පත්ව තැතිගත් හදවත් වලින් යුතුව හිස්ලූලූ අත දිවයති. සමාජය මේ ඛේදවාචකය යථාර්ථානුකූලව විසඳන ප්‍රමාණයටම ඔවුන්ට ශිෂ්ටාචාරයේ මූලික සම්මත ලැබෙනු ඇත්තේය.

## 2. යූ.එන්.පී. ශාපයට එරෙහිව

1977 න් පසු ශිෂ්‍ය ව්‍යාපාරය යම් පමණක අර්බුදයකට හා නිශ්චිත නොවූ තත්ත්වයකට ඇද වැටින. එහෙත් (71 - 77) ශිෂ්‍ය ව්‍යාපාරය තුළ නායකත්වය දැරූ සාම්ප්‍රදායික මාක්ස්වාදී පක්ෂවල ශිෂය සංවිධාන ක්‍රමයන් ගරා වැටී වීරසූරිය අරගලයෙන් පසු (1976 නොවැ. 12) බිඳවැටී මැතිවරණ අන්ත පරාජයෙන් පසු මහත් පසුබෑමකට ලක්විය. අනික් අතින් රටේ පැවතුන ජයග්‍රාහී ඒ.ජා.ප. දේශපාලනයට සමාන්තරව එහි ශිෂ්‍ය අංශය වූ සමවාදී ශිෂ්‍ය පෙරමුණද පැතිර යමින් පැවතින. මෙයට අමතරව නැවත දේශපාලන ප්‍රවාහයකට එක්වූ ජ.වි.පෙ. ශිෂ්‍ය අංශය වූ සමාජවාදී ශිෂ්‍ය සංගමයද සිය වැඩ කටයුතු අරඹා තිබුණි. එහෙත් මේ සියලු බලවේගයන්ට ජයගත යුතු පැහැදිලි අර්බුද ගණනක් විය.

වීරසුරියගේ ලේ පැල්ලම් වලින් දැත් සොදාගන්නට එවකට ශිෂ්‍ය ව්‍යාපාරය තුළ බලවත්ව සිටි ලංකා ජාතික ශිෂ්‍ය සංගමය (ශ්‍රී ලං.කො.ප.) හා ශ්‍රී ලංකා ප්‍රගති ශීලී ශිෂ්‍ය පෙරමුණ (ශ්‍රී ලං.නි.ප.) දැඩි උත්සාහයක් ගත්තද එය අසීරු කටයුත්තක් විය. මෙයට අමතරව ලං.ස.ස.ප., න.ස.ස.ප. හා වෙනත් ට්‍රොට්ස්කිවාදී ශිෂ්‍ය සංවිධානයන්ට ද මැතිවරණයෙන් ලැබූ අන්ත පරාජය නිසාත් වම බිඳවැටෙමින් තිබුණ නිසාත් නිතරම නැවුම් බාවයකින් ඉල්වන ශිෂ්‍ය ව්‍යාපාරය කැටිකරගන්නට නොහැකි විය. හැඟීම් බර ශිෂ්‍යයන්ට ඔවුන්ගේ බුද්ධිමය රළු විවාධ කර්කෂ විය.

ධනපති ආත්මාර්ත කාමී දේශපාලන ප්‍රවාහයක් ශිෂ්‍ය ව්‍යාපාරයට එක්කෙරුම ස්වාභාවයෙන්ම පරාර්ථය කරා කැපවන ශිෂ්‍ය ව්‍යාපාරයට අසීරු කටයුත්තකි. ඒ සඳහා නව විවෘත ආර්ථිකය සමග තරුණ පෙළ වැදගත් පහත් සංස්කෘතියක් ද, රැකියා විරහිත උපාධිධාරීන් ගේ අවිනිශ්චිතභාවය ද, පෞද්ගලික ලාභ ප්‍රයෝජන ද, ජුනිටා පරිපාලනයේ සහයද, මැර බලයද එක්සත් සමාජවාදී ශිෂ්‍ය පෙරමුණ උපයෝගී කරගත්තේය.

chandikalanawaka.lk

අනෙක් අතින් 71 කැරැල්ල පරාජය වීමෙන් පසු එයට සහභාගී වූ මෙන්ම නොවූ කොටස් වෙතින් ජ.වි.පෙ. දේශපාලනයට එල්ලවූ මතවාදමය අභියෝගය නිසා සමාජවාදී ශිෂ්‍ය සංගමයට ද සිය වැඩකටයුතු ආරම්භ කර පවත්වා ගැනීම අසීරුවිය. අසීමිත කැපවීම් හා සිසුන්ගේ සටන්කිමීත්වය හා එක්ව සිටීමට ද ඔවුන් ඉටාගත්තේ මේ අභියෝගය ජය ගන්නට විය හැකිය.

මෙයට අමතරව විවිධ ස්වාධීන ශිෂ්‍ය බලයන්ද විය. ප්‍රගති ආදී නම් වලින් බොහෝවිට සාර්ථක නායකයන් වටා ඒවා ගොනුව පැවතින. පක්ෂ දේශපාලනය තරමක් දුරට ප්‍රතික්ෂේප කළ විද්‍යා පීඨයන්හි මෙවැනි වූ දේශපාලනයන් ජනප්‍රිය විය.

සරසවි ස්වාධීනත්වය ද, ජනතා ස්වාධීනත්වය ද, සිසුන්ගේ හා ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ද අහෝසිකර දමූ 1978 ව්‍යවස්ථාවටත් හාල් පොත් කප්පාදුවටත් එරෙහි සටනත් මේ සියලු බලවේගවල ජීවය මගින් සටන් උරගලක් විය. එහෙත් රජයේ පැවති අසීමිත බලය හා විරුද්ධ බලවේගවල දුර්වලතාවය ඉදිරියේ ශිෂ්‍ය නායකයන්ට ශිෂ්‍යබාවය අහෝසිවෙමින් (විශේෂයෙන් සටන් පැතිර ගියේ පේරාදෙණියේ) සටන අවසන් විය. 78 ව්‍යවස්ථාවෙන් ජාතික ශිෂ්‍ය සභා හරහා අ.වි.වි.ශි.බ.ම. ගොඩනැංවූහ.

1979 දී මොරටු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නායකයන් 7 දෙනකුගේ අසාධාරන පන්තා තහනමට එරෙහිව මොරටු සරසවියේ සිදුවූ මාරාන්තික උපවාසය ප්‍රතිවිරෝධතා නංවන්නක් විය. අ.වි.වි.ශි.බ.ම. තුළ ස.ශි.ස. හා වෙනත් බලවේග අතර මේ සටන ගැන ප්‍රතිවිරෝධතා ඇතිවූ සටන ගැන ප්‍රතිවිරෝධතා ඇතිවූ අතර ස.ශි.ස. සටන පිළිබඳ මුනිවත රැකිය. එහෙත් උපවාසයේ 8 වන දිනයේ ලැබීම ශිෂ්‍ය ව්‍යාපාරයට ජීවයගෙන දුන්නාක් මෙන්ම යූ.එන්.පී. ය ලැබූ ප්‍රථම පරාජයද විය.

1980 - 81 වර්ෂවලදී, 80 ජූලි කම්කරු වර්ජනය, 81 පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිහිටුවීම ආදී ක්‍රියාදාමයන් සිදු විය. ජූලි වර්ජනය පිළිබඳව ද ශිෂ්‍ය ව්‍යාපාරය තුළ මතභේද විය. ජ.වි.පෙ. වර්ජනයට සහය නොදුන් අතර සාම්ප්‍රදායික වමේ පක්ෂ සිය ශක්තිය උරගා බැලීම පිණිස වර්ජනය දියත් කළහ. මතබේද නිසා ශිෂ්‍ය ව්‍යාපාරයන්ද වර්ජනයට ක්‍රියාකාරී සහයක් නොලැබිණ. 81-පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරය එක්සත්ව නැගී සිටියද, වෛද්‍ය විද්‍යාලවල පැවති සිසුන් ගේ උද්දච්ඡ මතයන් නිසා අසාර්ථක විය. එහෙයින් මේ යුගයේදී සිදුවූයේ ඉහත සඳහන් කළ තුන්කොන් බලයන්ගේ බල අරගලය, විශාල මතවාදමය, දෘෂ්ඨිමය අරගලයක් සෑම බලයක් විසින් ම ගොඩනගනු ලැබීය. නේවාසික ප්‍රශ්න ආපන ශාලා ප්‍රශ්න, ශිෂ්‍ය ණය, විභාග ප්‍රශ්න,

මැර ප්‍රශ්න ආදීය සටන් වල මූලික තේමාවන් විය. ශිෂ්‍ය සභා නිලවරණය මේ සඳහා උපරිම ලෙස යොදාගනු ලැබීය.

පොදුවේ සමාජවාදී ශිෂ්‍ය සංගමය වර්ධනය වන බව පෙණින, විශේෂයෙන් ජයවර්ධනපුර (විද්‍යෝදය) විශ්වවිද්‍යාලයේත් පේරාදෙණිය හා මොරටුව විශ්ව විද්‍යාලවලත් ඔවුන් ශක්තිමත් විය. සාම්ප්‍රදායිකවම කොළඹ විශ්වවිද්‍යාලයේත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත් යම් පදනමක් විය. සමාජවාදීන් විශේෂයෙන් කැලණි කොළඹ හා පේරාදෙණිය යන විශ්වවිද්‍යාලවල පදනම දාගෙන තිබිණ. ස්වාධීන බලවේග කොළඹ මොරටුව ආදී විශ්වවිද්‍යාලවල පදනම දමා තිබිණ. 1982 වන විට අ.වි.ශි.බ.ම. බලය තනිකරම පාහේ සමාජවාදී ශිෂ්‍ය සංගමයට හිමි විය.

1982 ජනවාරි - පෙබරවාරි කාලය තුළ සංවිධානාත්මක ප්‍රථම ශිෂ්‍ය සටන වූ ධවල පත්‍රිකා විරෝධී සටන ආරම්භ විය. තනිකරම අ.වි.ශි.බ.ම. නායකත්වයෙන් සිදුවූ මේ සටන ශිෂ්‍ය රැස්වීම්, ජනතා රැස්වීම්, පිකටිං, උද්ඝෝෂණ වල සිට ශිෂ්‍ය ඉතිහාසයේ අතිශය උද්වේගකර මොහොතක් වූ පාර්ලිමේන්තුව වටකිරීම දක්වා ඉදිරියට ගියේය. එහිදී පොලිස් අශ්වයන් විසින් පහර දෙනු ලදුව මොරටු සරසවි සිසුවකුගේ පාදයක් බිඳිණ. විශාල පිරිසක් තුවාල ලැබීය. ශිෂ්‍ය උද්ඝෝෂණය මගින් ධවල පත්‍රිකාව ඉල්ලා අස්කරන්නට පාලකයින්ට සිදු විය. රටපුරා පාසැල්, පිරිවෙන් වැනි ආයතනයන්ද සටනට පිවිසි අතර විශාල ලෙස ජනතාවද උද්ඝෝෂණවලට සහභාගි වීම කැපී පෙනෙන ලකුණක් විය. (කලකට පසු ධවල පත්‍රිකාව හොර රහසේ නැවත ක්‍රියාත්මක විය.)

ධවල පනත පිළිබඳ අරගලයක් ශිෂ්‍ය ව්‍යාපාරයේ ගමන් මග හෙළිදරවු කළේය. එක් අතකින් එය ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වූ බල අරගලය ඒකත්වයට පත්කළ අතර කම්කරුවන්, ගොවියන් හා බහු ජනතාව පාගා දමමින් වහසි බස් දෙඩවූ යූ.එන්.පී. ය දනගැස්වූ ප්‍රථම බහුජන සටන වීමෙන් විශාල ජනතා උද්‍යෝගයක් දල්වාලීය. හයිඩ්පාක් පිටියේදී පැවති විරෝධතා රැලියේ දී අ.වි.ශි.බ.ම. නායකයින් ලෙස බී.ඇම්. ආනන්ද (පේරාදෙණිය) සහ ස්කන්ධ රාජා (යාපනය) එකම වේදිකාවක ජනතාව ඇමතීම විශේෂ සිදුවීමක් විය.

ධවල පනත නිසා පස්සට විසිවී ගොස් තිබුණු සමාජවාදීන් 1982 ජනපතිවරණයෙන් ද ඊනියා ජනමතවරණයෙන් ද ජය ලබා විජයග්‍රාහී ලෙස සරසවි නිලවරණයට එළැඹුණහ. එහෙත් ශිෂ්‍යයන් තවමත් ගරා වැටී නොමැත. පොදුවේ සමාජවාදීන් නිලවරණයෙන් පරාජය වූහ. පේරාදෙණියේ දී ජයග්‍රාහීන් හා සමාජවාදීන් අතර ගැටුමක් ඇතිවිය. එය සමාජවාදීන් විසින් ම ඇතිකරගත් එකකි. අවසානයේ නිර්දෝශීන්ට දඬුවම් ලබා දෙමින් කැකිල්ලේ තීන්දු ලැබින. උදලාගම කොමිසමට එරෙහිව, එහි තීන්දු වලට එරෙහිව සිසුන් මාරාන්තික උපවාසයක් ආරම්භ කළහ. අවසාන බලය ද පරිහරනය වීමෙන් පසු සිසු ඉල්ලීම් ලැබුණද, එය

ජනපති විසින් අවලංගුකර ශිෂ්‍ය නායකයින් අත් අඩලගුවට ගැනීමෙන් කෙලවර විය. මේ ගැටලුව අධිකරණය දක්වා ද ගලා ගිය අතර උදලාගම කොමිසමේ තීන්දුව වැරදි සහගත බැව් අධිකරණය විසින් තීන්දු කරන ලදී. සටන පරාජය වූවද එයින් විශාල ආශ්වාදයක් සිසුන්ට ලැබිණ.

1983 දී තියුණු සටන් තුනක් එකවිට ඇතිවිය. ඒ උසස් අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහිවය. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහිවත් පෞද්ගලික නීති උපාධියට එරෙහිවත් කොතලාවල ආරක්ෂක පීඨය හරහා මොරටු ඉන්ජිනේරු පීඨයට හා කොළඹ විද්‍යා පීඨයට ඇතුළත් වීමට දැරූ උත්සහායට එරෙහිවත්ය. පෞද්ගලික වෛද්‍ය විද්‍යාල සටන හැර අනෙක් සටන් දෙකම සටන් මධ්‍යස්ථානයේ ජීවය මතින් ජයගනු ලැබීය. වෛද්‍ය පීඨ තවමත් ශිෂ්‍ය ව්‍යාපාරයට දුරස්ථය. එලෙසම 1983 ජුලි කොලාහලයේදී දෙමළ සිසුන් රැකගන්නට ද තියුණු සටනක් කෙරුමට සිදුවිය. කෙසේ වෙතත් 83 ජුලි ශිෂ්‍ය සභා තහනම් කරමින් සියළු ශිෂ්‍ය නායකයින් අත්අඩංගුවට ගනිමින් හදිසි නීතිය යටතේ ශිෂ්‍ය ව්‍යාපාරයට විශාල ප්‍රහාරයක් එල්ල විය. 1983 න් පසු යාපනය හා මඩකලපුව සරසවි ශිෂ්‍ය ව්‍යාපාරයෙන් ඈත් විය.

1984 වර්ෂයේ ජුනි මස ලෝක ඉතිහාසයේ ප්‍රථමවරට පිහිටුවනු ලැබූ සරසවි පොලීසියේ වෙඩි තැබීමෙන් ජුනි 19 වැනි දින පද්මසිරි අබේසේකර නම් වෛද්‍ය සිසුවා මිය ගියේය. එය යූ.එන්.පී. යේ ප්‍රථම සරසවි සිසුන්ට ඇක්වයිනාස් නේවාසිකාගාරය අසල වෙඩි තැබීමෙන් ජුනි 21 වන දින රෝහණරත්නායක මිය ගියේය. ඉන්පසුව එය විරෝධතා සටනක් ලෙසද පසුව සරසවි පොලීසිය ඉවත් කෙරුමේ සටනක් ලෙසද, පාසැල් මට්ටම දක්වා විහිදී ගොස් පේරාදෙණියේ පොලීසිය ඉවත්කරගන්නා තුරු දීර්ඝකාලීනව සරසවි වසා තැබීමත් සිසුන් සරසවි හැරයාමටත් තුඩු දුන්නේය.

මේ සටනේ ඉතා පැහැදිලි ප්‍රවනතාවය වූයේ ශිෂ්‍ය සභා අහිමිවූවද ඒ වන විට පොදු නියෝජනයන් ද, දේශපාලන නියෝජනයන්ද, සැඳුම්ලත් ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු ස්ථාපිත වීමත් සරසවි දීර්ඝ කාලීනව වසා දැමීමට හා ශිෂ්‍ය මර්දනයට එරෙහිව දෙමාපියන් සංවිධානය වීමත් ය. එලෙසම විශේෂයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය මැර බලයට එරෙහිව සිසුන් තීරණාත්මක ලෙස සටන් වැදීමත් දීප ව්‍යාප්ත ශිෂ්‍ය සටන් රැල්ලත් කැපී පෙණින.

1985 පෙබරවාරි මස දින කිහිපයක් තුළ ජනතාවට රහසිගතව සම්මත කරගන්නා ලද 1985 අංක 7 දරණ 1978 පනතේ සංශෝධන විශ්වවිද්‍යාල පනත ඉතා තීරණාත්මක පනතක් විය. ඒ මගින්,

1. පෞද්ගලික උපාධි ප්‍රදාන ආයතනයන් බිහිකෙරුමත්
2. ශිෂ්‍ය සබා අහෝසි කරලීමත්

3. උපකුලපති පත් කෙරුමේ අයිතිය, උත්තර මණ්ඩල අහෝසි කරමින් සෘජුව ජනාධිපති අතට ගැනීමත් සිදු විය.

ධවල පත්‍රිකාව ජනතාව තුළ සංවාදයට භාජනය වීමට කාලයක් ලබා දුන් අතර එහෙයින් ම එය උද්ඝෝෂණ ඉදිරියේ හකුලා ගන්නට සිදුවිය. එහෙයින් ම මේ පනත කිසිදු සාකච්ඡාවකට ඉඩකඩ නොදෙමින් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පවා කතා කෙරුමට ඉඩ නොදෙමින් සම්මත කර ගත්හ.

මේ සඳහා වේගයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලදී. පිටපිට දින තුනක්ම කොළඹ නගරය පුරා ශිෂ්‍ය පෙළපාළි ගමන් ගත්තේය. පෙබ:25 වැනි දින පැවැත්වූ ජාතික විරෝධතා දිනයට රට පුරා පාසැල් දහසකට අධික සංඛ්‍යාවක් සහභාගිවිය. කම්කරුවන් හා එක්ව ද පිකටිං වැනි ක්‍රියා මාර්ග ගන්නා ලදී. මේ පනත පිළිබඳව විවාදයකට එවකට ජාතික ආරක්ෂක ඇමති ලලිත් ඇතුළත්මුදලි විසින් අභියෝග කළ අතර සිසුන් විසින් එය පිළිගෙන ඉදිරිපත්කළ මූලික ප්‍රජාතාන්ත්‍රික කොන්දේසි ඔහු නොපිළිගත්තේය. ඒ අතර අභියෝගය න.ස.ස.ප. ලේකම් වික්‍රමබාහු කරුණාරත්න මහතා විසින් භාරගැනීම තුළ විවාදයට ලක්වීම පිළිබඳව ශිෂ්‍ය ව්‍යාපාරය ව්‍යාකූල වූ අතර රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති බවට දෙදෙනාම පිළිරුනීමෙන් පසු විවාදය අවසන් විය.

පනත පරාජය කළ නොහැකි වුවද ශිෂ්‍ය සටන විසින් එහි ක්‍රියාත්මක බාවය අවලංගු කරන ලදී. රටපුරා පාසැල් සිසුන් ගණනාවකගේ පන්ති තහනම් වීම,සිසුන් අත්අඩංගුවට පත්වීම් ආදිය සිදුවිය.

85 ජුලි 15 වැනි දින මොරටු සරසවියේ සිවිල් සංකීර්ණ විවෘත කිරීමට ආ එවකට මුදල් ඇමති රොනී ද මැල් මහතාට සරසවියට ඇතුළු වීමට නොදී පිටමං කළේ "නිදහස් අධ්‍යාපනය කෑ ඇමතීන් පන්නමු"යන සත්‍යග්‍රහය සටන් පාඨය හරහාය. මෙයින් සිසු නායකයන් 7 ක් පන්ති තහනමට ගොදුරුවූ අතර දීර්ඝ සටනකින් පසු පරාජය කරන ලදී.

ජ.පුර විශ්වවිද්‍යාලයේ එවකට උපකුලපතිවූ කරුණාසේන කොඩිතුවක්කු හා ග්‍රාමීය යූ.එන්.පී. මැරයන් උපයෝගිකරගෙන සිසුන්ට එරෙහිව මහා ප්‍රහාරයක් එල්ල කරන ලද්දේද මේ වකවාණුවේදීය. එකලම මෙන් මොරටු සරසවියේද යූ.එන්.පී. මැරයන් හා ගැටුම් වාර්තා විය. මේ වායින් සිසුන් විශාල ප්‍රමාණයකට බරපතල තුවාල සිදුවීම්, දේශපාලන අභිමිවීම හා සරසවි දීර්ඝව වසා තැබීම සිදුවිය.

1985 සටන් වර්ෂයක් වූ අතර එවකට ලාබාල වියේ පසුවූ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු ස්ථාවර වීමට මේ සටන් බලපෑවේය. සිසුන් 50 කට එක් නියෝජිතයෙක් බැගින් වු පොදු නියෝජනයක් එහි විය. මෙය ක්‍රියාත්මක

නොවුයේ කොළඹ සරසවියේ පමණි. එහි ශිෂ්‍ය නියෝජිතයන් දේශපාලන පදනමකින් තෝරාගත් අතර පොදු පදනමට ස්වාධීන ශිෂ්‍ය සංගමය එරෙහි විය. ( විද්‍යා පීඨය මෙයට වෙනස්ව පොදු නියෝජිතයන් තේරූහ ) කෙසේ වෙතත් ශ්‍රී.ල.ම.ප, න.ස.ස.ප, ල.ස.ස.ප., ශිෂ්‍ය සංවිධාන ප්‍රතිපත්තිමය නීන්දුවක් ගනිමින් අ.වි.වි.ශි.බ.ම වෙතින් ඉවත් විය.

පොදුවේ 1986 වර්ෂය පොදු සටහනක් ඇතිවූ වසරක් නොවේ. මහ පොළ ශිෂ්‍යාධාර වැඩි කෙරුමට හා වෙත් සුභසාධක සඳහා වසර පුරාම උද්ඝෝෂණ පැතිර ගියේය. රුහුණු විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ විභාග ප්‍රශ්නයක් මත වර්ජනයක් ඇතිවිය. දීර්ඝ ලෙස සරසවි වසා තැබුමේ සම්ප්‍රදාය ඇතිවුයේ මෙයිනි. රුහුණු සරසවිය මාස 8ක්ද, ආයුර්වේදය මාස 09 ක්ද වසා තැබිණ. දේශීය වෛද්‍ය ආයතනය විවෘත කරගත හැකි වූයේ සිසුන් විශාල පිරිසක් එයට කඩාපැනීම තුළිනි. කෙසේ වුවද සටන් දෙකම දීර්ඝ කාලීනව වුව ජයෙන් කෙළවර විය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය මැර ප්‍රහාරයක් නිසා ඇතිවූ ගටුමින් ද මාස 7කට වැඩි කාලයක් වැසී ගියේය. සිසු නායකයන්ට පැනවූ දඬුවම් ඉවත් වී පීඨය ආරම්භ විය. මාස කිහිපය තුළ සටන් පැවතිනි.

1986 වසර පොදුවේ විවේකී වසරකි. එහි සිදුවූ විශාල ම දෙය නම් සිසුන් විශාල වශයෙන් දේශපාලන සංවාදයේ යෙදීමය. විශේෂයෙන් ජනවාර්ගික ප්‍රශ්නය නිසා සිසුන් තුළ විශාල දේශපාලන උනන්දුවක් ඇති විය. මේ වසරේ දීම පළාත් සභා ආදියත් , ජනමනස ප්‍රකම්පනය කළ ඝාතන ආදියත් මූලිකව පෙරට ආවේය. මෙහිදී ශිෂ්‍ය ව්‍යාපාරයේ වූ කොටස් දෙකක් එකිනෙකට වෙනස් මත දැරූහ. එය ක්‍රමයෙන් එකිනෙකට පරසතුරු බලයන් දෙකක් බවට වර්ධනය විය. ස්වාධීන ශිෂ්‍ය සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය බල දෙකේ නායකත්වයට පැමිණියහ.

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරය බිහිවුයේද මේ වකවානුවේදීය. කොළඹ සරසවියේ දී දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරය පිහිටුවීමට ගියකළ දේ.ශි.ව්‍ය. සාමාජිකයන් සහ ස්වාධීන ශිෂ්‍ය සංගමය අතර ගැටුම් ඇතිවිය. මේ ගැටුම් වඩාත් තිරණාත්මක මුහුණුවරක් ගත්තේ ස්වාධීන ශිෂය සංගමයේ නායක දායසීල පතිරණ ශිෂ්‍යයා 1986 දෙසැ 18 වැනිදින සාහසික ලෙස පැහැරගෙන ගොස් ඝාතනය කෙරුමෙනි. එය සමාජවාදී ශිෂ්‍ය සංගමය හා ජ.වි.පෙ විසින් සිදුකළ බවට ස්.ශි.ස. චෝදනා කළ අතර ස.ශි.ස. කියා සිටියේ එය සිසුන් අතර ගැටුම් ඇති කරවන්නට රජය විසින් සිදුකළ වගක්ය. කෙසේ වෙතත් රජය විසින් ස.ශි.ස. හා දේ.ශි.ව්‍ය. තහනම් කර ජ.පුර.සරසවියේ සිසුනායකයන් රැසක් මිනිමාරුම් චෝදනා මත අත්අඩංගුවට ගන්නා ලදී. ( මොවුන් චෝදනා විරහිත බව පසුව පෙනින ) ස්වාධීන ශිෂ්‍ය සංගමයද සිය බල

ස්ථානය වූ කෙළඹ සරසවියෙන් ස.ශි.ස. සාමාජිකයන් හා ආධාරකරුවන් පහරදී පලවා හැරියේය.( මෙහිදී ස්වාධීන ශිෂ්‍ය සංගමයෙන් පහර කෑ අය අතර භික්ෂූන් වහන්සේලා ද වූහ.) වෙනත් සරසවිවලින් ද ගැටුම් වාර්තා විය.

මෙහිදී පෙනුන ඉතා සෘජු ප්‍රවනතාවය නම් තම බලය සඳහා සිය බාහිර උදව්කරුවන්ගේ ආධාරයෙන් ඕනෑම ක්‍රියාවලියක් සිදුකෙරුමට ශිෂ්‍ය කණ්ඩායම් පෙළඹී සිටීමය.

එසේ හෙයින් 1987 වර්ෂයම ඇරඹුණේ අර්බුදවලිනි. පතිරණ ඝාතනයන් සමග මෙතෙක් ඇදෙමින් ගැටෙමින් තිබූ අ.වි.වි.ශි.බ.ම දෙකඩ විය. ඔවුන් එක්ව සිටි අවසාන අවස්ථාව නායකත්ව සමාජවාදී ශිෂ්‍ය සංගමයට ලැබුණු අතර පොදුවේ දේශප්‍රේමී ප්‍රවනතා නියෝජනය කළ පොදු සිසුන් ගේ සහාය එයට ලැබෙන බව පෙනිණ. ස්වාධීන ශිෂ්‍ය සංගමය මූලික කරගත් නව අ.වි.වි.ශි.බ.ම.ටද දේශපාලන වශයෙන් පැසිස්ට් විරෝධී පැරනි වමේ කොටස් වල සහාය හිමිවිය. කෙසේ වුවත් 87 වසර ඇරඹුණු විට. ශි.ක්‍රි.ක.බලය සඳහා මේ ප්‍රවනතා දෙකම යොමුවන බව පෙනින.

1987 මාර්තු අග විද්‍යාලංකාර ( කැලණි ) සරසවියේ උගත් 540 පමණ වූ සරසවි භික්ෂූන් වහන්සේලා භික්ෂු නේවාසිකාගාරයක් ඉල්ලා සටහනක් ආරම්භ කළ අතර එය සරසවි අල්ලා ගැනීමක් කරා ගමන් ගති. 1983 පේරාදෙණි උපවාසයට පසු ප්‍රථම වතාවට නැවත වතාවක් සරසවියක් ශිෂ්‍ය පාලනයට නතු විය. මේ සටන කෙළවර වූයේ උපකුලපති ඉල්ලා අස්වී කුඩා භික්ෂු නේවාසිකාගාරයක් ද ලැබීමෙනි.මේ කාලයේදීම කොළඹ සරසවියේ විද්‍යා පීඨ ශිෂ්‍ය නායකයන්ට පහර දී ස්වාධීන ශිෂ්‍ය සංගමය එහි බලය ඇල්ලීමට ගත් උත්සාහය නිසා පොලිසිය ද මැදිහත් වූ දීර්ඝ සිසු ගැටුමක් සිදුවිය. ඇත්තවශයෙන්ම එහිදී පොලිස් ප්‍රහාර ඉදිරියේ වුව ස්වාධීන ශිෂ්‍ය සංගමයේ මැර ක්‍රියාවට පොදු සිසුන් තියුණු අයුරින් පිළිතුරු දුන්හ.

කැලණි භික්ෂු සටන අතිශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. එහි පළමු වැන්න නම් අයාලේ යමින් සිටි සරසවි භික්ෂූන් වහන්සේලා එක් අරමුණක් කරා සංවිධාන ගත කෙරුමය. අන්තර් විශ්ව විද්‍යාලීය භික්ෂු බල මණ්ඩලය නම් පසුකලෙක ජාතිය වෙනුවෙන් සිය ඓතිහාසික මෙහෙවර ඉටුකළ භික්ෂු බලයේ ප්‍රථම මූලය මෙමඟින් ඉදිවිය. අනෙක් අතින් අ.වි.ව.ශි.බ.ම දෙකක් ලෙස පැවතුන ශිෂ්‍ය ව්‍යාපාරය ඒ තත්ත්වයට පත් වූයේ දේශප්‍රේමී මතවාදයන් ජයග්‍රහණය වෙමිනි. කැලණි භික්ෂු සටන මහා සටන් රැල්ලක ප්‍රථම රණගොස විය.

මෙසේ ජාතිකමය වශයෙන් ද එක් වු බලයන්ගේ ප්‍රථම නැගිටීම වූයේ අප්‍රේල් 21 පිටකොටුවේ බෝම්බ ප්‍රහාරයට එරෙහිව භික්ෂුන් වහන්සේලා හා සිසුන් විසින් මෙහෙයවු ඇදිරි නීතියද නොතකා ගිය ජනතා පෙළපාළියයි.

1987 මැයි දිනය රජය තහනම් කළේය. එහෙත් එය ජනතාව විසින් සමරනු ලැබීය. ප්‍රතිඵල වූයේ නාරාහේන්පිට අභයාරාමයේ සරසවි සිසුන් හා භික්ෂුන් වහන්සේලා ද සහභාගි වු මව්බිම සුරැකීමේ ව්‍යාපාරයේ මැයි දිනයට වෙඩි තැබීමය. විද්‍යෝදයේ ( ජ.පුර ) සරසවියේ කිත්සිරි මෙවන් රණවක ශිෂ්‍යයා හා කම්කරුවකුවු ලෙස්ලි ආනන්ද මිය ගියේ එහිදීය. මෙය ශිෂ්‍යයින් ප්‍රකෝප කරවන්නක් විය. මැයි 04 දා පානදුරයේදී සියලු රාජ්‍ය බලයන් පරදා ගිය සිසුන්ගේ දැවැන්ත අවමංගල පෙළපාළිය, රජයට එරෙහිව ලඟ එන ජනතා නැගිටීමක ලකුණු කියා පෑවේය. සරසවියවලට සෘජු පොලිස් මැදිහත් වීම් සිදුකර සිසුන් අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද අතර ජ.පුර හා කොළඹ සමහර ආචාර්යවරු හා පරිපාලකයන් අඩස්සි කොට සිසුන් නිදහස් කරගැනීමට තරම් සිසුන් චණ්ඩ වන ලකුණු පහළ විය. මැයි 18 වන විට සියලු සරසවි වැසි ගියේය.

ඉන් පසු ජුනි 21 පද්මසිරි රෝහණ දිනය සැමරීමට සිසුන් සිතා සිටියද ප්‍රමුඛ පෙලේ සිසු නායකයන් 70 දෙනෙකු පමණ ජුනි 20 දින අත්අඩංගුවට ගන්නා ලදී. යළිත් ජුලි මැද සරසවි ආරම්භ වූයේ සිසු නායකයන් රැසක් චෝදනා විරහිතව අත්අඩංගුවේ සිටියදීය.

ඒ ජුලි මාසය වෛද්‍ය සිසුනටද තීරණාත්මක එකක් විය. ප්‍රථම පෞද්ගලික වෛද්‍ය විද්‍යාල සිසු පිරිස අවසන් විභාග සඳහා පෙනී සිටින්නේ ඒ මසය. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය කොළඹ විශ්ව විද්‍යාලයෙන් වෙන් කරනු ! දක්වා වෙද සිසුන් අරගලයද වැඩී ගියේය. ප්‍රථම වතාවට වෛද්‍ය සිසුන් ද සංවිධානය වූ අතර අනෙක් සිසුන් සමග ඒකාබද්ධ ද විය. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ද පෞද්ගලික වෛද්‍ය විද්‍යාල කොළඹින් වෙන්කර ස්වාධීන ආයතනයක් කරනු ! යන සටන් පාඨය ඔස්සේ පෙරට ආ අතර තම දරුවන්ගේ නිදහස් අධ්‍යාපනය රැක ගන්නට සෞඛ්‍ය සේවකයෝ ද පෙරට ආහ. වෛද්‍ය සිසුන්ගේ සටනේ කැපී පෙනෙන ලක්ෂණය නම් සමාජයේ ඔවුනට හිමිව තිබු ගෞරවනීය ස්ථානය හේතු කොට ගෙන විශාල ජන සහායක් ඔවුනට ලැබීමය. එය ශිෂ්‍ය ව්‍යාපාරයේද නවමං හෙළිකළ අතර විශාල ලෙස මුදල් සම්පත් එකතු කරලීම , සරසවිවලම උයාපිහාගෙන ජීවත්වීම, සරසවි මූල කඳවුරු කරගෙන සටන් ගෙනයෑම, කම්කරු ශ්‍රේණින් සමඟ සක්‍රිය සබඳකම් ආදි විශාල ක්ෂේත්‍රයක් ශිෂ්‍ය ව්‍යාපාරයට එක් කළේය.මේවනවිට පෙනුණු එක් ලක්ෂණයක් නම් සිසුන් පෙරට යෑමට පෑ අතිශය නිර්භයත්වයත් වඩා ප්‍රචණ්ඩ සීමාවන් කරා ඔවුන් යොමු වීමත්ය.

ඉන්දු ලංකා ගිවිසුම් පෙරට ආවේ මෙවන් වකවානුවකය. සියල්ල අමතකකර රට පාවා දීමේ ගිවිසුම පරාජය කළ යුතු යැයි සිසුන් තීරණය කළහ. ඇත්ත වශයෙන්ම ගිවිසුමට එරෙහිව වූ ජනතා නැගිටීමේ ගිනිසිළුව වූයේ සිසුන් සහ භික්ෂුන් වහන්සේලාය. මොරටුව සරසවියේ ක්ලිපඵඩ් පෙරේරා සහ නිමල් ලියනගේ ශිෂ්‍යන් එහි දී මරා දැමුණු අතර තවත් සිසුන් 20 ගණනක් වෙඩි වැදී බරපතල තුවාල ලැබූහ. ජූනි 29 සියලු සරසවි වැසී ගියේය.

ගිවිසුම ශිෂ්‍ය ව්‍යාපාරය මෙන්ම රටේ දේශපාලනය ද අලුත් මුහුණුවරකට ගෙන ගියේය.තම බලය රැක ගැනීම සඳහා රජය ද ඉන්දියාවේ හා ඇමරිකාවේ සහායෙන් වැඩියෙන් හමුදාකරණය කරා ගමන් කළ අතර ප්‍රතිකණ්ඩායම් ද රජය සමග බලය විසඳාගැන්ම සඳහා ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ම පිළිතුරු සපයමින් සිටියහ.

සරසවි ඔක්තෝම්බර් නොවැම්බර් ආරම්භ විය. නොවැ 12 දා පළාත් සභා හඳුන්වාදුන් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යාස්ථාවට එරෙහිව ද අවිහිංසා මගින් පොදුජන විරෝධය පළකළ කොටස වූයේ ශිෂ්‍යයන්ය. මොරටුව සරසවියේ උපවාසයක් ආරම්භ වූ අතර ජ,පුර සරසවියේද උපවාසයක් ආරම්භ විය. හමුදා වටලෑම් සහ එවැනි ජනතාවාදී උද්ඝෝෂණයක් පෙරට ගෙනයාමට ආණ්ඩු විරෝධීන් අසමත්වීම නිසා උපවාසයන් නැවතින .එහෙන් පළාත් සභා විරෝධී ජනතාවට එය විශාල ආශ්වාදයක් සැපැයු බැව් නිසැකය.

මව් බිමේ හා ජාතියේ ඉරණම විසඳන ගැටලුවලට ප්‍රමුඛත්වයක් දුන් සිසුන් ඊළඟට ඔවුන් වටාම එල්ල වූ මර්ධනයට එරෙහිව සටන් වදින්නට විය. අත්අඩංගුවට ගැනීම් ඉන් ප්‍රධාන විය. මේ වනවිට ( නොවැ 12 ) පැහැරගෙන ගිය රුහුණු සරසවියේ කථිකාචාර්ය සත්‍යපාල වන්නිගම ඉල්ලා ද සිසුන් මෙන්ම ඇදුරන්ද වර්ජන කරමින් හා පෙළපාළි යමින් සිටියහ. කැලණි සරසවියට හා ජයවර්ධනපුර සරසවියට හමුදා කඩා පැනීම සිදුවූ අතර දෙසැ - 22 වනවිට නැවතත් සරසවි පද්ධතියට වැසී ගියේය.

1988 ඇරඹෙද්දීම සිසුන් එක් කරුණක් වටහා ගත්හ. එනම් මෙවර ශිෂ්‍ය සටන වඩාත් දිර්ඝ කාලීන එකක් වන බවය. ඔවුන් ක්‍රම ගණනාවක් ඔස්සේ මේ සඳහා සූදානම් වූහ. ප්‍රථමයෙන්ම ආසන මට්ටමෙන් සරසවි සිසුන් එක්රැස් කෙරුම විය. දෙවනුම දිස්ත්‍රික් මට්ටමෙන් සිසුන් එක්රැස් කරවූහ. ඉන්පසු දිස්ත්‍රික් මට්ටමෙන් සම්මන්ත්‍රණ, පත්‍රිකා, ආධාර මුදල් ආදීය ගොඩනැගින. ඊළඟට දිස්ත්‍රික් මට්ටමෙන් දෙමාපියන් සංවිධාන කිරිමද විය. එයද සාර්ථක වනවිට දෙපරිසම එක්ව ඒකාබද්ධ ක්‍රියාමාර්ග කරා ගිය අතර සමස්ථ ලංකා සරසවි සිසු දෙමාපිය සම්මේලනය පිහිටූහ.දීපව්‍යාප්තව ක්‍රියාමාර්ග ද ගනු ලැබීය . විශ්ව විද්‍යාල සිසුන්ගේ දෙමාපියන්ගේ ඉල්ලීම වූයේ

01. අත් අඩංගුවට ගත් සිසුන්ට චෝදනා ඉදිරිපත් කරනු ! නැතිනම් නිදහස් කරනු !
02. සියලු සරසවි එකවිට විවෘත කරනු !
03. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කරනු !
04. කිංස්ලි ද සිල්වා වාර්තාව ඉල්ලා අස් කරනු !
05. ශිෂ්‍ය සභා ලබා දෙනු ! සරසවි ස්වාධීනත්වය සුරකිනු !
06. නේවාසිකගාර ලබා දෙනු ! මහපොළ ශිෂ්‍යාධාර වැඩිකරනු !

විශේෂයෙන් වෛද්‍ය පීඨවල දරුවන්ගේ දෙමාපියන් දෙමාපිය සම්මේලනයේ අතිශය ක්‍රියාකාරීන් වූ අතර බොහෝ මධ්‍යම පන්තිකයන් වෙතින් ශිෂ්‍ය සටනට ආර්ථික මෙන්ම සමාජ බලයක් ද ලැබිණ.

ඊළඟ පියවර වූයේ දිස්ත්‍රික් මට්ටමෙන් පාසැල් සිසුන්, කාර්මික විද්‍යාල සිසුන් ආදිය එක්රැස් කෙරීමය. රටේ උසස් පෙළ පාඨමාලා ඇති බොහෝ පාසැල්වල ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු ගොඩනගන ලදී. අන්තර් කාර්මික විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය යටතේ මරදාන, රත්මලාන, ජර්මන් කාර්මික, රත්නපුර, කළුතර, ගාල්ල ආදී කාර්මික විද්‍යාල එක්සත් කරන ලදී. පාලි බෞද්ධ විශ්ව විද්‍යාලයන් බොහෝ පිරිවෙන් ද අන්තර් විශ්ව විද්‍යාලයීය භික්ෂු බල මණ්ඩලය යටතට ගන්නා ලදී. මෙයට අමතරව සහකාර වෛද්‍ය සිසුන් ආදී විශ්වවිද්‍යාවල පවත්වාගෙන ගිය පාඨමාලා සිසුන් ද, හෙදි විදුහල් ආදීය සංවිධානය කරන ලදී.

ඊළඟ පියවර වූයේ කම්කරු ක්ෂේත්‍රයයි. පළමුවෙන්ම සරසවිවල කම්කරුවන් සියළු දෙනා එක්සත් කර වැටුප් සටනකට සංවිධානය කරන ලදී. එය එතෙක් මෙතෙක් සරසවිවල සිසු - කම්කරු සමගියේ වර්ධනීයම අවස්ථාව විය. ඇත්ත වශයෙන්ම සරසවි මුල කඳවුරු විය. ඒවායින් ලිපිද්‍රව්‍ය, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත්, ටයිප්රයිටර්, වාහන ආදී ලෙස විශාල පහසුකම් තොගයක් උකහා ගන්නා ලදී. සරසවි සිසුන් විසින් අතාත්විකව පාලනය කරන තැනට පත්විය. කම්කරු ක්ෂේත්‍රයේ විවිධ දිශාකරා ද සෙමෙන් සෙමෙන් පියවර තබන ලදී. වරයා, දුම්රිය, බැංකු, විදුලි සංදේශ, සෞඛ්‍ය, රත්මලාන කම්කරු පුරය සිට වෛද්‍ය ඉංජිනේරු වැනි ප්‍රවීණයන්ගේ වෘත්තීය සමිති පවා ආක්‍රමණය කරන ලදී. මෙසේ ගොඩනගන ලද බලයන් පසුව පාර්ලිමේන්තුව විසුරුවීමට පවා බල පෑවේය.

අවසානයේ වූයේ ජනතාව සංවිධානය කෙරුමය. දේශප්‍රේමී ජාතික පෙරමුණක් යන සටන් පාඨය ඔස්සේ තුවක්කු නිසා දේශපාලනයෙන් පලාගිය ජනතාවද, අරාජික අනායක බහු ජනතාවද සංවිධානය කරන ලදී. රටපුරා පැවැත්වූ ප්‍රසිද්ධ සම්මන්ත්‍රණවලට දහස් ගණනින් සහභාගී විය.

chandikaranawaka.lk

මානව හිමිකම් ක්ෂේත්‍රයේද විශාල වෙනසක් ඇති විය. 88 මුල සුළුවෙන් ඇරඹි මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය මධ්‍යස්ථානය අවසානයේ රටපුරා පුරවැසි කමිටු පිහිටුවා දිවයිනේ ප්‍රමුඛතම මානව අයිතීන් රැකීමේ බලය විය. බෝඩ් ලෑලිවලට සීමාවෙමින් උතුරේ ජනයාගේ මානව අයිතීන් පමණක් කතා කළ මුදල් ගරාගත් මානව අයිතීන් සුරැකීමේ මුදලාලිගේ සියලු ඒකාධිකාරයන් වහාම බිඳ වැටිනි. වගකීමෙන් ආරක්ෂා කෙරුමේ පනත වහාම පළමු පියවර ආපසු ගැන්වූයේ මානව අයිතීන් සුරැකීමේ ශිෂ්‍ය මධ්‍යස්ථානය නිසාවෙනි.

ඉතාම වැදගත් කාරණය වූයේ රටේම භික්ෂූන් වහන්සේලා එක්සත් කෙරුමට හැකිවීමය. ශ්‍රීලංකා මහා සංඝ සම්මේලනය ජාතියේ මුර දේවතාවුන් සිය ඓතිහාසික භූමිකාව නැවත රඟ දැක්වීමට සුදානම් බවක් කියා පෑවේය.

1987 නොවැම්බර් මාසයේ දී අත්අඩංගුවට ගත් සිසුන් නිදහස් කරන ලෙස ඉල්ලා හෝ ඔවුන්ට අධිකරණය හමුවට පමුණුවන ලෙස හෝ ඉල්ලා කොළඹ සරසවියෙන් පටන් ගැණුනු විභාග වර්ජනය පේරාදෙණියටද අනෙක් සරසවිවලටද පැතර ගියේය.

මාර්තු 07 දා මොරටු සරසවි සිසුන් සරසවිය හැර ගියේය. මාර්තු 18 දා රුහුණු ද වැසී ගියේය.ශිෂ්‍ය කැරැල්ල ඇරඹුණේ තංගල්ල වසන්ත ප්‍රසන්න සිසුන් ඝාතනයටත් ධවල පත්‍රිකාව ක්‍රියාත්මක කෙරුමටත් සරසවි සිසු ඉල්ලීම අරභයාත්ය. මැයි 03 වනදා සිසුන් නිදහස් කළ බවට වංචාකර සරසවිවල සමහර පීඨවල තබන ලදී. එය වර්ජනය කරනු ලැබීය. මැයි 08 දා අ.වි.වි.ශි.බ.ම සභාපති මොරටු සරසවියේ නිමල් බාලසූරිය අභිරහස් ලෙස බෝම්බයක් පිපිරීමෙන් මිය ගියේය. එය සිසුන් ප්‍රකම්පනය කරන්නක් විය. මැයි 03 දා සිට පාසැල් උද්ඝෝෂණ ද ඇරඹිණ. එය සෙමින් වුවත් පෙරමෙන් නොව දීර්ඝකාලිනව ඇදී යන්නට විය. ජුනි 21 දා දික්වැල්ලේදී නිශාන්ත ජයවර්ධන නම් පාසැල් සිසුවා (16) පාසැල තුළම හමුදාව විසින් මරා දැමිණ. පාසැල් වැසී ගියේය. ඉන්පසු බදුල්ලේදී ප්‍රදීප් කරුණාරත්න මහනුවර දී බන්ඩාර අබේකෝන් ආදී ලෙස සිසුන් මරා දැමිනි. කොළඹ රාජකීය, ආනන්ද, නාලන්ද ආදීයෙහි සිට දිවයින පුරා විශාල පාසැල් සිසුන් පිරිසක් වීදි පෙළපළිවලට පැමිණින. ගාල්ල, බදුල්ල, මාතර, පොළොන්නරුව ප්‍රදේශවල සිට ත්‍රිකුණාමලය දක්වාත් සමහර කඳුකර ප්‍රදේශවල දෙමළ හා මුස්ලිම් පාසැල් දක්වාත් ශිෂ්‍ය නැගීටීම ගලා ගියේය. සියළු පාසැල් දින නියමයක් නැතිව වැසී ගියේය.

අ.වි.වි.ශි.ම., අ.වි.වි.හි.බ..ම., අ.කා.වි.බ.ම. හා අන්තර් පාඨශාලා ශිෂ්‍ය බ.ම. එකතුව ජුනි 14 ජාතික ශිෂ්‍ය මධ්‍යස්ථානය පිහිටවූහ. ජුලි 04 දා සම්මත ලජකා සරසවි සිසු මාපිය සම්මේලනය පිහිට විණ. ජුනි 22 නොවැ. 03 දක්වා ශ්‍රී ල.නි.ප., ම.එ.පෙ., ජ.වි.පෙ.,

එ.ලං.ජ.ප., ශ්‍රී ලං.මු.කො.ප., ස.ල.දෙ.කො. ආදී පක්ෂ කෙරුමට යත්න දරමින් තිබිණ.

ඇත්ත වශයෙන්ම සිදුවූ ශිෂ්‍ය නැගිටීම ඓතිහාසික වෙයි. එය තම උරුමය සොයා යන ජාතියක නිදහස් සටහනක් මිස අන්කිසිවක් නොවීය. සමස්ත ජනතාවගේම ආකල්ප දින කිහිපයක් තුළ වෙනස් කරන්නට ජීවිත පරිත්‍යාගයෙන් කළ ශිෂ්‍ය සටනේ අධිෂ්ඨානය සම්මත විය. නොවැම්බර් මස සිට ජ.වි.පෙ විසින් අරඹන ලද ප්‍රහාරාත්මක ක්‍රියා නිසා ශිෂ්‍ය මාවත නැවතී ඒ වෙනුවට තුවක්කු ආදේශ විය. එතැන් සිට විශාල සරසවි සිසුන් ගණනක්, පාසැල් සිසු - සිසුවියන් ගණනක් මරා දැමීම්වලට අතුරුදහන් වීම්වලට වධබන්ධනවලට ලක්වූ අතර ඝාතනය දිනපතා සාමාන්‍ය දෙයක් විය. 1989 පෙබරවාරි මස වනවිට දිනකට 53.7 ක් මරා දමන්නට තරම් වු ඝාතන ශිෂ්ටාචාරයක් බිහිව තිබිණ.

සරසවි අධ්‍යාපනය 1978 සිට වසර දෙකකින් කඩාවැටී ඇත. එහෙයින් ම පාසැල් අධ්‍යාපනයද කඩා වැටී ඇත. උසස් පෙළ විභාගය ඵල රහිත ක්‍රියාවක් වී තිබේ. සරසවි සිසුන් තෑගිගත් හදවත්වලින් යුතුව මහ මාවත් වල රස්තියාදු වෙමින් සිටිති. ජාතියේ බුද්ධිය වඳවී තිබේ. මුළු රටම අමුසොහොනක බජව් නටන තත්ත්වයකට ඇඳ දමා තිබේ. අපේ මව්බිම කොයිබටද ?

## 3. අරගලය පසුපස

### ● අධ්‍යාපනික රටාවේ හා ශිෂ්‍ය ව්‍යාපාරයේ සමාජ ස්ථරයන්

විවිධ සමාජ ස්ථරයන් ඒවාටම ආවේණික වූ අංග ලක්ෂණ තුළින් ක්‍රියාත්මක වෙමින් සමාජයේ වංචාවල භාවයට හේතුකාරක වෙයි. ශිෂ්‍ය අධ්‍යාපනික ක්‍රියාදාමයේ දී අප වෙහෙසින් ම මෙහී දී සලකා බලනුයේ ලංකා විශ්ව විද්‍යාලය ( 1912) පිහිටුවීමෙන් පසු විවිධ සමාජ ස්ථරයන් ක්‍රියාත්මක වූ ආකාරයයි.

නාගරික ලෙස වෙසෙන ඉතාම විශාල වශයෙන් සම්පත් පරිභෝජනය කරන බොහෝවිට රටේ පාලක පංතින් සැදුම්ලන ඍජු අයුරින් බටහිරීකරණය වූ (ආදී රාජකීය - සාන්ත තෝමස් සම්ප්‍රදාය) හා බටහිර සංස්කෘතින් (පාදඩ) මෙන්ම ධනපති ක්‍රමය ද රැක ගැනීම හා පවත්වා ගැනීම පිණිස කැපවී සිටින ඉහළ බමුණු කුලයේ ධනපතින් වෙතින් ශිෂ්‍ය ව්‍යාපාරයට වූ දායකත්වයක් ඇත්තේ පාලකයින් ලෙස ශිෂ්‍යයින්ට එරෙහිව එහි අනෙක් අන්තය බදා සිටීමෙන් පමණි. එහෙත් බටහිර උසස් අධ්‍යාපන පද්ධති එලෙසින් ම ලංකාවට හඳුන්වාදුන්නෝ මොවුහුය. මොවුන්ගෙන්

ඉතාම අතළොස්සක් පමණක් සමහර විටෙක 10 ගණන්වල ලංකා විශ්ව විද්‍යාලය තුළ සිටියහ. එහෙත් මේ ස්ථරයේ දරුවන් බහුතරය සෘජුව ඔක්ස් - බ්‍රිජ් සම්ප්‍රදාය එම රටවල දීම උගත් පිරිසක් වූහ. අනුකාරක බටහිර ආර්ථික - සංස්කෘතික - අධ්‍යාපනික හර පද්ධති එලෙසම හඳුන්වාදීම නිසාවෙන් ලාංකීය අධ්‍යාපන ක්‍රමය ඉමහත් කතරක අතරමං කර දැම්ම පිළිබඳව සම්පූර්ණ වගකීම එයට අර්ථික බලය සැපයූ මේ සමාජ ස්ථරය වෙත යොමු වේ.

නාගරික ලෙස වෙසෙන සමහර විටෙක ගමෙන් සංක්‍රමණය වූ මැද පන්තියේ කොටස් එනම් වෛද්‍ය, පරිපාලන, සිවිල්සේවා, ඉංජිනේරු, නීති ආදී කොටස්වලින් හා එයට පහළින් වූ ගුරු- ලිපිකරු ආදී වෘත්තිකයන්ගෙන් ද විශාල ගම්‍යතාවක් ශිෂ්‍ය ව්‍යාපාරය දෙසට හා අධ්‍යාපනය ක්‍රමය දෙසට යොමුවී පවතී. 1942 - 1970 පමණ වනතෙක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය බහුතරය සැදුම් ලද්දේ මෙවැනි ස්ථවරයකිනුය.අද ද වෛද්‍ය ඉංජිනේරු ආදී පාඨමාලාවල බහුතරය මේ පංතීන් වෙතින් සැදුම්ලා තිබේ. මොවුනට ආර්ථිකමය වශයෙන් ඉහළ ධනපති පංතිය සමග ගැටුමක් ඇති අතර බොහෝවිට සංස්කෘතිය අතින් ඔවුන් හා එතරම් වෙනසක් නැත්තේය. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වයත්, බටහිර සංස්කෘතික ලක්ෂණ උරාගැනීමත් මොවුන්ගේ ලක්ෂණය වුවද ධනපති මෙන්ම එසේ නොවන ද, බටහිර ගැති මෙන්ම එසේ නොවන ද උගතුන්, බුද්ධිමතුන්, චින්තකයන් , උපදේශකයන් ආදිය මේ ස්ථරවලින් බිහිව තිබේ. මෙහි සටන්කාමීම කොටස් 10 ගණන්වල ලංකා සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ආදිය වෙත ඇදී ගිය අතර අද ද පුළුල් ලෙස ආණ්ඩු විරෝධී දේශපාලන ප්‍රවනතා හා රටේ බුද්ධිමය සංවාද ක්ෂේත්‍රයේ පෙරමුණ ගෙන තිබේ. එයට කිසියම් අයුරකින් ඔවුන්ගේ මධ්‍යම ආර්ථික තත්ත්වයද සංස්කෘතියේ වූ මැදුම් භාවය ද විටෙක හේතුවන්නට ඇත. 56 ට පෙර රාජකීය සෙන්තෝමස් වෙත යම් පමණකින් ද ඉන් පසුව විශාල වශයෙන් ඊනියා ජාතික පාසල් වු ආනන්ද - විශාඛා- මහින්ද- ධර්මරාජ ආදී පාසැල්වලින් ද මොවුන් බිහිවූ බව පෙනේ. ආර්ථිකමය අස්ථාවර භාවය නිසා දැඩි තරඟයක යෙදෙන්නට අධ්‍යාපනය ද ආයෝජනයක් ලෙස සලකන්නට මොවුන් පුහුණුව ඇතිබව පෙනේ.එලෙසම මොවුන් අධ්‍යාපනයේ හා උසස් අධ්‍යාපනයේ යම් පමණක ඒකාධිකාරයක් දරති.එහෙයින්ම ශිෂය ව්‍යාපාරයටද ඉමහත් බලපෑමක් අද දවසේ සිදුව තිබේ.

නාගරික ලෙස වෙසෙන පීඩිත කොටස් එනම් කම්කරුවන්, මුඩුක්කුවාසීන් ලෙසත් පාතාල ලෝකයේ විවිධ කොටස් ලෙසත් වෙසෙන නගර තුළ වඩාත්ම කර්කශ වූත්, වඩාත් ම ප්‍රහාරාත්මක වූත් සමාජික හා සංස්කෘතික ලෙස කෙලසන ලද ජන කොටස තවමත් අධ්‍යාපනික රටාවට බලයක් ලෙස ප්‍රවේශ වී නැත. උසස් අධ්‍යාපනයෙහිලාද මොවුන්ගේ ප්‍රවනතායයක් වුවද පසුගිය යුගය තුළ විවෘත ආර්ථිකය විසින් මුදාහල

පාදකඩකරණයේ වියරු බලවේගයක් ලෙස මේ සමාජ ස්ථරය පත්වූ හෙයින් අධ්‍යාපනික ලෙස ඔවුන්ගේ දායකත්වය වඩාත්ම අඩුව ගොස් තිබේ.ඒ කෙසේ වෙතත් මේ බලවේග තුළ නිසඟයෙන්ම පවතින කැරලිකාරීත්වය ආදිය පසුගිය වකවානුව ( 1988 ) පුරා පැතිර ගිය ශිෂ්‍ය සටන්වලදි නාගරික පෙනී ගියේය.

ගම්බදව වෙසෙන ඉඩම් හිමියන්, වෙදුන්, ගුරුන් හා ප්‍රභූ පන්තියේ දරුවන් වෙතින් ද අධ්‍යාපනයට හා ශිෂ්‍ය ව්‍යාපාරයට විශාල බලපෑමක් සිදුව තිබේ. පස්වැන්නේ ශිෂ්‍යත්වය හා වෙනත් ක්‍රම ඔස්සේ මුල් යුගයේ මොවුන් ඉංග්‍රීසි උසස් අධ්‍යාපනය වෙතට නගරය වෙතට සංක්‍රමණය වුවද වේගයෙන් නාගරික ප්‍රවාහයට අසු වූයෙන් සිය ගැමි අධ්‍යාත්මයේ මුල් සිඳ ගත්හ.

එහෙත් සෘජුව ම මධ්‍ය මහා විද්‍යාල වෙතින් අධ්‍යාපනයට උසස් අධ්‍යාපනයට මං පෙත් ඇතිවූ විට ශිෂ්‍ය ව්‍යාපාරය දෙසට විශාල දේශපාලන බලයක් යොමු කළ පිරිසක් වූහ. මේ සමාජ ස්ථරය ආර්ථිකමය ලෙස පාලක පංතින්ගෙන්ද, නාගරීකරනය වීමට යෑම ආදිය නිසා සංස්කෘතික වශයෙන්ද පීඩාවට පත්වූ කොටසකි. එසේ හෙයින් නව ආර්ථික හා සංස්කෘතික නිම්නයන් සොයා යෑමේ බුද්ධිමය වුවමනාවක් මේ සමාජ පංතිය වෙතින් දෝංකාර වෙයි. ජාතිකමය චින්තනයක් බුද්ධියෙන් මෙන්ම ඉවෙන් ද වටහාගත හැකි පිරිසක් මොවුන් අතරින්ද බිහිවේ. 1956 න් පසු ඉතා විශාල වශයෙන් තම ආර්ථික - සංස්කෘතික පදනම් රැක ගැනීම සඳහා අනවරත අරගලයක යෙදීමට සිදුවීම මඟින් බොහෝසෙයින් ගැමි නිර්ධනීන වෙතට හෝ නාගරික මැද පන්තිය වෙතට හෝ ධ්‍රැවීකරණය වෙමින් පවතී.

ග්‍රාමීය වශයෙන් ඉතාම පහත් මුහුණුවරක පසුවන දුගී ගැමි ගොවි කොටස්වල දරුවන්ට අධ්‍යාපනයේ මංපෙත්වලින් බොහොමයක් ඇහිරිගොස් ඇති අතර තමා වටා වෙසෙන සෑම බලයක් වෙතින්ම සියවස් ගණනක සිට ආර්ථික - සමාජමය - සංස්කෘතික ලෙස පීඩාවට පත්ව සිටී. එහෙත් නිදහස් අධ්‍යාපන සංකල්පය 1947 සහ 1956 පෙරළිය හරහා මේ සමාජ ස්ථරයේ යම් කොටසක් අධ්‍යාපන එක්වූ අතර ප්‍රමාණයෙන් කුඩා වු හ් කොටස් තමන් නිරූපණය කරන අතිවිශාල සමාජ ස්ථරයේ ඛේදවාචකය වහා වටහා ගත් හෙයින් ශිෂ්‍ය ව්‍යාපාරය වෙතට මෙන් මේ කොටස් පරිසරය සමඟ සාමුහික ජන ජිවිතවලට හුරු වූ කොටසක් බැවින් වඩාත් ජාතික හැඟිම් වලින් යුක්තය. ආර්ථිකමය අතින් පීඩාකාරී නිසා වඩාත් ප්‍රචණ්ඩය. ඒ වගේම වඩාත් අවංකය. තම ඉරණම වටහා ගන්නා තෙක් මේ ජනකොටස් තම ආර්ථික - සංස්කෘතික හා දේශපාලනික ස්වාමීන්ට ඉතා කීකරුව සේවය කරති. එහෙත් ඔවුනට බුද්ධිය ගෙන එන්නේ පිටතින්ය. වෙහෙසින්ම අධ්‍යාපන ක්ෂේත්‍රයෙනි. දැන්

ඔවුන් අවදිවී තිබේ. අන් කවර බලයකටත් වඩා දැඩි ලෙසත්, ජාතිකමය ලෙසත්, හැඟිම්බර ලෙසත්, කැපවීමෙන් මොවුන් පෙරට ඇදීයති. උතුරේ විමුක්ති කොටි සංවිධානයටත්, දකුණේ ජ.වි.පෙ.වෙනත් ගාමක බලය සැපයුවේ මොවුන් වන අතර 1953 හර්තාලයේදීත් ඉන්වසර 18 කට පසු 1971 දීත් ඉන්වසර දහඅටකට පසු 1989 දීත් ලෙස මොවුන් නැගී සිටි බව පෙනේ. ඔවුන්ගේ ස්වාභාවයෙන්ම පවතින අන්තවාදය හා ප්‍රචණ්ඩත්වය නිසා මොවුන් බොහෝ විට විනාශව ගිය බවක්ද පෙනේ. ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වඩාත්ම කැරලිකාරී හා සිමාන්තික උද්වේගයෙන් තිබේ.

## ● ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වූ සංඝට්ඨනයන්

1940 ගණන්වල දේශීය පාලක පංතියේ දරුවන් යම් ප්‍රමාණයක් අධ්‍යාපනය කරා ඇදී ආ අතර එය බොහෝ විට එංගලන්තයේ ලැබූ අධ්‍යාපනයේ ආධිපත්‍යයට අභියෝගයක් එල්ල කළ අතර එය වාමාංශික හා දක්ෂිණාංශික බලයන් දෙකක් අතර සටනක් විය. ඇන්. ඇම්. කොල්වින් වැනි වමේ නායකයින් හා ඩී.ඇස්. කොතලාවල වැන්නවුන් අතර දේශපාලන සංඝට්ඨනය තුළින් එය නිරූපණය විය. ඒ අනුව එවකට පැවැති කොළඹ - පේරාදෙණිය වැනි විශ්ව විද්‍යාලවල වූ ශිෂ්‍ය බලයන් ද ඒ අනුවම බෙදී ගියේය. අනෙක් අතින් අධ්‍යාපනික - සංස්කෘතික ක්ෂේත්‍රයේ ද වන මතවාදයන් පෙරට ඒමක් විය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පේරාදෙණි ගුරුකුලය එවැනි එක් මූලික බුද්ධිමය සංවාදශීලී කුලකයක් විය. එහෙත් ගැමි බලවේග ද ජාතික හැඟිම් උකගා ගනිමින් ප්‍රවාහනයක් ලෙස පෙරට ආ අතර 60 දශකය වනවිට වමේ දකුණේ සියලු බලවේග වලට ආර්ථික - සංස්කෘතික ලෙස සෑම ක්ෂේත්‍රයකම ප්‍රහාර එල්ල කරන්නට විය. බණ්ඩාරනායක වැනි දක්ෂිණාංශික ලිබරල් මතධාරීන්ටද පිලිප් වැනි වමාංශික මාක්ස්වාදීන්ට ද මේ රැල්ලට අනුගත වන්නට සිදුවිය. බුද්ධිමය සංවාද ක්ෂේත්‍රයේද සරච්චන්ද්‍රගේ බටහිර දෘෂ්ඨියට එරෙහිව වික්‍රමසිංහගේ දේශීය දෘෂ්ඨිය ද දේශපාලනයට සමාන්තරව සාහිත්‍ය හා සංස්කෘතික ක්ෂේත්‍රයේ පෙරට ආවේය. 56 විසින් ඇති කරන ලද රැල්ල තුළින් අධ්‍යාපන ක්‍රමය ලැබූ ජීවය නිසා ගැමි දරුවන් පිබිද ආ අයුරු අපි ඉහත කිහිපපොළකට සඳහන් කළෙමු. ගැමි දරුවන්ගේ මේ නව බලයන් ශිෂ්‍ය ව්‍යාපාරය වෙත වෙසෙසින්ම පදනම් වීම නිසා ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වෙනත් විවිධ (ඉහත සඳහන් කරන ලද) සමාජ බලයන් හා ප්‍රතිවිරෝධතා ඇති කරගත්හ.මේ තත්ත්වය බොහෝ ශිෂ්‍යයින්ගෙන් සමන්විත 1971 තරුණ කැරැල්ල බිහිකළේය. එකී කැරැල්ල නිරූපණය කරනු ලැබුයේ නැගී සිටීමට වෙරදරන ගැමි දරුවන්ගේ ආර්ථික- සංස්කෘතික-අධ්‍යාපනික ද්වේෂයයි. 71 කැරැල්ල විසින් එවකට පැවැති

සමගි පෙරමුණ රජය වඩාත් වේගවත් ගමනක් කරා පොළොඹවනු ලැබීය.

70-77 වකවානුවේ දී ශිෂ්‍ය ව්‍යාපාරය තුළ ගාමක බලය ලෙස හිසඑසවූයේ සම්ප්‍රදායික වමේ පක්ෂවලට අයත් වූ නාගරික හා ගම්බද මැද පන්තියේ දරුවන්ය. කැරැල්ල නිසා සමහර විටෙක විශාල පසු බැස්මක් ගැමි දරුවන්ට සිදුවිය. අනෙක් අතින් කැරැල්ල නිසා ඔවුන් කෙරේ පාලක පන්තීන් තුළ වූ බිය නිසාද ඔවුන් බලයේ ඈත පරිධියේ ලක්ෂ්‍ය වෙතට තල්ලු කරනු ලැබීය. එහෙත් ගැමි ජීවය ප්‍රමාණයක් ලෙස තවමත් ඉතිරිව තිබින. නැතිනම් දිස්ත්‍රික් කෝටා ක්‍රම ආදිය නිසා වඩාත් විශාල වී තිබින. එසේ හෙයින් අනිවාර්යයෙන් ඇතිවිය යුතු ඝර්ෂණය එනම් ගැමි දරුවන් හා නාගරික ගම්බද මැද පන්තිය අතර සියලු ක්ෂේත්‍රවල ප්‍රතිවරෝධය දැල්වෙමින් තිබිණ. 71 පිපිරීම නිසා වසර 6 ක් නිහඬව වුන් ශිෂ්‍ය  ව්‍යාපාරය නැවත පිපිරී ගියේ 76 වීරසූරිය ඝාතනයත් සමඟය. එහෙත් එකී බලයන් සියල්ලේ වාසිය ඒ වන විටත් තම මුහුනුවර වෙනස් කරගෙන සිටි යූ. එන්. පි.ය විසින් හිමිකරගන්නා ලදී.

1977 න් පසු ඇතිවූ සමාජ ආර්ථික චණ්ඩ මාරුතයට ශිෂ්‍ය ව්‍යාපාරය ද හසුවිය. රටපුරා පැවැති ප්‍රගතිශීලී කොටස් වෙතට පළමුව අනුගත වීමද වෙනුව විනාශයද ලෙස මර්දනය ඉදිරිපත් විය.මෙහිදී ඇතිවූ විශාල ම වෙනසක් වූයේ ශිෂ්‍ය ව්‍යාපාරය තුළට යූ.එන්.පී.දේශපාලනය බලයක් ලෙස ඉදිරිපත් වීමය. එය එක්සත් සමාජවාදී ශිෂ්‍ය පෙරමුණ විය. යූ.එන්.පී.යේ වර්ධන යුගය. (77-81) කාලය තුළ සරසවිවලද සමවාදීන් වර්ධනය වූහ. සමවාදීන්ගේ විශාල ප්‍රමාණයක් සැදුම් ගත්තේ දුගී ගැමි දරුවන් වෙතින් ම වීම සැලකිය යුත්තකි. මෙය ගැමි දරුවන් වෙත පෙන්වන එක් ගුණයක් වූ අන්තවාදයට නිදසුනක් ය. ඔවුන් එරෙහි වීමේ දී ප්‍රතිධ්‍රැවය නියෝජනය කරනා ප්‍රමාණයටම අනුගත වීමේ දී ප්‍රතිගාමීත්වයේ ධ්‍රැවය නියෝජනය කරයි. මෙය ගම් කරාද ව්‍යාප්ත වූ කොම්ප්‍රදෝරු ධනපති පංතියේ සිට " පොදුජන " යුගය තෙක් යූ.එන්.පී. යේ ගමන්මගද සිහිකරයි. මේ කෙසේ වෙතත් අදහාගත නොහැකි තරම් ශීඝ්‍රයෙන් ප්‍රගතිශීලී දේශපාලනය අතුගෑවෙන තත්ත්වය තුළ ගැමි ගොවි දරුවන්ගේ ප්‍රගතිශීලී මුහුණුවර හා නාගරික මැද පන්තියේ බුද්ධිමය සටන්කාමීත්වය අතර එකඟත්වයක් ඇති විය. වඩාත් නිවැරදි කියතොත් නාගරික මැද පන්තියේ " විද්‍යාත්මක " මතවාදයන් වෙතට ගැමි ප්‍රගතිශීලීන් ඌකහාගන්නා ලද්දේය. 1982 - ධවල පත්‍රිකා සටන, 1984 - පද්මසිරි - රෝහන සටහන, 1985 - නව සංශෝධන පනතට එරෙහිව සටන ඔවුන් එක්ව කළ අවසන් සටන් විය. ක්‍රමයෙන් ජාතික දේශපාලන කරලිය තුළ ජනවාර්ගික ගැටලුව තම ඓතිහාසික භූමිකාව රඟදක්වන්නට වූ විට සියලු බලවේගවලට තම තමාගේ සමාජ ස්ථරවලට වැද, තම සංස්කෘතික රාමුන් වෙතින් ගැටලුව විග්‍රහ කරන්නට සිදුවිය. නාගරික මැදපංතියේ ආධිපත්‍යය ඉසුලු පැරැණි වමේ කොටස්

ද වෙනත් එයට සමාන්තර බලවේගයන්ද නව සංස්කෘතක රැල්ලේ ජනප්‍රිය මාක්ස්වාදීන් ද (ස්වාධීන ශිෂ්‍ය සංගමය ප්‍රධානය) " ජාතීන්ගේ ස්වයං නිර්ණය පිළිබඳ අයිතිය" පිළිබඳ වූ ලෙනින් ගේ මතය දෙමළ ජනතාවට ගැලපෙන බව ප්‍රකාශ කරමින් වෙනම දෙමළ ඊලාම් රාජ්‍යයකට පක්ෂ වූහ. මේ අතර තම සංස්කෘතික පදනම් ඉවෙන් හා බුද්ධියෙන් වටහාගත් කොටස් විශේෂයෙන් ගැමි ප්‍රගතිශීලී කොටස් ඊළාම්වාදයට එරෙහිව නැගී සිටියහ. කලකට පෙර (83 ට පෙර) නාගරික මැද පංතියේ සූත්‍ර පාඨවලට අනුගතව සිටි සමාජවාදී ශිෂ්‍ය සංගමය ද සිය මතවාදයන් වෙනස්කර ගනිමින් සිය විභවය වූ ගැමි දරුවන්ගේ මතවාදය වහා දල්වාලූහ. මේ වනවිට 'සමවාදීන්' දෙපිරිසම එක්ව පරාජය කර තිබුන හෙයින් මෙලෙස මෙකී බලවේගයන් අතර තිබූ තාවකාලික එකඟත්වය බිඳී ගියේය. එය පැසිස්ට්වාදීන් හා ජාත්‍යාන්තරවාදීන් අතර සංඝට්ඨනයක් ලෙස එක් පිරිසක් ප්‍රකාශ කළ අතර එය දේශප්‍රේමීන් හා දේශද්‍රෝහීන් අතර සටනක් ලෙස අනෙක් පිරිස ප්‍රකාශ කර සිටියහ. කෙසේ වෙතත් සකලවිධ යූ.එන්.පී.යේ ආර්ථික සංස්කෘතික මර්දනයට ජාතික හැඟීම් තුළ ප්‍රතිබලයක් ගොඩනැගුනු අතර එවකට රටේ සිදුවෙමින් පැවැති ජාතිකමය හැඟීම් පෙළ ගැස්මට සමාන්තරව යෑම නිසා ජාතික මතවාද දැරූවන්ගේ ජයග්‍රහණයට හේතුකාරක විය. මෙලෙස නාගරික මැද පන්තියේ මතවාදයන් පරාජය වී ගැමි දරුවන්ගේ ජාතිකමය මතවාදයන් පෙරට ආවේය. එය ඉතා විශාල කම්පන තරඟයක් ලෙස රටේ දේශපාලන බලයට ද ප්‍රහාර එල්ල කළ අතර නව ආකල්ප පෙරළියක් ජනතාව තුළ ඇති කළේය.

## ● ශිෂ්‍ය ව්‍යාපාරයේ ස්වභාවය හා ප්‍රවනතා

ශිෂය ව්‍යාපාරය වූ කලී සුළු ධනේශ්වර ක්‍රියාවලියක් යැයි මාක්ස් - ලෙනින් ට්‍රොට්ස්කි ආදීන් විසින් විග්‍රහ කරති. ඒ කෙසේවෙතත් එදා පිරිවෙතින් ඇරඹුණු ශිෂ්‍ය ව්‍යාපාරය එදා සිට අද දක්වා සියළුම වර්ගවල ආක්‍රමණිකයන්ගෙන් මව්බිමෙත්, සියලුම ආකාරවල දේශිය ප්‍රතිගාමීත්වයෙන්ගෙන් ජනතාවත් ගලවා ගැනීම සඳහා ඉතා තීරණාත්මක කාර්යභාරයන් ඉටුකළ බවත් විශේෂයෙන් ගරා වැටෙද්දී, මර්දනය කරද්දී ඒ සියලු සීමාවන් පියමන් කරමින් නොවැටී පෙරට ආ බවත් සත්‍යකි. මෙවන් ගමනක යෙදෙන්නට ශිෂ්‍ය ව්‍යාපාරයට ගම්‍යත්වයක් ලැබුණේ කුමන අයුරකින්ද?.

ඕනෑ ම ව්‍යාපාරයක් - බලවේගයක් එහි දේශපාලනික බලයේ තරම හා වටිනාකම නිර්ණය කරනුයේ එය දේශපාලනික බලයේ තරම හා වටිනාකම නිර්ණය කරනුයේ රය වටා පවත්නා සමාජ - ආර්ථික බලවේගයන්ට අනුවය. ඒ අනුව පොදුවේ ශිෂ්‍ය ව්‍යාපාරය සැදුම් ලන්නේ ඉහළ බමණු කුලයේ පාලක පන්තීන් වෙතින් නිරන්තරයෙන් බැටකන ඔවුන් විසින් නොසලකා හරින ලද බලවේගයක් ද ලෙසය. තවද එයට

ගැමි ගොවි දරුවන්ගේ දෘඪතර කැපවීමේ හා සටන් කාමීත්වයේ ගම්‍යතාවය ද කැවී ඇති හෙයින් වේගයෙන් පෙරට ඇදීයන සිවරූපයක් උසුලයි.

මේ සමස්ත තත්ත්වය අමතරව ශිෂ්‍ය ව්‍යාපාරය සහමුලින්ම තරුණයන්ගේ සමන්විත වීමද, එහි නායකත්වය නිරන්තරයෙන් නැවුම් වීමටද, එය යම් පමණකට එනම් ඉරණමකට ගොදුරු වූවන් රැසකගෙන් සැදුම්ලන නිසාවෙන් ද පොදු සහෝදරත්වයේ සාමූහික බලයකට හා සංවිධාන ශක්තියකට  ද හිමිකම් කියයි. තරුණ විය වූ කලී තමා අවට පරිසරය උකහා ගැනීමට වඩාත්ම වැඩියෙන් මිනිසා සටන් කරන යුගය යි. ඕනෑම සමාජ වෙනසකට තරුණ ජීවය වූ කලී අවශ්‍යම සාධකයයි. ස්වශක්තියෙන් හා ජීව ක්‍රියාදාමයෙන්ද වඩාත්ම ක්‍රියාත්මක හා නිරෝගි අවස්ථාව තුරුණු වියයි. එසේම දෙමාපියන් වෙතින් යම් පමණකට යැපෙන හෙයින් වඩාත් ආර්ථික නිවහල් බවක් ඔහු සතු වෙයි. බොහෝ විට වසරින් වසර එක් කොටසක් ඉවත් වී වඩාත් නැවුම් කොටස් පෙරට එන බැවින් නව්‍යතාවයකින් ද යුතුවෙයි. එළෙසම එකම පොදු ඉරණමකට ලක්ව ඇති හෙයින් සරසවියේ කුටුකම්බි වැට තුළ ද යම් පමණක එකඟත්වයක් ඇති සමවයසේ පිරිසක් හමුවේ. එලෙසම විශේෂයෙන් සරසවිය තුළ කුමන නීති තිබුණද සංවිධානය වීමේ හැකියාව ලැබේ. සංවිධානය නිසාවෙන් පුද්ගල බිය තුරන් වී ඒ වෙනුවට සංවිධානයේ සමාජ බලය පෙරට එයි. එහෙත් පුද්ගල බලය නිසි අයුරින් ගොඩනැංවුණු කොටස් සංවිධාන ව්‍යුහයෙන් පිටතට ගිය විගස අලුත් තත්ත්වය තුළ කැළඹෙන්නේ  මෙහෙයිනි. සරසවියෙන් ඉවත්වන ශිෂ්‍යයා සමාජයට පිවිසෙද්දී තනි ඔහුට තම පවුලේ යුතුකම් ද තමා ඉදිරියේ ආත්මාර්ථය ගුරුකොටගත් සමාජ ප්‍රවාහය ද පෙනේ. තමා පෙර සිටි සංවිධානාත්මක දැල දූන් ඔහුට නැත. ඉදින් යම් හෙයිකින් ඔහුට රැකියාවක් ද ලැබුණහොත් ඔහු දූන් ජනතාවට තරමක් ඉහලින්ය. ලිංගික අවශ්‍යතා, ප්‍රේමය, අනාගත බිය ආදී දේද ඔහු වටා හොල්මන් කරයි. මේ සියල්ල ඔහු පොදු සමාජ ප්‍රවාහයට එක්කරයි. එයට එරෙහිව උඩුගං බලා යෑමේ ශක්තිය ඇත්තේ  තමන්ටත් දැඩි ලෙස සංවිධානය වූ  තම ආත්මය තියුණු අයුරින් බිඳ දැමිය හැකි වුවත්, ඒ වෙනුවට දයාර්ද සමාජ සම්බන්ධතා වැළඳගත හැකි වූත් එක් අතකින් දය බරිත අතළොස්සකට පමණි.

ශිෂ්‍ය ව්‍යාපාරයේ විශේෂයෙන් ම සරසවිය තුළ ඇතිවූ ශිෂ්‍ය සටන්වල දී කැපීපෙණුනු ලක්ෂණය නම් ඒවායේ කෙටිකාලීන ස්වභාවයයි. කාලය කෙටි වුවද අසීමිත කැපවීම මත ඇති කරන බලය නිසා ආවේගය අතිමහත්වෙයි. ඉන්පසු ජයෙන් හෝ බොහෝවිට පරාජයෙන් හෝ පසු නිහඬව සිටීමේ කාලය උදාවේ. ඒ අතරතුර බුද්ධිමය සංවාද, සංවිධාන-

යන් අලුත්වීම අලුත් නායකයන් බිහිවීම ආදිය බිහිවීම ආදිය සියල්ල සිදුවේ. එහෙත් පොදු ප්‍රවාහය නතර වී නොමැත. එහෙයින් නැවත අරගල මතුවේ. ලේ වැගිරීම්, ජීවිතහානි, අසීමිත කැපවීම්වලින් පසු නැවත සාමය උදාවේ. එහෙත් රටේ පොදු දේශපාලනය අර්බුදය උත්සන්න වීම වැඩිදියුණු වන තරමට ද එය ශිෂ්‍ය සටන් සමග සම්පාත වන තරමටම 'තාවකාලික සාමයේ යුගය' කෙටිවීම ද, සටන් කාලය දික්ගැස්සීමද සිදුවේ. 1987-88-89 පුරා පැතිර පවතින්නේ ජාතික වශයෙනක් වූ මහා වෙනසකට රට දක්වන උනන්දුව හා ශිෂ්‍ය සටන් සම්පාතවීම නිසා ඇතිවූ සටනකි.

පසුගිය කාලය පුරා ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වූ එක් පැහැදිලි වෙනසක් වූයේ සරසවි තලයේ සටන් මධ්‍යස්ථානය කලා පීඨයේ සිට විද්‍යා පීඨ දෙසට මාරුවීමය. පාසැල් වියේදී ම දැඩි තරඟ කාරීත්වයක් ඇති ආක්‍රමණකාරී සිසුන් විද්‍යා අංශ කරා යොමු වීම එක් හේතුවක් විය හැකිය. අනෙක් අතින් දැඩි තරඟයක් තුලින් ම සරසවි පැමිණ රැකියා අහිමිවන විට වඩා ප්‍රචණ්ඩ අයුරින් ප්‍රතික්‍රියා දක්වන්නට ද ඔවුන් පෙළඹීම සැලකිය යුත්තකි. කෙසේ වෙතත් 77 - 82 කාලයේ සමාජවාදී ශිෂ්‍ය පෙරමුණ ජනප්‍රිය වූයේ කළා පීඨයේ වීමද සැලකිය යුත්තකි. විද්‍යාපීඨවල ඇතිවූ මධ්‍යම ගුණය ඔවුන් විසින් වඩාත් සටන්කාමී කළේ ද?.

**● ජනවාර්ගික යුද්ධය හා අධ්‍යාපනය......**

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික යුද්ධයට දේශිය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ද හේතුකාරක රැසක් වෙයි. විදේශිය වශයෙන් ඉන්දියාවේ කලාපීය පැවැත්ම සඳහා වූ ආර්ථික, දේශපාලන යුදමය ආධිපතිභාවය ද, තමිල්නාඩු දේශපාලනය ද, තමිල්නාඩුව ඉන්දියාවෙන් වෙන්වීමට තැත්කෙරුමට එරෙහිව ශ්‍රී ලංකාව පදනමක් කරගැනීමට ද මේ සියලු පදනම්වල සිට ශ්‍රී ලංකාවේ ඉන්දීය විරෝධය පිළිවෙත් අවප්‍රමාණය කෙරුමටද තම වෙළඳ පොළ ඇමරිකාව, ජපානය ආදී තරඟකරුවන් වෙතින් රැකගැනීමට හා පුළුල් කෙරුමට ද ඉන්දියාවට අවශ්‍ය වේ. ඉන්දියවේ ස්වාධීන ධනපති ක්‍රමයේ වැඩිමද, එහි විදේශ ප්‍රතිපත්තිය සොවියට බර වීමද දූනටමත් ලිබරල් සමාජවාදී රටවල සිට තුන්වන තුන්වන ලෝකය දක්වා රටවල නව නායකයෙක් ලෙස ඉන්දියවේ නැගී ඊටියද නුරුස්සන ඇමරිකාව පකිස්තාන, බංගලාදේශය හා ශ්‍රී ලංකාවේ රූකඩ පාලනයන් ඉන්දියාවට එරෙහිව යොදවන අතර ම ඉන්දියාවට බලයෙන් ආඳාගත් රාජ්‍යයන් වෙන්කරලීමට කුමන්ත්‍රණය කරයි. මෙසේ වූ මහ බලවතුන්ගේ පොරය නිසාවෙන් ලංකාවේ බෙදුම්වාදී අරගලය ලේ වගුරුවන යුද්ධයක් බවට පෙරළි ගියේය.

දෙමළ ජනයාගේ ගරිල්ලා සංවිධාන දෙස බැලීමේදී එවායින් බොහෝමයක් තරුණ තරුණියන් ආර්ථික - සංස්කෘතික හා කුල ක්‍රමය නිසාවෙන් පීඩාවට පත්වූ ගැමි ගොවි ධීවර ජනයා බව

පෙනී යයි. 1910-50 ගණන්වල පොන්නම්බලම්ගේ ද්‍රවිඩ කොංග්‍රසයටයත්, 1960 ගණන්වල චෙල්වනායගම් ගේ පෙඩරල් පක්ෂයටත් 70 ගණන්වල අමිර්තලිංගම්ගේ ද්‍රවිඩ එක්සත් පෙරමුණටත් අහිංසකයන්ව සහ අවංකව වන්දිය පාවිච්චි කළ මොවුන් පසුව සිංහල වැසියන්වත්, ලංකා හමුදාවන්ටත්, ඉන්දීය හමුදාවන්ටත්, පහරදෙන තරම් සාහසික බලයක් වූයේ කෙසේද? නිසැකයෙන්ම ඔවුන් නිද්‍රාවට පත්ව සිටි පීඩිත ගැමි ගොවි බලයක් විය. ඔවුන් අවධි කරණු ලැබුයේ නගරයෙන් අධ්‍යාපනය ලැබූ දෙමළ ශිෂ්‍යයන් විසිනි. එසේනම් ගරිල්ලා යුද්ධයේ සේවා නූල දල්වා ඇත්තේ ද දෙමළ ශිෂ්‍ය ව්‍යාපාරය විසිනි.

ස්වාභාවයෙන්ම වැඩිම ජාතික හැඟීම් ඇත්තේ ගැමි ගොවි - ධීවර ආදී කොටස් වෙතටය. දේශීය වශයෙන් දෙමළ - සිංහල බමුණුකුල අතර බල අරගලය පතිත වෙද්දී තම තමන්ගේ බල කඳවුරු ශක්තිමත් කර ගැනීම සඳහා මේ පහළ ගැමි ගොවි - ධීවර ජනයාගේ ජාතික හැඟීම් වලින් ස්වාමියන් ලෙස වැඩ ගැන්මට ඔවුන් පෙළඹ වීම ස්වාභාවිකයි.

යාපනය, වන්නිය ආදී ප්‍රදේශ ස්වාභාවයෙන් ම කටුක දේශපාලනික තත්ත්වයක් ගනී. එහි ගොවිතැන සඳහා වැඩි මුදලක් ආයෝජනය කළයුතු වෙයි. එහෙයින් අධිරාජ්‍යවාදීහු යාපනය ජනායා යොමු කළේ දුම්කොල වගාව වෙත පමණි. අනෙක් අතින් යාපනය ඔවුන් දුටුවේ රැකියා ලබාදීමේ මධ්‍යස්ථානයක් ලෙසය. පහත රට සිංහල පෙදෙස් වතු ආර්ථිකය, මිනිරන් වෙළඳාම කරා යොමු වෙද්දී දෙමළ ජනයා වැඩි වඩියෙන් උසස් අධ්‍යාපනය වෙතට හා ඒ තුළින් ඇතිවූ රැකියා කරා යොමු වූහ. අධිරාජ්‍යවාදී යුගයේ දී (පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රීසි යුග තුනේම) යාපනයේ මිෂනාරි හා බටහිර අධ්‍යාපනය ඉතාම දියුණු තත්ත්වයකට පත්විය. අදද ඉතාම දියුණු බටහිර වර්ගයේ පාසැල් පවතින්නේ යාපනයේය. මෙලෙස යාපනයේ පාසැල් අධිරාජ්‍ය යුග තුනේදීම කරදරයකින් තොරව වැඩුණේ යාපනය යටත් නොවූ දේශය රාජ්‍ය වූ කන්ද උඩරටින් බොහෝ ඈත පිහිටීම නිසාවෙනි. මෙයට අමතරව ඉනිදීය නිදහස් සටනේ ආභාෂය ලබමින් ස්වාමි විවේකානන්ද වැන්නවුන් සරණ යමින් ආරුමුග නාවලර් වින්නවුන් විසින් කතෝගික - ක්‍රිස්තියානි ආක්‍රමණයන්ට එරෙහිව හින්දු සංස්කෘතිය නගා සිටුවීම සඳහා යාපනයේ උසස් හින්දු විද්‍යාලයන් තැනීම නිසාද දෙමළ ජාතිකත්වය වැඩී ආයේය.

1898 දී බටහිර පළාතේ සිසුන් 1510 කට වූයේ එක් පාසලකි. දකුණු පළාතේ එය 2400 ක් තරම් ඉහළ වනවිට යාපනයේ එය 980ක් වැනි අඩු සංඛ්‍යාවක් විය.

මෙලෙසම 1911 දී යාපනයේ ඉංග්‍රීසි බස දත් බව 4.5% ක් වන විට පහත රට සිංහල සඳහා එය 3.5% ක්ද, උඩරට සිංහල සඳහා 4.3% ක්ද තරම් අඩු සංඛ්‍යාවක් විය.

මෙයින් පෙනී යන්නේ යාපනයේ ජනතාව ලැබූ අධ්‍යාපනික සමෘද්ධියය. එය තුළින් දෙමළ නාගරික මැද පන්තිය තම ජනවාර්ගික ප්‍රතිශතයට වඩා වැඩි වශයෙන් රජයේ ඉහළ රැකියාවන් කරා ගමන් ගත්හ.

වෛද්‍ය සේවා

| වසර | ගණන | සිංහල | දෙමළ | බර්ගර් |
|---|---|---|---|---|
| 1870 | 23 | 2(8.7%) | - | 21(91.3%) |
| 1907 | 61 | 15(24.6%) | 9(11.7%) | 37(60.7%) |
| 1925 | 188 | 80(12.8%) | 58(30.8%) | 50(26.7%) |
| 1935 | 283 | 156 (55.1%) | 73(25.8%) | 57(19.1%) |
| 1946 | 345 | 205(59.1%) | 115(33.3%) | 25(7.3%) |

| සිවිල් | සේවය | සිංහල | දෙමළ | බර්ගර් |
|---|---|---|---|---|
| 1870 | 7 | 7 | - | - |
| 1907 | 12 | 4(33.3%) | 2(16.7%) | 6(50%) |
| 1925 | 33 | 13(40%) | 11(33.3%) | 9(27.3%) |
| 1916 | 116 | 69(59.5%) | 31(26.7%) | 16(13.8%) |

අධිකරණ සේවා(ශ්‍රේෂ්ඨාධිකරණ - දිස්ත්‍රික් උපාධි ඇතුළු)

| | | | | |
|---|---|---|---|---|
| 1935 | 30 | 8(26.7%) | 10(33.3%) | 12(40%) |
| 1916 | 53 | 26(49.4%) | 14(26.4%) | 14(26.5%) |

මෙලෙස පරිපාලනය ක්ෂේත්‍රයේ දෙමළ මැද පන්තිය දැරූ තත්ත්වය ඔවුන් ගේ ජනවාර්ගික ප්‍රතිශතය ඉක්මවන ලද බව පෙනේ. මෙය අධිරාජ්‍යවාදීන් ඉතා දැනුවත්ව සිදුකළ දෙයකි. එය දෙමළ ජනයාට වරප්‍රසාද දෙන්නේ යැයි සිංහල ජනයා වෙත හැඟීම් ඇතිකරවන්නට විය.

1956 පෙරළියෙන් ඉංග්‍රීසි බලය දුර්වල වූ බව අපි දැක්කෙමු. එහෙත් සිංහල රජ බස වුවද දෙමළ බසට ඒ තැන නොලැබ යාමෙන් ඉංග්‍රීසි නොදත් ගැමි ගොවි ධීවර දෙමල ජනයා උසස් අධ්‍යාපනය මංපෙත් හි අතරමං කරවනු ලැබීය. 56 සිංහල ක්‍රියාදාමය ඉංග්‍රීසි පරාජය කරන විට දෙමළ මැද පන්තිය ද තම ආධිපත්‍ය ඇදවැටෙනු දුටුවේ ජනවාර්ගික ලෙස ධ්‍රැවීකරණය වූහ.

(1956 සිට 1970 දක්වා පරිපාලනය සේවයේ ද්‍රවිඩ සහභාගීත්වය 30% සිට 5% දක්වාත් ලිපිකරුවන්ගේ එය 50% සිට 5% දක්වාත් පහත වැටී තිබිණි.)

ස්වභාෂාවෙන් විද්‍යා විෂය හැදෑරීම ආරම්භ වූයේ 1968 දී වූ විට ඊට පෙර සිටම විද්‍යා පීඨවල දෙමළ බහුතරයේ ආධිපත්‍ය විය. විද්‍යා

chamindanawaka.lk

අධ්‍යාපනය ආර්ථිකයේ ප්‍රධාන දහරාව වෙත්ම, වෙළඳ විෂයන් වූ වෛද්‍ය ඉන්ජිනේරු පාඨමාලා වෙතට දෙමළ ජනයා වඩාත් යොමු වූයේ ඒ තුළින් හෝ ගැලවීමට ලබා ගැනීමට විය හැකිය.

1969 - 70 විශ්වවිද්‍යාල ප්‍රවේශය

| පාඨමාලාව | සිංහල% | දෙමළ% | මුස්ගිම් - මැලේ% | එකතුව |
|---|---|---|---|---|
| වෛද්‍ය | 112(48.9) | 112(48.9) | 2(0.9) | 229 |
| ඉන්ජිනේරු | 77(51.9) | 72(48.3) | 149 | |
| විද්‍යා (සියලු) | 457(57.7) | 315(39.8) | 13(1.6) | 792 |
| කලා (සියලු) | 2522(84.4) | 176(7.5) | 44(4.0) | 2337 |

මෙයින් පෙනෙන්නේ දෙමළ සිසුන් වැඩි වශයෙන් විද්‍යා - වෛද්‍ය - ඉන්ජිනේරු ක්ෂේත්‍ර කරා යොමුවෙද්දී සිංහල සිසුන් කලාපීඨ කරා යොමු වීමය. යාපනයේ දියුණු විද්‍යා අධ්‍යාපනයද මෙයට හේතු විය.

දෙමළ භාෂාවට නිසි තැන දී ඉංග්‍රීසි වෙනුවට සිංහල - දෙමළ භාෂා ඒකාධිකාරයක් ඇතිකරනු වෙනුවට 1973 දී මාධ්‍ය පදනම් කරගත් ප්‍රමිතිකරණයක් ආරම්භ විය. මෙයින් බලාපොරොත්තු වූයේ ඉංග්‍රීසි බස උපයෝගීකරගත් විද්‍යා අධ්‍යාපනයේ දෙමළ ඒකාධිකාරය බිඳ දැමීමය.

1974 - විශ්වවිද්‍යාල ප්‍රවේශය

| පාඨමාලාව | සිංහල% | දෙමළ% | මුස්ලිම්% | එකතුව |
|---|---|---|---|---|
| වෛද්‍ය | 184(70.0) | 68(25.9) | 8(3.0) | 263 |
| ඉන්ජිනේරු | 223(78.8) | 46(16.3) | 14(4.9) | |
| විද්‍යා (සියලු) | 1058(75.4) | 294(20.9) | 46(3.3) | 1403 |
| කලා (සියලු) | 1934(86.0) | 226(10.0) | 84(3.7) | 2250 |

මෙයින් පෙනී යන්නනේ විද්‍යා අධ්‍යාපනයේ ලා දෙමළ ප්‍රතිශතයන් ශීඝ්‍රයෙන් අඩුවී ගිය ආකාරයය. දෙමළ මැද පන්තිය හා ශිෂ්‍යයින් කැළඹී ගිය අතර ජනවාර්ගික ධ්‍රැවණයේ තීරණාත්මක ක්‍රියා මාර්ගය ඇරඹුහ.

මාධ්‍ය ප්‍රමිතිකරණය ඍජු ජාතිවාදී ක්‍රියාදාමයක් වූ අතර එහි ප්‍රථිලය වූයේ ඉතාම සංවේදී දෙමළ තරුණයන් ඒවන විටත් ඇවිලෙමින් පැවති ජනවාර්ගික කැළඹීම යුද්දයක් බවට පරිවර්තනය කරලීමේ කේන්ද්‍රීය න්‍යෂ්ඨිය වීමය. ඇත්තෙන්ම එය ජනවාර්ගික යුද්ධයේ තීරණාත්මක සාධකය බවට පත්විය. සිදුවූ වරද වහා වටහා ගන්නා අතර දිස්ත්‍රික් පදනම සැකසුනේ ඒ සඳහායි. නිදහස් අධ්‍යාපනයේ වරම පොදුවේ සිංහල දෙමළ ගැමි ගොවි දරුවන්ට අහිමිව තිබූ අතර ගැමි දරුවන්ට සහන සැලසූ දිස්ත්‍රික් පදනම පවා යාපනයේ අර්ථ දක්වනු ලැබුයේ සිංහල වර්ගවාදය ලෙසය. කෙසේ වෙතත් සැබෑ අධිපතිබාවය සැබෑ පීඩකයාට එරෙහි වූ සටන විකෘති සිංහල ජනයාට එරෙහි වර්ග වාදයක් ලෙස පිපිරි ගියේය.

ඉතා සැලකිල්ලෙන් බැලිය යුතු තවත් අංශයක් නම් වතු දෙමළ ජනයාගේ අධ්‍යාපනය දෙසය. ඉතාම නොදියුණු අධ්‍යාපනයක් මොවුන් ලබන බව සැක නැත. ඔවුන්ගේ දරුවන්ට කෙසේවත් සෑහෙන අධ්‍යාපනයක් ලැබෙන්නේම නැත. පසුගිය කාලය පුරා වඩා දුෂ්කර ප්‍රදේශ වූ වන්නි දිස්ත්‍රික්කයේ හා නැගෙනහිර පළාතේ වතු දෙමළ ජනයා, කතෝලික සෙඩෙක් ආයතනය හා ලිබරල් රටවල සහාය ඇතුව ගාන්ධියන් ව්‍යාපාරය විසින් ලක්ෂගණනින් පදිංචි කර ඇති අතර ඔවුන් වෙත ද මේ කටුක අධ්‍යාපන තත්වයන් පවතී. පොදුවේ වතු දෙමළ තරුණයින් අතර ද සිය සාම්ප්‍රදායික නායකයන්ට අහිංසක ලෙස ඡන්දය දුන් යුගය අවසන් වී ඇති බවට ප්‍රවනතාවයක් ගොනුවී ගෙන එයි. රැකියා අවශ්‍යතා නිසා පිපිරීම කල් ගියද වතු ආර්ථිකය කඩා වැටුන හොත් දෙවන යාපනය මෙන් මොවුන් පුපුරා වැටෙන බවට ද සැකයක් නැත්තේය. නැගෙනහිර මුස්ලිම් ජනකොටස් අතරද මෙවැනිම ප්‍රවනතාවයක් පැන නැගෙමින් පවතී. මේවා සියල්ල යාපනය ගත් ආදර්ශය ගතහොත් රට කොයිබටද?

ප්‍රායෝගික ලෙස ශිෂ්‍ය ව්‍යාපාරය තුළ 1982 ධවල පනත තෙක් යාපනය හා මඩකලපුව විශ්වවිද්‍යාල රැඳී සිටියහ. 1982 ධවල පනතට එරෙහිව හයිඩ්පාක් රැලියේදී යාපනය මහා ශිෂ්‍ය සංගම් සභාපති ස්කන්ධ රාජා (මොහු පසුව ආරක්ෂක අංශ විසින් මරා දැමිණ) සෙසු අ.වි.වි.ශි.ව.ම. නායකයන් සමග ජනතා ඇමැතීය. ඉන්පසු සබඳතා ක්‍රමයෙන් පිරිහී 1983 න් පසු අහිමිව ගියේය. විවිධ ජනවාර්ගික කැරලිවලට පසු යාපනයෙන් ද මඩකලපුවෙන් ද සිංහල සිසුන් සහමුලින්ම පළවාහරින ලද අතර දෙමළ සිසුන් පේරාදෙණියේ හා මොරටුවේ එල්ල වූ තර්ජන ශිෂ්‍ය ව්‍යාපාරය විසින් පරාජය කරන ලදී.1983 න් පසු යාපනය මඩකළපුව විශ්වවිද්‍යාල ශිෂ්‍ය ව්‍යාපාරයෙන් පමණක් නොව රජයේ පාලනයෙන්ද ඈත්වී ගියේය. 1987 ඔක්. ඉන්දීය හමුදා ප්‍රහාර එල්ල වීමෙන් පසු නැවත යම්කිසි සම්බන්ධතාවයක් ගොඩනැගූ නමුත් පැවති කැළැඹිලි දියේ ගිලී ගියේය. 1989 මුල යාපනය සරසවි සිසුන් දෙදනකු ඉන්දීය හමුදා විසින් ඝාතනය කෙරුමත් ඉන්දීය අතවරත් නිසාත් නැවත සබඳතා ඇතිවන පකුණු පහලව තිබේ. ජාතික සමගියේ පාඩම තම ජනයාට ද අධිරාජ්‍යවාදයට ද උගැන්විය හැක්කේ ශිෂ්‍ය පාඩම තම ජනයාට ද අධිරාජ්‍යවාදයට ද උගැන්විය හැක්කේ ශිෂ්‍ය ව්‍යාපාරයට මිස අන් කවරකෙටද?

## 4. කළ යුත්තේ කුමක්ද?

අද දවසේ ශිෂ්‍ය ව්‍යාපාරයද අර්බුදයක පවතී. කළයුත්තේ කුමක්ද? යන්නට පෙර සිදුවූයේ කුමක්ද යන්න වටහා ගැනීම අතිශය වැදගත්

වේ. ඉතිහාසයේ පෙර නොවූ විරූ රාජ්‍ය විරෝධී ශිෂ්‍ය කැරැල්ලක්, කොටින්ම ගමේ බඩවැටියේ සැඟවුණු ගල් කොටස්වල තුරුළුවත්තේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය දක්වා වූ ආණ්ඩු විරෝධී අරගලයක් තිබියදී එකළොස්වරක් රට විනාශ කළ රජයක්, රට අමුසොහොනක් කළ රජයක් නැවත බලයට පත්වූයේ කෙසේද? එයට වැරදි කරුවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පමණක්ද?

කෙසේ වුවත් එ.ජා.ප. නැවත බලයට ඒමට ආණ්ඩුව එරෙහිව සටන් කරනවා යැයි. කියන අනෙක් සෑම පක්ෂ හා සංවිධාන මෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරයද වගකිව යුතුය. ලැබුණු අතිවිශාල අත්දැකීම් සම්භාරයත් සමග තම දර්ශනය උපාය උපක්‍රම නිවැරදි කරගෙන එය, ජාතික විමුක්ති සටන ජයග්‍රහණය කරා ගෙන යා යුතුය.

## සැබෑ අධිරාජ්‍යවාදියා කවුද? ඉන්දියාවද? ඇමරිකාවද?

ඉන්දියාව අද ව්‍යාප්තවාදී සුපිරි බලයකි. නිදහසට පෙර රාජ්‍යයන් 562 ක් වූ ඉන්දියාව සාර්දාර් පතෙල්ගේ ඥානයෙන් ද, ශ්‍රී නේරුගේ බලයෙන්ද, රාජ්‍යයන් බලයත් අල්වා ගනිමින් ව්‍යාප්ත වෙමින් සිටී. සිකීම්, භූතාන්, කාෂ්මීර්, නේපාල, බංගලාදේශ ආදියෙන්ද නොනැවතී ලංකාව, මාල දිවයින, මුරුසිය, පිජී, බොර්නියෝ සිට ඕස්ට්‍රේලියාව දක්වා ඇයගේ ව්‍යාප්තවාදී හස්තයන් දිගු වී සිටී. ආර්ථික - දේශපාලන අතින් ද ඈ දැන් සුපිරි බලයකි.ඇගේ හමුදාවලින් සේනාංක දෙකක් ලංකාවේ උතුරු - නැගෙනහිර අත්සන් කරගෙන සෙසු ප්‍රදේශවල රූකඩ රජයක් පිහිටුවා තිබේ. ඇගේ වාර්ශික අය - වැයෙන් ලංකාව සඳහා ද ප්‍රතිපාදන වෙන්කෙරේ.

ඇමරිකාව මුළු ලෝකය පුරා පැතිර ගිය අධිරාජ්‍යවාදී ආර්ථික - දේශපාලනික බලයයි. ආර්ථික අතින් සැලකු කල ඉන්දියාවද සිටින්නේ ඇමරිකන් බලය යටතේය. දේශපාලනික ලෙස ඉන්දියාව ඇයට අභියෝගයකි. ජපානයේ මෙන්ම ඉන්දියාවේ ද ස්වාධීන ධනපති ක්‍රමය ඇයට තර්ජනයකි. ඉන්දියාව වඩාත් හානිකර වන්නේ ඇය සෝවියට් දේශය සමග බැඳී ඇති නිසාය. එහෙයින් ඉනිදියාව අස්ථාවර කිරීම සඳහා පකිස්තානය, බංගලාදේශය, ඇෆ්ගන් ගරිල්ලන්, ලංකාව, ආසියන් හවුල යොදා ගැනීමටත් ඉනිදියාවේම බෙදුම්වාදීන් යොදාගැන්වීමටත් ඇයට අවශ්‍යය. ලංකාව තුළ ද ඇගේ ඇඟිලිගැසීම් ඇතිවූයේ අද ඊයේ නොවේ. එය 1956 - 60 බණ්ඩාරණායක ආණ්ඩුව අස්ථාවර කිරීම බණ්ඩාරණායක මහතා ඝාතනය කෙරුම, 60 -65 බණ්ඩාරණායක මැතිනියගේ රජයට 61 දී පාසල් තෙල් කොම්පැනි ජනසතුවට එරෙහිව බාධාකෙරුම 62 හමුදා කුමණ්ත්‍රණ හා 64 රාජාසන කතාවෙන් ඇගේ



chandrikawalaka.lk

රජය පැරද වීමට මණ්ත්‍රීන්ට අල්ලස් දීම දක්වා දිවයයි. 77 න් පසු බලයට ආවේ යැංකි ඩිකී ගේ ආණ්ඩුවය. ආර්ථික දේශපාලණික ලෙස ලංකාව නොබැඳි පිළිවෙතින් ඇමරිකන් අධිරාජ්‍ය පිළට වැටිනි. යුද්ධ උපදේශකයින් ද, කුලී හේවායින් ද, රහස් තොරතුරු අංශද ඇමරිකන් හඬ ද පිහිටවිණ. තිස් අවුරුද්දකින් අවසන් කෙරුමට නියමිත මහවැලි ව්‍යාපාරය සහමුලින්ම වෙනස් කළේ. සය අවුරුද්දකට සැලසුම් සකස් කළේ ඇමරික්න් යුද කඳවුරක් ත්‍රිකුණාමලයට ගෙන එම සඳහාය යි කියනු ලැබේ. කෝටි 16000 කට වඩා විදේශ ආධාර කළේ අතලෙවකන්නට නොවේ. අවසානයේ ඉන්දියාව විසින් ඇමරිකාවේ මිල්ටරි සැලැස්ම පරාජය කළේය. ඉන්දීය හමුදා එකකි. මුළුමහත් සමාජ ආර්ථික ලෙස අප බැඳී සිටින්නේ ඇමරිකාව නොවේද?

එහෙත් ඉන්දියාවේ ව්‍යාප්තවාදී වුවමනාව අප පරාජය කළ යුතුය. පසුගිය කාලය පුරා ශිෂ්‍ය ව්‍යාපාරය ප්‍රමුඛ දේශප්‍රේමී බලයන්ගේ ඉන්දීය විරෝධී සටන් පාඨ නිසා රජය තුළ මෙන්ම විපක්ෂයද ඇමරිකන්වාදීන් බලවත් විය. ඇමරිකාව ළඟට ඇතිව, ඇගේ කරපිටින් ගොස් ඉන්දියාව පන්නන්නට තැත්කෙරුම දේශපාලනික විහිලුවකි. අද ප්‍රශ්නය ඇත්තේ ඉන්දීය බැංකු, ඇමරිකානු බහුජාතිකයන් සඳහාද ගනුදෙනු බේරා ගත යුතුය. අනෙක් අතින් ලෝකයේ ප්‍රගතිශීලී වාමවාදී රාජ්‍යයන් රැසක් ඇමරිකාවට එරෙහිවීම ගැන ඉන්දියාවේ නායකත්වය පවතී. සී.අයි.ඒ. සංවිධානය විසින් ස්වීඩනය අගමැති ඝතනය කළේ ඔහු ඉන්දියාවේ. නායකත්වයෙන් ඇමරිකන් විරෝධී කඳවුරක් පිහිටුවීමට තැත්කළ නිසාය යි කියනු ලැබේ. රජීව්, ඉන්දිරා තරමට ම ඇමරිකන් විරෝධී නොවුවත් උපායක් ලෙස හෝ ලෝක ප්‍රගතිශීලී කඳවුර සමග සිටියි. එහෙයින් අප ඉන්දියාවට එරෙහි විය යුත්තේ ජාත්‍යන්තර ප්‍රගතිශීලී බලයන් දිනාගන්නා ආකාරයටය.

රටේ ස්වෛරීත්වය රැකගන්නට ඉන්දියාවට හා ඇමරිකාවට එහෙත් විය යුත්තේ එකිනෙකා තුරුලට මාරුවෙමින් අනෙකා පරදන්නට නොව ඉඟුරු දී මිරිස් ගන්නට නොව දෙදෙනාටම පන්නා මව්බිම රකින්නටය.

අද රටට ජාතික සමගියද අවශ්‍ය වෙයි. එහිදී වටහා ගත යුතු ප්‍රථම දෙය නම් ජාතීන් එක් කළ හැක්කේ ඉංග්‍රීසින් පොදු රාමුවක නොව එයට පටහැනි සිංහල - දෙමළ රාමුවක බවය. අද ජාතික ප්‍රශ්නයට විසඳුම් දී ඇත්තේ පළාත් සභා මගිනි. එහි හරය බලය විමධ්‍යගතකරණය යැයි කියනු ලැබේ. 'බල බෙදීම' ධනවාදී ලිබරල් න්‍යායේ සිටි මාක්ස් - ලෙනින් වාදී සෝවියට් සභා දක්වාද පෙරදිග ගාන්ධි ක්‍රමයේ ග්‍රාම රාජ්‍යවලට ද මූලික වෙයි. බලය බෙදීමට ශිෂ්‍ය ව්‍යාපාරය විරුද්ධ ද? ශිෂ්‍ය ව්‍යාපාරය ජාතීන් ලෙස බලය බෙදීමට එරෙහි බව පළාත් අවස්ථා

champikaranawaka.lk

champikaranawaka.lk

වයේ පාඩම් උගත්තේය. මෙසේ උනුනුන් ගෙන් උගෙන ගැනීමෙන් සිදුවූයේ ජනතාව තව වරක් පරාජය වීම පමණි. අච්චාරු සංස්කෘතියේ ඉහළම වීරයා බලයට පත්විය. බණ්ඩාරණායක මහතා සිංහලෙන් ඉංග්‍රීසි උගත් පොදු ජනයා ගේ හැඟීම් වටහා ගත් අයෙකි. ජාතියේ අවසන් විමුක්ති සටන බොල් හරයන් සහිත පැසිස්ට් වර්ගයේ පාලනයකින් කෙලවර වී තිබේ.

පසුගිය එකළොස් වසර (77-88) යූ.එන්.පී. ය එක් එක් ජනතා වුවමනාවන් සඳහා එක්එක් පුද්ගලයන් ඉදිරිපත් කර අවසානයේ ලාභාංශ මත සියල්ල සමගි කළේය. (ලිබරල් ආර්ථිකයට රොනී ද මෙල් මහතා බටහිර මතවාදයට යුද්ධයට ලලිත් ඇතුළත්මුදලි මහතා, වතු දෙමළ ජනයාට තොණ්ඩමන් මහතා, සිංහල ජාතිවාදයට දේවනායගම් මහතා ලෙසය) රජයේ මේ උපක්‍රමය යථාර්ථයක් යැයි ගත් ශිෂ්‍ය ව්‍යාපාරය ද ප්‍රේමදාස මහතා බේරා ජේ.ආර්. ජයවර්ධන මහතාට පහර දුන්නේය. ප්‍රේමදාස මහතා පව් සොදාගත් අතර යූ.එන්.පී. ය රැකුනි. දැන් ප්‍රේමදාස මහතාද ඒ උපක්‍රමයම අනුගමනය කරමින් සිටී. යුද්ධ පෙරමුණේ රන්ජන් විජේරත්නය. සිංහල පෙරමුණේ වි.ජ.මු. ය. "අද ඇත්තේ වංචාවක්, මෙයට එරෙහිව කැරලි ගසන්නට ඕනෑ" (රාවය 1989 පෙබ. කලබ) වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතා කියද්දී කැරලිකරුවන් ගැන කතා කරන්නට ද මරණය නියම කරන බව රන්ජන් විජේරත්න මහතා කියයි. නැවතද ශිෂ්‍යයන් රන්ජන් විජේරත්න මහතාට පමණක් පහර දෙන බව පෙනේ. එහෙත් වඩා හානිකර සිල්රෙදි පොරවා ගත් වෘකයින්ය. ජාතියේ ජාතික වුවමනාවන්ටද යූ.එන්.පී. යට හැකිවිය. එය එතරම්ම දියුණු මුහුණුවරක් සහිත දක්ෂිණික පක්ෂයකි. මේ සියලු තත්ත්වයන් වටහානොගෙන ශිෂ්‍ය ව්‍යාපාරය කටයුතු කළ හොත් නැවත ශිෂ්‍ය උද්ඝෝෂණයේ ප්‍රථිපලයක් ලෙස කොටියා පුල්ලි මාරුකරගෙන ප්‍රතිගාමීත්වය වෙනුවෙන් නැවත බලයට එනු ඇත.

## තමා වටහා ගැනීම

යූ.එන්.පී. යට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරය සටන් වැදුන ද ඔවුන් නැවත බලයට පැමිණවීමට ද ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාමාර්ග වැරදි උපක්‍රම හේතු වූ බව ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාමාර්ග වැරදි උපක්‍රම හේතුවූ බව ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහි චෝදනාවකි. එයට විදේශ ප්‍රතිගාමීන් ද සහය දුන් බව චෝදනාවල කියැවේ. 1969 මැයි 30 දා ප්‍රංශයේ පලවූ "ලා මොන්ඩේ" පුවත්පත වාර්තාකරණ ආකාරයට 1968 පඅවති පැරිස් ශිෂ්‍ය කැරැල්ල ඇමරිකානු මධ්‍යම ඔත්තු සේවය (C.I.A) විසින් යුදෙව්වන්ගේ සහය ඇතිව ඊට පෙර වර්ෂයේ (1967) අරාබි ජාතිකයන්ට පක්ෂව හා ඇමරිකාවට විරුද්ධව අනුගමනය කළ ප්‍රතිපත්තිය නිසා

"ඩිගෝල්" ට දඬුවම් පැමිණ වීමකි. 1988 ලංකාව පුරා පැතිර ගිය ශිෂ්‍ය කැරලි එයට පෙර අනුගමනය කළ ප්‍රතිපත්තියට (1987 - ගිවිසුම දඬුවම්) පැමිණ වීමක්ද?

ශිෂ්‍ය ව්‍යාපාරය තමා වටහා ගත යුතු ය. සිය අධ්‍යාපනික සීමාවේ ඉල්ලීම් විසඳා ගත හැකිව තිබියදී වසර දෙකක් දුර ශිෂ්‍යයින් කැපවීම කළේ යූ.එන්.පී. ය බලයට ගෙන ඒමට නොවේ. මෙය පොදු සිසුන් අතර මෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය අතර ද ඉමහත් අපේක්ෂා භංගත්වයකට පත් වීමට තුඩු දී තිබේ.

ශිෂ්‍ය ව්‍යාපාරය වටහාගත යුතු ප්‍රථම දෙය විය යුත්තේ රටපුරා යුද්ධ වතාවරණයකට මග පෑදෙමින් ශිෂ්‍ය ව්‍යාපාරය වැනි ආයුධ සන්නද්ධ නොවන ව්‍යාපාරයට හා බහුජන ක්‍රියාකාරීත්වයට බාධා පැමිණි ජනතාව ඝාතනය වන බවය. පසුගිය ජනාධිපති වරණය හා මහ මැතිවරණය වර්ජනය කෙරුමට තීන්දු කෙරුම, තම ශක්තිය තුවක්කු බලයෙන් ඡන්දය වැලැක්වීමට ගත් තැන, ප්‍රජාතන්ත්‍ර කරණය කෙරුමය. එක් අවස්ථාවක රජය අතුරු ආණ්ඩුවකට යෑමට සූදානම්ව සිටියදී ඊළඟ පාලනයේ හවුල්කරුවන් බවට ශිෂ්‍ය ව්‍යාපාරය පත්වන ලකුණු පහළව තිබියදී සියලු ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවන් බහුජනතා ක්‍රියාවන් ප්‍රතික්ෂේප කර ශ්‍රී ල.නි.ප. ය පැරදවීමේ අටියෙන් ක්‍රියාකෙරුමේ අන්තවාදී ක්‍රියාවන් නිසා අද රටපුරා උද්ගතව ඇති යුදකාරී වතාවරණයට ශිෂ්‍ය ව්‍යාපාරයද වගකිව යුතු ය. එක් අතකින් ආණ්ඩුව භික්ෂූන් වහන්සේලා ඇදුරන් සරසවි සිසුන් පාසැල් සිසුන් ඝාතනය කරද්දී අනෙක් සන්නද්ධ කොටස් ද භික්ෂූන් වහන්සේලා - පාසැල් ඇදුරන් - සිසුන් ඝාතනය කරන බව දැක්වීමට තරම් නිහතමානී විය යුතුය. යුද්ධයෙන් ජයක් නැත. එයින් තවත් පරම්පරාවක් විනාශ වනවා පමණි.

රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවා මෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය සිසුන්ගේ හා එය නියෝජනය කරන විවිධ කණ්ඩායම් වල ප්‍රජාතන්ත්‍රවාදයට ද ගරු කළ යුතු ය. ශිෂ්‍ය ව්‍යාපාරය මෙන්ම ව්‍යසනයක් කරා ගියේ අර්බුදය ඉදිරියේ එය දැඩි මධ්‍යගත ස්වාභාවයක් ගත් නිසාය. ශිෂ්‍යයාගේ කැමැත්තෙන් ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොර ශිෂ්‍ය ව්‍යාපාරයක් නැත.

ශිෂ්‍ය ව්‍යාපාරය විසින් වටහාගතයුතු වැදගත්ම දෙය නම් ජනතාවගේ මානසිකත්වය හා ක්‍රියාකාරීත්වයයි. ජනතාවගේ මෙන්ම ශිෂ්‍යයන්ගේ ද බහුජන නැගිටීම ඉතා ක්ෂණිකව එක්වරම නැගෙයි. එයින් පසු බිඳෙයි. කාලයක් නිහඬව සිටියි. නැවත නැගෙයි. එසේ ශිෂ්‍ය හා ජන රැල්ල ඉහළටම නැංවීමට හැකි උපරිම අයුරින් බලය ලබාගැනීමත් සිය ඉල්ලීම



chandrikanwa.lk

ලබාගැනීමත් ශිෂ්‍යයන් කළ යුතුය. එසේ නැතිව ජනරල්ල සැමදා පවතින්නක් ලෙස සලකා කටයුතු කරතොත් ඉතාම තීරණාත්මක මොහොතේ කට්ටිවාදීව ක්‍රියා කළොත් ජනතාව කිසි විටෙක එවන් බලකායකට ඇදී යන්නේ නැත. එහි වාසිය යූ.එන්.පී. යට යි. අනෙක් අතින් ශිෂ්‍යයන් ඉදිරියේ තිබුණු තම අධ්‍යන සීමාවේ ගැටලු බෙහෙවින් ම ක්ෂණික ඒවාය. ශිෂ්‍ය ව්‍යාපාරයට පාලන බලය ලැබෙන තුරා පාසැල් හා සරසවි වසා තැබිය නොහැකිය. (ජනපතිවරණයට පෙර ආණ්ඩුව පැරදවීමට අධ්‍යාපනය කැප කෙරුමට බහුතර සිසුන් සූදානම් වුවත්, තීරණාත්මක පරාජයකින් පසු ජය පෙනෙන සේයාවක් නැතිව ඔවුන් එයට කිසිසේත් සූදානම් නැති බව ශිෂ්‍ය ව්‍යාපාරය දත යුතුය.) එමෙන්ම ශිෂ්‍යයන්ගේ ඉල්ලීම කාලය හා අවකාශය අනුව වෙනස් වේ. 1985 දී සංශෝධන පනත අස්කර ගන්නා තුරු සරසවි නොයමුයි කී ශිෂ්‍ය ව්‍යාපාරය උද්ඝෝෂණය ඉදිරියේ පනත ආපසු නොගන්නා විට සරසවි සිටියහ. ප්‍රයෝගිකත්වය එයයි. එහෙයින් තමන්ගේ ඉල්ලීම එදා මෙන්ම වත්මනට ද කෙතරම් ගැලපෙනවාද නැද්ද යන්න තම ඉල්ලීම් සමග බහුතර සිසුන් කෙතරම් ගැලපෙනවාද නැද්ද යන්න ගැන ශිෂ්‍ය ව්‍යාපාරය තීරණයක් කළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය රැක ගත හැක්කේ එයට ගරු කෙරුමෙන් පමණකි.

ශිෂ්‍ය ව්‍යාපාරයේ මධ්‍යස්ථභාවය පිළිබඳව ද ප්‍රශ්න තිබේ. ශ්‍රී.ල.නි.ප. ජ.වි.පෙ. - ම.එ.පෙ. හා දෙමළ මුස්ලිම් සංවිධාන එක්සත් කෙරුමේදී ඒ සැම කොටසකට ම තමන් ගේ නියෝජනයක් ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වූ නිසා එහි මධ්‍යස්ථභාවය ගැන සැකයක් නොවීය. බහුතර සිසුන්ට ද එය එලෙසම විය. ශ්‍රී.ල.නි.ප. පාක්ෂිකයන් ලබා ජනතාවගේ ද තඹ දොයිතුවක විශ්වාසයක් නැත. ඔවුන් විශ්වාසය තැබූ හා ගරු කළ එක් ආයතනයක් නම් ශිෂ්‍ය ව්‍යාපාරයයි. එහෙත් ශිෂ්‍ය ව්‍යාපාරය එම තත්ත්වය අද විනාශ කරගෙන ඇත්තේය. මේ තත්ත්වය නැවත ගොඩනගා ගත යුතු ය. මධ්‍යස්ථභාවය හා සාතන වගට එරෙහිව රටේ ස්වෛරීත්වයත්, ජාතියේ උරුමයත් රැකගැනීමට ඉතිහාසයේ උරුමය අනුව ඔවුන්ට පා තැගිය හැක්කේ එවිටය.

ඔබ පරාජය වී ඇත. එහෙත් ඔබ විනාශ වී නැත.

හතර අතින් කළු කෙරුවත් වැහි වැටුනේ නෑ යාළු<br>
පඳුරු ලලා ගස වැඩුනත් මල් පිපුනේ නෑ යාළු

හෙටවත් රතු මල් පිපේ දැයි බලමු

-1989 පෙබරවාරි-

champikaranawaka.lk

හතර වටින් කළු කෙරුවත් වැහිවැටුනේ නෑ යාළු
පදුරු ලලා ගස වැඩුනත් මල් පිපුනේ නෑ යාළු

# හෙටවත් රතුමල් පිපේදැයි බලමු

ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතියන්හි විකාශනය හා
ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ගමන් මග පිළිබඳ අධ්‍යයනයක්
අතීතය මත පාදක ව
අනාගතයට හෙළන බැල්මක් !



චින්තන පර්ෂදයේ
ප්‍රකාශනයකි.
මිල රුපියල් 25/-

champikaranawaka.lk